87 වන කාණ්ඩය
7 වන කලාපය

සිකුරාදා
1969 සැප්තැම්බර් 5

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 1397]**

විසර්ජන පනත් කෙටුම්පත (1969-70) [දහසයවන වෙන් කළ දිනය] [තී. 1411] :

ශීර්ෂ 70-76 සහ 80 කාරක සභාව විසින් සලකා බලන ලදී.

**කල් තැබීමේ යෝජනාව [තී. 1613]**

පරිශිෂ්ටය [තී. 1617]

PUBLIC LIBRARY
JAFFNA
3052

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 87
இல. 7

வெள்ளிக்கிழமை
5, செப்ரெம்பர் 1969

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூலவிடைகள் [ப. 1397]

ஒதுக்கீட்டு மசோதா (1969–70) [ஒதுக்கப்பட்ட பதினாறும் நாள் : [ப. 1411] :

குழுவில் ஆராயப்பட்டது [தலைப்புக்கள் 70–76, 80]

ஒத்திவைப்புப் பிரேரணை [ப. 1613]

அநுபந்தம் [ப. 1617]

---

Volume 87
No. 7

Friday
5th September 1969

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

PRINCIPAL CONTENTS

OFFICIAL REPORT

ORAL ANSWERS TO QUESTIONS [Col. 1397]

APPROPRIATION BILL (1969-70) [Sixteenth Allotted Day] [Col. 1411]:

Considered in Committee [Heads 70-76 and 80]

ADJOURNMENT MOTION [Col. 1613]

APPENDIX [col. 1617]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය
## பிரதிநிதிகள் சபை
## House of Representatives

**1969 සැප්තැම්බර් මස 5 වන සිකුරාදා**

வெள்ளிக்கிழமை, 5 செப்டெம்பர் 1969.

*Friday, 5th September 1969*

---

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලසනාරූඪ විය.

சபை, மு. ப. 10 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 10* A.M. MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 3.

**පී. සී. ඉඹුලාන මයා. (කෘෂිකර්ම හා ආහාර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. பீ. சீ. இம்புலான—விவசாய, உணவு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. P. C. Imbulana—Parliamentary Secretary to the Minister of Agriculture and Food)

I ask for three weeks' time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 4.

**ඉඹුලාන මයා.**
*(திரு. இம்புலான)*
(Mr. Imbulana)

Here too I ask for three weeks' time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

### නන්නපුරාව වි. සේ. ස. සමිතිය පිහිටි ගොඩනැගිල්ල
### நன்னபுருவ ப. நோ. கூ. ச. : கட்டடம்
### NANNAPURAWA M.P. C.S. : BUILDING

5. **ආර්. එම්. ධර්මදාස බණ්ඩා මයා. (බිබිලේ)**
*(திரு. ஆர். எம். தர்மதாச பண்டா—பிபிலே)*
(Mr. R. M. Dharmadasa Banda—Bibile)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සීමාසහිත නන්නපුරාව විවිධ සේවා සමුපකාර සමිතිය පවත්වාගෙන යන ගොඩනැගිල්ල සහ ඉඩම එම සමිතිය සතු කර ගැනීමට කටයුතු කිරීමට අවසර ඉල්ලා එම සමිතිය විසින් 1965 වර්ෂයේදී මොණරාගල සමුපකාර උප කොමසාරිස්ගෙන් ඉල්ලීමක් කළ බව එතුමා දන්නවාද? (ආ) මෙම ඉල්ලීමට මෙතෙක් කිසිම පිළිතුරක් උප කොමසාරිස් සමිතියට යවා තිබේද? (ඉ) එසේ නම්, ඒ කවදාද? නොඑසේ නම්, ඒ මන්ද? (ඊ) මෙම ඉල්ලීම පැහැර හැරීමට හේතු මොනවාද? (උ) මෙම ඉල්ලීම ඉටු කිරීමට එතුමා කටයුතු කරන්නේද? (ඌ) එසේ නම්, ඒ කවදාද? නොඑසේ නම්, ඒ මන්ද?

விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) நன்னபுருவ பலநோக்குக் கூட்டுறவுச் சங்கம் லிட். இப்பொழுது இருக்கின்ற காணியையும் கட்டடத்தையும் பெற்றுக்கொள்வதற்குரிய நடவடிக்கை எடுப்பதற்கு அனுமதி கோரி 1965 மொனருகல கூட்டுறவு அபிவிருத்தி உதவி ஆணையாளருக்கு விண்ணப்பித்த தென்பதை அவர் அறிவாரா? (ஆ) இச் சங்கத்தின் இந்த வேண்டுகோளுக்கு இது வரையில் உதவி ஆணையாளர் ஏதாவது பதி



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ධර්මදාස බණ්ඩා මයා.]

லனுப்பியிருக்கிறாரா? (இ) ஆமெனில், எப்போது? இல்லையெனில், ஏன்? (ஈ) இந்த வேண்டுகோள் உதாசீனஞ் செய்யப்பட்டதேன்? (உ) இந்த வேண்டுகோளை நிறைவேற்ற அவர் நடவடிக்கை யெடுப்பாரா? (ஊ) ஆமெனில், எப்போது? இல்லையெனில், ஏன்?

asked the Minister of Agriculture and Food: (*a*) Is he aware that the Nannapurawa Multi-purpose Co-operative Society Limited appealed to the Assistant Commissioner of Co-operative Development, Moneragala in 1965, for permission to take action to acquire the land and the building in which the society is functioning? (*b*) Has the Assistant Commissioner sent any reply to this request of the society so far? (*c*) If so, when? If not, why? (*d*) Why has this request been ignored? (*e*) Will he take action to grant this request? (*f*) If so, when? If not, why?

**ඉඹුලාන මයා.**
(*திரு. இம்புலான*)
(Mr. Imbulana)

(*a*) No such request has been received by the Assistant Commissioner of Co-operative Development, Monaragala. (*b*), (*c*), (*d*), (*e*) and (*f*) Do not arise: *vide* (*a*) above.

## කාරෙයිතිවු ලුණු ලේවාය
## காரைதீவு உப்பளம்
## KARAITIVU SALTERN

1. **එස්. ඩී. බණ්ඩාරනායක මයා.** (ගම්පහ)
(*திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ*)
(Mr. S. D. Bandaranayake—Gampaha)

කර්මාන්ත හා ධීවර කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පුත්තලම් දිස්ත්‍රික්කයේ කාරෙයිතිවු ග්‍රාමයේ පිහිටි විශාල ලුණු ලේවායන් අවුරුදු දහයකට වැඩි කාලයක් තිස්සේ වැඩ නොකර ඇති බවත්, මෙම ලුණු ලේවායෙන් දිවි පෙවෙත රැක ගත් ගම්මුන්ට ඒ හේතුවෙන් විශාල ගැහැටක් සිදුවී ඇති බවත් එතුමා දන්නවාද? (ආ) මෙම ලුණු ලේවාය රජයට පවරාගෙන එම ගමෙන් ලබාගත් කම්කරුවන් යොදවා රජයේ සංස්ථාවක් වශයෙන් පැවැත්වීමට හෝ, සමුපකාර ක්‍රමයට එය පැවැත්වීමට ගම්මුන්ට භාරදීමට හෝ එතුමා කටයුතු කරනවාද?

கைத்தொழில், கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) புத்தளம் மாவட்டத்தில் காரைதீவு எனுங் கிராமத்தில் ஒரு பெரிய உப்பளம் கடந்த பத்து வருடங்களுக்கு மேலாக செயலற்றுக்கிடக்கிறது என்பதையும், தமது சீவியத்தை நடத்த இதில் தங்கியிருக்கும் கிராமவாசிகள் இதனால் பெருங் கஷ்டத்திற்குள்ளாகிறார்களென்பதையும் அவர் அறிவாரா? (ஆ) இந்த உப்பளத்தைப் பொறுப்பேற்று அந்தக் கிராமத்தொழிலாளரை அங்கு அமர்த்தி அதனை ஒரு அரசாங்கக் கூட்டுத்தாபனமாக நடத்துவாரா? அல்லது, அதனைப் பொறுப்பேற்று ஒரு கூட்டுறவுத்தாபனமாக நடத்தவென அந்தக் கிராம மக்களிடம் கையளிப்பாரா?

asked the Minister of Industries and Fisheries: (*a*) Is he aware that a large saltern in the village of Karaitivu in the Puttalam District is lying unworked for over ten years; and that the villagers who depended on it for their livelihood are undergoing hardship as a result? (*b*) Will he acquire this saltern and run it as a State Corporation with labour from that village; or will he acquire it and hand it over to the villagers to run it as a Co-operative?

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා.** (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(*திரு. டீ. ஷெல்ற்றன் ஜயசிங்ஹ—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி*)
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

(*a*) Yes. This is a private saltern which has not been worked since 1959, due mainly to the shortage of labour and lack of interest among the waikkal owners. (*b*) Investigations have already been started with a view to ascertaining the cost involved in rehabilitating the saltern. If capital costs are not excessive it will be run on lines similar to any other private saltern.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## චන්කානෙයි සුළු නගර සභා ප්‍රදේශයේ ගැමියන්ට ඉඩම්

சங்கானை ப. ச. பகுதி விவசாயிகளுக்கு காணி

LANDS FOR PEASANTS IN CHANKANAI T.C. AREA

2. එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) චන්කානෙයි සුළු නගර සභාවට අයත් ප්‍රදේශයේ ඇති වගා නොකරන ලද ඇතැම් ඉඩම් රජයට පවරාගෙන ආහාර වගාව සඳහා දුප්පත් ගැමියන් අතර බෙදා දෙන ලෙස ඉල්ලමින් 1968 මැයි 5 දතමින් චන්කානෙයි සුළු නගර සභාව විසින් එවන ලද ලිපියක් එතුමාට ලැබී තිබේද? (ආ) එසේ නම් මෙම සාධාරණ ඉල්ලීම එතුමා ඉටුකරනවාද? (ඉ) නො එසේ නම් ඒ මන්ද?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) சங்கானை பட்டின சபைப் பகுதியிலுள்ள பயிர்ச் செய்கையற்றிருக்கும் காணிகளை அரசாங்கம் பொறுப்பேற்று உணவுப் பயிர்ச் செய்கைக்கென வறிய விவசாய மக்களுக்குக் கொடுக்கும்படி கேட்பதும் 1968 மே 5 ஆம் தேதியிடப்பட்டதுமான ஒரு கடிதம் பட்டினச்சபைக் காரியாலயத்திலிருந்து அவருக்குக் கிடைத்ததா? (ஆ) ஆமெனில், இந்த நியாயமான கோரிக்கையை அவர் நிறைவேற்றுவாரா? (இ) இல்லையெனில், ஏன்?

asked the Minister of Land, Irrigation and Power: (*a*) Has he received a letter from the Chankanai Town Council Office dated May 5th 1968, requesting that certain uncultivated lands within their area be acquired by the Government and be given to the poor peasants for food cultivation? (*b*) If so, will he comply with this reasonable request? (*c*) If not, why not?



**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්—ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල ඇමති වෙනුවට)**

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சர் சார்பாக)

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs—on behalf of the Minister of Land, Irrigation and Power)

(*a*) No. (*b*) Does not arise. (*c*) Does not arise.

## කටාන බදුවත්ත මෝලේ ඩබ්ලිව්. ඒ. ජුසේ අප්පුහාමි මහතා

திரு. டபிள்யூ. ஏ. ஜுசே அப்புஹாமி, பதுவத்தை ஆலை, கட்டான

MR. W. A. JUSE APPUHAMY, BADUWATTA MILLS, KATANA

6. එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා. (මිනුවන්ගොඩ — ලක්ෂ්මන් ජයකොඩි මයා.—දිවුලපිටිය—වෙනුවට)
(திரு. எம். பி. டி சொய்ஸா சிறிவர்தன—மினுவாங்கொடை—திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய சார்பாக)
(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. Lakshman Jayakody—Divulapitiya)

කම්කරු හා රැකීරක්ෂා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) සේවක අර්ථ සාධක අරමුදලට සම්බන්ධ කටාන බදුවත්ත මෝලේ කම්කරු ඩබ්ලිව්. ඒ. ජුසේ අප්පුහාමි මහතා (240/බී/8 හා සේ.අ.අ. සිඑල්/ඇෆ්ජ් ඇෆ්ජ්/4363) මාස ගණනකට පෙර ඉල්වා ඇති ප්‍රතිලාභය ගෙවීමට ඇති ප්‍රමාදය කුමක්ද? (ආ) වහාම එය ගෙවීමට කටයුතු කරනවාද? නොඑසේ නම්, ඒ මන්ද?

தொழில், தொழில் வசதி அமைச்சரைக் கேட்ட வினா: (அ) ஊழியர் சேமலாப நிதியைச் சேர்ந்த கட்டான பதுவத்தை ஆலைத் தொழிலாளி திரு. டபிள்யூ. ஏ. ஜுசே அப்புஹாமி (240/பி/8 சே. அ. அ./சிஎல்/எவ்/4363) சில மாதங்களுக்கு முன் கோரியிருந்த நிதியை வழங்குவதிலுள்ள காலதாமதம்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

*யாது? (ஆ) உடனடியாக அதனை வழங்குவ தற்கு நடவடிக்கை எடுக்கப்படுமா? இல்லை யெனில், ஏன்?*

asked the Minister of Labour and Employment: (a) What is the delay in paying the E.P.F. benefits claimed some months ago by Mr. W. A. Juse Appuhamy (240/බී/8 හා සේ. අ.අ./ සිඑල්/ඇෆ්ජ්. ඇෆ්ජ්. 4363), Labourer, Baduwatta Mill in Katana? (b) Will he take steps to pay this money without delay? If not, why?

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ— தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச் சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. S. de S. Jayasinghe—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

(a) The delay in making payment was due to the fact that the required particulars were not correctly furnished in the application. (b) Yes.

## පේෂකර්ම බලවේග යන්ත්‍ර කාර්මිකයන් සඳහා පඩි පාලක සභාවක්

*மின்தறி நெசவாளர்களுக்கு சம்பள நிர்ணயச் சபை*

**WAGES BOARD FOR POWERLOOM WORKERS**

7. **ද සොයිසා සිරිවර්ධන මයා.** (ජයකොඩි මයා. වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ஜயக் கொடி சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Jayakody)

කම්කරු හා රැකීරක්ෂා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පේෂකර්ම බලවේග යන්ත්‍ර කාර්මිකයින් සඳහා පඩිනඩි ගෙවීම ගැන පඩිපාලක සභාවක් වහාම සකස් කිරීමට එතුමා කටයුතු සලස්වනවාද? (ආ) නො එසේ නම්, ඒ මන්ද?

*தொழில், தொழில் வசதி அமைச்சரைக் கேட்ட வினா: (அ) மின்தறி நெசவாளர்களுக் கென ஒரு சம்பள நிர்ணயச் சபையை உட னடியாக அமைக்க அவர் ஏற்பாடு செய் வாரா? (ஆ) இல்லையெனில், ஏன்?*

asked the Minister of Labour and Employment: (a) Will he take immediate steps to constitute a Wages Board for Power Loom Workers? (b) If not, why?

**එස්. ද එස්. ජයසිංහ මයා.**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*

(Mr. S. de S. Jayasingha)

I am tabling the Answer.

**සභාමේසය මත තබන ලද පිළිතුර මෙසේ යි:**

*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு:*

*The answer tabled is as follows:*

(අ) රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවක් පිහිටුවා ඇත. මෙම පඩිපාලක සභා වෙන් ග්‍රාමසංවර්ධන හා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය යටතේ පවත්වාගෙන යනු ලබන බලවේග පේෂකර්ම ආයතනවල සේවකයන් හැර අනිකුත් බලවේග පේෂකර්ම සේවකයන් ආවරණය වේ. (ආ) ඉහත (අ) අනුව පැන නොනගී.

(a) A wages board for the Textile Manufacturing Trade has been set up. This covers power-loom workers other than those in power-loom projects carried on under the aegis of the Department of Rural Development and Cottage Industries. (b) Does not arise, in view of (a) above.

## කැටයාපතන විද්‍යාලය: කේ. එම්. හීන් බණ්ඩා මහතාට ගෙවිය යුතු මුදල

*கெற்றயாபத்தன வித்தியாலயம்: திரு. கே.எம். ஹீன் பண்டாவுக்குரிய பணம்*

**KETAYAPATANA VIDYALAYA: MONEYS DUE TO MR. K. M. HEEN BANDA**

8. **ද සොයිසා සිරිවර්ධන මයා.** (ටී. බී. එම්. හේරත් මයා.—වලපනේ—වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. T. B. M. Herath—Walapane)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) නු/ කැටයාපතන විද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බනිස් සැපයීම වෙනුවෙන් මතුරට වැටගේපොත කේ. ඇම්. හීන්බණ්ඩා මහතාට රු. 674.10 ක් තවමත් නො ගෙවා ඇති බව එතුමා දන්නවාද? (ආ) එම අයගේ බනිස් සැපයීමේ කොන්ත්‍රාත්තුව අවලංගු කරන ලද්දේ 1968 ජනවාරි මාසයේ බව එතුමා දන්නවාද? (ඉ) එම මුදල වහාම ලබාදීමට එතුමා ක්‍රියා කරනවාද, නො එසේ නම්, ඒ මන්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) நு/கெற்றயாபத்தன வித்தியாலய மாணவ மாணவிகளுக்கு பணிஸ் வழங்கியமைக்காக, மத்துரட்டை, வெட்டகே பொத்த என்னுமிடத்தைச் சேர்ந்த திரு. கே. எம். ஹீன்பண்டாவுக்கு ரூபா 674.10 சதம் இன்னும் கொடுக்கப்படவில்லை என்பதை அவர் அறிவாரா? (ஆ) மேற்குறிப்பிட்டவருக்கு அளிக்கப்பட்டிருந்த பணிஸ் வழங்கும் கொந்தருத்து 1968 ஜனவரி மாதம் இரத்துச் செய்யப்பட்டதென்பதை அவர் அறிவாரா? (இ) அப்பணத்தை உடனடியாக பெற்றுக் கொடுக்க அவர் ஏற்பாடு செய்வாரா? இல்லையெனில், ஏன்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that Mr. K. M. Heen Banda of Wetagepota in Maturata has not been paid yet a sum of Rs. 674.10 due to him as payment for buns supplied to the students of நு/Ketayapatana Vidyalaya? (*b*) Is he aware that his contract for supplying buns was cancelled in January 1968? (*c*) Will he take action to pay him this money without delay? If not, why?

**ජයසූරිය මයා.**
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

(*a*) Payment of a sum of Rs. 518.70, and not Rs. 674.10, is due to the baker. (*b*) Yes. (*c*) Action is being taken to pay this amount to this baker.

## විස්කි මෝල්ට් සාන්ද්‍රක ආනයනය

விஸ்கி மதுபான தானியத்தை செறிவடிவத்தில் இறக்குமதி செய்தல்

IMPORT OF WHISKY MALT CONCENTRATE

9. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර—ආචාර්ය එන්. එම්. පෙරේරා—යටියන්තොට—වෙනුවට)

(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை—கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை சார்பாக)

(Mr. Leslie Goonewardene—Panadura on behalf of Dr. N. M. Perera—Yatiyantota)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) විස්කි මෙරටෙහි නිෂ්පාදනය කිරීම සඳහා විස්කි මෝල්ට් සාන්ද්‍රකය ආනයනය කිරීමට යෝජනාකර තිබේද? (ආ) එසේ නම් එවැනි සාන්ද්‍රකය මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර නොකැඳවන ලද්දේ මන්ද? (ඉ) එවැනි සාන්ද්‍රක මිළදී ගැනීමට සුදුසු සමාගම්වල නම් ඉදිරිපත් කරන ලෙසට පමණක් ලන්ඩන්හි, ලංකා තානාපති කාර්යාලයෙන් ඉල්ලා සිටි බව එතුමා දන්නවාද? (ඊ) මේ සඳහා ලංකා තානාපති කාර්යාලය ඉදිරිපත් කළ නම් පහ එතුමා සඳහන් කරනවාද? (උ) මෙම සාන්ද්‍රක ගැලුමක් එංගලන්තයේ සහ ස්කොට්ලන්තයේ දැනට පවතින මිළ අනුව සිලිං 45 ක්ව තිබියදී ගැලුම සිලිං 86 බැගින් මිළදී ගැනීමට ග්‍රෙග්සන්ස් නමැති සමාගමක් හෝ පුද්ගලයෙක් හෝ සමග පස් අවුරුදු ගිවිසුමක් අත්සන් කිරීමට ක්‍රියාකර ගෙන යන බව එතුමා දන්නවාද? (ඌ) එවැනි මොන යම් ගිවිසුමක් හෝ අත්සන් කිරීම නැවැත්වීමට එතුමා වහාම පියවර ගෙන ඒ සඳහා ටෙන්ඩර් කැඳවනවාද?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கையில் விஸ்கி தயாரிப்பதற்காக விஸ்கி மதுபான தானியத்தை செறிவடிவத்தில் இறக்குமதி செய்ய ஆலோசிக்கப்பட்டுள்ளதா? (ஆ) ஆமெனில், இவ்வித செறிவடிவ தானியத்தைப் பெற கேள்விப் பத்திரங்கள் கோரப்படாததேன்? (இ) இவ்வித செறிவடிவதானியத்தை வழங்கக்கூடிய கம்பனிகளின் பெயர்களை மாத்திரம் அனுப்பும்படி இலண்டனிலுள்ள இலங்கை தானிகராலயம் கேட்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா? (ஈ) இதற்காக இலங்கை தானிகராலயத்தால் அனுப்பப்பட்ட ஐந்து பெயர்களையும் கூறுவாரா? (உ) இங்கிலாந்திலும் ஸ்கொட்லாந்திலும் செறிவடிவதானியத்தின் விலை கலனொன்றிற்கு 45 சிலின் ஆகவிருக்கும் போது ஒப்பந்தத்தை கைச்சாத்திடுவதற்கான "கிறெக்ஸன்" எனப்படும் நபருடன் அல்லது கம்பனியுடன் இச்செறிவடிவதானியத்தை கலனொன்றிற்கு 86 சிலின் ஆகப் பெறுவதற்கான ஒப்பந்தத்தை கைச்சாத்திடுவதற்கான நடவடிக்கைகள் ஆரம்பிக்கப்பட்டிருப்பதை அவர் அறிவாரா? (ஊ) இவ்வித ஒப்பந்தத்தைக் கைச்சாத்திடுவதை நிறுத்துவதற்கான உடனடி நடவடிக்கையை எடுத்து கேள்விப் பத்திரங்களைக் கோருவாரா?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is it proposed to import whisky malt concentrate for the manufacture of Whisky locally? (*b*) If so, why were no tenders called for to purchase such concentrates? (*c*) Is he aware that the Ceylon Embassy in London were only asked to supply names of companies that were suitable for the purchase of such concentrates? (*d*) Will he state the 5 names submitted by the Ceylon Embassy for this purpose? (*e*) Is he aware that action is being taken to sign an agreement with a firm or person called Gregsons for 5 years to purchase concentrates at 86 shillings a gallon when the ruling price in England and Scotland is 45 shillings a gallon? (*f*) Will he take immediate action to stop the signing of any such agreement and call for tenders?

**ගරු ජේ. ආර්. ජයවර්ධන (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති වෙනුවට)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சர் சார்பாக)*

(The Hon. J. R. Jayewardene—on behalf of the Minister of Land, Irrigation and Power)

(*a*) Yes. (*b*) This is not an article which can be purchased on tenders because it is not the price but quality and source which matter. (*c*) The whisky project was started by the River Valleys Development Board which had already obtained Excise approval for one variety before the industry was handed over to the Sugar Corporation. To enlarge the field of selection the addresses of five suppliers obtained from the U. K. Commission in Ceylon were referred to the Ceylon Embassy in London. (*d*) Messrs F. E. R. Dixon & Sons; Messrs J. W. Nicholson & Co. Ltd., Messrs Duncan Metheson & Co.; Messrs J. S. Druce & Co.; Messrs Whyte & Mackay Ltd., (*e*) No. (*f*) Does not arise.

## ශ්‍රී ලංකා සීනි සංස්ථාව: ට්‍රැක්ටර් මිළට ගැනීම

*ஸ்ரீ லங்கா சீனிக் கூட்டுத்தாபனம்: இழுபொறி வாங்கல்*

**SRI LANKA SUGAR CORPORATION TRACTOR PURCHASES**

10. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (ආචාර්ය එන්. එම්. පෙරේරා වෙනුවට)

*(திரு. லெஸ்லி குணவர்தன—கலாநிதி என். எம். பெரேரா சார்பாக)*

(Mr. Leslie Goonewardene—on behalf of Dr. N. M. Perera)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) උස් පරතරය ඇති ට්‍රැක්ටර් සැපයීම සඳහා ශ්‍රී ලංකා සීනි සංස්ථාව ටෙන්ඩර් කැඳවා ඇති බව එතුමා දන්නවාද? (ආ) මෙම ටෙන්ඩර් වල විශේෂ විස්තර සහ නිෂ්පාදන වර්ගය ගැන සඳහන් නොකිරීම නිසා මෙම ටෙන්ඩර් නොපැහැදිලි බව එතුමා දන්නවාද? (ඉ) පහත සඳහන් උස් පරතරය ඇති ට්‍රැක්ටර් දැනටමත් සීනි සංස්ථාව සතුව තිබියදී අළුත් ට්‍රැක්ටර් මිළදී ගැනීමට ඇති අවශ්‍යතාවය කුමක්ද? (i) ජෝන් ඩියර් ට්‍රැක්ටර් 21 යි; (ii) මැසී ෆර්ගසන් ට්‍රැක්ටර් 39 යි; (iii) ෆෝඩ් "4000" ට්‍රැක්ටර් 25යි; (iv) මැසී හැරිස් ට්‍රැක්ටර් 2යි; (v) චෙම්බර්ලේන් ට්‍රැක්ටර් 10යි. (ඊ) දැනට මෙම ට්‍රැක්ටර් සංස්ථාව සතුව තිබෙන නිසා සහ සුළු අළුත් වැඩියා කිරීම් ඇතිව හෝ නැතිව හෝ ඒවා සේවයට යෝග්‍ය නිසා තව දුරටත් අළුත් ට්‍රැක්ටර් මිළදී ගැනීම නැවැත්වීමට එතුමා පියවර ගන්නවාද? (උ) ටෙන්ඩර් කැඳවීමට පෙර භාරකාර තැනගෙන් විමසන ලද්දේද? (ඌ) නො එසේ නම් ඒ මන්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) இடைவெளி உயர்வாயுள்ள இழுபொறிகளைப் பெறுவதற்கான கேள்விப்பத்திரங்களை ஸ்ரீ லங்கா சீனிக் கூட்டுத்தாபனம் கோரியுள்ள தென்பதை அறிவாரா? (ஆ) இக்கேள்விப் பத்திரங்கள் தெளிவற்றனவாகவும், விவரக் கூற்றற்றவையாகவும், இனவிவரமற்றதாகவுமுள்ளன என்பதை அறிவாரா? (இ) (i) 21 யோன் டீர் இழுபொறிகள் (ii) 39 மசி பெகர்கஸன் இழுபொறிகள் (iii) 25 போ(f)ட் "4000" இழுபொறிகள்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(iv) 2 மசி ஹறிஸ் இழுபொறிகள் (v) 10 சேம்பர்லின் இழுபொறிகள் ஆகிய பெருமளவிற் சுத்தஞ் செய்யக்கூடிய இழுபொறிகள் ஏற்கனவே கூட்டுத்தாபனத்திலுள்ளபோது புதிதாக இழுபொறிகளைப் பெறவேண்டி தேவையென்ன? (ஈ) இழுபொறிகள் இப்பொழுது உள்ளதாலும், இவற்றில் பெரும்பாலானவை சிறு திருத்தங்களில்லாமலும், திருத்தங்களுடனும் பாவிக்கக்கூடியதாகவுள்ளதாகையாலும் மேலும் புதிய இழுபொறிகளைப் பெறுவதை இரத்துச் செய்வதற்கான நடவடிக்கை எடுப்பாரா? (உ) கேள்விப்பத்திரங்கள் கோரப்படுமுன் இதற்கு பொறுப்பாயுள்ள பொறியியலாளருடன் கலந்தாலோசிக்கப்பட்டதா? (ஊ) இல்லையெனில், ஏன்?

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that the Sri Lanka Sugar Corporation has called for tenders for the supply of high-clearance tractors? (*b*) Is he aware that the tenders are vague without any specifications and without any mention of make or type? (*c*) What is the necessity for purchasing new tractors when the Sugar Corporation already has the following high-clearance tractors:—(i) John Deere 21 tractors, (ii) Massey Ferguson 39 tractors, (iii) Ford "4000" 25 tractors, (iv) Massey Harris 2 tractors, (v) Chamberlain 10 tractors? (*d*) In view of the fact that these tractors are now available and most of them serviceable with or without minor repairs, will he take steps to cancel the purchase of further new tractors? (*e*) Was the Engineer in charge consulted before tenders were called? (*f*) If not, why not?

ගරු ජේ. ආර්. ජයවර්ධන (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති වෙනුවට)

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சர் சார்பாக)

(The Hon. J. R. Jayewardene—on behalf of the Minister of Land, Irrigation and Power)

(*a*) Yes. (*b*) No sufficient specifications are mentioned in the notice to enable manufacturers to tender. If any particular make is mentioned only one manufacturer will be able to tender. (*c*) There are only 10 Chamberlain high-clearance cane landers and 12 John Deere high-clearance tractors at Hingurana. Of these 12 John Deere tractors only 5 are in working order and the balance 7 are undergoing major repairs. The other tractors mentioned in the question are not high-clearance tractors. About 20 high-clearance tractors are required for the inter-cultivation operations at present. (*d*) No, in view of (*c*) above. (*e*) Yes. (*f*) Does not arise.

## දිවුලපිටිය මහා විද්‍යාලයේ බී. ඒ. ධර්මසේන මහතා

திரு. பி. ஏ. தருமசேன, திவுலுபிட்டிய மகாவித்தியாலயம்

MR. B. A. DHARMASENA, DIVULAPITIYA MAHA VIDYALAYA

11. ද සොයිසා සිරිවර්ධන මයා. (ජයකොඩි මයා. වෙනුවට)

(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ஜயக்கொடி சார்பாக)

(Mr. de Zoysa Siriwardena on behalf of Mr. Jayakody)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දිවුලපිටිය මහා විද්‍යාලයේ උපාධිධර උපගුරු බී. ඒ. ධර්මසේන මහතාට 1966 සැප්තැම්බර් 16 සිට අද දක්වා ගෙවන ලද්දේ කුමන වැටුප් ක්‍රමයක් මතද? (ආ) ඔහුට උපාධිලත් කෙනෙකුට මෙන් වැටුප් නොගෙවීමට හේතු දක්වනවාද? නොඑසේ නම්, ඒ මන්ද? (ඉ) වහාම හිඟ වැටුප් ගෙවීමට කටයුතු කරනවාද? නො එසේ නම්, ඒ මන්ද?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினு: (அ) திவுலுபிட்டிய மகா வித்தியாலயத்தைச் சேர்ந்த பட்டதாரி ஆசிரியர் திரு. பி. ஏ. தருமசேனு 1966 செத்தெம்பர் 16 ஆந் தேதியிலிருந்து இற்றைவரை என்ன சம்பளத் திட்டத்தில் இருந்திருக்கின்ருர்? (ஆ) இவருக்கு பட்டதாரிகள் சம்பளத் திட்டத்தை வழங்காததற்கு காரணங்களைக் கூறுவாரா? இன்றேல், ஏன்? (இ) சம்பளப் பாக்கியை வழங்குவதற்கு உடன் நடவடிக்கை எடுப்பாரா? இன்றேல், ஏன்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) What has been the salary scale of Mr. B. A. Dharmasena, Graduate Teacher, Divulapitiya

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Maha Vidyalaya, from 16th September, 1966 to date ? (*b*) Will he state the reasons for not paying him the graduates' scale of salary ? If not, why ? (*c*) Will he take immediate action to pay him arrears of salary ? If not, why ?

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமினி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(*a*) Mr. B. A. Dharmasena, Assistant Teacher, Divulapitiya Maha Vidyalaya, has been paid to date on the salary scale applicable to Sinhala trained teachers from 16.9.1966. His salary has now been adjusted on the scale of salary applicable to graduate teachers with effect from that date. (*b*) Does not arise. (*c*) Action is being taken to pay him arrears of salary.

## විසර්ජන පනත් කෙටුම්පත 1969-70

*ஒதுக்கீட்டு மசோதா 1969-70*

## APPROPRIATION BILL, 1969-70

**කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී.—**
[ප්‍රගතිය සැප්තැම්බර් 4.]

**කථානායකතුමා මූලාසනාරූඪ විය.—**

குழுவில் மேலும் ஆராயப் பெற்றது.—[தேர்ச்சி: 4, செப்ரெம்பர்—

[*சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*]

*Considered further in Committee.*—[*Progress* : *4th September*]

[MR. SPEAKER *in the Chair.*]

**70 වන ශීර්ෂය.—ස්වදේශ කටයුතු අමාත්‍ය වරයා**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩි නඩි සහ අනිකුත් දීමනා, රු. 4,83,015**

70 ஆம் தலைப்பு:—உள்நாட்டலுவல் அமைச்சு

வாக்குப்பணம் இல. 1—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 4,83,015

HEAD 70.—MINISTER OF HOME AFFAIRS

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 483,015*

**සභාපති**

*(அக்கிராசனர்)*

(The Chairman)

I want to inform hon. Members that we are three or four hours behind time. Six hours have been allotted for this Ministry. Out of these six hours, one hour has been given to the Minister for his reply. There are 38 names submitted to me for this discussion. It is impossible for me to allow all of them to speak, I might have to refrain from calling upon some hon. Members even though the Whip has given me their names. We will not exceed six hours in respect of this Ministry.

**එච්. එම්. නවරත්න මයා.** (මිනීපෙ)

*(திரு. எச். எம். நவரட்ன—மினிப்பே)*

(Mr. H. M. Nawaratna—Minipe)

"සම්මතය රුපියල් 10 කින් අඩු කළ යුතු ය" යි මම යෝජනා කරනවා.

ගරු සභාපතිතුමනි, ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මෙම වැය ශීර්ෂය යටතේ ස්වදේශ ඇමතිතුමා ගැනත් වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට මම බලාපොරොත්තු වෙනවා. මා නියෝජනය කරන මිනිපේ කොට්ඨාශය නොදියුණු ප්‍රදේශයක්. එම ප්‍රදේශයට ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා යටතේ තිබෙන උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවෙන් සකස් කළ යෝජනා ක්‍රමයෙන් විශාල මුදලක් වියදම් කර එම නොදියුණු පළාත දියුණු කිරීම ගැන මා එතුමාට මගේ අවංක ආදර ස්තුතිය පුද කරනවා. අප දන්නා තරමින් සභාපතිතුමනි, මෙම අවුරුදු ගණන ඇතුලත මගේ ආසනයේ පාසල් ගොඩනැගිලි සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් නම් ශතයක්වත් ලැබුණේ නැහැ. උඩ රට ගැමි පුනරුත්ථාපන දෙපාතීමේන්තුවෙන් තමයි ඒ පාසල් ගොඩනැගිලි සඳහා විශාල මුදලක් මගේ ආසනයට ලැබුණේ. ඒ වාගේම මා නියෝජනය කරන මිනිපේ ආසනයට ජල නළ යෝජනා ක්‍රම, පාරවල් ආදී විශාල සේවාවල් සැලසී තිබෙනවා. උඩ රට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවෙන් වැඩ භාර ගැනීම පිණිස රුපියල් ලක්ෂ සීයක් වෙන් කර තිබුණත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වියදම් කරන්නට පුළුවන් වන්නේ නොහොත්, භාණ්ඩාගාරයෙන් නියම කර තිබෙන්නේ, ලක්ෂ පණහක් පමණයි. ලක්ෂ සීයක වැඩ භාරගෙන තිබෙන නිසා මේ මුදල් ප්‍රමාණය කිසිසේත් ප්‍රමාණවත් නැහැ. එම නිසා උඩරට නොදියුණු පළාත් දියුණු කිරීම පිණිස මෙම භාර මාසය ඇතුළත තව ලක්ෂ 40 ක් වත් දිය යුතුයි. එසේ දුන්නොත් ලක්ෂ 90 ක් පමණ ලැබෙනවා. ඒ අනුව උඩ රට නොදියුණු පළාත් දියුණු කර ගන්නට අපට පුළුවන් බව මා කියන්න කැමතියි.

ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා තවත් වැදගත් සේවාවක් කර තිබෙනවා. එනම් පේෂකර්ම මධ්‍යස්ථාන දීමේදී සෑම ආසනයකටම සමසේ සැලකීමයි. විරුද්ධ පක්ෂයේ ය ආණ්ඩු පක්ෂයේ ය කියා නොබලා සෑම ආසනයකටම සම සේ මධ්‍යස්ථාන 7 ක් බැගින් දුන් එකම ඇමතිතුමා ස්වදේශ කටයුතු භාර ඇමතිතුමායි. එහෙත් එතුමාගේ ඒ ව්‍යාපාරය අද කඩාකප්පල් වන තැනට කටයුතු සැලසී තිබෙනවා. ඒ මක්නිසාද? බිර්ලා කෙනෙක් ලංකාවට ඇවිත් අපේ පේෂකර්ම ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කාබාසිනියා කරන්නට දඟලන බව අපට පසුගිය දා පත්‍ර මාර්ගයෙන් දැන ගන්නට ලැබුණා. ඒකෙන් සිද්ධ වෙන්නේ මොකක්ද? පේෂකර්මාන්තයෙන් එදිනෙදා ජීවනෝපාය සලස්වාගන්නා තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවකට රැකී රක්ෂා නොමැති වීමෙන් මහත් හිරිහැරයකට මුහුණ පාන්නට සිදු වීමයි. ඒ සම්බන්ධයෙන් ලංකාවේ පේෂ කර්මාන්ත සමිති විසින් —එක්සත් ජාතික පක්ෂයට විශාල ලෙස උදව් කළ කාරියවසම් මහත්මයා මගින්—සන්දේශයක් එවා තිබෙනවා, **මේම් කාරණය** ගැන සාකච්ඡා කිරීමට දිනයක් දෙන්නය කියා. ඒ සංගම්වලට කරුණු ඉදිරිපත් කිරීමටත් සාකච්ඡා කිරීමටත් ගරු ඇමතිතුමා අවස්ථාවක් දේවියයි මා බලාපොරොත්තු වෙනවා. ඒ සංගම්වලට ඉඩ ප්‍රස්ථාව සලසා දෙනමෙන් මේ අවස්ථාවේදී මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු සභාපතිතුමනි, මා වැඩිදුර කතා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. තවත් එක කාරණයක් තිබෙනවා. මිනිපේ කොට්ඨාශයේ උඩ දුම්බර ආදායම් පාලක නිලධාරීතුමා මාරු කිරීමට අල්ලපු ආසනයේ සිටින ඉඩම් උප ඇමතිතුමාත් අවට තවත් මන්ත්‍රීවරුන් කීප දෙනෙකුත් උත්සාහයක් කරනවාය කියා මට දැනගන්නට ලැබී තිබෙනවා. ඇත්ත වශයෙන් ඒ ගැන මා කණගාටු වෙනවා. ආණ්ඩුවේ නිලධාරියකු වශයෙන් මේ ආදායම් පාලක නිලධාරීතුමා ප්‍රදේශයට විශාල සේවයක් කරන බව මා නිර්භයව ප්‍රකාශ කරන්නට සතුටුයි. එතුමා මාරු කරන්නට උද්ඝෝෂණයක් ගෙන යන හේතුව මම කියන්නම්. මාඩුගොඩ ප්‍රදේශයේ කලු කඩකාරයින් ටිකක් ඉන්නවා. ඔවුනුත් ඔවුන්ගේ නායකයා වන ජස්ටින් පෙරේරා මහත්මයාත් මේ ආදායම් පාලක නිලධාරීතුමා සිටිනවාට කැමැති නැහැ. එපමණක් නොවෙයි. ජස්ටින් පෙරේරා මහත්මයා රජයේ කැලෑවෙන් හොරෙන් ලී කපද්දී මේ ආදායම් පාලක නිලධාරීතුමා ඒ ලී ටික තහනම් කළා.

මාඩුගොඩ ඒකාබද්ධ වෙළඳ සංගමයක් —"ට්‍රේඩිං එක්ස්චේන්ජ්"—එකක් තිබෙනවා. ජස්ටින් පෙරේරා මහත්මයාත් ඒකෙ නායකයෙක්. ඔහු මොකද කළේ? "ට්‍රේඩිං එක්ස්චේන්ජ්" එකටය කියා සලු සැලෙන් ගෙන ගිය රෙදි මහනුවර කලු කඩේට විකුණා ඉතිරි ටික තමාගේ පෞද්ගලික කඩේ තබා විකුණුවා. ඒක ආදායම් පාලක නිලධාරීතුමාට අසුවුණා. මේ ආදායම් පාලක නිලධාරීතුමා ඒ කාරණය සම්බන්ධයෙන් මහනුවර අතිරේක දිසාපතිතුමාට වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඔය ආදි කරුණු නිසා මේ ආදායම් පාලක නිලධාරීතුමා මාරු කිරීමට උද්ඝෝෂණයක් ගෙන යනවා. එක්සත් ජාතික පක්ෂයේ මාඩුගොඩ ශාඛාවේ සභාපතිත් ජස්ටින් පෙරේරා මහත්මයායි. මේ සභාපති තමයි මේවා සියල්ලක්ම කළේ. ඔහු අවට සිටින එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් හමු වී මේ ආදායම් පාලක නිලධාරියා සිටියොත් අපට කවදාවත් මිනිපේ ආසනය දිනන්නට බැහැ. මෙයා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක්. එම නිසා මොහු වහාම මාරු කළ යුතුය කියා කියනවා. ඒ අවට මෙවැනි දේවලට ඇඟිලි නොගසන එක්සත් ජාතික පක්ෂයේ හොඳ මන්ත්‍රීවරුනුත් සිටිනවා. ඇත්ත වශයෙන්ම මේ ආදායම් පාලක නිලධාරී තුමා ඉතාම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නවරත්න මයා.]

අවංක නිලධාරියෙක්. කෘෂිකර්මය දියුණු කිරීමට, වගා ව්‍යාපාරය දියුණු කිරීමට මේ ආදායම් පාලක නිලධාරිතුමා ගන්නා උත්සාහය ගැන මුළු ප්‍රදේශයම දන්නවා. උඩුනුවර ගරු මන්ත්‍රීතුමා (ඩී. බී. විජේතුංග මයා.) මේ ආදායම් පාලක නිලධාරිතුමා ගැන පෞද්ගලිකව දන්නවා. නමුත් අවංක නිලධාරියකු වශයෙන් හොර ජාවාරම් ඇල්ලූ නිසා මේ නිලධාරියා මාරු කරන්නට යනවා. වරදක් කළොත් ඔහු වහාම මාරු කරන්න. නමුත් මෙවැනි තත්ත්වයක් උඩ මාරු කරන්නට එපා. එතුමා මාරු නොකරන බවට ගරු ඇමතිතුමා මට පොරොන්දුවක් දෙනවාද? වැරදි නොකරන අවංක ආණ්ඩුවේ නිලධාරියකුට ඒ ආකාරයට දඬුවම් නොදෙන මෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

පූ. භා. 10.15

**ධර්මදාස බණ්ඩා මයා.**
*(திரு. தர்மதாச பண்டா)*
(Mr. Dharmadasa Banda)

ගරු සභාපතිතුමනි, ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම ගැන මා සතුටු වෙනවා. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගෙන් මගේ කොට්ඨාශයේ අසරණ ගොවීන්ට මේ වර්ෂයේදී සිදු වූ විශාල මෙහෙයක් ගැන මා පළමුවෙන්ම මතක් කරන්නට සතුටුයි. එය මා ඉතාම වැදගත් කාරණයක් හැටියට සලකනවා. ගොවිතැන් ආරක්ෂා කර ගැනීමට අපේ ප්‍රදේශවල ගොවීන්ට තුවක්කු ලබා ගැනීමට විශාල දුෂ්කරතාවයක් තිබුණා. ඒ වාගේම ගොවීන් විශාල සංඛ්‍යාවක් සතුව බලපත්‍ර රහිත තුවක්කු තිබුණා. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා රජයේ අවසරය ඇතිව ගොවීන් ළඟ තිබුණු ඒ බලපත්‍ර රහිත තුවක්කුවලට බලපත්‍ර ලබා දුන්නා. විශේෂයෙන්ම මගේ කොට්ඨාශයේත් මොනරාගල කොට්ඨාශයේත් ගොවි ජනතාව ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් බව මා මතක් කරන්නට සතුටුයි. මෙතෙක් හොර තුවක්කු වශයෙන් හැඳින්වුණු ඒ තුවක්කු දැන් කිසිම භයක් නැතිව ගොවි මහත්වරුන්ට පාවිච්චි කරන්නට අවස්ථාව ලැබී තිබෙනවා.

ඒ සමගම තවත් කාරණයක් මතක් කළ යුතුව තිබෙනවා. යම් පිරිසක් කරන ලද බොරු ප්‍රචාර නිසා ගොවීන් විශාල පිරිසක් තමන් සතු බලපත්‍ර රහිත තුවක්කු භාර දුන්නේ නැහැ. ඔවුන් භය වුණා. ඒවා හොර තුවක්කු වශයෙන් හැඳින්වෙන බැවින් ගොවි මහත්වරුන්ට ඒවා භයෙන් පාවිච්චි කරන්නට සිද්ධ වී තිබෙනවා. එම දිස්ත්‍රික්කයේ තවත් බොහෝ ප්‍රදේශවලත් ජනතාව තවමත් සඟවා ගෙන සිටින තුවක්කුවලට ඉදිරි වර්ෂයේදී බලපත්‍ර ලබා ගැනීමට නැවතත් අවස්ථාවක් ලබා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා. මෙයට පෙර වර්ෂවලදී උඩරට ගැමි පුනරුත්ථාපනය සඳහා එතරම් මුදලක් වැය කළේ නැහැ. එසේ වුණත් පළමුවරට මෙම වර්ෂය තුළදී රුපියල් ලක්ෂ හැටක මුදලක් වෙන් කරවාගෙන, එම මුදල ලද වියදම් කර ඉන් පසුව තවත් රුපියල් ලක්ෂ හතලිහක් වෙන් කරගෙන, එයිනුත් පුනරුත්ථාපනය කටයුතු කරගෙන යාම ගැන ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාට මෙම අවස්ථාවේදී මගේ කෘතඥතාව පුද කරනවා. මට පෙර කථා කළ මිනිපේ මන්ත්‍රීතුමා කීවා, පාඨශාලා ගොඩනැගිලි ලබාදීමට අධ්‍යාපන දෙපාර්තමේන්තුව උනන්දුවක් නොදැක්වුවත් උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ආධාර නිසා ගොඩනැගිලි ඉදි කිරීමට හැකි වුණු බව.

—

මෙපමණ විශාල මුදලක් වෙන් කර ඇතත්, උඩරට ප්‍රදේශවල තත්ත්වය අනුව කල්පනා කර බලන විට නම්, මෙම මුදල ප්‍රමාණවත් වන්නේ නැති බව පෙනී යනවා. එම නිසා මෙයට වඩා විශාල මුදලක් වෙන් කර දීමට ඇමතිතුමා ක්‍රියා කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. ඒ අතරම උඩරට ආසන සඳහා වැඩි වැඩියෙන් ආධාර සලසනවායයි ඇතැම් අංශවලින් චෝදනා එල්ල කරනවා. උඩරට ප්‍රදේශවල පවතින නොදියුණු තත්ත්වය ගැන උඩරට ප්‍රදේශවල සිදු වී ඇති හානිය ගැන සලකා බලන විට රුපියල් ලක්ෂ පණහක් හැටක් පමණක් නොවෙයි, රුපියල් කෝටි පණහක් හැටක් වෙන් කළත් ප්‍රමාණවත් වන්නේ නැහැ.

පාරවල් ගැන කථා කරන විට බොහෝ අවස්ථාවලදී අපට සැතපුම් විසිපහ තිහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තරම් දුර මාර්ග කපන්න සිදු වෙනවා. උඩ රට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තු වෙන් පාරවල් තැනීමේ කටයුතු රජයේ වැඩ දෙපාර්තමේන්තුවට භාර දුන්නත්, අවුරුද්දකට තනා නිම කිරීමට එම දෙපාර්තමේන්තුව භාර ගන්නේ සැතපුම මක දුර ප්‍රමාණය පමණයි. එසේ භාර ගනු ලබන ප්‍රමාණයෙනුත් තනා නිම කර දෙන්නෙ බොහෝ විට සැතපුම් කාලක් හමාරක් පමණයි. මේ අන්දමට සැතපුම් දහයක පාරක් සකස් කර දීමට අවුරුදු දහයකට වැඩි කාලයක් ගත වෙනවා. සමහර විට පාරේ අවසාන සැතපුම තනා නිම කරන විට මුල සැතපුම් හතර පහේ තාරත් ගැළවී ගොස් තිබෙන්න පුළුවනි. එම නිසා අපේ ප්‍රදේශවලට ලැබෙන ආධාර ප්‍රමාණවත් නැති බව සඳහන් කරන අතරම, මිනිපේ ගරු මන්ත්‍රීතුමා ඒ සම්බන්ධයෙන් පළ කළ අදහස් මාද අනුමත කරනවා.

ගරු සභාපතිතුමනි, උඩරට සංවර්ධනය කිරීම පිළිබඳව මුදල් වෙන් කිරීමේදී කවර පැත්තකින් කොයි අන්දමේ විරුද්ධතා වක් පැන නැගුණත්, උඩරට තිබුණු දියුණුව සම්පූර්ණයෙන්ම නැති කර දමා තිබෙන නිසාත්, එම ප්‍රදේශ සංවර්ධනය කිරීම, ප්‍රතිසංවිධාන කිරීම අවශ්‍යව ඇති නිසාත්, උඩරට ගැමි පුනරුත්ථාපනය සඳහා විශාල මුදලක් වෙන් කළ යුතු බව මතක් කර දෙන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, උඩරට ගැමි පුනරුත්ථාපනය සඳහා වෙන් කර ඇති මුදල් වලින් මධ්‍යම පළාතටද ආධාර ලබාගැනීමට වරප්‍රසාද සලසා දී තිබෙනවා. ඒ ගැන අපේ විරුද්ධතාවක් නැහැ. නමුත් ඌව ප්‍රදේශයේ ඇති දිස්ත්‍රික්ක දෙකෙන් මොණරාගල ප්‍රදේශය ඉතාමත්ම නොදියුණු තත්ත්වයක තිබෙන බව ගරු ඇමතිතුමාට මතක් කර දෙන්න කැමතියි. සාමාන්‍යයෙන් දියුණු ප්‍රදේශයකට රුපියල් විසි තිස් දහසක් වියදම් කර පාඨශාලා ගොඩනැගිල්ලක් තනා දෙන විට, මොණරාගල දිස්ත්‍රික්කයටද එක පාඨශාලා ගොඩනැගිල්ලක් පමණක් ලබාදීමෙන් සෙතක් සැලසෙන්නේ නැහැ. මන්ද? අපේ ප්‍රදේශයේ ඇතැම් ස්ථාන වල සැතපුම් දහයෙන් දහයටත් වඩා දුර ප්‍රමාණයේයි පාඨශාලා ගොඩනැගිලි ඉදි කර තිබෙන්නෙ. මේ නිසා අඩු වශයෙන් සැතපුම් පහෙන් පහකටවත් පාඨශාලා පිහිටුවීමට සිදු වෙනවා. ඒ අන්දමට සැතපුම් පහෙන් පහටවත් පාඨශාලා ඉදි කිරීමට උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවේ සහාය අපට අවශ්‍යයි. අපේ ප්‍රදේශවල පවත්නා තත්ත්වය ගැන සලකා බලන විට සෑම කෙනෙකුටම සාධාරණත්වය ඉටු කරනවාය කියා, මධ්‍යම පළාතේ ආසනයකට පාඨශාලා ගොඩනැගිල්ලක් ලබා දෙන විට අපේ ආසනයටත් එක් ගොඩනැගිල්ලක් පමණක් ලබා දීමෙන්, ඒ කියන සාධාරණත්වය ඉටු වෙනවායයි මා නම් කල්පනා කරන්නේ නැහැ. මේ වර්ෂයේදී සෑම ආසනයකටම එක් පාඨශාලා ගොඩනැගිල්ල බැගින් ලබා දෙන බව කියනවා. නමුත් මෙය අසාධාරණ පියවරක් ලෙසටයි මට හැඟෙන්නෙ. මොණරාගල දිස්ත්‍රික්කය වැනි නොදියුණු ප්‍රදේශවලට එක් ගොඩනැගිල්ලක් ලබා දීමෙන් පමණක් ප්‍රයෝජනයක් සැලසෙන්නේ නැහැ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ගොඩනැගිලි සපයා දෙන්න පුළුවන් කමක් නැහැ, වෙනත් වැය කළ යුතු කටයුතු රාශියක් තිබෙන නිසා. එම නිසා මොණරාගල දිස්ත්‍රික්කයට වැඩි වැඩියෙන් ආධාර කිරීම උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවේ යුතුකම බව මෙහිලා සඳහන් කරන්න කැමතියි.

ඒ සමගම ඇතැම් මැතිවරණ කොට්ඨාශ වල, ගම්කාර්ය සභා පාරවල් තැනීම සඳහා රුපියල් තිස් හතලිස් දාහ සමහර අවුරුදුවලදී වියදම් කර තිබියදී, මොනරාගල දිස්ත්‍රික්කයේ ගම්කාර්ය සභාවලට අයත් පාරවල් සඳහා සතයක්වත් වියදම් කර නො තිබුණු අවස්ථා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් උදාහරණ දක්වන්න යන්නෙ නැහැ. කෙසේ වුණත් මින් ඉදිරියටවත්, ගම්කාර්ය සභා පාරවල් තැනීමේදී එමෙන්ම මහා මාර්ග තැනීමේදී, නොදියුණු ප්‍රදේශයක් වශයෙන් ගැනෙන මොරණගල දිස්ත්‍රික්කයට විශේෂ සැලකිල්ලක් දක්වන්නටය කියා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මේ අවුරුද්ද මුලදී කීවා, සෑම මැතිවරණ කොට්ඨාශයකම ගම්කාර්ය සභාවලට රුපියල් ලක්ෂය බැගින් දෙන්න සූදානම් කියා. අපෙන් ලැයිස්තු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙන්වා ගත්තා. එහෙත් තවම එකක් වත් ලැබුනෙ නැහැ. අනික් ආසනවලට ලැබී තිබෙනවද කියා මා දන්නෙ නැහැ.

ගරු සභාපතිතුමනි, අපේ මැතිවරණ කොට්ඨාශවල තිබෙන ගම්කාර්ය සභා වලින් හැතැප්ම 70, 100, 125 දක්වා දුර ප්‍රමාණවල පාරවල් සංවර්ධනය කරන්නට තිබෙනවා. ඒ සඳහා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබෙන්නේ රුපියල් 10,000 යි. ඒ මුදලෙන් ඒ හැතැප්ම ගණන සංවර්ධනය කරන්න බැහැ. ඒ නිසා කලින් දෙන්නට සූදානම් වූ ප්‍රමාණය—සෑම කොට්ඨාශයකටම රුපියල් ලක්ෂය බැගින් දීමේ යෝජනාව—ඒ ආකාරයෙන් වියදම් කිරීමට ඒ ගම්සභා වලට අවසර දෙන ලෙසත්, එසේම ආධාර ලබා දෙන ලෙසත් මා ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින්නේ.

ගරු සභාපතිතුමනි, වෛද්‍ය සහ සෞඛ්‍ය ආධාර සඳහා උඩරට ගැමි කොමිසමෙන් වෙන් කර තිබෙන්නේ ඉතා සුළු මුදලක් බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. සෞඛ්‍ය තත්ත්වයෙන් ඉතා නොදියුණු මොණරාගල දිස්ත්‍රික්කයේම සාත්තු සේවක සේවිකා සේවයක්වත් තිබෙන්නේ ආරෝග්‍යශාලා දෙකක පමණයි. ඒකත් තියෙන්නේ අඩාල වශයෙනුයි. අප ඒ තරම් ප්‍රපාතයට වැටී සිටින නිසා උඩරට ගැමි කොමිසමෙනුත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙනුත් අපට ආධාර කරනවා නම් අපේ ප්‍රදේශවල සෞඛ්‍ය තත්ත්වය මීට වඩා දියුණු කර ගන්නට පුළුවන් වෙනවා. ඒ නිසා සෞඛ්‍ය සේවය සඳහා උඩරට ගැමි කොමිසමෙන් ආධාර මීට වඩා ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

අපේ දිස්ත්‍රික්කයට දිසාපති කාර්යාලයක් තිබුණත් ඒ දිසාපති කාර්යාලයේ අඩුපාඩු රාශියක් තියෙනවා. ගොඩනැගිලි නැතිකම නිසා, නිවාස නැතිකම නිසා අපට එවන නිලධාරීන් පවා එහි සේවයට යන්නට මැළිකමක් දක්වනවා. සමහර නිලධාරීන් මොණරාගල කච්චේරියට පත් කර යැවූ විට යන්නට බැරිය කියා ඒ පත්වීම් අවලංගු කරවා ගත් අවස්ථා ගැන මා දන්නවා. ඔවුන් එසේ කරන්නේ ඒ ස්ථානයේ නිවාස පහසුකම් නැති නිසයි. ඒ නිසා හැකි ඉක්මණින්ම ඒ ස්ථානයේ නිවාස පහසුකම් ඇති කර දෙන ලෙස මා ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපේ දිස්ත්‍රික්කයේ දැනට ආදායම් පාලක නිලධාරි කොට්ඨාශ 5ක් පමණයි, තියෙන්නේ. මේ කොට්ඨාශ පහේ හැතැප්ම 130ක පමණ දුරක් තියෙනවා. එක් ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයක් ලංකාවේ සමහර දිස්ත්‍රික්කවලට වඩා විශාලයි. අපට ආදායම් පාලක නිලධාරි කොට්ඨාශ 5ක් මදි. දැනට සිටින නිලධාරීන් සංඛ්‍යාව මදි නිසා ඒ වැඩ කටයුතු කරගෙන යාම ඉතාමත් අපහසුයි. ඒ නිසා මොණරාගල දිස්ත්‍රික්කයේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශ නැවත කඩා වෙන් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

එසේම අපේ ප්‍රදේශවල ග්‍රාම සේවක කොට්ඨාශත් වෙන් කිරීමට සිදු වෙනවා. මට ආරංචි පිළිවෙළට මෙතෙක් මුළු දිස්ත්‍රික්කයේම කඩා වෙන් කර තිබෙන්නේ ග්‍රාම සේවක කොට්ඨාශ 2ක් පමණයි. එය ස්ථිර වශයෙන් අවසාන කර නැහැ. ඊට වඩා වැඩි ගණනක් ග්‍රාම සේවක කොට්ඨාශ කඩා වෙන් කර අපට පහසුකම් ඇති කර දෙන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මගේ ආසනයට බලවේග පෝෂකර්ම මධ්‍යස්ථානයක් ලබා දීම ගැන ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාට මා ස්තුති වන්ත වන්නට ඕනෑ. මේ බලවේග පෝෂකර්ම මධ්‍යස්ථාන තැනීම සම්බන්ධයෙන් රජයේ වැඩ දෙපාර්තමේන්තුව වැඩ කරන්නේ ඉතාමත් නිදිමත ගතියෙන්. මාස 6ක් තිස්සේ ඒ අය සැලැස්මවල් සහ ඇස්තමේන්තු හදනවා. රජයේ වැඩ දෙපාර්තමේන්තුව තව අවුරුදු 4ක් තිස්සේ මේක හදන බවට සැකයක් නැහැ. මේ වැඩ, රජයේ වැඩ දෙපාර්තමේන්තුව මාර්ගයෙන්ම කරවා ගැනීමට බලා නොසිට—දැනටම මාස 10ක් පමණ ප්‍රමාද වී තිබෙන නිසා—වෙනත් අංශයකට භාරදී මේ වැඩ කරවන ලෙස හෝ එසේ කරන්නට බැරි නම් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ අවධානය ඉතාමත් ඉක්මනින් යොමු කරවා ඒ කටයුත්ත ඉක්මනින් ආරම්භ කරන ලෙස මා ඉල්ලා සිටි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නවා. මුළු ඌවා දිස්ත්‍රික්කයටම බලවේග පෝෂකම් මධ්‍යස්ථාන 3ක් අනුමත වී තිබෙනවා. ඒ තුනෙන් එකකවත් වැඩ තවම පටන්ගෙන නැහැ. ප්‍රථමයෙන්ම ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා මුල් ගල තැබූ මැදගම බලවේග පෝෂකර්ම මධ්‍යස්ථානයේ වැඩ තවමත් අරඹා නැහැ. වැඩ කරන්නට ටෙන්ඩර් කැඳවීමට බලාපොරොත්තු වන බව ආරංචියි. ඒ බව කියාත් දැනට මාස 6 ක් පමණ ගත වී තිබෙනවා. තවත් ප්‍රමාද නොකර ඉතාමත් ඉක්මනින් මෙය ආරම්භ කරන ලෙස ඉල්ලන අතර මෙතෙක් ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා අපේ ප්‍රදේශයට ලබා දුන් සේවයට වඩා විශාල සේවයක් ඉදිරි කාලය තුළදී උඩරට ගැමි කොමිස මෙන් සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙනුත්, ඒ අමාත්‍යාංශයේ අනික් දෙපාර්තමේන්තුවලිනුත් බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන්නට සතුටුයි. ගරු ඇමතිතුමා යටතේ තිබෙන සුරා බදු දෙපාර්තමේන්තුවේ නිලධාරින් මොණරාගල දිස්ත්‍රික්කය ගැන මීට වඩා සැලකිල්ලක් දක්වනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ කථාව නවත්වනවා.

**සෝමරත්න සෙනරත් මයා.** (අම්පාරෛයි)
*(திரு. சோமரத்ன செனரத்—அம்பாறை)*
(Mr. Somaratne Senerath—Amparai)

With your permission I would like to make a personal explanation of a certain matter.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

You ought to have given prior notice of this.

**සෙනරත් මයා.**
*(திரு. செனரத்)*
(Mr. Senarath)

ගරු සභාපතිතුමනි, පසුගිය දෙවන දින මා මෙහිදී කළ කථාව පිළිබඳව ඊයේ "ඩේලි නිව්ස්" පත්‍රයේ පළ වී ඇති වාර්තාවක වැරදීමක් සිදු වී තිබෙනවා. එම පත්‍රයේ 13 වන පිටුවේ 2 වන තීරුවේයි එය පළ වී තිබෙන්නේ. ඒ මෙසේයි:

"The present Board had a person who was often so drunk that he could hardly walk."



I did not refer to any person of the present Board or of the previous Board of the R.V.D.B. I did refer to a character in the Sugar Corporation, but not to anybody in the R.V.D.B. past or present. That may be corrected.

පූ. භා. 10.30

**ඇස්. බී. යාලෙගම මයා.** (රත්තොට)
*(திரு. எஸ். பி. யாலேகம—ரத்தோட்ட)*
(Mr. S. B. Yalegama—Rattota)

ස්වදේශ කටයුතු භාර අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබීම ගැන මා පළමුකොටම සන්තෝෂ වෙනවා. මෙම අමාත්‍යාංශය යටතේ පවත්නා උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව පිළිබඳව මා ප්‍රථමයෙන්ම වචන ස්වල්පයක් කියන්නට කැමතියි.

උඩරට ආසන වෙනුවෙන් පසුගිය වසර කිහිපය තුළ මෙම දෙපාර්තමේන්තුව මගින් එක්තරා ප්‍රමාණයක සේවයක් කෙරී තිබෙන බව පෙනෙනවා. ඒ බව මා ප්‍රශංසා මුඛයෙන් සඳහන් කරන්නට කැමතියි. උඩරට ප්‍රදේශවල ඇති පිටිසර ආසනයන්හි යම්කිසි සංවර්ධන වැඩ කොටසක් අපට කරවාගන්නට පුළුවන් වුණා නම් එය එසේ වූයේ උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව මගින් ඒ ඒ අංශ සඳහා මුදල් වැය කිරීම නිසා බව මා ප්‍රකාශ කරන්නට කැමතියි.

පසුගිය වසර හතරහමාර තුළ ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා නිතරම පාලක ආණ්ඩු පක්ෂයේ සහ විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් සමග සාකච්ඡා පවත්වා තිබෙනවා. ගරු සභාපතිතුමනි, පසුගිය වසර හතරහමාර තුළ ඒ ඒ ප්‍රදේශවලට අයත් වැඩ කටයුතු කිරීම සඳහා ගතයුතු පියවර මොනවාද යන්න ගැන එතුමා අප සමග හත් අට වතාවක්ම සාකච්ඡා පවත්වා තිබෙනවා. පසුගිය කාලය තුළ විශාල වැඩ කොටසක් ඒ ඒ ප්‍රදේශවල කරන්නට අපට පුළුවන්කම ලැබුණේ එවැනි ක්‍රියා මාර්ග හේතු කොටගෙනයි. මා ඒ ගැන සන්තෝෂ වෙන අතරම මෙම අවස්ථාවෙහිදී එතුමාට ස්තුති කරන්නටද කැමතියි. උඩරට ගැමි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලේගම මයා.]

පුනරුත්ථාපන අංශයෙහි හිටපු කොම සාරිස්තුමා වන විජේකෝන් මහතාත් වර්තමානයෙහි සිටින ඒකනායක මහතාත් යන දෙපොළම කාර්යශීලී ලෙස වැඩ කටයුතු කළ හෙයින් ලොකු සහන යක් සැලසී ඇති බව මෙම අවස්ථාවෙහිදී සිහිපත් කළ යුතුයි. එදා වාගේම දැනුත් එසේ වැඩ කටයුතු කරගෙන යන බව කියන්නට ඕනෑ. එහෙත් එක්තරා අඩු පාඩුවක් ගැන සඳහන් කළ යුතුයි. මෙම වැඩ කටයුතු දෙපාර්තමේන්තු දෙකක් මගින් කෙරෙන නිසයි බොහෝ ප්‍රමාදයන් සිදු වී තිබෙන්නේ. විශෙෂයෙන් කාර්මික අංශය උඩරට ගැමි පුනරුත්තාපන අංශය ට සම්බන්ධ කිරීම උචිතයයි මෙම අවස්ථා වෙහිදී මා කියන්නේ නැහැ. එසේ වුවත් අද උඩරට ගැමි පුනරුත්ථාපන අංශයෙහි වැඩ කටයුතු හුඟක් දුරට කෙරෙන්නේ මහනුවර පිහිටි ප්‍රධාන නිර්මාන ඉංජි නේරු කාර්යාලයෙනුයි. ගරු සභාපති තුමනි, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය විධායක ඉංජිනේරුවන් සෑම දිස්ත්‍රික්කයකම සිටිනවා. උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව මාර්ග යෙන් කරනු ලබන පාරවල් එහෙම එම ඉංජිනේරුවන් අතර සමසේ බෙදා දෙන වා නම් මීට වඩා ඉක්මනින් එම වැඩ කටයුතු කර ගන්නට පුළුවන් වෙනවා ඇති.

එහෙත් අද සිදු වී තිබෙන්නේ කුමක් ද? ඌව ප්‍රදේශයේ නුවරඑළි දිස්ත්‍රික්ක ය, මාතලේ දිස්ත්‍රික්කය, මොනරාගල දිස්ත්‍රික්කය, මහනුවර දිස්ත්‍රික්කය යනාදී දුර බැහැර පිහිටි සියලුම දිස්ත්‍රික්කවල වැඩ කටයුතු පාලනය කරන්නට සිදු වී තිබෙන්නේ මහනුවර පිහිටි කාර්යාලයටයි. එම කාර්යාලයේ ඉංජිනේරුවන් 6 දෙනෙක්ද කොහේද සිටිනවාලු. විශේෂ යෙන් උඩරට දුෂ්කර ප්‍රදේශවල ගමන් පහසුව එහෙම ඇත්තේ නැහැ. මහනුවර සිටින නිලධාරියෙක් මොනරාගල දිස්ත්‍රික් කය වැනි දිස්ත්‍රික්කයකට ගොස් පරීක්ෂ ණයක් පවත්වා ආපසු එන විට ඔහුගේ ගමන් ගාස්තු වශයෙන් මසකට සමහර විට රුපියල් දෙසියයක් තුන්සියයක් හෝ හාර සියයක් පමණ ගෙවන්නට සිදු විය හැකියි. ඊට වඩා ක්‍රමානුකූලව වැඩ කට යුතු කිරීමෙන් වැඩි ප්‍රයෝජනයක් ලබා ගන්නට අපි කල්පනා නොකරන්නේ ඇයි? සෑම දිස්ත්‍රික්කයකම විධායක ඉංජි නේරුවන් සිටිනවා. එම විධායක ඉංජි නේරුවන්ට එම වැඩ කටයුතු පවරනවා නම් ඔවුන්ට පුළුවනි තම තමන්ගේ කොට්ඨාශවල තිබෙන පාරවල් යනාදියෙහි වැඩ කටයුතු නිසි සේ පරීක්ෂා කරන්නට. ඒකයි කරන්න තිබෙන්නෙ. උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසම සම්බන්ධයෙන් මා කියන්නේ එපමණයි. ඇස්තමේන්තු පිළියෙල කිරීම, වැඩ පරීක්ෂා කිරීම ආදී දේවල් සම්බන්ධයෙන් අපි හුඟක් දුරට කාලය නාස්ති කරනවා. අපේ වැඩ ඉක්මණින් කර ගැනීමට මෙය ලොකු බාධාවක් වෙනවා. ඇස්තමේන්තුවක් පිළි යෙල කළ විට එය විධායක ඉංජිනේරු තැන විසින් නුවර සිටින ප්‍රධාන ඉංජි නේරු තැනට එවන්න ඕනෑ. ඔහු එය කොළඹට එවන්න ඕනෑ. ඊළඟට එය කොළඹින් අනුමත කර උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසමේ කොමසාරිස් වරයාට යවනවා. ඊට පසුව කොමසාරිස් වරයා විසින් ස්වදේශ කටයුතු භාර ඇමතිවරයාට එවන්න ඕනෑ. ඔන්න ඔය විධියටයි ඇස්තමේන්තුවට අනුමැතිය ලබා ගන්න පුළුවන් වන්නෙ. මේ විධියට වට රවුමක් යාම නිසා සිදු වන්නේ වැඩි ප්‍රමාද වීමයි. මේ නිසා, වැඩ ඉක්මන් කිරීම සඳහා මේ වට රවුම් ගහන වැඩ පිළි වෙළ කෙටි කිරීමට උඩරට ගැමි පුනරුත් ථාපන කොමිසමේ කොමසාරිස්වරයාට වැඩි බලතල දෙන්නය කියා මා ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, මා ඊට වඩා වැඩි දෙයක් උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසම සම්බන්ධයෙන් කියන්න බලා පොරොත්තු වන්නෙ නැහැ.

ඊළඟට මාතලේ කච්චේරිය සම්බන්ධ යෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළ යුතු කාරණා කිහිපයක් ගැන කියන් න කැමතියි. රජයේ නිලධාරීන් මාරු කර යැවීම සම්බන්ධයෙන් රජය මොන විධියේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන වාද කියා මට තේරුම් ගන්න බැහැ. මා දන්නා තරමින් නම් රජයේ සේවක යෙක් අවුරුදු 4 කට නැත්නම් 5 කට වඩා එකම ස්ථානයක සේවයේ යෙදී සිටින් නෙ නැහැ. නමුත් මේ මාතලේ කච්චේරි යේ සමහර නිලධාරීන් සිටිනවා අවුරුදු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

15 ක් 20 ක් තිස්සේම එම කච්චේරියේ සේවය කරනවා. මාතලේ මා දන්නා එක් සේවකයෙක් සිටිනවා, ඔහු අවුරුදු 22 ක් තිස්සේම සේවය කරන්නේ මාතලේ කච්චේරියේයි. ඔහු ආදායම් බදු ගෙවන්නෙත් නැහැ. අද එය විහිලුවක් බවට පත් වී තිබෙනවා. අද බොහොම ලොකුවට මේ රටේ සමානාත්මතාවය, දූෂණ කටයුතු නැති කිරීම ආදී දේවල් ගැන කතා කරනවා. පසුගිය දවස්වල මා දැක්කා ආදායම් බදු ගැන කතා කරන විට ඒ සම්බන්ධයෙන් මොන විධියේ දූෂණ සිදුවී තිබෙනවාද කියා. අවුරුදු 10ක් 15ක් තිස්සේ එකම ස්ථානයකට වී රාජකාරියේ යෙදෙන ඔය විධියේ පුද්ගලයන් සිටිනවා. මේ නිසා මාතලේ දිස්ත්‍රික්කයේම උපන් අයට අද අවස්ථාවක් නැහැ, ඒ ප්‍රදේශයේ යම්කිසි සේවයක් කිරීමට.

මාතලේ කච්චේරියේ එම්. ඩී. ජයසිංහ කියා මහත්මයෙක් සිටිනවා. මා විශේෂයෙන්ම ඔහු ගැන සඳහන් කරන්න ඕනෑ. මේ කාරණය ගැන මා පුද්ගලිකව දන්නවා. ඔහු මේ කච්චේරියේ සේවය කරන්න වී දැනට අවුරුදු 15 කටත් වැඩි කාලයක් ගත වී තිබෙනවා. 3 වැනි ශ්‍රේනියේ සාමාන්‍ය පෙළ ලිපිකරුවෙක් හැටියටයි මොහු සේවය කරන්නෙ. මොකක්ද මොහු කරන්නෙ? එම කච්චේරියේ සේවය කරන සමහර සේවකයන්ට විරුද්ධව අභූත චෝදනා එක්තරා මන්ත්‍රීවරයෙකු වෙත ඉදිරිපත් කර ඒ මගින් පසු ගිය කාල සීමාව ඇතුළතදී සේවකයන් කිහිප දෙනෙකුන්ම වෙනත් ප්‍රදේශවලට මාරු කර යවා තිබෙනවා. සෑම අවස්ථාවක දීම මොහු කරන්නේ නොයෙක් විධියේ බොරු චෝදනා ඒ ඒ සේවකයන්ට විරුද්ධව ඉදිරිපත් කර ඒ මන්ත්‍රීතුමාගේ මාර්ගයෙන් ඔවුන් මාරු කර යැවීමයි. මේ විධියට අර අහිංසක සේවකයින් කිහිප දෙනෙක්ම මාරුකර යවා තිබෙනවා. මේ විධියේ දේවල් සිදු වීමට ඉඩ දෙන්න එපාය කියායි අපි ඉල්ලා සිටින්නෙ. මා ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගෙන් අහන්නේ ඇයි මේ විධියට එකම ස්ථානයක අවුරුදු 15ක් 20ක් සේවය කිරීමට සමහර නිලධාරීන්ට ඉඩ දෙන්නේ කියායි.

මා තවත් කාරණයක් කෙරෙහි ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි. මාතලේ දිස්ත්‍රික්කයට ආදායම් පාලක නිලධාරි කොට්ඨාශ 3ක් තිබුණා. මාතලේ නැගෙනහිර ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය, මාතලේ දකුණු ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය, මාතලේ උතුරු ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය යනුවෙනුයි. පසුව මේ කොට්ඨාශ 3 කොට්ඨාශ 5ක් බවට පත් කළා. මාතලේ නැගෙනහිර කොට්ඨාශය භාරව සිටින ග්‍රාම සංවර්ධන නිලධාරි තුමා පැමිණියේ 1958 දීයි. සමරපාල සිල්වා නමැති ඒ මහතා එහි සේවයට පත්ව ආවේ 1958 දීයි. අදත් ඒ කොට්ඨාශයේ ග්‍රාම සංවර්ධන නිලධාරියා හැටියට සේවය කරන්නේ ඒ මහතායි. දැන් ඔහු ඒ කොට්ඨාශයේ සේවය කරන්නට වී අවුරුදු 11ක් ගත වෙනවා. දෙපාර්තමේන්තුවේ යම්කිසි ප්‍රතිපත්තියක් තිබෙනවාද, මේ විධියේ කටයුතු කිරීමට ඉඩ දෙන්න කියා මා අහනවා. මේ නිලධාරියාට මේ විධියේ හිතුවක්කාර වැඩ කිරීමට ඉඩ දෙන්නෙ ඇයි? අද මගේ කොට්ඨාශයේ එකම ක්‍රියාකාරී ග්‍රාම සංවර්ධන සමිතියක්වත් ඇත්තේ නැහැ. දිසාපතිතුමාගෙනුත්, ග්‍රාම සංවර්ධන පරිපාලක නිලධාරියාගෙනුත්, ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂවරයාගෙනුත් මා මේ ගැන ඇසුවා. මේ විධියට හිතුවක්කාර වැඩ කරන්න ඉඩ දෙන්නේ ඇයිද කියා මා ඇසුවා. කිසිම වැඩක් කරන්නෙ නැහැ. අද මගේ කොට්ඨාශයේ ග්‍රාම සංවර්ධනය සම්පූර්ණයෙන් නැති වී ගොස් තිබෙනවා. ඒ නිලධාරීන් මොකක්ද කිව්වේ? "මේ සම්බන්ධයෙන් යම්කිසි පියවරක් ගත හොත් අපටත් මාරු වෙන්නයි සිදු වන්නෙ." ඔන්න ඔය පිළිතුරයි ඒ අය මට දුන්නෙ.

ගරු සභාපතිතුමනි, මේ නිලධාරියා මා විසින් දෙවතාවක්ම මාරු කෙරෙව්වා. ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා විසින් මොහු දෙවතාවක්ම මාරු කළා. නමුත් එක්තරා මන්ත්‍රීවරයෙක් පස්සේ ගොස් ගරු ඇමතිතුමා ලවා නැවතත් එය මාරු වීම අවලංගු කරවා ගත්තා. දෙවතාවක්ම ඔය විධියට මාරු වීම් අවලංගු කරවා ගත්තා. අද රත්තොට ආසනයේ ග්‍රාම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විසර්ජන පනත් කෙටුම්පත, 1969-70 —කාරක සභාව

[යාලේගම මයා.]

සංවර්ධනයක් ඇත්තේ නැහැ. එය කාලා දමා කාබාසිනියා කර දමා ඉවරයි. මා ගරු ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. ඔබතුමා ඇමතිවරයෙක් නේද? ඇයි මේ විධියට දේශපාලන පන්දම් කාරයින්, එක් එක් පුද්ගලයින් කියන අන්දමට තමුන්නාන්සේ වැඩ කරන්නෙ? තමුන්නාන්සේ හිතට එකඟව වැඩ කරන්නේ නැත්තේ ඇයි කියලයි මම අහන්නෙ. ඒ නිලධාරියා ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය මරා දමා තිබෙනවා. තමා මාරු කර යවන්නට බැරි යයි ඒ නිලධාරියා භය නැතිව ප්‍රකාශ කරනවා. යම් යම් අයගේ බලපෑම්වල ශක්තිය ඔහුට තිබෙන නිසා ඔහු ඒ විධියට ප්‍රකාශ කරනවා. එකම ග්‍රාම සංවර්ධන සමිතියක්වත් ඒ කොට්ඨාශයේ නෑ. මේ නිලධාරියා කර තිබෙන අපරාධවලින් ටිකක් මම විස්තර කරන්නම්. මා නියෝජනය කරන කොට්ඨාශයේ ඉඹුල්පිටිය පාඨශාලාව සඳහා 1965 දී මුදල් වෙන් කළා. තවම ඒ ගොඩනැගිල්ල සාදා ඉවර නැහැ. දැන් 1969 අවුරුද්දත් අවසාන වී ගෙන යනවා. එහෙත් ඒ ගොඩනැගිල්ල සාදා ඉවර නැහැ. මා නියෝජනය කරන කොට්ඨාශයේ පල්ලෙවෙල පාඨශාලා ගොඩනැගිල්ලට මුදල් වෙන් කළේත් 1965 වර්ෂයේ වුවත් අද වන තුරුත් එය සාදා ඉවර කරන්නට පුළුවන් වී නැහැ. ගුරුලවෙල පේෂකර්ම මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිල්ලක් සෑදීම පටන් ගත්තේ 1966 අවුරුද්දේදී වුවත් තවම එය සාදා ඉවර කර ගන්නට පුළුවන් වී නැහැ.

ගරු සභාපතිතුමනි, රොඩී කුලය නමින් නොදියුණු කුලයක් මා නියෝජනය කරන කොට්ඨාශයේ තිබෙනවා. ඒ කුලයේ ළමයින්ට සෑම අවුරුද්දකම පොත්පත් සහ රෙදිපිළි ආධාර දීමට ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියා කරතත් මේ නිලධාරියා පසුගිය අවුරුද්ද සඳහා ඒ ළමයින්ට කිසිම ආධාරයක් ලබා දෙන්නට කටයුතු කර නැහැ.

හැම කොට්ඨාශයකටම අවුරුදු පතා සමාජ සංවර්ධන සේවිකාවක් පත් කළ යුතුව ඇතත් මා නියෝජනය කරන කොට්ඨාශය සඳහා එවැනි නිලධාරිනියක් පත් කර නැහැ. තවද, මා නියෝජනය කරන කොට්ඨාශයේ මඩකුඹුරේ ජලනල යෝජනා ක්‍රමය සම්බන්ධව වාර්තාවක් ඉදිරිපත් කරන්නැයි දිසාපතිතුමා මේ නිලධාරියාට නියම කළත් තවමත් ඒ වාර්තාව ඉදිරිපත් කර නැහැ. වැලිකන්ද නමැති ගමේ ග්‍රාම සංවර්ධන සමිතිය ඒ ගමට පොදු ළිඳක් ඉල්ලුවත් ඒ ග්‍රාම සංවර්ධන සමිතිය ක්‍රියා කාරී නැතැයි කියමින් ඒ නිලධාරියා ඒ ළිඳ දීමට ක්‍රියා කෙළේ නැහැ. මේ අන්දමට මේ නිලධාරියා අනන්තවත් වැරදි කර තිබෙනවා. මේ නිලධාරියා සම්බන්ධයෙන් මා ග්‍රාම සංවර්ධන පරිපාලකවරයාගෙනුත්, ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂවරයා ගෙනුත් දිසාපතිවරයාගෙනුත් විමසූ විට ඒ අය කීවේ යම්කිසි විධියකින් මේ නිලධාරියා සම්බන්ධයෙන් ඒ උදවිය අත ගැසුවොත් ඒ අයටත් මාරු වී යන්නට සිදු වන බවයි. ඉතින් ඒ තරම් බලයක් මේ නිලධාරියාට තිබෙනවා. මේ නිලධාරියා මාරු කර යවන ලෙස මා ගරු ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා මුණ ගැසී දෙවතාවක්ම කීවා. දේශපාලන ප්‍රශ්නයක් උඩ නොවෙයි, මා ඒ විධියට කීවේ. ඒ නිලධාරියා ගෙන් ඒ පළාතට සේවයක් සිදු නොවෙනවා නම් ඔහු ඒ ප්‍රදේශයේ තබා ගැනීමෙන් වැඩක් නැහැ. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරියකුට එක් කොට්ඨාශයක අවුරුදු 11 ක් සේවය කරන්නට පුළුවන්ද? අවුරුදු 11 ක් එක් කොට්ඨාශයක සේවය කළ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් නිලධාරියකු සිටිනවා නම් ඔහු වෙන කෙනකු නොව මේ සමරපාල සිල්වායි. මේ විධියට යම් යම් නිලධාරීන්ට අවුරුදු ගණන් එක් කොට්ඨාශයක පැල්බැඳගෙන ඉන්නට ඉඩ දෙනවාද? ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය කාබාසිනියා කර දමන්නට ඉඩ දෙනවාද?

මා අද කථා කරන්නේ ලොකු චිත්ත වේගයකිනුයි. හොඳ අදහසක් අනුව ආරම්භ කරන ලද ශ්‍රේෂ්ඨ ව්‍යාපාරයක් කඩාකප්පල් කර දැමීම සඳහා අවුරුදු දහය, පහළොව තිස්සේ මේ නිලධාරීන්ට එක තැනක පැල් බැඳගෙන ඉන්නට ඉඩ දෙනවාද? මෙම ව්‍යාපාරයේ යහපත ගැන කල්පනා කර බලා ක්‍රියා කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එක පුද්ගලයකුට එක ස්ථානයක අවුරුදු 11ක් පැලපැදියම් වී සිටින්නට ඉඩදී තිබෙන්නේ ඇයි? එහෙම නම් ඒ විධියට අනෙක් නිල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ධාරීන්ටත් සලකන්නට වුවමනා නේද? මේ නිලධාරියා මාරු කර යවා කොට්ඨාශයට වැඩ කරන්නට පුළුවන් කාර්යක්ෂම නිලධාරියකු පත් කර එවන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගැන පොදුවේ වචනයක් කිය යුතුව තිබෙනවා. අද ඒ නිලධාරීන් අතරමං වී සිටිනවා. ග්‍රාම සංවර්ධන නිලධාරීන් 1948 සිටම ඔවුන්ගේ පඩිනඩි සම්බන්ධයෙන් හා සේවා තත්ත්වය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන දුක්ගැනවිලි පිළිබඳව තවමත් කිසිම සහනයක් සලසා නැහැ. ඔවුන් එදා සිටින තත්ත්වයෙන්මයි, අදත් ඉන්නේ. ඔවුන් කලකිරුණු සවභාවයකින් පසු වෙනවා. ඒ නිලධාරීන්ට දැනට වඩා හොඳින් සලකන්නට ඕනෑ. එහෙම වුණොත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩ දැනට වඩා කාර්යක්ෂම අන්දමින් කරන්නට පුළුවන් වන බව මතක් කරමින් මගේ වචන සවල්පය අවසන් කරනවා.

**පී. ජී. මුතුබණ්ඩා මයා.** (ලග්ගල)
*(திரு. பீ. ஜீ. முத்துபண்டா—லக்கல)*
(Mr. P. G. Muthubanda—Laggala)

ගරු සභාපතිතුමනි, ගරු ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ මාත් වචන කීපයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. මේ ඇමතිතුමා ඉතාමත්ම දක්ෂ අන්දමින් කටයුතු කිරීම ගැන එතුමාට ස්තුතිවන්ත වන බව ප්‍රථමයෙන්ම මතක් කරන්නට ඕනෑ. මා නියෝජනය කරන කොට්ඨාශයට මේ ඇමති අංශයෙන් පේෂ කර්ම මධ්‍යසථාන 7 ක් දුන්නා. දැන් ඒ මධ්‍යස්ථාන 7 වැඩ කටයුතු සාර්ථක අන්දමින් කෙරීගෙන යනවා.

මිණිපේ ජනපදයේ තුන්වැනි පියවර යටතේ ට්‍රැක්ස් හයක් තිබෙනවා. ඉඩම් ලැබූ ගොවි පවුල්වල උදවිය හතළිස් දෙදහක් පමණ මේ ට්‍රැක්ස් හයේ ඉන්නවා. දවස්පතා එහෙන් මෙහෙන් කඩා පනිමින් ඉඩම් නොලබාම ඒවායේ සිටින අයත් ගණනින් බොහොම විශාලයි. මේ සියලු දෙනාම සිටින්නේ එක ග්‍රාමසේවක කොට්ඨාශයක් තුළයි. තනිකර එක ග්‍රාමසේවක කොට්ඨාශයක මේ තරම් විශාල පිරිසක් සිටින විට නොයෙක් අඩුපාඩුකම් ඇති වන බව තමුන්නාන් සේ පිළිගන්නවා ඇති. මීට දෙතුන් මාසයකට පෙර මේ ප්‍රදේශය ග්‍රාමසේවක කොට්ඨාශ දෙකකට කඩා තිබෙන නමුත් එයත් ප්‍රමාණවත් වන්නේ නැහැ. කච්චේරියේදී පවත්වන ලද ඩී. සී. සී. කමිටු රැස්වීමේදීත් මේ කාරණය සඳහන් කර තිබෙනවා. මේ ප්‍රදේශය ග්‍රාමසේවක කොට්ඨාශ පහක් වන ආකාරයට බෙදා වෙන් කළ යුතුය යන අදහස දිසාපතිතුමාත් අනුමත කර තිබෙනවා. එසේ කළොත් මේ ජනයාට ග්‍රාමසේවක මහත්මයෙකු ලවා කරවා ගැනීමට තිබෙන දේවල් වැඩි අපහසුවක් නැතිව කර කියා ගන්නට පුළුවන් වේවි. දැන් පවතින තත්ත්වය යටතේ නම් යම් වැඩක් කරවා ගැනීමට දවස් දහය, පහළොව රස්තියාදු වන්නට සිදු වෙනවා. ජනගහනයත් වැඩියි; ඒ වාගේම රාජකාරිත් වැඩියි. ඒ නිසා කෙනෙකුට ග්‍රාමසේවක මහත්මයා සොයා ගැනීමත් බොහොම අමාරු දෙයක් වෙලා තියෙනවා. ට්‍රැක් 10, ට්‍රැක් 12, ට්‍රැක් 12 බී, ට්‍රැක් 13 සහ ට්‍රැක් 13බී යන කොට්ඨාශවලට එක් එක් ග්‍රාමසේවක මහත්මයා බැගින් පත් කර දෙන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මගේ කථාවට සවන් දුන් ගරු ඇමතිතුමාටත්, මට කථා කරන්නට අවස්ථාව දුන් ගරු කථානායකතුමාටත් ස්තුති කරමින් මගේ වචන සවල්පය අවසන් කරනවා.

පූ. භා. 10.45

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.** (මිහින්තලේ)
*(திரு. பீ. எம். கே. தென்னகூன்—மிஹிந் தலை)*
(Mr. P. M. K. Tennekoon—Mihintale)

ගරු සභාපතිතුමනි, ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගේ වැය ශීර්ෂ යටතේ විශේෂයෙන් උතුරු මැද පළාතට බල පාන ප්‍රශ්න කිහිපයක් ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට අවස්ථාවක් මට ලබා දීම ගැන තමුන්නාන්සේට පළමු වෙන්ම මම ස්තුතිවන්ත වෙනව. උතුරු මැද පළාතේ මැතිවරණ කොට්ඨාශයන් නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට අප කීප දෙනාම හැම අදාළ විවාදයකදීම වාගේ ඉදිරිපත් කළ වැදගත් ආයාචනයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

නම් නොදියුණු අනුරාධපුරයත් උඩරට ගැමි පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතට ගන්නා ලෙස කළ ඉල්ලීමයි. ඒ ඉල්ලීම සලකා බැලූ ගරු ඇමතිතුමා පසුගිය අවුරුද්දේ දුන් පිළිතුරකින් අපට අප ඉදිරිපත් කළ කරුණ කවදා නමුත් ඉටු වනු ඇතැයි තරමක් දුරටවත් සෑහීමකට පත් වන්නට පුළුවන්කමක් ලැබුණා. තරමක් දුරටවත් අප සෑහීමකට පත් කර වන්නට එදා එතුමාට පුළුවන් වුණා. ඒ සම්බන්ධයෙන් කටයුතු කරගෙන යන බවයි එදා ගරු ඇමතිතුමා ප්‍රකාශ කෙළේ. අනුරාධපුර දිස්ත්‍රික්කයත් ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමයට ඇතුළත් කරන්නට බලාපොරොත්තු වන බවක් එදා අපට හැඟී ගිය නමුත් අද වනතුරු ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් අපට ඇති නොවූ බව කනගාටුවෙන් පළ කළ යුතුව තිබෙනවා. කඳුරට යහපත් තත්ත්වයකට දියුණු කිරීම ගැන අප විරුද්ධ නැහැ. ඇත්තෙන්ම එය අපේ බලවත් සන්තෝෂයට කාරණයක් බව පැහැදිලිවම ප්‍රකාශ කරන්නට කැමතියි. ඒ අන්දමට අපේ සතුට පළ කර සිටින අතරම අප ඉල්ලූ කාරණය සම්බන්ධයෙන් වචනයක් කියන්නට ඕනෑ. ජාතික විමුක්තිය අරභයා ජාතික සටනක් ගෙන යෑමේ අනිෂ්ට ප්‍රතිඵලයක් වශයෙන්දෝ විනාශ මුඛයට පත් වී ගිය උතුරු මැද පළාතේ හද්දා පිටිසර ජනයාගේ පොදු යහපත පිණිස ඒ ප්‍රදේශයත් උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය යටතට ගෙන කටයුතු කළොත් ඒ උදවියටත්, තමන්ගේ විමුක්තිය උදෙසා අතීතයේ සටන් බිමට බැස සටන් කළ සිය පරම්පරාවේ උදවියටත්, යුක්තියක් ඉටු වුණායයි සතුටු වන්නට පුළුවන් වෙනවා. ඒ නිසා, ඒ කාරණය ගැන නැවත වරක් කල්පනා කර බලා, මහජනයා වෙනුවෙන්, මහජන නියෝජිතයන් වශයෙන්, මහජන මන්ත්‍රීවරුන් වන අප ඉදිරිපත් කරන කරුණු කෙරෙහි අවධානය යොමු කර ඒ ඉල්ලීම ගැන සැලකිලිමත් වන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ගොවිතැනින් ජීවත් වන ගොවීන්ට තුවක්කු බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාව කොයි තරම් වැදගත් එකක්දැයි තමුන්නාන්සේ දන්නවා. අද තුවක්කු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය කුමක්ද? තමන්ගේ තත්ත්වය විදහා පාමින්, බලපත්‍රයක් ඉල්ලා ඉල්ලුම්පත්‍රයක් පළමුවෙන්ම ඉදිරිපත් කරන්නට ඕනෑ. දිසාපතිතුමා වෙත ඉල්ලුම්පත්‍රය යැව්වාම එතනින් එය ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැන වෙත යොමු කරනු ලබනවා. එතනින් එය ග්‍රාමසේවක මහතාටත් යවනවා. ග්‍රාමසේවක වාර්තාව ලැබීමෙන් පසු නැවතත් ඒ ඉල්ලුම් පත්‍රය පළාතේ පොලිස් අධිකාරි කාර්යාලයට යවනවා. පොලිස් අධිකාරිතුමා එය පළාතේ පොලිස් කාර්යාලයට පිටත් කරනවා. ප්‍රදේශය භාර පොලීසියේ නිලධාරියෙක් මෙය පරීක්ෂා කර, බලපත්‍රයක් දීමට නුසුදුසුයයි කීවොත් බලපත්‍රයක් ලබා ගන්නට ගොවියාට පුළුවන්කමක් ඇති වන්නේ නැහැ. මා මෙහිදී කරුණක් මතක් කළ යුතුයි. යම් පුද්ගලයෙකුගේ පෞද්ගලික තත්ත්වය පිළිබඳව වාර්තා කිරීමට පුළුවන්කම තිබෙන්නේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතුමාට හා ග්‍රාමසේවක මහත්මයාටයි. යම් කෙනෙක් අපරාධකාරයෙක් වශයෙන් අපරාධකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වී සිටිනවාද නැද්ද යන්න සොයා බැලීමට පමණයි පොලිසියට පුළුවන්කම තිබෙන්නේ. පොලීසියෙන් දිසාපතිතුමා බලාපොරොත්තු වන්නෙත් එපමණයි. එහෙත් දැනට කෙරෙන පිළිවෙළ අනුව දිසාපතිතුමාගේත් ප්‍රාදේශීය ආදායම් නිලධාරිතුමාගේත් තීරණය වෙනස් කිරීමට පුංචි පොලිස් රාළහාමි කෙනෙකුට පුළුවන්කම තිබෙනවා. මගේ අත්දැකීම් අනුව මට ඒ බව කියන්නට පුළුවන්. සමහර අවස්ථාවල ප්‍රාදේශීය ආදායම් නිලධාරිතුමා රෙකමදාරු කරනවා තුවක්කු බලපත්‍රයක් දෙන්නය කියා. අනික් පැත්තෙන් ඒ ගැන පරීක්ෂා කරන පොලිස් රාළහාමි ලියනවා බලපත්‍රයක් දෙන්න එපාය කියා. හේතුවක් කියන්නෙත් නැහැ. එය අසාධාරණයක්. මේ කාරණය නිසා අපේ ගම්බද අයට තුවක්කු බලපත්‍රයක් ලබා ගැනීම සම්බන්ධව තරමක කරදරයකට මුහුණ පාන්නට සිදු වෙනවා. ඒ නිසා මේ කරුණ ගැන පරීක්ෂා කර බලා යම් පුද්ගලයෙක් අපරාධකාරයෙක්ද අපරාධකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත්ව සිටිනවාද නැද්ද කියන කාරණය පමණක් පොලීසියෙන් ලබා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙන දිසාපතිතුමාගේ හා ප්‍රාදේශීය ආදායම් නිලධාරීතුමාගේ වාර්තා අනුව තුවක්කු බලපත්‍ර දෙන්නට වැඩ පිළිවෙළක් සකස් කරන හැටියට ගරු ඇමතිතුමාගෙන් ඉතා කරුණාවෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මගේ ආසනයේ උඩ්ඩියන් කුලම කෝරළයේ රිජිස්ට්‍රාර් තනතුරකට ළඟදී කෙනෙක් පත් කළා. මට මතකයි ඒ දැන්වීමේ තිබුණා එම තනතුර සඳහා ඉල්ලුම් කරන පුද්ගලයා ඒ ප්‍රදේශයේ අවුරුදු 10ක ස්ථිර පදිංචියක් ඇති කෙනෙක් විය යුතුයි කියා. එහෙත් ඉල්ලුම් පත්‍ර දමන්නට මාසයකට කලින් මාටඹුවා කෝරළයේ පදිංචි කෙනෙක් උඩ්ඩියන් කුලම කෝරළයේ ගම්මානයකට තමන්ගේ හාල්පොත හරවා පදිංචිය පෙන්වා එම තනතුරට පත් වී සිටිනවා. මා මේ කාරණය ගැන පසුගිය දිනකත් ගරු ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාට දැනුම් දුන්නා. ඇත්ත වශයෙන්ම තත්ත්වය එහෙම නම් ඉල්ලුම්කරුවන් එම ප්‍රදේශයේ අවුරුදු 10 ක පදිංචියක් ඇති අය විය යුතුයි කියා දැන්වීමේ පළ කිරීමෙන් වැඩක් නැහැ. මේ කරුණ නිසා ඒ ගම්වල පදිංචිකරුවන් තරමක කලකිරීමකට පත් වී සිටිනවා. ඒ ප්‍රදේශයේ ස්ථිර පදිංචියක් නොතිබුණු ඉල්ලුම්පත්‍ර දමන්නට මාසයකට පමණ කලින් හාල්පොත ඒ ප්‍රදේශයට හැරවූ පුද්ගලයෙක් එම තනතුරට පත් වී සිටිනවා. මෙවැනි තත්ත්වයක් ඇවතීම ඉතා මත්ම නරකයි. මෙය ගරු ඇමතිතුමාගේ අනුදැනුම ඇතිව කෙරුණක්ද නැතිව කෙරුණක්ද කියා මා දන්නේ නැහැ. මෙවැනි වැරදිසහගත දේවලට ඉඩ නොතබා මේ කරුණ ගැන ඇමතිතුමා පරීක්ෂා කර බලනවා ඇත කියා මා විශ්වාස කරනවා.

එක එක්කෙනාගේ ඉල්ලීම් අනුව උතුරු මැද පළාතේ විවාහ, උප්පැන්න හා මරණ රිජිස්ට්‍රාර්වරුන් සමාදාන විනිශ්චයකරුවන් වශයෙන් පත්කර තිබෙන බව මා දන්නවා. නිහඬ නිසල වැදගත් සේවයක් කරන ඒ රිජිස්ට්‍රාර් රාළහාමිලා සැම කෙනෙක්ම සමාදාන විනිශ්චයකරුවන් වශයෙන් පත් කිරීමට ගරු ඇමතිතුමා අධිකරණ අමාත්‍යාංශයත් සමග සාකච්ඡා කර තීරණයක් ගන්නවා නම් ඒ දුෂ්කර ප්‍රදේශවල ජීවත් වන ගැමි ජනතාවට එනයින් විශාල යහපතක් සිදු වෙනවා. ඒ කරුණ ගැනත් සැලකිල්ල යොමු කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

අද උතුරු මැද පළාතේ ග්‍රාම සේවක මහත්වරුන් මුල්වරට පත්වීම ලැබූ ස්ථාන යේම රාජකාරිය කර ගෙන යනවා. මේ අවුරුදු හයක් හතක් පමණ වූ කාලය තුළ ඔවුන්ගේ ස්ථාන මාරු පිළිබඳව කිසිම වැඩ පිළිවෙළක් සකස් වී නැහැ. ඒ නිසා සමහර කෙනෙක් තමන්ගේ ගම් ප්‍රදේශවලම සිටගෙන යහපත් ජීවිත ගත කරන අතර හුඟ දෙනෙක් ගමින් බැහැරව කරදර සහිතව තමන්ටම කාර්යාලයක්වත් නැතිව අනුන්ගේ පැල්පතකට වී දහස කුත් කරදර මැද ජීවත් වෙනවා. ඒ නිසා ග්‍රාම සේවකයන්ගේ ස්ථාන මාරු පිළිබඳව විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරන හැටියට මා ඉල්ලා සිටිනවා. එසේ කළොත් වැඩි කරදරයක් නැතිව ඔවුන්ට තමන්ගේ රාජකාරිය කරන්නට පුළුවන් වෙනවා.

අවසාන වශයෙන් මා තමුන්නාන්සේට මතක් කළ යුතු තවත් කරුණක් තිබෙනවා. අද කසිප්පු වැනි හලාහල විෂ වර්ග සම්බන්ධව මේ රටේ තිබෙන ආන්දෝලනය ගැන තමුන්නාන්සේ දන්නවා. මෙය නැති කිරීමට ආණ්ඩුව මොන විධියට මහන්සි ගත්තත් කසිප්පු නැත්නම් හැලි අරක්කු පෙරීම අද ගෘහ කර්මාන්තයක් බවට පත් වී තිබෙනවා. මෙය නැති කිරීමට සුදුසු වැඩ පිළිවෙළක් අප විසින් ගත යුතුව තිබෙනවා. මෙය තරමක් දුරටවත් අඩු කරන්නට ගත හැකි ලෙහෙසි පියවරක් තිබෙනවා. ඒ ගැන අනුරාධපුරයේ දිස්ත්‍රික් සම්බන්ධතා කමිටුවේදීත් මා යෝජනාවක් ඉදිරිපත් කළා. අද මේ රටේ සුරා පිළිවෙතේ පන්ති භේදයක් තිබෙනවා. එක්තරා වර්ගයක අරක්කු යම් කෙනෙකුට ගෙන යන්නට පුළුවන්කම තිබෙන්නේ බෝතල 2 ක් පමණයි. එහෙත් ඉහළ පන්තියේ අරක්කු හා වෙනත් බීම වර්ග ඕනෑ තරමක් ගෙන යන්නට සුරාබදු රෙගුලාසි යටතේ තහනමක් නැහැ. රුපියල් අවේ, දහයේ, දොළගේ අරක්කු එක් අයෙකුට එක වරකට ගෙන යන්නට පුළුවන කම තිබෙන්නේ බෝතල 2 ක් පමණයි. "මෙන්ඩිස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

ස්පෙෂල්" වැනි ඒවා කේස් පිටින් ගෙන ගියත් කිසිම කෙනෙකු අල්ලන්නෙ නැහැ. පොළොන්නරුවේ කෙනෙකු අරක්කු බෝතල 2 ක් මිළ දී ගන්නට අනුරාධපුරයේ තැබෑරුමට එන්නට ඕනෑ. අරක්කු බෝතල් 2 ක් ගන්නට ඒ මනුෂ්‍යයාට හැතැප්ම පණහක් හැටක් දුර යන්නට සිදු වෙනවා. ඒ නිසා අරක්කු බෝතල දෙකේ නීතිය අවලංගු කර කෙනෙකුට වුවමනා තරමක් ගෙන යන්නට ඉඩකඩ සලසනවා නම් දූන් ගම්බද ප්‍රදේශවල තිබෙන හලාහල විෂ වගී විකිණීම බොහෝ දුරට නැති වී යන බව මට නිසැකවම කියන්නට පුළුවනි.

**ඩී. ඊ. තිලකරත්න මයා.** (රත්ගම)
*(திரு. டி. ஈ. திலகரத்ன—ரத்கம)*
(Mr. D. E. Tillekeratne—Ratgama)

බෝතල 4 කරන්න ඕනෑ.

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.**
*(திரு. பீ. எம். கே. தென்னகூன்)*
(Mr. P. M. K. Tennekoon)

කිය කළත් කමක් නැහැ. මේ බෝතල් දෙකේ සීමාව ඉවත් කර දමන්න ඕනෑ. එයින් ආණ්ඩුවට කිසිම පාඩුවක් සිදු වෙන්නෙ නැහැ. ජින්, බ්‍රැන්ඩි, විස්කි, ආදිය කේස් පිටින් ඕනෑ තරමක් ගෙන යන්නට පුළුවන්කම තිබෙනවා නම් ගැමියන් බොන රුපියල් අට, දහය, දොළහේ අරක්කු පමණක් බෝතල 2 කට සීමා කර තැබෑරුම් ළඟ පොලිස් නිලධාරීන් හා සුරාබදු නිලධාරීන් මුරට දමා කරන මේ විගඩම මොකක්ද කියා මා අහනවා. ඉහළ පන්තියේ උදවියට සුරාබදු නීති යටතේ කිසිම අවහිරයක් නැති බව මෙයින් පෙනී යනවා. දුප්පත් පන්තියෙ මිනිහෙකු බෝතල 2½ අරගෙන ගියොත් නිලධාරීන් පැන ඔහු අල්ලාගෙන පසුව උසාවියට ඉදිරිපත් කරනවා. අන්තිමේදී ඔහුට දඩයක් නියම කර බෝතල 2 ක් ආපසු දී අනික් භාගය රාජසන්තක කරනවා. මේක අසාධාරණ නීතියක්. අධිරාජ්‍ය යුගයේ ඇති කළ නීති තවමත් මේ විධියට තබාගෙන මේ රටේ අහිංසක ජනතාවට මේ අන්දමට හිරිහැර කරන්නට කල්පනා කරනවා නම් ඒක සාධාරණ නැති බව මා කියනවා. ඒ නිසා මේ බෝතල දෙකේ නීතිය අවලංගු කර දමන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේ කිරීමෙන් ආණ්ඩුවට කිසිම පාඩුවක් සිදු නොවන අතර ගම්බද ප්‍රදේශවල තිබෙන හැළි අරක්කු වැනි හලා හල විෂ වගී බොහෝ දුරට දුරු වන්නටත් පුළුවනි. මේ කාරණා පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වේවායි ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය මෙයින් හමාර කරනවා.

**ඩී. බී. විජේතුංග මයා.** (උඩුනුවර)
*(திரு. டீ. பி. விஜேதுங்க—உடுநுவர)*
(Mr. D. B. Wijetunga—Udunuwara)

ගරු සභාපතිතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. විශේෂයෙන් උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව ගැන වචනයක් කිය යුතුව තිබෙනවා.

ගත වුණු අවුරුදු 50 තුළදී මධ්‍යම පළාතටත්, ඌව පළාතටත් සිදු වූ සේවයට වඩා විශාල සේවයක් පසුගිය අවුරුදු 4ක තරම් කාලය තුළ අපේ පළාත්වලට උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවෙන් සිදු වුණු බව මේ අවස්ථාවේදී ස්තුති පූර්වකව සඳහන් කිරීම වටිනවා. එහි මූලස්ථානය මහනුවරට ගෙන ගොස් විශාල මුදලක් වැය කර වැඩ රාශියක් කර ගෙන යාමට ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා ක්‍රියා කළා. අධිරාජ්‍ය යුගයෙන් මිදීමෙන් පසු මධ්‍යම පළාතෙත් ඌව පළාතෙත් වැඩ රාශියක් කළ යුතුව තිබුණා. රුපියල් ලක්ෂ තුන්-හාර සියයක් වියදම් කර දැනට ඒ පළාත්වල වැඩ කටයුතු රාශියක් උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව මගින් ඉටු කර තිබෙන නිසා, උඩරට ගැමි ජනතාව වෙනුවෙන් ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාට අපි ප්‍රශංසා කරනවා. විශේෂයෙන් ඒ කටයුතු මෙහෙයූ වර්තමාන කොමසාරිස්තුමා වන ඒකනායක මහත්මයාත්, හිටපු කොමසාරිස්තුමා වන විජේකෝන් මහත්මයාත්, ඉතා දක්ෂ නිලධාරීන් වශයෙන් මේ අවස්ථාවේදී හඳුන්වා දෙන්නේ නොයෙක් ආපදා මධ්‍යයේ ඒ කටයුතු ඉටු කළ නිසයි. යන්ත්‍ර සූත්‍ර නැති කාලයක, ස්ටීම් රෝලර් හෙවත් ගල් තලන රෝල් නැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාලයක, සිමෙන්ති නැති කාලයක, ඒ කටයුතු බොහොම ක්‍රමානුකූල අන්දමින් ගෙන ගොස් වැඩ කටයුතු රාශියක් ඉටු කර දුන්නා. ඒ ගැන විශේෂයෙන් අපි සඳහන් කරන්නේ ඒ නිසයි.

ඊළඟට ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් මෑතකදී ආරම්භ කරන ලද බලවේග රෙදි මධ්‍යස්ථාන දාහ ගැන සඳහන් කරන්නට ඕනෑ. අපේ ඇමතිතුමා ඒ ව්‍යාපාරය පටන් ගත්තේ විශාල බලාපොරොත්තු ඇතුවයි. සමහරවිට දැන් ඒ ව්‍යාපාරය තුළ කඩාකප්පල් ව්‍යාපාර පැන නැඟී ඇති නමුත්, ඒ මධ්‍යස්ථාන දාහ කොයි විධියෙන් හෝ යළිත් සංස්ථාපනය කළ යුතුයි. ඉතාම දක්ෂ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත පිළිබඳ අධ්‍යක්ෂ වරයකු අපට සිටින නිසා මේ, කටයුත්ත අපට බොහොම හොඳින් කර ගන්නට පුළුවන් වෙනවාට කිසිම අඩමනායක් නැහැ. මේ මධ්‍යසථාන දාහ සමූපකාර සමිති දාහක් බවට පරිවර්තනය කර, ඒවාට වුවමනා කරන නූල් වර්ග සියල්ලම ජාතික පේෂකර්ම සංසථාව මගින් නොව කෙළින්ම දෙපාතර්මේන්තුව මගින් පිට රටින් ගෙන්වා ගැනීමට ඉඩ දිය යුතුයි කියා / මා යෝජනා කරනවා. එහෙම කළොත් මේ ව්‍යාපාරය සාර්ථක ලෙස ගැමි ජනතාවගේ ප්‍රයෝජනය සඳහා පවත්වා ගෙන යන්නට අපට පුළුවන් වෙනවා.

ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා යටතේ පවතින දෙපාතර්මේන්තු මේ අවුරුදු කිහිපය තුළ හොඳින් ක්‍රියාත්මක වී තිබෙන බව කියන්නට ඕනෑ. ග්‍රාම සේවක කොට්ඨාශ 600 ක් අළුතෙන් ඇති කරන ලෙස අපි මේ රජයෙන් ඉල්ලා සිටියා. ගිය අවුරුද්ද තුළ අපට එයින් 100ක් ලැබුණා. ලබන අවුරුද්ද තුළදී ඉතිරි 500 ත් පිහිටුවා රටේ ජනතාවට විශාල සේවයක් ඉටු කර ගැනීමේ පහසුකම් සලසනවා ඇතැයි මා විශ්වාස කරනවා. මේ රටේ ජනගහනය වැඩි වන ප්‍රමාණයට සරිලන අන්දමින් ආදායම් පාලක කොට්ඨාශ වැඩි කර නැහැ. මේ තත්ත්වය කල්පනාවට ගෙන දිස්ත්‍රික්ක, කච්චේරි, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශ, ග්‍රාම සේවක කොට්ඨාශ ආදිය වැඩි කළ යුතු බවට ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරි පත් කර තිබෙනවා. දැන් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලවලින් වැඩක් කරවා ගන්නට දවස් කීයක් රස්තියාදු වෙන්නට ගැමි ජනතාවට සිදු වී තිබෙනවාද ? එමනිසා, වැඩි වන ජනගහනයට සරිලනසේ පරිපාලන සේවයත් පුළුල් විය යුතුව ඇති බැවින් ඇමතිතුමාගේ යෝජනාව මා ස්ථිර කරනවා. එම යෝජනාවට සියලුම මන්ත්‍රී වරුන්ගේ සහයෝගය ලැබේ යයි මා බලාපොරොත්තු වෙනවා.

ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය වැදගත් ව්‍යාපාරයක්. එම නිසා ග්‍රාම සංවර්ධන නිලධාරීන් කෙරෙහි මීට වඩා සැලකිල්ලක් දැක්විය යුතු බවට රත්තොට ගරු මන්ත්‍රී තුමා (යාලෙගම මයා.) දැක්වූ අදහසට මාත් එකඟ වෙනවා. ග්‍රාම සංවර්ධන නිලධාරීන් ට උසසස්වීමේ වරප්‍රසාද පිරිනැමීම පිළිබඳව පසුගිය රජය මෙන්ම මේ රජයත් සැලකිලි මත් වෙමින් සිටිනවා. එහෙත් තවම ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් නම් ඇති වුණේ නැහැ. ග්‍රාම සංවර්ධන නිලධාරීන්ට පරිපාලන සේවයට උසස්වීමේ ඉඩකඩ ලබා දීම අපහසු වී තිබෙන්නේ ඔවුන්ගේ උපජීම වැටුප් ඒ සඳහා ප්‍රමාණවත් නො වන නිසා යයි මා හිතනවා. එම නිසා ජ්‍යෙෂ්ඨ ග්‍රාම සංවර්ධන නිලධාරීන්ගේ උපජීම වැටුප, පරිපාලන සේවයේ 5 වැනි ශ්‍රේණියේ නිලධාරීන්ගේ මූලික වැටුප දක්වාත් වැඩි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

දහනායක යුගයේදී ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්ත මේන්තුවල වැඩ කටයුතු ක්‍රමවත් වී තිබෙන බව සන්තෝෂයෙන් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. කලින් නොතාරිස් වරුන්ගේ ඇබෑර්තු රාශියක්ම නොපුරවා තිබුණු නමුත්, එම ඇබෑර්තු පිරවීම සඳහා පසුගිය දවස්වල විධිමත් වැඩ පිළිවෙලක් යොදා තිබෙනවා. එසේම අවශ්‍ය තරම් රෙජිස්ට්‍රාර්වරුනුත් පත් කර තිබෙන නිසා ඒ වැඩ කටයුතුත් හොඳින් කෙරීගෙන යනවා. විශ්‍රාම යනවාත් සමගම සමාදාන විනිශ්චයකාර ධූරය අහෝසි වන සේ සෑම රෙජිස්ට්‍රාර්වරයකුටම නිල බලයෙන් සාමදාන විනිශ්චයකාර ධූරයත් දැනෙන්සේ විධිවිධාන සලසන ලෙස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේතුංග මයා.]

මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.) කළ ඉල්ලීමට මාත් එකඟ වෙනවා. එසේ කළොත්, යම් යම් කටයුතු සඳහා සාමදාන විනිශ්චය කාරයන් සොයා ගැනීමට තිබෙන අමාරුව නිසා ගම්බද ජනතාව දැනට මුහුණ පාන ලොකු දුෂ්කරතාවකින් ඔවුන්ට සහනයක් ලැබෙනවා. මහජන ප්‍රශ්න ඉතා ඉක්මනින් නිරාකරණය කරමින් මහ ජනයාට සේවය කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාතර්මේන්තුව විසින් වැඩ පිළිවෙලක් යොදා තිබෙනවා. දෙපාර්ත මේන්තු ප්‍රධානයා වන සමරසේකර මහත්මයා, මහජන ඕනෑ එපාකම්වලට ඉතා උනන්දුවෙන් ඇම්හුකන් දී කටයුතු කරන හොඳ දක්ෂ නිලධාරියෙක් බවට සාක්ෂි තිබෙනවා. එසේම, ස්වදේශ කට යුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තුමා සහ සහකාර ලේකම්තුමාලාත් ආණ්ඩු පක්ෂයේ පමණක් නොව විරුද්ධ පාර්ශ්වයේත් ගරු මන්ත්‍රීවරුන්ගේ ඕනෑ එපාකම් හොඳින් සලකා බලා කටයුතු කරන නිලධාරීන් බව, මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කළ යුතුව තිබෙනවා.

උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්ත මේන්තුවේ එක අඩුපාඩුවකුත් මේ අවස්ථා වේදී පෙන්වා දෙන්නට මා අදහස් කරනවා. මීට මාස කීපයකට පෙර සම්මත කර ගත් යෝජනාව අනුව රුපියල් ලක්ෂ 10 ක් පමණ වටිනා යන්ත්‍රසූත්‍ර ගෙන්වා ගන්නට තවමත් බැරි වී තිබෙනවා. ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවෙන් කෙරුණු බාධා නිසායි, ඒ තත්ත්වය ඇති වී තිබෙන්නේ. එම නිසා, ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවෙන් කෙරෙන බාධා වළක්වාගෙන එම යෝජනාව අනුව එකී යන්ත්‍රසූත්‍ර වහාම ගෙන්වා ගන්නට ඇමති තුමාගේ අවධානය යොමු වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

පූ. භා. 11

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரி. பி. தென்னகூன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)

සභාපතිතුමනි, ස්වදේශ කටයුතු පිළි බඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මටත් වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මේ ගරු සභාවේ භාරදූර කටයුතු දක්ෂ ලෙස මෙහෙයවමින්, මෙවැනි විවාදවලට සහභාගි වන්නට අප ටත් කෙසේ හෝ අවස්ථාව සලසා දීම සඳහා ඔබතුමා දරන උත්සාහය ගැන අපේ ස්තුතිය ඔබතුමාට හිමි වෙනවා.

මන්ත්‍රීවරුන්ගේ දේශපාලන පාට ගැන තැකීමක් නොකොට සාධාරණව තම යුතුකම් ඉෂ්ට කරන ඇමතිවරයෙක් වශ යෙන් ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති තුමා ප්‍රසිද්ධියක් දරනවා. මා මේවා කියන්නේ එතුමා ලවා යම් යම් වැඩ කරවා ගැනීමේ අදහසකින් නොවෙයි. එතු මාට එවැනි ප්‍රසිද්ධියක් තිබීම අපට ඉතාම ප්‍රීතිදායක කරුණක්. එතුමා සාධාරණ ලෙස වැඩ කරන බවට රාවයක් ගරු මන්ත්‍රීවරුන් අතර පැතිර තිබීම ඉතාම වැදගත් කරුණක් හැටියට අප සල කනවා.

ගරු මන්ත්‍රීවරුන් කීපපොළක් විසින් සඳහන් කළාක් මෙන්, ග්‍රාම සේවක නිල ධාරීන් පිළිබඳ කරුණක් දෙකක් එතුමා ගේ සැලකිල්ලට යොමු කිරීමට මා අදහස් කරනවා. අපගේ කොට්ඨාශවල ඇතැම් පළාත් හුඟක් විශාල වන අතර ඇතැම් පෙදෙස් ඉතාම කුඩායි. ඇතැම් විට, සිය යක හමාරක ජනගහනයක් සිටින පළාත ටත් ග්‍රාම සේවක නිලධාරියකු පත් කර සිටිනවා. ඒ වාගේම පන්දහසක පමණ ජනගහනයක් සිටින පළාතටත් එක් ග්‍රාම සේවකයකු පත් කර සිටිනවා. එවැනි ප්‍රදේශවල වැඩ කිරීමේදී ග්‍රාම සේවක නිලධාරියාට මෙන්ම ජනතාවටත් බරපතල අමාරුකම්වලට මුහුණ පාන්නට සිදු වෙනවා.

ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන විය යුතු අනෙක් කරුණ නම් ග්‍රාම සේවක නිලධාරීන්ගේ උසස් වීම් පිළිබඳ ප්‍රශ්න යයි. ග්‍රාම සේවකයන් සදාකාලිකවම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ග්‍රාම සේවක වශයෙන්ම සිටින්නට ඉඩ හරිනවාද? ඒ අයට අනාගත බලාපොරොත්තු, උසස් වීමේ මාර්ග නැද්ද? එවැනි අනාගත බලාපොරොත්තු නැති උදවියගෙන් සාධාරණ අන්දමේ සේවයක් ලබා ගැනීම ඉතාම අමාරු බව අප පිළිගත යුතුයි. අධිරාජ්‍යවාදී කාලයේ තිබුණු ආරච්චි ක්‍රමයේ පවා උසස් වීම් තිබුණා. ආරච්චි කෙනකුට කෝරළේ මහත්මයා වීමටත් කෝරළේ මහත්මයකුට රටේ මහත්මයා වීමටත් ඒ කාලයේදී ඉඩකඩ තිබුණා. එවැනි උසස් වීම් ආරච්චිවරුන්ට ලැබුණු අවස්ථා අපට ඕනෑතරම් දකින්නට ලැබෙනවා. ඒ විධියට, ග්‍රාම සේවක නිළධාරීන්ටත් ආදායම් පාලක නිළධාරි තත්ත්වයට උසස් වීමේ අවස්ථාව නොලැබෙන්නේ ඇයිදැයි මා ගරු ඇමතිතුමාගෙන් අහනවා. එවැනි පාරක් කපන්නට බැරි ඇයි? උසස් වීමේ මාර්ග සැලසුවහොත් වෙනත් සේවා වල අයට වඩා ග්‍රාම සේවක නිළධාරීන්ට ආදායම් පාලක නිළධාරි, උප දිසාපති, දිසාපති ආදී තනතුරුවලට උසස් වීමට කිසිම අමාරුවක් ඇති වන්නේ නැහැ. එබඳු උසස්වීම් ලබා ගැනීමට තරම් දැනීම ඇති උදවිය ග්‍රාම සේවක නිළධාරීන් අතර සිටින නිසා මේ ගැන ගරු ඇමතිතුමාගේ කල්පනාව යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළාක් මෙන් මා ද තුවක්කු බලපත්‍ර දීම ගැන වචනයක් කිව යුතුව තිබෙනවා. තුවක්කු බලපත්‍ර අවශ්‍ය අයට ඒවා ලබා ගැනීමේ අමාරුකමකුත් අනවශ්‍ය උදවියට ඒවා ලබා ගැනීමේ පහසුවකුත් දැන් ඇති වී තිබෙනවා. තුවක්කු බලපත්‍රයක් ලබා ගැනීමට ග්‍රාම සේවක නිළධාරියාගේ සහතිකය අවශ්‍ය බව මා දන්නවා. මාතලේ දිස්ත්‍රික්කයේ දඹුලු මැතිවරණ කොට්ඨාශයේ වල්මෝරුව වසම නමින් එක්තරා ප්‍රදේශයක් තිබෙනවා. එහි කේ. බී. දිසානායක මහත්මයා තුවක්කු බලපත්‍රයක් ඉල්ලුවා. මොහුට ඉඩකඩම් කිසිවක් නැතැයි ග්‍රාම සේවක නිළධාරියා නිර්දේශ කළා. පසුව දිසානායක මහත්මයා තමාගේ ඉඩකඩම් පිළිබඳ විස්තර ආදායම් පාලක නිළධාරිතුමාට ඉදිරිපත් කලා. ආදායම් පාලක නිළධාරිතුමා පැමිණ එක ඉඩමක් බැලූ පමණින්ම, තුවක්කු බලපත්‍රයක් ලබා ගැනීමට එයම ඇතැයි ප්‍රකාශ කළා. ග්‍රාම සේවක නිළධාරීනුත් පොලීසියත් ඇතැම් පෞද්ගලික එදිරිවාදුකම් උඩ යම් යම් අයගේ සුදුසුකම් වසා දමන බව අප දන්නවා. එසේ කටයුතු කරන ග්‍රාම සේවක නිළධාරීන් හෝ වෙනත් නිළධාරීන් හෝ සිටිනවා නම්, පළි ගැනීමේ චේතනාවෙන් රාජකාරි නොකරන ලෙස ඔවුන්ට අවවාද කරන ලෙසත්, එවැනි අයට යම් කිසි දඬුවම් ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලෙසත් ගරු ඇමතිතුමාට මා මතක් කරනවා.

ගැමි කොමිෂන් සභාව සාධාරණ ලෙසත් ප්‍රයෝජනවත් අන්දමිනුත් වැඩ කරගෙන යන බව බොහෝ ගරු මන්ත්‍රීවරුන්ගෙන් කියැවුණු නමුත් පසුගිය කාල සීමාව තුළදී එම කොමිසම දඹුලු මැතිවරණ කොට්ඨාශයේ කළ වැඩ සම්බන්ධයෙන් නම් මට කොහෙත්ම සතුටු වන්නට ඉඩ නැති බව ප්‍රකාශ කරන්න ඕනෑ. එය ඇමතිතුමාගේ වරදක්යයි මා කිසිසේත් කල්පනා කරන්නේ නැහැ. ගරු ඇමතිතුමා මේ ළඟදී ලැයිස්තු දෙකක් එව්වා, අහවල් අහවල් ස්ථානවල අහවල් අහවල් පාරවල වැඩ කරනවාය කියා. එහෙත් ඒ ලැයිස්තු දෙකෙන් එකක්වත් දඹුල්ලේ මැතිවරණ කොට්ඨාශයේ එකම පාරක්වත් සඳහන් වී නැහැ.

මෙමම ආණ්ඩු සමයට කලින් අපේ ආණ්ඩුව තිබුණ කාලයේදී උඩලාගම මහතා මාතලේ දිස්ත්‍රික්කයේ කොමසාරිස් වී සිටියා. ඊට පසුව මදුරාව මහතා ආවා. ඒ වාගේම විජේකෝන් මහත්මයාත් සිටියා. දැනට ඒකනායක මහතා ඉන්නවා. ඒකනායක මහතා නම් ඒ ප්‍රදේශය ගැන ඉතාම හොඳින් දන්න කෙනෙක්. ගමක් ගමක් පාසා පාරක් තොටක් පාසා දන්න නිසා ඒ මහතා තුළ ප්‍රදේශය ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. ඒ මහතා නම් වැඩ කරාවි. එහෙත් මේ පසු ගිය අවුරුදු හතර හමාර ඇතුළත කිසිම දෙයක් කෙරී නැති බව මා කනගාටුවෙන් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. තෙන්නකෝන් මයා.]

දීර්ඝ කාලයක සිට අප විසින් ඉල්ලනු ලබන දෙයක් තමයි නාගහවෙල-කත්දෙ වත්ත පාර සෑදීම. ඒ පාර පිළිබඳ කටයුතු කරන්නට මේ ළඟදීත් සූදානම් වූවිට ඊට හරස් කපන ස්වභාවයක් පවතිනවා. එහි මහ බලවන්ත ඉඩම් අයිතිකාරයෙක් සිටි නවා. මැතිවරණවලදී දඹුල්ල ආසනයේ එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයන් වෙනුවෙන් සම්පූර්ණ වියදම් දැරීම භාරව සිටින්නේ මැන් කියන පරණ බස් සමා ගම්කාර මහත්මයායි. තමන්ගේ ඉඩම කොහොමටවත් දෙන්නෙ නැත කියා මේ මැන් මහත්මයා කියනවා. මා ගරු ඇමති තුමාගෙන් අහන්න කැමතියි, ආණ්ඩුව වැඩ කළ යුත්තේ මැන් මහත්මයා කියන හැටියටද, එසේ නැතහොත් දහ සක් පමණ සිටින ගම්වාසීන්ගේ ඉල්ලීම පරිදිද කියා. ඒ ඉල්ලීම ඉටු නොකර තිබෙන්නේ ආණ්ඩුව මැන් මහත්මයාට යට වෙලාවත්ද? එයින් අපට පෙනී යන් නේ උන්නැහේ ආණ්ඩුවටත් වැඩිය ලොකු පුද්ගලයෙක් බවයි. මාතලේ දිස්ත්‍රික්කයේත් දඹුල්ල දිස්ත්‍රික්කයේත් එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂක යන්ට මැතිවරණවලදී වියදම් කරන නැනැත්තා උන්නැහේ නිසා උන්නැහේට ආණ්ඩුවට වඩා වැඩි බලයක් ඒ ප්‍රදේශයේ තිබෙනවාලු. ඇත්ත වශයෙන්ම එය අපේ කනගාටුවට කාරණයක්.

ඒ වාගේම නාගහපොල-කොස්ගොල්ල පාර පිළිබඳ කටයුතු කර දෙනවාය කියා ගරු ඇමතිතුමා එහෙ ගිය වෙලාවෙ පොරොන්දු වී තිබෙනවා. එහෙත් තව මත් ඒ කාරණය ඉෂ්ට වී නැහැ. එම පාරේ සහ හොරොම්බෝව-ආඳාගල පාරේත් කට යුතු ඉතාමත් ඉක්මනින් කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.. එමෙන්ම දිගු කලක සිට අප කරන ඉල්ලීමක් තමයි නාඋල-හඬුව-නායාකුඹුර-කළුන්දැව-කිඹිස්ස පාර පිළිබඳ කටයුතු කර දීම. හැතැප්ම හතරහ මාරක් තිබෙන මෙම පාරේ අඟලකවත් වැඩ කටයුතු පසු ගිය අවුරුදු හතරහමාර ඇතුළත මේ ආණ්ඩුව විසින් කර නැති බව කණගාටුවෙන් සඳහන් කළ යුතුව තිබෙ නවා. තවද අවුවන්ගල-ගෙඩිගස්වලාන-පිඳුරන්ගල-සීගිරිය පාර සහ සීගිරිය-කොස් ගහඇල-දියකැපිල්ල පාර යන පාරවල් වැඩ ද උඩ රට ගැමි පුනරුත්ථාපන දෙපාර්ත මේන්තුවෙන් පටන්ගන්නා බව ප්‍රකාශ කර තිබෙනවා. එහෙත් තවමත් ඒ කට යුතු පටන්ගෙන නැහැ. මෙම වැඩ කටයුතු ප්‍රමාදවීමට හේතුව වශයෙන් අපට පෙනී යන කාරණා කීපයකුත් තිබෙනවා. මෙම දෙපාර්තමේන්තුවේ වැඩ, අංශ කීපයකට භාර දී තිබෙනවා. පළාත් පාලන අංශය, අධ්‍යාපන අංශය, ඉංජිනේරු අංශය ආදී අංශවලට භාර දී තිබෙන වැඩවලින් අධ්‍යා පන අංශයේ වැඩ ඉක්මනින් කෙරෙනවා. එහෙත් පළාත් පාලන අංශයට භාර දෙන වැඩ අවුරුදු ගණනකට කෙරෙන්නෙ.

දඹුල්ලේ පහළවැව පාලම සඳහා ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවෙන් රුපි යල් 35,000 ක මුදලක් වෙන් කර දැන් අවුරුදු දෙකක් ගත වී ඇතත් වගපණහ පල්ලේසිය පත්තුවේ ගම්කාර්ය සභාවට ඒ කාර්යය කරගන්න බැරුව ඉන්නවා. එම නිසා ඉතා ඉක්මනින් ඒ කටයුත්ත කිරීමට යම් කිසි ක්‍රියා පිළිවෙළක් යොදන වා නම් ඉතාම වැදගත් බව මා සඳහන් කරන්න කැමතියි.

ඉදිරිපත් කිරීමට බොහෝ කරුණු තිබු ණත් තවත් එක කරුණක් ගැන පමණයි සඳහන් කරන්න බලාපොරොත්තු වෙන් නෙ. සුරා ප්‍රතිපත්තිය ගැන මිහින්තලේ ගරු මන්ත්‍රීතුමාත් (පී. එම්. කේ. තෙන්න කෝන් මයා.) සඳහන් කළා. තවත් මන්ත්‍රී වරුන් එය අනුමත කළා. මොකක්ද ඒ අදහස? බෝතල් දෙකක් පමණක් වෙනු වට ඕනෑ තරම් අරක්කු අරන් යන්නට ඉඩ දීමයි. මම කියන්නෙ නැහැ. එහෙම ඉඩ දෙන්නය කියා. ගරු ස්වදේශ කට යුතු භාර ඇමතිතුමනි, කවුරු මොන මත දැරුවත් මා එකක් පමණයි ආණ්ඩුවට කියා සිටින්නෙ. එනම් මෙය සම්පූර්ණ යෙන්ම වැරදි බවයි. රේන්ද විකිණීමත් වැරදියි; අරක්කු පෙරීමත් වැරදියි; රා පෙරීමත් වැරදියි, බෝතල එකක් වික්කත් වැරදියි, බෝතල දෙකක් වික්කත් වැර දියි. මෙන්ඩිස් ස්පෙෂල් වික්කත් වැර දියි; බීර වික්කත් වැරදියි. කිසි කලෙක සිංහල ආණ්ඩුවක් රා අරක්කු විකුණා නැහැ. ඒවා සෑදුවේ නැහැ. සිංහල ආණ්ඩුවක් රේන්ද විකුවණුය කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉතිහාසයේ කොතැනකවත් නැහැ. මිනිසුන් පිස්සන් කර පහළොස් කෝටියක් ලැබුණත් මොකටද ? වර්තමාන ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා මේ අමාත්‍යාංශය භාර ගත්තාට පසුව යම් ස්ථිර පියවරක් ගනීවිය කියා මා තුළ බලාපොරොත්තුවක් තිබුණා. රටේ මිනිසුන් පිස්සන් කිරීමට මොනම සිංහල ආණ්ඩුවක්වත් කටයුතු කර නැහැ. සමහර විට මේ ගරු සභාවේදී වුණත් ඇතැම් උදවියට කථා කරන්නට බැරි අවසථා ඇති වෙනවා. ඇත්ත වශයෙන්ම මේ තත්ත්වය ඉතාම කණගාටුදායකයි. ලෝකය පවතිනතාක් කල් කවදාවත් සුරාව නැති කරන්නට පුළුවන්ය කියා මා කියන්නේ නැහැ. කොයි තරම් නීති පැනවුවත්, දඩ ගැසුවත්, දඬුවම් දුන්නත්, බෝතල් දෙක වෙනුවට බෝතල් දහයක් අරගෙන යන්නට ඉඩ දුන්නත් කවදවත් ඔය සුරාව නැති කරන්නට බැහැ. ලෝකය පවතිනතාක් කල් සුරාවත් පවතිනවා. [බාධා කිරීමක්] දුටු ගැමුණු රජතුමා රා වික්කේ නැහැ. මොනම සිංහල රජකුවත් රා වික්කේ නැහැ. සිංහල රජවරුන් රා අරක්කු නොබීවාය කියා මා කියන්නේ නැහැ. ඔය සමහර රජවරු මත් ද්‍රව්‍ය බොන්නට ඇති. නමුත් ඒවා අලෙවි කළේ නැහැ. දැන් තත්ත්වය සම්පූර්ණයෙන්ම පිරිහී තිබෙනවා. නියම දෙමව්පියන් කවදාවත් දූ දරුවන් ඉදිරිපිට මත් ද්‍රව්‍ය පාවිච්චි කරන්නේ නැහැ. දැන් නම් පියවරු පුතුන්ට බෝතලෙන් වත් කර දෙනවාලු. ඒවාගේම පුතුන් පියාට වත් කර දෙනවාලු. සිංහල සිරිතේ හැටියට රහසිගතව ඒ ඒ පිළිවෙළට, ඒ ඒ තරාතිරමේ හැටියට තමයි මිනිසුන් බොනවා නම් බොන්නේ. කිසිම කෙනෙකුට බොන්නට එපාය කියා මා කියන්නේ නැහැ. ඕනෑම කෙනෙකු බීවදෙන්. ඒකට අපෙන් වරදක් නැහැ. කෙනෙකුගේ බීම නවත්වන්නට අප කල්පනා කරන්නේ නැහැ. නමුත් ආණ්ඩුවක් විසින් සුරා පෙරීමත්, විකිණීමත් ,බෙදා හැරීමත් වැරදි බවයි මා කියන්නෙ. ඒක ඉතාම පහත් ක්‍රියාවක් හැටියට මා හඳුන්වනවා. අපේ මොනම සිංහල ආණ්ඩුවක්වත් එවැනි පහත් ක්‍රියාවක් කර නැහැ. සාධාරණ ආණ්ඩුවක් නම් මේ සුරා පෙරීමේත් විකිණීමේත් බෙදා හැරීමේත් ප්‍රතිපත්තිය වෙනස් කළ යුතුයි. කවුරු විරුද්ධ වුණත් ඒ බව මා ප්‍රසිද්ධියේම කියා සිටිනවා.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.** (මීගමුව)
*(திரு. என். டென்ஸில் பெர்ணண்டோ—நீர்கொழும்பு)*
(Mr. N. Denzil Fernando—Negombo)

අවුරුදු නවයක් නිස්සේ කළේ නැහැ ?

පූ. භා. 11.15

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னக்கோன்)*
(Mr. T. B. Tennekoon)

ඒ කාලයේ මා ස්වදේශ කටයුතු භාර ඇමතිව සිටියේ නැහැ ; මට වෙන ඇමතිකමක් තිබුණේත් නැහැ. අවුරුදු නවයටම තාවකාලික වශයෙන් වෙනත් කෙනෙකු වෙනුවෙන් හත් අට වතාවක් මා කැබිනට් මණ්ඩලයේ වාඩි වෙන්නට ඇති. එපමණයි. නමුත් සම්පූර්ණ බලතල තිබෙන ආණ්ඩුවක් තිබෙනවා නම් මා පළමුවෙන්ම කරන්නේ ඔය සුරාව පෙරීමත් බෙදා හැරීමත් විකිණීමත් වහාම තහනම් කිරීමයි

ගරු සභාපතිතුමනි, අපේ අගමැතිතුමාත් මුළු රටටම එවැනි අදහස් ඉදිරිපත් කර තිබෙනවා. එවැනි තත්ත්වයක් ඇති කරනවාය කියා ප්‍රකාශ කර තිබෙනවා. නමුත් ඒ ප්‍රකාශ එතුමා විසින් ඉෂ්ට නොකිරීම ගැන මා කණගාටු වෙනවා. තවත් බොහෝ දේවල් කථා කරන්නට තිබෙනවා. නමුත් ඒවා ගැන කථා කරන්නට ගියොත් තමුන්නාන්සේ අමනාප වන නිසා මා වාඩි වෙනවා.

**ඒ. ලතීෆ් සින්නලෙබ්බෙ මයා.** (මඩකලපුව දෙවන මන්ත්‍රී)
*(ஜனாப் ஏ. லதீப் சின்னலெப்பை—மட்டக்களப்பு இரண்டாம் அங்கத்தவர்)*
(Mr. A. Latiff Sinnalebbe—Second Batticaloa)

Mr. Chairman, I must thank you for giving me this opportunity of speaking on the Votes of the Ministry of Home Affairs.

I would be failing in my duty if I do not say a word of praise about the Hon. Minister himself. A senior politician of this august Assembly, he is one of the Ministers who under-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

stands the needs of the people and the difficulties of Members of Parliament. Listening to the speeches made by the hon. Members of the Opposition we are able to say that he is one of the Ministers who does not discriminate against hon. Members who hold political views different from his own but listens to the difficulties of all hon. Members alike and accommodates their requests as far as possible.

Regarding handloom centres, over a thousand have been set up and satisfactory progress is being made.

One word about the powerlooms. I must thank the Hon. Minister for having allocated a powerloom for my electorate, to be sited at Kattankudi, but I must say that the work has been jeopardized by the administrative officers at the kachcheri level.

When I first made inquiries in regard to this matter I was told that there was no Crown land available at Kattankudi for the siting of the powerloom. After three months I raised the matter at a meeting of the D.C.C. and then it was said that that there was Crown land available. I pointed out that there was Crown land available and that if Crown land was not available I should have been informed and then I may have donated land for this purpose. Up to now the site has not been selected.

We as Members of Parliament try to satisfy the needs of the people but what happens is that works are not carried out by the administration especially at the kachcheri level. Why are these people at the kachcheri trying to jeopardize this matter?

I must thank the Hon. Minister for having given us a circuit D.R.O's office at Kattankudi. Kattankudi is one of the most thickly populated Muslim villages in the Island. This was a long-felt need—such an office at Kattankudi. It serves the needs of the people not only of Kattankudi but the adjoining villages, such as Araipattai and Thalankuda, as well. That is, it serves 60,000 to 70,000 people.

When the question of increasing the number of the D.R.O's divisions was discussed, with great difficulty I managed to get a separate D.R.O's division demarcated from Kalladi to Keerankudi. This proposal was accepted at the D.C.C. but to my utter astonishment the papers were not sent up to the Ministry.

I ask, why was this proposal not sent up to the Ministry? Am I to take it that we are being discriminated against? Is this proposal being jeopardized because it came from a Muslim Member of Parliament? I am anxious to know.

In fact I brought this to the notice of the Hon. Minister and he addressed a letter to the Government Agent of Batticaloa. Up to now I do not know what the position is. Had the proposal been sent to the Ministry, I am sure this D.R.O's division would have been included in the new divisions that were created.

I understand that only six divisions are to be created. This particular D. R. O's division about which I am talking has not been created, not due to any fault of mine but due to the inaction of whatever it may be of the kachcheri administration and of the Government Agent. As a result of this proposal not being sent up to the Ministry the needs of the people of that area are suffering due to the inactivity of a few officers. I earnestly appeal to you and to the Hon. Prime Minister to look into this matter and try and make this "lucky seven" D.R.O. division. We want a separate D.R.O's division set up. There is a D.R.O's office at Kattankudi. It is necessary because the population is large.

In regard to the needlework centres of the rural development societies, there is no initiative taken by the rural development officers in the Batticaloa area, especially in my electorate. It is their duty to see that

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the needlework centres function properly and cater to the needs of the people.

There is inordinate delay in the issue of gun licences by the kachcheri. Over 60 per cent of my constituents are farmers, cultivating either in colonization schemes or in areas adjoining thick jungles. I endorse the views expressed by the hon. Member for Mihintale (Mr. P. M. K. Tennekoon) who said that the police officers try to report on the assets of the applicants for gun licences. That is all wrong. The duty of a police officer is, when the papers are referred to him, to report whether the applicant has been convicted in a court of law, whether he is involved in any crime, whether he is a thug, etc. Instead they report on the assets of applicants, and in the process solicit bribes. Reporting on assets is the duty of the D.R.O. or the gramasevaka. You should look into this matter and see that the gun licences are issued to genuine applicants.

I have suggested that we should have a Muslim registrar for the Batticaloa municipal area. Now we have a registrar who comes from Kattankudi and performs the functions. In fact we have agreed upon this at the D.C.C. level, but I am afraid the papers have not been forwarded to the Ministry. I do not want to complain about these matters here, but the people blame the members of Parliament when work is slack at the kachcheri level. It is only when the administrative machinery functions properly that the effects of government policy are felt tangibly by the people. If the officers do not take any interest whatsoever to see that the policies of the Government are put into effect what is the use of our being M.Ps? We cannot get anything done at the kachcheri.

In fact I am told that certain Muslims when they visit the kachcheri are called kaakaas and they are discriminated against. I have brought this matter to the notice of the Government Agent, but to date nothing has been done. Did he send out a circular to the clerical staff and try to find out why this is happening at the kachcheri?

I would urge you to look into these matters that I have brought to your notice, especially about the creation of a special D.R.O's division.

**ආර්. එම්. අප්පුහාමි මයා.** (බණ්ඩාරවෙල)

*(திரு. ஆர். எம். அப்புஹாமி—பண்டாரவளை)*

(Mr. R. M. Appuhamy—Bandarawela)

ගරු සභාපතිතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට මටත් අවස්ථාවක් දීම ගැන මා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාට අප මේ අවස්ථාවේදී විශේෂයෙන් ස්තුතිවන්ත වන්නේ එතුමා පක්ෂභේදයෙන් තොරව ක්‍රියා කිරීම නිසයි. මට පෙර කථා කළ සෑම ගරු මන්ත්‍රීවරයකුම පාහේ එතුමාගේ අමාත්‍යාංශයේ වැඩ පිළිබඳව එතුමාට ප්‍රශංසා කළ බව අපට පෙනී ගියා.

නොදියුණු ප්‍රදේශයක් වන උඩරට ප්‍රදේශයේ දියුණුවක් බලාපොරොත්තු වෙනවා නම් එය විශේෂයෙන් බලාපොරොත්තු වන්නට පුළුවන්, උඩරට ගැමි පුනරුත්ථාපන අංශයෙන් කෙරෙන වැඩ නිසා බව, උඩරට ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මා කියන්නට ඕනෑ. උඩරට ගැමි පුනරුත්ථාපන අංශය සඳහා මීට වඩා මුදල් වෙන් කර කටයුතු කරනවා නම් නොදියුණු උඩරට ප්‍රදේශය මීට වඩා ඉක්මනින් දියුණු කර ගැනීමට පුළුවන් වෙනවා. උඩරට ගැන පුනරුත්ථාපන අංශය මගින් පසුගිය අවුරුදු කීපය තුළ මගේ ඡන්ද කොට්ඨාශයේ පාරවල්, ජල යෝජනා ක්‍රම ආදිය පිළිබඳ වැඩ කීපයක් කර තිබෙනවා. එහෙත් පසුගිය අවුරුද්දේ සිදු විය යුතුව තිබූ වැඩ කොටස නම් ටිකක් ඇන හිට තිබෙන බව කණගාටුවෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ. එසේ සිදු වී තිබෙන්නේ කලින් අවුරුදුවල වැඩිපුර මුදල් වියදම් කර තිබීම නිසා පසුගිය අවුරුද්දේ බලාපොරොත්තු වූ වැඩ කර ගන්නට බැරි වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අප්පුහාමි මයා.]

මෙන් බව දැන ගන්නට තිබෙනවා. කෙසේ වෙතත් මේ වර්‍ෂයේ සෑහෙන වැඩ කොටසක් කිරීමට දැනටම කටයුතු ආරම්භ කර තිබෙන බව ඒ සමගම සන්තෝෂයෙන් මතක් කළ යුතුව තිබෙනවා.

උඩරට ගැමි පුනරුත්ථාපන අංශයේ වැඩ යටතේ මගේ කොට්ඨාශයේ නාවුල්ල-දෙමෝදර පාලම 1967-68 වර්‍ෂයේ ප්‍රමුඛතා ලේඛනයට ඇතුළත්ව තිබුණා. 1968-69 වර්‍ෂයේදී එය ප්‍රමුඛතා ලේඛනයේ අංක 15 ට සඳහන් වී තිබුණා. මේ පිළිබඳව ඇස්තමේන්තු සකස් කර ක්‍රියා කරන්නය කියා බදුල්ලේ විධායක ඉංජිනේරු තැනට දන්වා තිබුණත් තවම ඒ වැඩ කොටස කෙරී නැහැ. ඇල්ල නගරයේ සිට බදුල්ල මහා මාර්‍ගය දක්වා වූ ඒ ඉතා පැරණි පාරේ දැනට ඒ ස්ථානයේ තිබෙන්නේ අත්වැල් පාලමක්. මේ අත්වැල් පාලම අවුරුදු ගණනාවකට පෙර දැමූ එකක්. අද එය ඉතාමත් අබලන් වී ඇති නිසා තත්ත්වය ඉතාමත් භයානකයි. පුවක් කොට දෙකක් උඩයි, මේ පාලම සවි කර තිබෙන්නේ. කොයි මොහොතේ මේ පාලම කඩා වැටේදෝ කියා බියක් තියෙනවා. ඒ පාලම එහි අහිංසක දරුවන්ගේත්, ගම්වාසීන්ගේත් ජීවිතවලට තර්ජනයක් වී තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව ඉක්මනින්ම ක්‍රියා මාර්‍ගයක් ගන්නට ඕනෑ.

හීල් ඔය-මකුල් ඇල්ල පාර ගැනත් සඳහන් කරන්න ඕනෑ. මගේ කොට්ඨාශයේ වැඩ හුඟක් අඩුවෙන් කෙරුනාය කියා තමුන්නාන්සේ සමග සාකච්ඡාවක් පැවැත්වූ අවස්ථාවේදී මේ පාරත් වැඩ ලැයිස්තුවට ඇතුළත් කරන්නය කියා තමුන්නාන්සේ නියෝග කළා. එහෙත් මෙතෙක් ඒ පිළිබඳව කිසිවක් කෙරී නැහැ. මල්වත්ත-දික්උල්පොත පාර, මාපිටිය-රෝස්ලන්ඩ් පාර ආදිය පිළිබඳව මූලික කටයුතු කරගෙන ගොස් තිබුණත් වැඩ ආරම්භ කිරීමක් තවම සිදු වී නැහැ. මේ පිළිබඳව ප්‍රමාදයක් තිබෙනවා නම් ඒ ප්‍රමාදය මගහරවා ඉක්මනින්ම එය කිරීමට විධිවිධාන යොදන මෙන් මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, දෙමෝදර-බල්ලේකෙටුව පාරේ පළමුවෙනි සැතපුමේ වැඩ අවසාන කර ඇතත් තව සැතපුම් 3 ක පමණ වැඩ කරන්නට තිබෙනවා. ඒ වැදගත් මාර්ගයෙහි වැඩ කටයුතු ඉක්මනින් අවසාන කරගැනීම සඳහා ගරු ඇමතිතුමාගේ සහ උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවේ සහයෝගය මා බලාපොරොත්තු වෙනවා.

විජේකෝන් මහතා උඩරට ගැමි පුනරුත්ථාපන අංශයේ නියුක්තව සිටියදී ඉතා සැලකිල්ලෙන් කටයුතු කළා. දැන් සිටින කොමසාරිස්තුමා වන ඒකනායක මහතාත් එම වැඩ පිළිවෙළ ඉතා සැලකිලිමත්ව ක්‍රියාවෙහි යොදන කෙනෙක් බව මතක් කළ යුතුයි. ඒ ඒ ගම්වල තිබෙන අඩුපාඩු තම ඇසින්ම දැක බලාගෙන විත් ඒවායේ සංවර්ධනයට අදාළ වන පරිදි ක්‍රියා කිරීම සඳහා එතුමා ලොකු මහන්සියක් ගන්න බව පෙනෙනවා. එවැනි ලොකු උත්සාහයකින් තමුන්නාන්සේගේ මෙම ගැමි පුනරුත්ථාපන අංශයෙහි වැඩ කටයුතු කරගෙන යතත්, එහි වැඩ මීටත් වඩා ඉක්මනින් කිරීම සඳහා නිසි පියවර ගතහොත් අපේ නොදියුණු ප්‍රදේශවල දියුණුව සඳහා එමගින් විශාල රුකුළක් ලැබෙනවා ඇති.

ගැමි පුනරුත්ථාපන අංශයෙහි වැඩ කටයුතු කොටස් තුනකින් කෙරෙනවා. නිර්මාණ ඉංජිනේරුතුමා මාර්ගයෙන් එක් වැඩ කොටසක් කෙරෙන අතර තවත් වැඩ කොටසක් රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන්ද, තවත් වැඩ කොටසක් ගම්සභා මගින්ද කෙරෙනවා. ඒ ඒ වැඩ කටයුතු සඳහා අවශ්‍ය මුදල් ලබාගැනීමාදියට ඇස්තමේන්තු සකස් කිරීම වැනි වැඩ කටයුතු ටිකක් ප්‍රමාද වන බව පේනවා. නිසියාකාර එම ඇස්තමේන්තු සකස් කොට ඒවාට අවශ්‍ය මුදල් කලට වේලාවට ලබා ගතහොත් එම වැඩ කටයුතු ඉක්මනින් කරවන්නට පුළුවන් වෙනවා.

පූ. භා. 11.30

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාව පිළිබඳවත් වචනයක් කිව යුතුයි. ඒ ඒ දිස්ත්‍රික්කවල වැඩ කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මන්ත්‍රීවරුන්, පළාත් පාලන නියෝජිතයන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් එක් රැස් වී මාස තුන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හතරකට වරක් කච්චේරියේ දිසාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පවත්වනවා. ඒකටයි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාවයයි කියන්නේ. අප ඒවායේදී ඉදිරිපත් කරන යෝජනා සහ සාකච්ඡා කරනු ලබන යම් යම් කරුණු ක්‍රියාත්මක වන්නේ ඉතා අඩුවෙන් බවයි කියන්නට තිබෙන්නෙ. සමහර කරුණු සාකච්ඡාවට පමණක් සීමා වී අවසන් වන බවයි පෙනෙන්නෙ. එසේ හෙයින් ඒ ඒ ප්‍රදේශවල දියුණුවට අදාළ වන පරිද්දෙන් ඒ ඒ ප්‍රදේශවල පවත්නා යම් යම් අඩුපාඩුකම් පිළිබඳව සාකච්ඡා කොට එම වැදගත් සභාවෙහිදී ගනු ලබන යම් අන්දමක තීරණයන් ඇතොත් ඒවා ඉක්මණින් ක්‍රියාත්මක කරන්නට වැඩ පිළිවෙළක් යෙදුවහොත් හොඳයි. එසේ නොකළොත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභා රැස්වීම් පැවැත්වීමෙන් එතරම් ප්‍රයෝජනයක් ලැබේවිය සිතන්නට අමාරුයි. එසේ වූ විට එය මහජන නියෝජිතයන්ගේ සහ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ වටිනා කාලය කා දැමීමක්ද වෙනවා.

ඊළඟට ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳව යමක් කිව යුතුයි. එම සමිතිවලින් ඒ ඒ ප්‍රදේශවලට ලොකු සේවාවක් සිදු වන බව පෙනෙනවා. විශේෂයෙන් පාරවල් කැපීමාදී කටයුතුවලදී විශාලතම සේවාවක් සිදු වෙනවා. එම සමිතිවල සාමාජිකයන්ගේ ශ්‍රම ශක්තියෙන් සැතපුම් ගණන් දුර පාරවල් කපා තිබෙන බව අප දන්නවා. එහෙත් අද එම ග්‍රාම සංවර්ධන සමිති අඩපණ වූ ඒවා බවට පත්ව තිබෙන බව කියන්නට පුළුවනි. ඒවාට ලැබුණු ආධාර මුදල් අද ලැබෙන්නේ නැහැ. එසේ හෙයින් ඒවාට එවැනි වැඩ කටයුතුවල නිරත වීමට නොහැකිව නමින් පමණක් පවත්වාගෙන යන්නට සිදු වී තිබෙන්නේ. ගමේ දියුණුවට අවශ්‍ය කරන වැඩ කටයුතුවලින් විශාල කොටසක් ඉටු කර ගත හැකි මෙම වැදගත් සමිතිවලට නව පණක් දී ඒවා ක්‍රියාත්මක සමිති බවට පත් කිරීම අවශ්‍ය දෙයක් බව මතක් කරන්නට කැමතියි.

ඊළඟට ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවත්නා වඩු කර්මාන්තශාලා පිළිබඳව යමක් කිව යුතුයි. මගේ කොට්ඨාශයේ වඩු කර්මාන්තශාලා දෙකක් තිබෙනවා. ඉන් එකක් යාන්ත්‍රික වඩු කර්මාන්තශාලාවක්. අනික අතින් වැඩ කරන වඩු කර්මාන්තශාලාවක්. පළාතේ ශුභ සිද්ධිය සඳහා යාන්ත්‍රික වඩු කර්මාන්තශාලාවෙන් සෑහෙන සේවයක් සිදු වෙනවා. එහෙත් එහි පවතින අඩුපාඩුවක් ගැන කියන්නට කැමතියි. එම මධ්‍යස්ථානයට අවශ්‍ය ගොඩනැගිල්ල පමණයි එතන තිබෙන්නේ. එහෙත් එය භාරව සිටින උදවියට නවතින්නට ස්ථානයක් ඇත්තේ නැහැ. එසේ හෙයින් එම උදවියට නවතින්නට සුදුසු ස්ථානයක් සාදා දීම ඉතා වැදගත් දෙයක් හැටියට මතක් කරන්නට කැමතියි.

කුඹල්වෙල පවත්වාගෙන යන වඩු කර්මාන්තශාලාවෙන් එතරම් සේවාවක් සිදු නොවන බව කිව යුතුයි. මේ ස්ථානය අධ්‍යාපන දෙපාර්තමේන්තුවට භාර දුන්නොත් හල්පේ මහා විද්‍යාලය ඒ අසල තිබෙන නිසා ඒ විද්‍යාලයේ ළමයින්ට වඩු කර්මාන්තය පිළිබඳ දැනුමක් ලබා දෙන්නට අවස්ථාව සැලසෙනවා.

මා තව එක කාරණයක් ගැන පමණයි, සඳහන් කරන්නේ. රන් රිදී බඩු උකස් ගන්නා ස්ථානවල අය කරන පොලී ප්‍රමාණය සියයට එකක්ව තිබුණු නමුත් දැන් එය සියයට තුන දක්වා වැඩි කර තිබෙන බව දැන ගන්නට තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමා ඒ ගැන සැලකිල්ල යොමු කර, වැඩි කර තිබෙන පොලී ප්‍රමාණය අඩු කිරීමට කටයුතු කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමින්, මට කථා කරන්නට අවස්ථාව සලසා දුන් සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**වී. ඒ. අලගකෝන් මයා.** (මන්නාරම)
*(திரு. வி. ஏ. அழகக்கோன்—மன்னார்)*
(Mr. V. A. Alegacone—Mannar)

Sir, I thank you very much for giving me this opportunity to speak a few words on the Votes of the Ministry of Home Affairs. In fact, I waited for nearly nine hours yesterday to get an opportunity to speak a few words on the Votes of the Ministry of Land, Irrigation and Power, but unfortunately I could

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අලගකෝන් මයා.]

not do so for lack of time. In fact, about 80 per cent of my area is agricultural.—[*Interruption*]. Anyhow, I thank you for giving me this opportunity to speak on the Votes of the Ministry of Home Affairs.

Sir, I come from a backward and far-flung area in the backwoods of Ceylon. It is for me to make it known that this is a backward area so that schemes may be undertaken for its improvement and progress. I should say that the Hon. Minister of Home Affairs has always been very good to me and acceded to whatever request I made to him if it was reasonable.

I should like to bring to the notice of the Hon. Minister of Home Affairs certain matters pertaining to my electorate. For the last ten years I have been making the request that a central secretariat be put up in my electorate. The present kachcheri is housed in a Dutch building which is about 200 years old. No amount of repairs can help to make this building satisfactory. It is in such dilapidated condition that plastering or colour washing is useless. No sooner is it done than the plaster falls off and the colour washing peels off. In the circumstances, officers do not like to work there as they fall ill because of the dust from the plaster and colour washing. As a result of this some officers have developed tuberculosis. I have time and again appealed to the Hon. Minister to put up a new building as early as possible. A new building is very necessary. There are several departments—for instance, the Department of Co-operative Development, the Department of the Commissioner of Agrarian Services, the Department of Local Government, and so on—which are paying heavy rents to house their departments. I think these departments pay nearly Rs. 2,000 a month by way of rent, which works out to Rs. 24,000 a year. I would appeal to the Hon. Minister to put up a new central secretariat as soon as possible. I urge the Hon. Minister to give his particular attention to this matter during the course of this financial year itself.

The second matter I wish to raise is about the District Registrar's office. In fact his office is housed in a small building attached to the kachcheri where records and deeds and things like that are filed. All the civil marriages are also performed in this office. This office is so small that there is hardly any room to provide seats for the people who come to register their marriages. There is only room to accommodate the four clerks. They sit in a corner and do the registrations. But the people who frequent the place are put to great inconvenience because there is no room for them to stay. They have to stand in the hot sun. There is not even a tree to give them a little shade. In the circumstances I would request you to see that the Registrar's office is extended so that there will be sufficient room for keeping the duplicated deeds and other documents as well as to provide a waiting room for people who come there to register marriages.

Thirdly, I wish to bring to your notice that the three D.R.O's divisions in the Mannar District have not undergone any change although the population has multiplied threefold. These divisions existed even before I was born in 1903. The three divisions are Mannar, Musali and Manthai. These divisions have existed for a hundred years without any change.

As such their work is in arrears. Except in the case of the Mannar division, police functions have to be performed by the D.R.O. of the other two divisions. In fact the D.R.Os have to travel long distances. The D.R.O. in charge of the Musali division has to travel ninety miles to Vavunikulam. In such circumstances the work is bound to suffer. Therefore I would request that another D.R.O. be appointed to the Vavunikulam area. It is impossible for one man to cover the whole

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

area under his division. Only the Mannar D. R. O's division is exempted from police duties. The work is bound to go into arrears unless another D. R. O's division is created.

Another request I should like to make is that the number of gramasevaka divisions be increased. In fact, we had a committee which recommended that the number of divisions be increased by five, but unfortunately we have not heard anything so far with regard to our suggestion. I hope something will be done to increase the number of gramasevaka divisions as that is very desirable. It is only then that it will be possible to expect good work to be done in the Mannar District. Under the present set-up nothing can be done. The work gets into arrears, as a result of which the people suffer.

The next matter I wish to speak on is something which I have had occasion to repeat for the last ten years, and that is about the tree tax system being introduced in Mannar. Mannar is a part of the Northern Province. While the whole of the Northern Province gets the advantage of the tree tax system, Mannar is excluded from it. I cannot understand why a part of the same province cannot enjoy the same advantage. In fact I have continuously brought this to the notice of the Hon. Minister and I have been told that you are going to abolish the tree tax system in Jaffna and that there is no purpose in introducing the tree tax system in Mannar. But I find that, although I have been told so for the last seven or eight years, the tree tax system is continuing in the Jaffna Peninsula.

පූ. භා. 11.45

I must bring to your notice that there is a class of people who are tree tappers, and that as a caste they are dying out because they have no work to do. If the tree tax system is introduced in the Mannar District, this community will not suffer but will be able to grow wealthier. In the Jaffna area, for instance, the people who tap the palmyrah tree for toddy have increased their wealth. They have been able to build modern houses and to educate their children, and they are living very happily. As things are, these people do not tap for toddy. Tavern renters employ people from outside, mostly Indians, for they like to get the work done cheap, without paying the local people more. As a result these local people as a caste are dying out, and probably in a few years' time they will be no more. In the circumstances, it is your duty to introduce the tree tax system for the Mannar area so that these people can prosper and become wealthy enough to lead a good life in their own country.

Fourthly, I want to refer to gun licences. In fact, for the last one to one and half years no gun licences have been issued in my area. In the Mannar District everyone who gets out of his house carries his life in his hand because this is a jungle area. The whole district is a jungle area and nearly 75 per cent of the population are cultivators. When they apply for a gun licence the application is recommended by the D. R. O. and the grama sevaka; but when it comes to the police they do not recommend the application; nor do they give any reason for refusing to recommend the application. We cannot even know from the police the reasons for not recommending the application. After all, the police has only to speak about the character of the applicant, whether he has a bad character, or has had a previous conviction or something like that.

In fact every man in my district needs a gun because as a cultivator he has to get out of his home and walk several miles through jungle land and, as I said, carry his life in his hand, because he can be attacked by elephants, leopards, cheetahs, bears and so on. As such the cultivators have to be provided with a gun. The Hon. Minister must issue instructions to the G. A. of the area to see that gun licences are issued liberally whenever required. I would request you to see that something is done in this respect.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අලගකෝන් මයා.]

Fifthly, I must say that there is only one arrack tavern for the whole of the Mannar District which covers an area of almost 985 square miles. As a result the kasippu menace is spreading fast and this kasippu poison is killing the people. Why should we not give the people who want to drink a wholesome drink? After a day's hard work a cultivator would like to have a wholesome drink to revive himself. Why stop him from taking his drink ? There is only one tavern for the whole district, and that too in the Mannar town. I would request the Hon. Minister to open two more taverns in the other two D. R. O. Divisions. There is one tavern at the Mannar D. R. O's division and I would request you to open two more taverns, one each at the Musali D. R. O's Division and at the Manthai D. R. O's Division. This will do good to the people because they are now killing themselves by drinking poison.

The hon. Member for Dambulla (Mr. T. B. Tennekoon) spoke very eloquently about prohibition. No doubt it is good but if a man must have a drink let him have a wholesome drink. The world is fast advancing. We have now come to the Space Age and Man has gone to the Moon and come back. To speak of prohibition at this time is, I would not call it nonsense, all useless talk. If a man must have a drink let him have a wholesome drink at a fair price. I hope the Hon. Minister will listen to what I have said and see that two more taverns are opened in the other two D. R. O's divisions.

The other matter is about hand loom centres. We have only 7 hand loom centres in the whole area. There is a demand for more and more hand looms and for more and more hand loom materials. I would request the Hon. Minister to give us more hand looms for this area which is a backward area.

I would also request the Hon. Minister to give us a powerloom centre. The only factory situated in my constituency is the fish canning factory given to us by the Hon. Minister of Industries and Fisheries. Most of the factories have been set up in and around Colombo.—[*Interruption*].

Another request I want to make to the Minister is that steps be taken to open up land in Mannar for the cultivation of cotton. In my area there is plenty of land suitable for the cultivation of cotton; but nobody appears to be taking any interest in developing this land, perhaps because mine is a constituency situated far away from the centre of activity. If this land is developed and cotton is planted we will be able to supply all the yarn required for the powerloom as well as the handloom factories in the island.

Some years ago the rural development societies and the community centres were combined, with the result that hardly any work was done by those organizations. Now, after the community centres were separated and handed over to the Minister of Local Government, the Assistant Commissioner of Local Government is taking a keen interest in the progress of the community centres. He has visited the whole area and revived many community centres Libraries and reading rooms have been opened, for which it is necessary that separate buildings be put up. Similarly, the rural development societies in the villages should be revived.

I thank the Hon. Minister for giving me a patient hearing and you, Mr. Chairman, for giving me time to bring these matters to the notice of the Minister.

ටී. බී. සුබසිංහ මයා. (කටුගම්පළ)
(திரு. ரீ. பி. சுபசிங்க—கட்டுகம்பொள)
(Mr. T. B. Subasinghe—Katugampola)

ගරු සභාපතිතුමනි, කියන්නට නම් කරුණු රාශියක් තිබුණත් මේ අවස්ථාවේදී එක කාරණයක් ගැන පමණක් මතක් කරන්නටයි, මා බලාපොරොත්තු වන්නේ. ගරු ඇමතිතුමා යටතේ ඇති කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව ගම්බද්‍ව සුළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සුළු කර්මාන්ත ආරම්භ කර තිබෙනවා. මා මතක් කරන්නේ එයින් රෙදි කර්මාන්තය පිළිබඳවයි. මන්නාරම පැත්තේ පවතින තත්ත්වය ගැන මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. අපේ ප්‍රදේශවල පවතින තත්ත්වය ගැන මා පෞද්ගලික වශයෙනුත් ගරු ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කර තිබෙනවා. නැවත ඒ සම්බන්ධයෙන් ටිකක් මතක් කර දෙන්නට කැමතියි. අද රෙදි විවීමේ කර්මාන්තය අඩපණ වී තිබෙනවා. වියන ලද රෙදිවලට මුදල් ලැබෙන්නේ නැහැ. ඒ වාගේම රෙදි විවීම සඳහා නූල් ලැබෙන්නේත් නැහැ. පේෂ කර්ම මධ්‍යස්ථානවල ගුරුවර ගුරුවරියන් අද නිකම් ඉඳගෙන පඩි ගන්නා තත්ත්වයක් පවතිනවා. වැඩ නැති නිසා ඒ උදවිය ගෙවල්වල ඉඳගෙන පඩි ගන්නා තත්ත්වයක් පවතිනවා. මේ අතර මේ ගරු ඇමතිතුමා මෑතකදී නලා පිඹගෙන, හේවිසි ගසාගෙන රෙදි විවීමේ මධ්‍යස්ථාන 1,000 ක්ද කොහේදෝ ආරම්භ කරන්නට යෙදුණා. මේ ව්‍යාපාරය පිළිබඳව ලොකු බලාපොරොත්තුවක් මහජනයා තුළ ඇති කළා. සේවකයන් පුරුදු කිරීම් ආදී වැඩත් කරන්නට යෙදුණා. රෙදි කර්මාන්තය දියුණු කිරීම සඳහා නොයෙක් පියවරවල් ගත්තත් අද සිදු වී තිබෙන්නේ මොකක්ද ? අද ඒ රෙදි විවීමේ මධ්‍යස්ථාන වසා දමා තිබෙනවා. ඒවායේ වැඩ කළ ළමයින් ගෙදරට වී ඉන්නවා. වියන ලද රෙදි විකුණන්නට බැහැ. රෙදි විවීම සඳහා නූල් ටිකක් ගන්නටත් බැහැ. අපේ පළාතේ තත්ත්වය ගැන මම කියන්නම්.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்டன் ஜயசிங்க)*
(Mr. Shelton Jayasinghe)
කොයි පළාතේද ?

**සුබසිංහ මයා.**
*(திரு. சுபசிங்க)*
(Mr. Subasinghe)
තමුන්නාන්සේ මේවා ගැන දන්නේ නැහැ. තමුන්නාන්සේ ලොකු කර්මාන්තකාරයෙක්. මා කියන්නේ සුළු කර්මාන්ත ගැනයි. තමුන්නාන්සේ බිර්ලා වැනි උදවිය සමග කර්මාන්ත කරන කෙනෙක්. පොඩි කර්මාන්ත ගැන දන්නේ නැහැ.

අපේ පළාතේ එක සමුපකාර සමිතියක් මගින් ඇති කරන ලද රෙදි විවීමේ මධ්‍යස්ථානයක ගම්බද තරුණියන් 500 ක් පමණ රෙදි විවීමේ යෙදී සිටියා. මාස දෙකකට වරක් ලක්ෂ එක හමාරක විතර රෙදි රැස් කරනවා. එහෙත් අද ඒ සමිතියට සිදු වී තිබෙන්නේ මොකක්ද ? මුදල් ඇමතිතුමා විසින් පිරිවැටුම් බද්දේ සංශෝධනයක් ඇති කරන ලද නිසා කොළඹ වෙළෙඳුන් ඒ රෙදි ගැනීම වර්ජනය කළා. ඒ නිසා අද ලක්ෂ එක හමාරක නැත්නම් දෙකක රෙදි ගබඩාවේ තිබෙනවා. මේවා ගැන කල්පනා කරන්නේ නැහැ. අර ඇමතිතුමා නොසැලකිලිමත් අන්දමට වැඩ කිරීම නිසා දොස් අසන්නට සිදු වන්නේ මේ ඇමති තුමාටයි. සරොමෙන් පළිගන්නවා. සුළු කර්මාන්තයක් හැටියට පවත්වාගෙන යන රෙදි කර්මාන්තය ආරක්ෂා කරන්නට ගරු ඇමතිතුමා නොයෙක් යෝජනා ඉදිරිපත් කර තිබෙන බව මම දන්නවා. එහෙත් මේ රටේ ආර්ථික ඒකාධිකාරිත්වයක් දරණ ලොකු කර්මාන්තකාරයන් මෙය පාගා දමන්නට උත්සාහ කරන නිසා ලංකාවේ සුළු කර්මාන්තත් ලොකු කර්මාන්තත් අතර කිසිම සම්බන්ධකමක් ඇති වන්නට මාර්ගයක් සැලසෙන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් කියන්නට කරුණු රාශියක්ම තිබෙනවා. ගරු ඇමතිතුමාත් යෝජනා රාශියක් ඉදිරිපත් කර තිබෙන බව අපට දැන ගන්නට ලැබී තිබෙන නමුත්, ඒ යෝජනාසියල්ලම වාගේ කුණු කූඩයට දමන හැඩයි අපට නම් පෙනෙන්නේ. මේ ආණ්ඩුවේ ඇමති මණ්ඩලය ඒ යෝජනාවලට සැලකිල්ලක් දක්වා නැති බවයි පෙනෙන්නට තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, අපේ රටේ සුළු කර්මාන්ත ආරක්ෂා කරන්නට ඕනෑ. ඒ සඳහා ආරක්ෂක වැඩ පිළිවෙළවල් ඇති කරන්නටත් ඕනෑ. සුළු කර්මාන්තයක් හැටියට පවත්වාගෙන යන රෙදි කර්මාන්තය ආරක්ෂා කරන්නට විධිමත් වැඩ පිළිවෙළක් යෙදුවේ නැත්නම් ලොකු කර්මාන්ත ගොඩනංවන්නට යනවාය යනුවෙන් ඝෝෂා කරමින් බිර්ලා වැනි උදවිය සමග කොයි තරම් සාකච්ඡා ආදිය ඇති කළත් අන්තිමේදී අප රටට හිතකර අන්දමට ඒවා කෙරෙන්නේ නැහැ. පල්ලේකැලේත් කර්මාන්තශාලාවක් ඇති කරන්නට යන බවක් අපට දැනගන්නට ලැබී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

තිබෙනවා. එංගලන්තයේ එක්තරා කොම්පැනියක් එය පටන් ගන්නට යන බවයි දැන ගන්නට ලැබී තිබෙන්නේ. ලොකු කර්මාන්ත පටන් ගැනීම ගැන අප විරුද්ධ නැහැ. ලොකු කර්මාන්තත් සුළු කර්මාන්තත් ඒකාබද්ධ කරගෙන යන්නට වැඩ පිළිවෙළක් ඇති කරන්නට ඕනෑ. ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්නැයි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

Order, please! The Sitting is suspended till 2 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.**

அதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

*Sitting accordingly suspended till 2 P.M. and then resumed.*

**ජේ. පී. ඔබේසේකර මිය. (මීරිගම)**
*(திருமதி ஜே. பீ. ஒபயசேக்கர—மீரிகம)*
(Mrs. J. P. Obeyesekere—Mirigama)

Mr. Chairman, before I start dealing with some of the subjects coming under the Ministry of Home Affairs, I would like to thank the Hon. Minister for having sent me this report. I do not know whether the other hon. Members have also received a copy of it.—[*Interruption*]. I do not know whether it is only for the Ladies, but certainly the Hon. Minister has sent me one. The Hon. Minister has taken a lot of trouble to answer in this report every point raised by hon. Members during the last Budget Debate.

I am sure, if I were to repeat the very same speech that I made on the last occasion this time too, the Hon. Minister would still have the same answer because, as far as I can see, for the last four and half years nothing has been done although his intentions are very good. The Hon. Minister strives very hard, but I do not think that he gets the full support of his Cabinet Colleagues.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி. சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

That is what happens.

**ඔබේසේකර මිය.**
*(திருமதி ஒபயசேக்கர)*
(Mrs. Obeyesekere)

Besides the opening up of a few Salu Sala shops and some handloom centres, the Hon. Minister has not been able to do as much as he wanted to do. Let us take the textile industry as a whole. For the last four and a half years we have been asking for the establishment of a central authority to control all production of textiles. The Hon. Minister has in his report stated that he has put up a memorandum to the Cabinet asking for the establishment of a central authority to co-ordinate and plan the textile industry.

As you know, the textile industry is handled by three Ministers—the Minister of State, the Minister of Industries and Fisheries and the Minister of Home Affairs. One lakh of handlooms will soon be working and nearly a hundred powerloom textile workshops also will be working soon. All these come within the Ministry of Home Affairs, and they are handled by the Department of Small Industries and Rural Development.

I know that Salu Sala had invited a team of experts from abroad to report on the textile industry in this country and that they have submitted a report after a stay of only three days here. However, I am glad that the Hon. Minister has chosen the people of this country, the officers and men who are familiar with the conditions of the textile industry in this country and its problems, to serve on a committee which has to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

submit a plan for the textile industry in Ceylon. I do not know whether their report is still out, but I do hope that their report will be considered and implemented. What I want to say is that, having all these powerloom and textile centres to be looked after and safeguarded, it is his business to see that the handloom industry gets the necessary safeguards. Mr. Chairman, reports alone will not suffice if they are not implemented.

What the Hon. Minister must see to is that the handloom industry and the powerloom textile workshops do not have to compete with these big concerns. We see that every day more and more mills are being approved. I am not going to talk about Birlas or anybody else here because already we have heard enough about the correct step taken by that great Lady, Mrs. Indira Gandhi, across our shores in India, in appointing a committee to investigate into this big power group, the Birlas. Now I am sure it will open the eyes of many here in Ceylon who have gone to the extent of inviting these big groups to invest moneys here, to the detriment of our rural weavers and workers. So it is up to the Minister of Home Affairs to put up a fight against these people from coming into Ceylon and taking away what is the right of the rural worker.

PUBLIC LIBRARY JAFFNA.

Much public money has been spent in setting up these centres. Under certain aid agreements, specially with China, some of these powerloom workshops have been installed, and it is only the Minister of Home Affairs who can see to it that certain lines of production are reserved entirely for these handloom and powerloom workshops. I certainly do not approve and will never approve of these big mills coming up or being sanctioned. If the National Textile Corporation together with Thulhiriya and Ambalangoda, cannot meet the demand let there be more units set up through corporations in the State sector to meet the textile requirements of the country.

I know, in the time of the S.L.F.P. Government, we had a definite policy that cotton production, the weaving of cotton, should be kept entirely for the public sector, except the Wellawatte Spinning and Weaving Mills, which of course was in the field already. Only production of synthetic was allowed to the private sector. I think that should be the policy even now. I do hope the Hon. Minister, who succeeded the late Mr. S. W. R. D. Bandaranaike as Prime Minister, will have sufficient courage to fight for this policy, for everyone knows that it was Mr. Bandaranaike who really gave a place to the textile industry in Ceylon. This month we celebrate the tenth anniversary of his death, and it is a fitting tribute to Mr. Bandaranaike if you will take the necessary steps to see to it that the textile industry, as planned by him, goes forward the way he wished. If, however, approvals are being given to these big mills to invest moneys here and compete with the handloom and small powerloom workshops, I hope some day when there is an S. L. F. P. Government again they will nationalize all those mills and make them all State corporations.

If the National Textile Corporation and the other State Textile ventures are unable to cope with the spinning of all counts of yarn and also the finishing of certain products, then I think the Minister should set up more workshops in the public sector to meet the deficiency.

I would like to mention here the establishment of one powerloom workshop in particular. I have mentioned this before to the Hon. Minister and he has agreed with me, but unfortunately there again his Cabinet Colleagues do not agree with him. Though he has been very generous in granting powerloom workshops and handloom centres to many Members of Parliament, I have not been able to secure one for Mirigama. There was one allocated to Mirigama, but it has been taken away to Warakapola. I think if the Prime Minister was not that selfish and gave it to Mirigama,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඔබයසේකර මයා.]
because he has a large mill at Thulhiriya in his own electorate, the people of Mirigama also could be satisfied to a small degree.

What I would like to ask the Hon. Minister is, what real progress has been made both in the handloom and handicraft sections for the last four and a half years. I have mentioned a little about the handloom industry.

Many Members of Parliament have mentioned the shortage of yarn. It is a fact that there is still a shortage of yarn, but it is amazing to find that there is so much yarn available in the blackmarket. How is it that some of these agencies—Kumar agency is one—are able to distribute yarn which is not available through the normal sources ? Surely by now the department should be able to ascertain how many different counts of yarn are needed for work in these handloom and powerloom centres ? I say that the department, and the department alone, should import yarn of all the necessary counts, should see to the question of dyeing, and should see that it is distributed through the co-operative unions to the various centres. If this is done I am certain there will not be any shortage of yarn nor will any loom in any of the centres lie idle as they are doing today.

The Hon. Minister of Home Affairs with the best of intentions opened a thousand centres. I think about 800 centres have already been completed. He has put up a Cabinet memorandum recommending that yarn be imported by weavers' unions. This was one of the answers of the Hon. Minister given to me last year. One year has already gone. I do not know whether the Hon. Minister has got his reply. And while he awaits a reply so many looms are lying idle today.

In the new centres that were set up it was stated that 25 weavers were to be trained in six months' time and given a loom to work in their homes. Is it not strange that today a weaver who goes to a government handloom centre and gets training cannot get a registered loom to work ? But in private workshops there are 30 to 40 looms working—the registered number of looms is only about eight—and they are able to get yarn to work all the looms. I have said, and I repeat it for the fifth time, that a proper investigation of the actual number of looms working in some of these private workshops will show where the yarn is going. The yarn should go to the government centres and co-operative societies where the looms are registered. The position is that yarn is not available to them. That is the shocking position. I have seen this happening in more than one village and in more than one centre. In some of the new centres handlooms are lying idle for lack of yarn, and demonstrators are not working because there is nothing to work with. Girls have gone home because there is nothing to weave. However, in private workshops, where only eight looms are registered, 35 to 40 looms are working today. I stress again the fact that yarn should be imported through the department and distributed through the co-operative unions and societies to various centres at which looms are registered.

I asked last year too what the Designs Section of the department has done, what part it has played. Nothing has been done to improve the design and quality of the handloom product or some of the other products that are produced by the department. I am quite sure that if you ask any official in the department he will tell you that no progress has been made. The Designs Department has not been reorganised. The Designs Department has not met the demand which is there today for good designs, for good colour combinations, and for quality material, and it is up to the Hon. Minister to see that this section is reorganized to meet these demands.

I mentioned schools last year. In India there is a school in which they give a three-year course in planning. Today the great problem we have to face is that weavers lack

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

even a basic knowledge. Take the demonstrators who are in charge of the schools. Here a school is handled by a mere demonstrator. Though he may be called "school assistant" he is a mere demonstrator. What are his or her qualifications? That is why I stressed last year too that the schools should be reorganized. You must provide courses in textile designing, textile technology, and textile weaving, so that those who pass out of these schools can go to the centres. You must recruit to the various centres only those who have passed from the school, so that you will not have these problems that you are having of turning out inferior quality products and a glut of inferior quality handlooms in the market. In fact I mentioned this last year, but nothing has been done.

ප. භා. 2.15

I have a centre in my electorate by the name of Kitharalana. I have asked for an inquiry regarding the running of the school there. The teacher does not recruit anybody locally, but gets her pupils from outside and charges exhibitant fees from them. Boarding fees are also charged from them and they are not even paid for the articles that they turn out in that centre. I do not know whether an inquiry has been conducted.

Another point I mentioned was that for the improvement of these handlooms, for improved weaving, dobbies and jacquards should be introduced. What has been done? The Hon. Minister has mentioned that training courses are being held and that people are being trained in this specialized work, but if you go to these centres, if you see the products that are being turned out, it will be obvious that no such training is being given to these people. I know of one centre where a demonstrator had been trained in dobby work. That was about seven years ago. But the dobbies are hanging there at the textile centre, and they are not being used. This sort of thing happens for the simple reason that the department does not take any follow-up action after giving this intensified training in dobby work and jacquard work. That is why we are not progressing in the handloom industry and that is why we are not progressing in the textile industry.

Recently the department participated in an International Handicrafts Fair at Frankfurt. The success of that participation was entirely due, I think, to the German Government taking a special interest in financing it. It spent a large sum of money both in connection with the Ceylon stand and in selecting and purchasing goods. I myself had a hand in some of the selections that were made, and I am glad that it was possible—I know the Hon. Minister himself tried—to see that the Director of Small Industries went and attended that fair on our behalf. He was not to have gone for the fair but I am glad to say that the Hon. Prime Minister appreciated that he should go when I spoke to him and explained the necessity for the Director attending the fair. And I think it was all for the good because we have been able to get large orders.

But I should like to caution the Hon. Minister on one matter, and that is that he should not take on more than what he can cope with. We have done well in that fair and I am sure we will do better in the coming fairs. But at this stage I would ask the Hon. Minister to see that the Hon. Minister of Commerce and Trade does not infiltrate into the workings of his department because I see the Hon. Minister of Commerce and Trade has asked the private sector to establish shops abroad. He is even willing to subsidize them to establish shops abroad.

If anything is to be sold abroad, I firmly believe that it should be done through Laksala and Laksala alone, and through the department. It is only then that we can have a proper control over the standard and quality of the goods and maintain the good name that Ceylon has acquired abroad. But if we do not do that

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඔබයසේකර මිය.]

and allow the private sector to sell our goods, they will make capital of the situation at the expense of the public sector and ultimately we might find that they do not even remit the money back but hold it in some private account abroad.

Then, I should like to ask the Hon. Minister what action he has taken on the proposed Handlooms Board and Handicrafts Board. I know that he has submitted a Cabinet Memorandum but nothing appears to have been done beyond that. It is absolutely essential that we should have a Handlooms Board and a Handicrafts Board. You may keep on opening more and more Laksalas like the C.W.E. shops, but I do not think that is really going to help the cause of handicrafts or the handloom industry. The idea of opening up Laksalas must be to create an incentive both to the craftsmen and to the workers of the area.

There is one other matter I wish to mention. Last year, a Member of the Upper House, Senator Mrs. Seneviratne, mentioned that Sir John Kotelawala and the members of the purple brigade had a hand in the setting up of Laksala. I do not want to talk too much about it. I think everyone knows what Sir John Kotelawala has done towards the arts and crafts of Ceylon. I do not want to mention all that. But people like Senator Mrs. Seneviratne should not make statements that are incorrect. I would like to tell her that if the people of Mirigama did elect me to that seat, it was because they realised that the S.L.F.P. Government had done something for the country by creating Laksala and giving a place to the handloom industry and the handicrafts of this country. This type of irresponsible talk by Senators, who should speak with a sense of responsibility, will do their party incalculable harm in the eyes of the country.

In this connexion I would like to observe that Senator Seneviratne has made a further diabolical statement regarding the recruitment of staff and employees at Laksala. I challenge her to prove one single instance where I used my position or influence. Those in authority will give her the reply. I would request the hon. Senator, without making these incorrect statements in the seclusion of the Senate, to give up her seat in the Senate and get herself elected in the correct way and come to this House, and I shall be more than pleased to debate this subject with her in this House. I wonder whether she will risk it.

Although Laksala shops are being opened at a terrific pace, there is one thing that I want to mention here. The members of the staff are already not happy there. I gather that two persons have been interdicted this week. The members of the staff are not happy in respect of promotions to posts of assistant managers. They are being overlooked and new people are being brought in. I think that before new people are brought in the people already there should be given a chance to prove themselves.

In the field of handicrafts I want to ask the Hon. Minister what progress is being made. Last year I spoke about pottery centres, needlework centres and brushwork centres, but we all know that in spite of the shortcomings that came to light after the two small exhibitions that were held nothing really has been done.

Then in regard to the Craftsmen's Association, why has it not been revived ? I referred to this last year. Why have not the members met ? Yet the president of that association, which ceased to function years ago, still serves on the Laksala Advisory Board. In what capacity ? How can he represent an association which is defunct ?

I would ask the Hon. Minister to have greater propaganda for and greater accent on the use of Ceylon goods. To do that we must realize the value of our handicrafts. I think it is absolutely necessary that we should realize that the skill of the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

fingers is ever a more highly-prized commodity in a world more and more flooded with the cold impersonality of machine-made goods.

The Hon. Minister should take definite steps to see that a Textile Ministry is established. More than that, he should see that a handloom board and a handicraft board are set up before long.

**ජෝර්ජ් අබයගුණසේකර මයා.** (හඟුරන් කෙත)

*(திரு. ஜோர்ஜ் அபயகுணசேக்கர—ஹன் குராங்கெத்த)*

(Mr. George Abeyagoonasekera—Hanguranketa)

ගරු සභාපතිතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් යටතේ සාකච්ඡාව පවත්වන මේ අවස්ථාවේ හඟුරන්කෙත මැතිවරණ කොට්ඨාශයට අදාල වන කරුණු ස්වල්පයක් ගැන ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වන සේ කථා කරන්නටයි මා නැඟී සිටියේ. මේ දවස්වල සියලු දෙනාගේම වාගේ ශ්‍රමය විශේෂයෙන්ම මේ රටේ ආහාර සුලභ කිරීමේ භාරදූර කාර්යය කෙරෙහි බහුල වශයෙන් යෙදෙන නිසා ග්‍රාමසේවක කොට්ඨාශ නැවත වරක් බෙදා වෙන් කිරීමේ කටයුත්ත තරමක් අමාරු වුවත්, අවශ්‍ය දෙයක් වී තිබෙනවා. ග්‍රාම සේවක කොට්ඨාශ විශාලත්වයෙන් අඩු කර, දැනට වඩා කුඩා කොට්ඨාශ බවට පත් කිරීම උචිත බවට නිර්දේශ කර තිබෙනවා. කඩා වෙන් කර, ප්‍රමාණයෙන් කුඩා කොට්ඨාශ බවට පත් කළ යුතුයයි නිර්දේශ කරන ලද ග්‍රාමසේවක කොට්ඨාශවලට අලුතින් ග්‍රාම්සේවක නිලධාරීන් පත් කිරීම හැකි තාක් ඉක්මනින් කළ යුතුව තිබෙනවා. ඒ නිසා ඒවාට නිලධාරීන් අලුතින් පත් කිරීම වහාම සිදු කරන්නට අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

හඟුරන්කෙත කොට්ඨාශය ගැන අමුතුවෙන් විස්තරයක් කරමින් එය හඳුන්වා දෙන්නට මේ අවස්ථාව නොවන බව මා පිළිගන්නවා. එහෙත් හඟුරන්කෙත කොට්ඨාශය ඓතිහාසික ස්ථානයක් බව තමුන්නාන්සේ දන්නවා. මෙය සභ[illegible] කළ කෙතක් හැටියට ප්‍රසිද්ධියක් උසුලන අතර, පුරාණ කාලයේ සිංහල රජ දරුවන්ගේ ආරක්ෂාව සැලසූ ස්ථානයක් බවත් මතක් කරන්නට කැමතියි. ඒ නිසා ඒ කාලයේ හඟුරන්කෙත මහනුවර සමග ඉතා කිට්ටු සම්බන්ධකමක් ඇතිව තිබූ ස්ථානයක් හැටියට සඳහන් කරන්නට පුළුවනි. මේ සථානයේ වාසය කළ මිනිසුන්ගේ විශේෂ නෑදෑ සම්බන්ධකම් මෙන්ම ගනුදෙනු ආදිය පිළිබඳ සම්බන්ධකම් පවා වැඩි වශයෙන්ම ඒ කාලයේ තිබුණේ මහනුවර සමගයි. අදත් ඇත්ත වශයෙන්ම හඟුරන්කෙත ජනයා වැඩි වශයෙන් සම්බන්ධකම් ඇතිව සිටින්නේ මහනුවර සමගයි. ඔය ආදී නොයෙකුත් වැදගත් කරුණු රාශියක් සැලකිල්ලට භාජන කිරීමෙන් පසු හඟුරන්කෙත ඡන්දදායක කොට්ඨාශය මහනුවර පරිපාලන කොට්ඨාශයට හෙවත් දිස්ත්‍රික්කයට යා කරන්නට පුළුවන් නම් යෝග්‍යයයි සිතා ඉදිරිපත් කරන ලද එක් වැදගත් යෝජනාවක් අනුව මහනුවර දිස්ත්‍රික් සම්බන්ධිකරණ කාරක සභාව හෙවත් කමිටුවත්, නුවර එළියේ දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවත්, එය එසේ කළ යුතුයයි නිර්දේශ කර තිබෙනවා. මේ යෝජනාව ඒ ආකාරයෙන්ම පිළිගෙන ක්‍රියාත්මක කරන්නට පුළුවන් නම් එයින් මහජනයාට ලැබිය හැකි විපුල ප්‍රයෝජනය ගැන සලකා මහජන පහසුව මෙන්ම මහජන යහපත සැලසෙන පිණිස එය හැකි තාක් ඉක්මණින් ක්‍රියාත්මක කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලය ගැනත් වචනයක් කියන්නට තිබෙනවා. හඟුරන්කෙත ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කාර්යාලය පවත්වාගෙන යන්නේ කුලියක් ගෙවන ගොඩනැගිල්ලකයි. එහි ඇති ඉඩකඩ ප්‍රමාණයත් මෙවැනි වැදගත් කාර්යාලයකට ප්‍රමාණවත් නැහැ. වෙනත් පහසුකම් සඳහාත් මෙහි ඉඩකඩ නැහැ. මේ ගැන මීට පෙරත් මේ ගරු සභාවේදී මම සඳහන් කළා. ඒ අදහසට අනුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තිබෙන ගොඩනැගිල්ලටම ගෙන ගියොත් ගෙවල් කුලී ආදිය වෙනුවෙන් ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාට වියදම් අඩු වෙනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් අබයගුණසේකර මයා.]

පමණක් නොව වෙනත් අමාත්‍යාංශවලටත් විශාල මුදලක් ඉතිරි කර ගන්නට පුළුවන් වන බව මට මේ අවස්ථාවේ කියන්නට පුළුවනි.

රටේ හැම තැනම වාගේත්, විශේෂයෙන්ම ගම්බද ප්‍රදේශවලත්, හැම දෙනාම පාහේ කථා කරන්නේ තමන්ගේ විවාහය නීත්‍යානුකූලව ලියා පදිංචි නොකර අඹුසැමියන් වශයෙන් ජීවත් වන ජෝඩු ගැනයි. එවැනි ජෝඩු දහස් ගණනක් අද මේ රටේ සිටින බව තමුන්නාන්සේ දන්නවා. මේ සම්බන්ධයෙන් අද ග්‍රාමසංවර්ධන දෙපාර්තමේන්තුව මගින් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. එහෙත් මීට වඩා හොඳ ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් වැඩ පිළිවෙලක් මේ සම්බන්ධයෙන් ඇති කරතොත් වඩා හොඳයි. විශාල ප්‍රචාරයක් කරමින් ප්‍රසිද්ධියේ මෙවැනි ජෝඩු එකතු කරගෙන විවාහ ලියා පදිංචි කරන්නට කටයුතු නොකර, අපේ සමාජ තත්ත්වය ගැන කල්පනා කර, ඒ පිළිබඳ නිසි අවබෝධයක් ලබාගෙන, සමාජ චාරිත්‍රවලට පටහැනි නොවන විධියට රහස්‍ය භාවය ආරක්ෂා කරමින් ඒ උදවිය නීත්‍යානුකූලව ලියා පදිංචි කරවීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ඇති කළොත් සත්තකින්ම දැනට වඩා හොඳ ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් වනු ඇතැයි මා විශ්වාස කරනවා. තවමත් අවිවාහකයකු ලෙස සිටින අපේ තරුණ ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා සමහර විට කසාද සහ දික්කසාද ගැන වැඩි සැලකිල්ලක් නොදක්වනවා වෙන්නට පුළුවනි. ඒ කෙසේ වෙතත්, සමාජ සේවයක් කරන්නට අවස්ථාවක් එතුමාට දැන් ලැබී තිබෙන බව නම් නොකියාම බැහැ.

ගරු සභාපතිතුමනි, අද මේ ගරු සභාවේදී ගරු මන්ත්‍රීන් බොහෝ දෙනෙක් රෙදි විවීම ගැන කථා කළා. ලංකාවේ පේෂ කර්මාන්තය ගැන කථා කරන විට කිසිම කෙනකුට අමතක නොවන පුද්ගලයන් කීප දෙනකු ගැන කල්පනා කරන්නට ඕනෑ. මේ අවස්ථාවේ ඒ උදවිය කෙරෙහි අපේ කෘතගුණ සැලකීමක් හැටියට, ස්වදේශීය නිෂ්පාදන වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ආත්ම පරිත්‍යාගයෙන් කටයුතු කළ ඒ අය සිහිපත් කළ යුතුයි, තිබෙනවා. රෙදිපිළි නිෂ්පාදනය සම්බන්ධයෙන් මේ රටේ පුරෝගාමීව කටයුතු කළ දිවංගත ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා, හේවාවිතාරණ මහත්මා සහ මහනුවර දොළපිහිල්ලේ මහත්මාත් මේ අවසථාවේ ගෞරවයෙන් මතක් කරන අතර; මගේ කොට්ඨාශයට පැමිණ එහි විදුලි බල පේස කර්ම මධ්‍යස්ථානයක් සඳහා මුල්ගල් තැබීම ගැන ගරු ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඒ විදුලි බල පේෂකර්ම මධ්‍යස්ථානය විවෘත කරන්නට නැවතත් මගේ කොට්ඨාශයට පැමිණෙන ලෙස තව මාස දෙකකින් පමණ ගරු ඇමතිතුමාට ආරාධනය කරන්නට මම බලාපොරොත්තු වෙනවා. ඒ සමගම, ගරු ඇමතිතුමා මගේ ප්‍රදේශයට නිර්දේශ කළ අත් යන්ත්‍ර පේසකර්ම මධ්‍යස්ථාන හත දැන් සංවිධානාත්මකව බොහොම හොඳට වැඩ කරගෙන යන බව මතක් කරන්නට කැමතියි.

මගේ කොට්ඨාශයේ අත් යන්ත්‍ර පේස කර්ම මධ්‍යස්ථානවලින් නිපදවනු ලබන රෙදිපිළි අලෙවි කර ගැනීම සම්බන්ධයෙන් ඒ තරම් බරපතල අමාරුවක් මට නැහැ. ගරු ඇමතිතුමා මාගේ කොට්ඨාශයට පැමිණි අවස්ථාවේ මතක් කළා වාගේ ඇත්තෙන්ම කොළඹ හතේ, කුරුඳුවත්තේ, නෝනා මහතුන්ගේ සහයෝගය ලැබිය යුතු තරමට ලැබෙනවා නම් මේ මධ්‍යස්ථානවල නිපදවන සාරි ආදිය අලෙවි කිරීම කිසිම විධියකින් ප්‍රශ්නයක් නොවෙන්නට පුළුවනි.

ගරු සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ගැන කල්පනා කරන විට අපට සතුටට පත්වන්නට බැහැ. මට මතකයි මා රජයේ සේවයේ සිටියදී මේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය මගින් හොඳ සේවාවක් සැලසෙන අන්දමට කටයුතු කෙරුණා. එහෙත් අද එය ඒ තරම් සාර්ථක අන්දමින් කෙරෙනවාය යයි කියන්නට අමාරුයි. ඒ නිසා ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය සාර්ථක කර ගැනීම සඳහා ග්‍රාම සංවර්ධන නිලධාරී මහත්වරුන් හා ප්‍රාදේශීය ආදායම් නිලධාරී මහත්වරුන් සුදුසු අන්දමින් කටයුතු කරනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා මගේ කොට්ඨාශයට පැමිණ සුළු පේසකම් ප්‍රදර්ශනයක් නැරඹූ අවස්ථාවේ කඳවල පිටියේ තරුණියින් දෙදෙනෙක් බතික් රෙදි සෑදීමේ කටයුත්ත පටන් ගෙන තිබෙන බව දැක්කා. ස්වෝත්සාහයෙන් කරන ඒ රක්ෂාව සඳහා ඔවුන්ට යම් ආධාරයක් දීමට කටයුතු කරන්නය කියා මා අමාත්‍යාංශයට ලියමනකුත් යැව්වා. එහෙත් තවමත් එවැනි යමක් සිදු වී නැහැ. රෙදි විවීමේ මධ්‍යස්ථානවල විශාල වශයෙන් රෙදිපිළි ගබඩා කර තිබෙනවා. ළඟදී හඟුරන්කෙත ප්‍රදේශයේ හොරකම් දෙක තුනක් ඇති වුණා. ගබඩා කඩා රෙදි පිළි අරගෙන ගොස් තිබුණා. ඒ නිසා ඒ ස්ථානවල ආරක්ෂාව පිණිස අමාත්‍යාංශය මගින් හෝ දෙපාතීමේන්තුව මගින් හෝ මුරකරුවන් පත් කිරීම වැනි ක්‍රමයක් ඇති කළොත් හොඳයි කියා මා හිතනවා. එසේ නැතිව හොරකම සිදු වුණාට පසුව පොලිසියේ හෝ ග්‍රාම සේවකයාගේ ආධාරය ඇතිව ඒ අයට සහනයක් ලබා දෙන්නට කටයුතු කිරීම හුඟක් අමාරුයි.

අ. භා. 2.30

උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාතීමේන්තුවේ කොමසාරිස්තුමාටත් ගරු ඇමතිතුමාටත් මට කලින් කථා කළ ගරු මන්ත්‍රීන් පිදූ මල් මාලාවලට අත ගසා එයට සම්මාදම් වීමට මාත් අදහස් කරනවා. ගම්වල ආර්ථික සංවර්ධනය, පාරවල් කැපීම, පාසල් ගොඩනැගිලි තැනීම, ජල සම්පාදන යෝජනා ක්‍රම ඇති කිරීම ආදී වශයෙන් විපුල සේවයක් එම දෙපාර්තමේන්තුවෙන් කෙරී තිබෙන බව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. තවත් කියයුතු කරුණක් තිබෙනවා. මේ සංවර්ධන කටයුතු සඳහා අපි විශාල මුදලක් වෙන් කරනවා. එසේ වෙන් කරන මුදල සාධාරණ අන්දමට නිසි ලෙස වියදම් කෙරෙනවාද කියා මට සැකයක් තිබෙනවා. 1965 දී වල්ජම්බුගහ උඩවත්ත කියන පාරේ වැඩ පටන් ගත්තා. එදා සිට අද වන තුරුම කර තිබෙන ප්‍රමාණය හැතැප්ම $\frac{1}{4}$ කට වඩා නැහැ. එවැනි ස්ථානවල තිබෙන සිමෙන්ති යකඩ ආදියත් නැති වෙනවා. ඒ නිසා ඒවායේ ආරක්ෂාව සඳහා උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාතීමේන්තුවත් රජයේ වැඩ දෙපාතීමේන්තුවත් කටයුතු කරනවා ඇත කියා මා බලාපොරොත්තු වෙනවා.

මගේ කථාව මීට වඩා දීර්ඝ කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන්ම උඩරට දියුණුව පිණිස කටයුතු කරන ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ සෑම අංශයකම නිලධාරි මහත්වරුන්ට අපේ ප්‍රශංසාව මේ අවස්ථාවේදී පුද කරන්න කැමැතියි. ගරු ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා ජනප්‍රිය පුද්ගලයෙක්, ජනප්‍රිය ඇමති කෙනෙක්. එතුමා හැම විටම ආණ්ඩු පක්ෂයේත් විරුද්ධ පාර්ශ්වයේත් මල් පොකුරු ලබා ගන්නට හැකි වන අන්දමට කටයුතු කරනවා දැකීම අප කාගේත් සන්තෝෂයට හේතුවක්. ඒ නිසා එතුමාට යළිත් මේ අන්දමට මහජන කටයුතු කරන්නට වාසනාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

ගරු සභාපතිතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ගැන කථා කරන්නට බලාපොරොත්තු වන මේ අවස්ථාවේ සුරාබදු දෙපාතීනේතුව ගැන වචන ස්වල්පයක් කියන්නට කැමතියි. මේ අවස්ථාවේ ගරු මන්ත්‍රීවරුන් හුඟ දෙනෙක්ම කියා සිටියා ඉතා භයානක අන්දමින් පැතිරී යන කසිප්පු වසංගතය ගැන. අද මේ රටේ කසිප්පු ව්‍යාපාරය පැතිරී තිබෙන අන්දම ගැන බලන විට මේ ආණ්ඩුව ලජ්ජා වන්නට ඕනෑ. සුරාබදු දෙපාර්තමේන්තුව කොයිතරම් උත්සාහයෙන් වැඩ කළත්, සුරාබදු දෙපාර්තමේන්තුවට කසිප්පු වසංගතය මැඩ පවත්වන්නට කොයිතරම් ඕනෑකමක් තිබුණත්, සුරාබදු දෙපාර්තමේන්තුවට අවශ්‍ය රථවාහන, මිනිස් බලය හා වෙනත් බලතල සෑහෙන තරමකින් සපයා නොදී, ඒ කාර්යාලවල කටයුතු කරගෙන යාමට ආධාර දීමේදී රජය දක්වන උදාසීනත්වය නිසා මේ රටේ කසිප්පු වසංගතය මැඩ පවත්වන්නට සුරාබදු දෙපාර්තමේන්තුව අපොහො

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org
3052

[තුඩාවේ මයා.]
සත් වී තිබෙනවා. සභාපතිතුමනි, සුරාබදු දෙපාර්තමේන්තුව මගින් මේ රටට විශාල ආදායමක් ලැබෙනවා; කෝටි සංඛ්‍යාත ධනයක් ලැබෙනවා. එහෙත් එයින් සියයට එකක තරමවත් මුදලක් මේ දෙපාර්තමේන්තුව දියුණු කිරීමට හා කාර්යක්ෂම කිරීමට යොදවන බවක් අපට පෙනෙන්නට නැහැ.

අද සුරාබදු කාර්යාලයේ එළිපත්ත ළඟ ඉඳගෙනම කසිප්පු විකුණන බවයි අපට දැනගන්නට තිබෙන්නේ. [බාධාකිරීමක්] පොළොන්නරුවේ ගරු මන්ත්‍රීතුමා කිය නවා, (විජේසිංහ මයා.) සුරාබදු කාර්යාල ඇතුළෙත් කසිප්පු විකුණනවා කියා. කසිප්පු වසංගතය මැඩ පවත්වන්නෙ නැත්නම් ආණ්ඩුවට ලැබෙන ආදායම අඩු වෙනවා පමණක් නොවෙයි, එය ජාතියේ සෞඛ්‍යයටත් ලොකු තර්ජනයක් වෙනවා. මේ රටේ වෛද්‍යවරුන්ගේ වාර්තා අනුව ආමාශගත රෝගවලින් වැඩි හරියක් කසිප්පුවලින් හැදෙන බවයි නිගමනය කර තිබෙන්නේ. මේ නිසා මේ ව්‍යාපාරය නැවැත්වීම ජාතියට කළ හැකි ඉතාම උසස් සේවයක්. එහෙත් මේ රටේ කසිප්පුකරුවන් ආණ්ඩුවටත් වඩා බල වත් පිරිසක්. කසිප්පුකාරයින් එකතු වෙලා නිසා කසිප්පුකාරයින්ගේ බලය නැති කිරීමට මේ ආණ්ඩුව එතරම් උත්සාහයක් නොගන්නා බවයි, අපට කියන්නට සිදු වී තිබෙන්නේ. කසිප්පු ව්‍යාපාරය මැඩ පැවැත්වීමට ඇමතිතුමාට වුවමනා වුණත්, ආණ්ඩුවේ මේ ප්‍රතිපත්තිය නිසා ඒ අදහස ක්‍රියාත්මක කරන්නට බැරි වී තිබෙනවා. සුරාබදු දෙපාර්තමේන්තුව කාර්යක්ෂම කිරීම පිණිස සුරාබදු පරීක්ෂකවරුන් සහ ගාඩ්වරුන් 700 ක් පමණ ලබා දෙන්නට ඇමතිතුමා බලාපොරොත්තු වුණු බව මා දන්නවා. එහෙත් ලබා ගන්නට පුළුවන් වුණේ පරීක්ෂකවරුන් 6 දෙනෙකු සහ ගාඩ්වරුන් 6 දෙනෙකුන් පමණයි. 700 ක් සඳහා මුදල් ඉල්ලා සිටි විට මුදල් ලැබුණේ 12 දෙනෙකු පත් කරගැනීමටයි. මේ වගේ තත්ත්වයක් තිබෙන විට කසිප්පු ව්‍යාපාරය නැති කර දමන්නෙ කොහොමද ? මේ ආණ්ඩුව රටට ජාතියට ආදරයක් තිබෙනවා නම්, ආගම් භක්තියක් තිබෙනවා නම්, කසිප්පු ව්‍යාපාරය සම්පූර්ණයෙන් නැති කර දැමීමට ක්‍රියා කළ යුතු බව මතක් කරන්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, මේ දෙපාර්තමේන්තුව කාර්යක්ෂම කිරීමට අවශ්‍ය නිලධාරීන් සහ වාහන සපයා අවශ්‍ය බලයත් දෙනවා නම්, මේ නිලධාරීන් ඔවුන්ගේ යුතුකම් කොටස ඉටු කර ගරු ඇමතිතුමාගේ අදහස පරිදි කසිප්පු ව්‍යාපාරය නැති කර දමා මේ රටට තවත් ආදායම් ලැබෙන විධියට කටයුතු කරයි කියා මා විශ්වාස කරනවා. අරක්කු විකිණීමට බලය තිබෙන තැන්වලින් මහජනයාට අරක්කු වෙනුවට ලැබෙන්නේ කසිප්පුය කියා පැමිණිලි තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් සොයා බලා ඒ කුටෝපක්‍රම නැවැත්වීමට ඇමතිතුමා ක්‍රියා කරනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව ඉතා වැදගත් දෙපාර්තමේන්තුවක්. පළමුකොට එයින් ග්‍රාම සංවර්ධන අංශය ගෙන බලමු. අද මේ රටේ ඇති ග්‍රාම සංවර්ධන සමිති බොහොමයක්ම නාම පුවරුවලට පමණක් සීමා වී තිබෙනවා. එවැනි සමිති සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට කොතෙක් පැමිණිලි කෙරුණත්, එම පැමිණිලි සම්බන්ධයෙන් නිලධාරීන් සැලකිල්ලක් දක්වන බවක් නම් පෙනෙන්ට නැහැ. පරවාහැර ග්‍රාම සංවර්ධන සමිතිය 1958න් පසු මේ දක්වාම රැස් වී නැහැ. සමිතිය රැස් කිරීම සඳහා ප්‍රදේශයේ මහජනතාව ලොකු උත්සාහයක් දැරුවා. මෙවැනි බොහොමයක් ග්‍රාම සංවර්ධන සමිති, නිලධාරීන් කිහිප දෙනකුගේ පෞද්ගලික බූදල හැටියට පරිහරණය වෙමින් කොන්ත්‍රාත් මඟින් ඔවුන්ගේ ලාභ ප්‍රයෝජන සලසන ආයතන බවට පත් වී තිබෙනවා මිස, ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය කෙරෙහි මහජන හැඟීම් උද්දීපනය කරමින් ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කෙරෙන නියම ග්‍රාම සංවර්ධන සමිති වශයෙන් පවතින්නේ නැහැ. එම නිසා, කිසිම වැදගත්කමක් නැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තත්ත්වයකට පත් වී ඇති එම සමිති ඒ අනතුරින් මුදා ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

රැකීරක්ෂා නැති තරුණ තරුණියන් විශාල පිරිසක් මේ රටේ සිටිනවා. ඔවුන් රැකීරක්ෂාවලට යොමු කරවමින් මේ රටේ ජාතික ධනය වැඩි කරන අතර, ඔවුන්ට ජීවත් වීමට මාර්ගයක් සලසා දෙන්නත් වැඩ පිළිවෙළක් සකස් කරන්න මෙම දෙපාර්තමේන්තුවේ කුඩා කර්මාන්ත අංශ යට පුළුවන්කම තිබෙනවා. එහෙත් ඒ සඳහා විධිමත් සැලැස්මක් ඇති කිරීමට එම දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබෙනවා. ඒ ඒ ප්‍රදේශවල ඇති අමු ද්‍රව්‍ය පිළිබඳව පරීක්ෂණ කොට ඒවායින් නියම ප්‍රයෝජන ගැනීමට මෙතෙක් කිසිවක් කෙරී නැහැ. මාතර ඡන්දදායක කොට්ඨාශ යේ විශේෂයෙන් කොහු කර්මාන්තය දියුණු කරන්නට පුළුවනි. මඩිහ, පොල් හේන හා වල්ගම යන ගම්මානවල කොහු කර්මාන්තයේ යෙදී සිටින උදවියට සහන යක් සැලසීම සඳහා ඒ ප්‍රදේශයට කොහු කර්මාන්තශාලාවක් ලබා දිය යුතු යයි මේ ගරු සභාවට මා ඉදිරිපත් කළ යෝජනා වක් සම්මත වුණා. ඇමතිතුමාගේ නියමය අනුව ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ආදායම් නිලධාරීතුමා විසින් කැඳවුණු සාකච්ඡාවට ග්‍රාම සංවර්ධන සමිති නියෝජිතයන් හා ගම් සභාපතිවරයාත් සමග මාත් සහභාගි වුණා. වල්ගම හෝ මඩිහේ එම කොහු කර්මාන්තශාලාව වහාම පිහිටුවීම සඳහා ඉඩමක් දෙන්නටත් ලෑස්ති බව අප එහිදී කියා සිටියා. අපේ අදහස් සාධාරණ බව එහිදී පිළිගැනුණා. එහෙත් තවමත් ඒ යෝජනාව ක්‍රියාත්මක වී නැති බව කණ ගාටුවෙන් මතක් කරන්නට සිදු වී තිබෙනවා. එම නිසා, පොල් ලෙලි පල් කිරීමේ හා කොහු කර්මාන්තයට අදාළ අනෙක් වැඩවල යෙදී සිටින දහස් සංඛ්‍යාත පිරිසකට සහනයක් සැලසීම සඳහා ඒ ප්‍රදේශයේ වහාම කොහු කර්මාන්ත ශාලාවක් පිහිටුවන ලෙස මා ඉල්ලා සිටිනවා.

මැටි කර්මාන්තය සම්බන්ධයෙන් කියන්නට තිබෙන්නේත් එයමයි. වල්ගමෙ උතුරේ මැටි කර්මාන්තශාලාවක් තිබුණා. දැන් එය වසා දමා තිබෙනවා. එම කර්මාන්තශාලාවේ වහළ කඩාවැටෙන තත්ත්වයක තිබෙන බව ලියුම් කීපයක්ම යවා පෙන්නුම් කර දුන්නාට පසුවයි, එය අළුත්වැඩියා කරන්නට පුළුවන් වුණේ. දැන් එය ගම්මුන් අතින් අළුත්වැඩියා වේ ගෙන යනවා. අවුරුදු ගණනාවක් තුළ එම කර්මාන්තශාලාව පාවිච්චියට නොගෙන අත්හැර දමා තිබුණා. මේ අන්දමින් මහ ජන මුදල් නාස්ති වන්නට ඉඩ හරින්නේ ඇයිදැයි මා අහනවා. එම ගොඩනැගිල්ල මැටි කර්මාන්තයේ යෙදී සිටින ඒ ප්‍රදේශ යේ ජනතාවගේ ප්‍රයෝජනය පිණිස හෝ වෙනත් කර්මාන්තයක් සඳහා හෝ යොදා ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

පේෂකර්මය ගැනත් වචනයක් දෙකක් කියන්නට ඕනෑ. පේෂකර්ම බලවේග යන්ත්‍ර කාර්මිකයන්ගේ වැටුප් ක්‍රමයක් ඇති කිරීම සම්බන්ධයෙන් අද උදේ නැඟූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් පාර්ලි මේන්තු ලේකම්තුමා කීවා, පිළිතුරු සභා ගත කරනවාය කියා. සභාගත කරන ලද එම පිළිතුර අපට නොලැබුණු නිසා ඒ වැටුප් ක්‍රමය සකස් කරනවාද නැද්ද යන වග අප දන්නේ නැහැ. නොයෙක් නො යෙක් ප්‍රදේශවල විදුලි බලවේග පේෂ කර්ම මධ්‍යස්ථානවල වැඩ කරන සේවක යන්ට ඒකාකාරව නොසලකන නිසාත්, ඒකසමාන වැටුප් ක්‍රමයක් නොගෙවන නිසාත් ඔවුන් අතර විශාල අසහනයක් ඇති වී තිබෙනවා. එමනිසා සියලුම පේෂ කර්ම සේවකයන්ගේ සේවය ඒකම තත්ත් වයකට පරිවර්තනය කිරීමට වහාම වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මගේ ඡන් දදායක කොට්ඨාශයේ ඉසදීන් නගරයේ පේෂකර්ම මධ්‍යස්ථානය මෙකී විසමතාවට උදාහරණයක් වශයෙන් දක්වන්නට පුළු වනි. මෙහි සේවකයන්ට ඉතාම සුළු වැටුපක් ගෙවන බවට ඔවුන් අතර විශාල දුක් ගැනවිල්ලක් තිබෙනවා. ඉසදීන් නගර යේ පේෂකර්ම මධ්‍යස්ථානයේ සේවක යන්ට ගෙවනු ලබන්නේ යටියන හා හක්මන මධ්‍යස්ථානවල සේවකයන්ට ගෙ වනවාට වඩා අඩු වැටුපක්. යටියන, හක් මන හා ඉසදීන් නගරය යන මධ්‍යස්ථාන තුනේ ගෙවනු ලබන්නේ තුන් ආකාරයක වැටුපක්. මේ වෙනස නැති කොට, මුළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]
ලංකාවේ සෑම තැනම එකම සේවයේ යෙදී සිටින පේසකාර්මිකයන්ට එක සමාන වැටුප් ක්‍රමයක් ඇති කිරීම ඉතාමත් කාලෝචිත බව මා මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මතක් කරනවා.

අ. භා. 2.45

ඉසදීන් නගරයේ පේසකර්ම මධ්‍ය ස්ථානයේ සේවකයන් තුළ විශාල කළකිරීමක් තිබෙන බව විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. සේවකයන් තෘප්තිමත් නොකර, ඔවුන්ගේ දුක් ගැනවිලිවලට ඇහුම්කන් නොදී මෙම මධ්‍යස්ථානය භාර නිලධාරියා වැඩ කරගෙන යාමේ ප්‍රතිඵල යක් වශයෙන් එහි ඉතාම ආකුල ව්‍යාකුල තත්ත්වයක් ඇති වී තිබෙනවා. පේෂ කර්මාන්තය ගැන හෝ වෙනත් කර්මාන්තයක් ගැන හෝ කිසිම දැනීමක් නැති, කච්චේරියක සිටි ලියන මහත්මයකුට පේසකර්මාන්ත මධ්‍යසථානයක් භාර දුන් විට ඒ ස්ථානයේ වැඩ හරියාකාර කෙරෙන්නේ කොහොමද? මෙවැනි මධ්‍යස්ථානයකින් නියම ප්‍රයෝජනය ලබා ගත හැකි වන්නේ පේසකර්මාන්තය පිළිබඳ පුහුණුවකුත් කාර්මික දැනීමකුත් ඇති කෙනකු එහි භාරකාරත්වයට පත් කිරීමෙන් පමණයි. ඉසදීන් නගරයේ පේසකර්ම මධ්‍යස්ථානයේ සේවකයන්ට ඇඳුම් මාරු කර ගැනීමට තැනක් නැ; කෑම කන්න තැනක් නැ; බොන්න වතුර නෑ. මෙම දුක්ගැනවිලි පිළිබඳව පෙත්සමක් මා ගරු ඇමතිතුමාටත් ඉදිරිපත් කළා. එම නිසා මේ කරුණු ගැන වහාම පරීක්ෂණයක් පවත්වා මෙමෙ සේවකයන්ට සහනයක් ලබා දීමට කටයුතු යොදන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඊළඟට, උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව ගැන වචනයක් කිව යුතුව තිබෙනවා. මෙම කොමිෂන් සභාව පිහිටුවන ලදද්ද්, අධිරාජ්‍ය යුගයේදී නැමි ජනතාවට සිදුවුණු විශාල පාඩු මකා දමා ඔවුන්ට කිසියම් සහනයක් සලස්වා ඔවුන්ගේ තත්ත්වය දියුණු කිරීම සඳහායි. එය වැදගත් කරුණක්. මා එයට විරුද්ධ වන්නේ නැහැ. එහෙත් උඩරට ගම්මාන මෙන්ම නොදියුණු තත්ත්වයේ පවතින වෙනත් ගම්මාන ලංකාවේ නොයෙක් ප්‍රදේශවල තිබෙනවා. ගම් කීපයක් උඩරට ගැමි කොමිෂන් සභාවට අළුතෙන් ඇතුළත් කළ යුතුය යන අදහසක් මිහින්තලේ මන්ත්‍රීතුමා (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.) ප්‍රකාශ කළා. නොදියුණු ගම් පිළිබඳ ප්‍රශ්නය උඩරටට සීමා වුණු ප්‍රශ්නයක් නොවෙයි. එය මුළු ලංකාවටම පොදු ප්‍රශ්නයක්. එම නිසා ලංකා ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව නමින් කොමිසමක් පත් කොට මුළු ලංකාවේම නොදියුණු ගම් ගැන විශේෂ පරීක්ෂණයක් පවත්වා උඩරට පහත රට භේදයක් නැතිව එම ගම් දියුණු කිරීමට ඒ කොමිසමට නියම කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ග්‍රාම නාම සම්බන්ධවද ඉදිරිපත් කළ යුතු කරුණක් තිබෙනවා. යම් යම් ජන කොටස්වල කුළ නාමයන්ගෙන් හැඳින්වෙන ගම්වල නම්, එම ගම්වල බහු ජන මතයත්, ග්‍රාම සංවර්ධන සමිති හා ප්‍රජා මණ්ඩල වැනි ආයතනවල අදහස් උදහසුත්, විහාරාධිපති ස්වාමීන් වහන්සේලාගේ මතත් විමසා බලා වෙනස් කරන ලෙස ගරු ඇමතිතුමා නියමයක් කර තිබුණා. මගේ ඡන්දදායක කොට්ඨාශයේ කුඹල්ගම නම් ගමක් තිබෙනවා. එම නම වෙනස් කර ගැනීමට එහි ජනතාවටත් ගම් කාර්ය සභාවටත් ග්‍රාම සංවර්ධන සමිතියටත් ගමේ විහාරාධිපති හාමුදුරුවන්ටත් ඕනෑකම තිබෙනවා. ඒ අනුව ඉල්ලීමක් කළ නමුත් එය ක්‍රියාත්මක වුණේ නැහැ. තම ගම්වල නම් වෙනස් කර ගැනීමට මහජනයා දක්වන සැලකිල්ල ගැන කල්පනාව යොමු කරන මෙන් දිසාපතිවරුන්ට නියම කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. තව එක කාරණයක් ඉදිරිපත් කර මගේ කථාව අවසාන කරනවා. අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමාගේ කාලයත් මට ගන්නට කී බව සංවිධායකතුමාට කිව්වා.

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

තව කීප දෙනෙකුම ඉන්නවා. කරුණාකර මිනිත්තු පහකින් අවසාන කරන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඊළඟට ග්‍රාම සේවකවරුන්ගේ දුක් ගැනවිලි සම්බන්ධව කරුණු කීපයක් ඉදිරිපත් කරන්නට තිබෙනවා. ශ්‍රී ලංකා එක්සත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ග්‍රාම සේවක සංගමය මගින් ගරු ඇමති තුමාට ඉල්ලීම් 58 ක් ඉදිරිපත් කළ බව මතක ඇති. ගරු ඇමතිතුමා ඒවා පිළිබඳව සාකච්ඡාවක් කළා. ඒ සාකච්ඡාවේදී ඉල්ලීම් 45 ක් දෙන්නට ගරු ඇමතිතුමා පොරොන්දු වුණා. ඒ ඉල්ලීම් 45 න් දැනට කීයක් ඉෂ්ට කර තිබෙනවාද කියා මා දැනගන්නට සතුටුයි.

නිල නාමය වෙනස් කරන මෙන් මේ ශ්‍රී ලංකා එක්සත් ග්‍රාම සේවක සංගමය ඉල්ලීමක් කළා. ග්‍රාම සේවක කියන නම වෙනුවට ග්‍රාම සේවා නිලධාරී යන නම යොදන මෙන් ඉල්ලීමක් කළා. ඒක ඉෂ්ට කරනවය කියා ගරු ඇමතිතුමා පොරොන්දු වුණා ; නමුත් මේ දක්වා ඒක ඉෂ්ට කර නැහැ.

ඒ වාගේම ග්‍රාම සේවක කොට්ඨාශවල කාර්යාලයක් සහ නිල නිවාසයක් ඇති කිරීමටත් රුපියල් 20 ක මාසික දීමනාවක් ගෙවීමටත් පොරොන්දු වී තිබෙනවා ; ඒකත් ඉෂ්ට කර නැහැ.

දක්ෂතාවත් හා පලපුරුද්ද අනුව ග්‍රාම සේවකවරුන්ට පරිපාලන සේවය දක්වා උසස් වීමේ ක්‍රමයක් ඇති කිරීමටද පොරොන්දු වී තිබෙනවා ; ඒකත් ඉෂ්ට කර නැහැ.

මිල පාලන පරීක්ෂක, ග්‍රාම සංවර්ධන නිලධාරී, සමාජ සේවා, ඉඩම් කච්චේරි පරි පාලක, ඉඩම් නිලධාරී, යන තනතුරුවලට සහ සතර වසක සේවයෙන් පසු විධායක ලිපිකරු සේවයේ දෙවන පෙළ විභාගයට පෙනී සිටීමට සහනයක් ලබා දෙන්නට පොරොන්දු වී තිබෙනවා ; ඒකත් ඉෂ්ට කර නැහැ.

ග්‍රාම සේවක සේවයට අවශ්‍ය නීති පොත්, ලිපි ද්‍රව්‍ය, කාර්‍යාලයීය භාණ්ඩ, වැහි කබා, හිස් වැසුම්, පාවහන් හා විදුලි පන්දම් ආදිය සැපයීමට ද පොරොන්දු වී තිබෙනවා. ඒකත් ඉෂ්ට කර නැහැ.

ග්‍රාම සේවක කොට්ඨාශය දක්වෙන පිඹුර — ප්ලෑන — බැගින් සැපයීමට පොරොන්දු වී තිබෙනවා ; ඒකත් ඉෂ්ට කර නැහැ.

සෑම ග්‍රාම සේවක මහතෙකුටම මිනුම් පටිය බැගින් සැපයීමටද පොරොන්දු වී තිබෙනවා ; ඒකත් ඉෂ්ට කර නැහැ.

සේවය කරන අවස්ථාවේදී ඇති වන අනතුරුවලදී පොලිස් සේවයේ මෙන් වන්දියක් ගෙවීමට ගරු ඇමතිතුමා එකඟ වී තිබෙනවා ; ඒකත් ඉෂ්ට කර නැහැ.

හදිසි රාජකාරි කටයුතු සඳහා වැය කිරීම පිණිස සෑම ග්‍රාම සේවක මහතෙකු වෙතම රුපියල් 100 ක තැන්පත් මුදලක් රජය මගින් සැපයීමට පොරොන්දු වී තිබෙනවා ; ඒකත් ඉෂ්ට කර නැහැ.

වැඩ බැලීමේ දීමනාව වශයෙන් රුපියල් 25 බැගින් එක් මසකට වුවද ගෙවීමට ගරු ඇමතිතුමා එකඟ වී තිබෙනවා ; ඒකත් ඉෂ්ට කර නැහැ.

වටිනාකම් සහතික නිකුත් කිරීමෙන් ලබන කොමිස් මුදලින් සියයට 50 ක් ලබා දීමට ගරු ඇමතිතුමා පොරොන්දු වී තිබෙ නවා ; ඒකත් ඉෂ්ට කර නැහැ.

ස්ය කොට්ඨාශය තුළ රාජකාරි ගමන් ගාස්තු ලබා දීමට පොරොන්දු වී තිබෙ නවා ; එය ඉෂ්ට කර නැහැ.

සෑම ග්‍රාම සේවකයෙකුටම රජය මගින් බයිසිකලයක් සපයන අතර වාහනයක් මිළ දී ගැනීමට ඉල්ලන අයට ණය මුදලක් ලබා දීමට ගරු ඇමතිතුමා එකඟ වී තිබෙනවා ; ඒක ඉෂ්ට කර නැහැ.

ග්‍රාම සේවය සඳහා තෝරා ගැනීමට පෙර අවුරුදු 5 කට වඩා අධික කාලයක් ගම් මුලාදෑනි තනතුරු දැරූ ග්‍රාම සේවකවරුන් ට ඉහළ වැටුප් පරිමාණයක් දීමට ඇමති තුමා පොරොන්දු වී තිබෙනවා ; ඒක ඉෂ්ට කර නැහැ.

1956 ට පෙර ගම්මුලාදෑනි තනතුරුවල ට පත් වූ, දැනට ග්‍රාම සේවක සේවයේ නියුතු, ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ ඊට උසස් අධ්‍යාපනික සහතික දරණ අයට පෙර සේවයද එක් කර වැඩි පඩි ලබා දීම සලකා බලනවාය කියා පොරොන්දුවක් දී තිබෙනවා ; ඒ ගැන තවම දැනුම් දීමක් කර නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

රජයේ ඉඩම් කච්චේරි සම්බන්ධ රාජකාරි වලින් ග්‍රාම සේවකවරුන් නිදහස් කරන්නේ නැත්නම් එම බදු අය කිරීම් කොමිස් සහිතව පැවරීමට පොරොන්දු වී තිබෙනවා; ඒක ඉෂ්ට කර නැහැ.

සහල් සලාක පොත් ග්‍රාම සේවක කාර්යාලවලට ගෙනැවිත් භාර දීමට පොරොන්දුවක් දී තිබෙනවා; ඒක ඉෂ්ට කර නැහැ.

ග්‍රාම සේවක පුහුණුවේ කාලය සේවයට එකතු කිරීමට පොරොන්දුවක් දී තිබෙනවා; ඒක ඉෂ්ට කර නැහැ.

රජයේ වෙනත් සේවයන්හි සිට ග්‍රාම සේවක සේවයට පැමිණි අයගේ සේවය නොකැඩුණු සේවයක් හැටියට ගණන් ගන්නා බවට පොරොන්දුවක් දී තිබෙනවා; නමුත් ඒකවත් ඉෂ්ට කර නැහැ.

මේ විධියට පොරොන්දු දී තිබුණත් ඉෂ්ට නොකළ තවත් ඉල්ලීම් රාශියක් තිබෙනවා. කාල වේලාව නැති නිසා ඒවා එකින් එක මතක් කරන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම මේ ඉල්ලීම්වලින් එකක් දෙකක් පමණයි ඉෂ්ට කර තිබෙන්නෙ. වැඩි හරිය ඉෂ්ට කර නැහැ. ඒවා ඉෂ්ට කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

තවත් කාරණයක් තිබෙනවා. ග්‍රාම සේවක මහත්වරුන්ට දේශපාලන අයිතිවාසිකම් නැහැ. ග්‍රාම සේවකයින්ට දේශපාලන අයිතිය දීම වැරදි බව මා පිළිගන්නවා. නමුත් තමුන්නාන්සේලා රජයේ සුළු සේවකයින්ට, පහළ ශ්‍රේණිවලට අයත් සුළු සේවකයින්ට, දේශපාලන අයිතිවාසිකම් දෙනවාය කිව්වා. ඒකත් ඉෂ්ට කර නැහැ. එම නිසා ග්‍රාම සේවකවරුන්ටත් මෙතෙක් දේශපාලන අයිතිවාසිකම් ලැබී නැහැ. නමුත් ඒක නොවෙයි ප්‍රශ්නය. ග්‍රාම සේවකවරුන්ට තමුන්නාන්සේලා මේ බලතල නොදුන්නාට යම් යම් ප්‍රදේශවල ආදායම් පාලක නිලධාරීන්ට ඒවා දී තිබෙන බව අපි දන්නවා.

මා විශේෂයෙන් සඳහන් කරන්නේ වැලිගම් කෝරළයේ ආදායම් පාලක නිලධාරියා පිළිබඳවයි. ඒ නිලධාරියාගේ සම්පූර්ණ කාලය යොදවන්නේ දේශපාලන කටයුතුවලටයි. ඔහු කොයි විධියට කටයුතු කරනවාද යන්න. ගරු ඇමතිතුමා පරීක්ෂණයක් කළොත් දැන ගන්න පුළුවන්. මේ ආදායම් පාලක නිලධාරියා සේවය කරන්නේ ඔහුගේ ගමේමයි. ඒ ප්‍රදේශයේ ඔහුගේ පෞද්ගලික පේෂකම් මධ්‍යස්ථාන තියෙනවා. ඔහු ඒවා මගින් ජාවාරම් කරගෙන යාම නිසා අවට තිබෙන පේෂකම් මධ්‍යස්ථාන එකක්වත් ක්‍රියාත්මක කරන්නට බැරි තත්ත්වයක් තියෙනවා. ඡන්ද කොට්ඨාශවලට දුන් පේෂකම් මධ්‍යස්ථාන සඳහා ගොඩනැගිලි සම්පූර්ණ කරන්නට බැරි වී තිබෙන්නේ මේ නිලධාරියා රාජකාරි කටයුතුවලට වඩා පෞද්ගලික ව්‍යාපාරවලට මුල් ස්ථානයක් දී කටයුතු කරන නිසයි. ඔහු ලබන මහා මැතිවරණයේදී අකුරැස්ස ආසනය සඳහා තරඟ කරන්නට එන බව දැන ගන්නට තියෙනවා. ඒ ගැන අපේ බයක් නැහැ. ඔහුගේ ඉදිරිපත් වීම ගැන අපේ විරුද්ධත්වයකුත් නැහැ. ඔහු එනවා නම් ඔහුට එන්න ඉඩ දෙන්න. ඔහුගේ තත්ත්වය කුමක්ද යන්න මැතිවරණයෙන් පසු දැන ගන්නට ලැබෙයි. එහෙත් ප්‍රශ්නය ඒක නොවෙයි. ඔහු නිලයෙන් අස් වෙලා දේශපාලන කටයුතුවල යෙදෙනවා නම් ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. එහෙත් තමාගේ ආදායම් පාලක නිලධාරි බලය යොදා සංවිධාන ඇති කර ගෙන, ග්‍රාම සේවකයන් මගින් රැස්වීම් පවත්වාගෙන යනවා, එක දවසකට රැස්වීම තුන, හතර පවත්වනවා. මේ ආදායම් පාලක නිලධාරීයාගේ ඡන්ද ව්‍යාපාරය ගැන මේ ආණ්ඩුව බොහොම ලැජ්ජා වන්නට ඕනෑ. සුළු සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් දෙනවාය කිව්වත් දේශපාලන වැඩවල යෙදුනායයි චෝදනා ලැබූ ග්‍රාම සේවකයන් ආදීන්ට දඬුවම් කළ—ඔවුන් අස් කළ—මේ ආණ්ඩුව, මේ නිලධාරියාට තමන්ගේ පක්ෂ දේශපාලනයට හවුල් වන්නට ඉඩ දෙන්නේ ඇයි කියා, අපක්ෂපාතව කටයුතු කරනවාය කියා අපේ විශ්වාසයක් තියෙන ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගෙන් අහන්නට කැමතියි. මෙවැනි කරුණු ගැන ඇඟිලි ගැසීමට එතුමාට උවමනාව තිබුණත්, ආණ්ඩු පක්ෂයේ උසස් පෙළේ නායකයන්ගෙන් මේ වැඩවලට උදව් උපකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලැබෙන නිසා එසේ කරන්නට ඉඩක් නැති වී තිබෙනවා. මේ ආදායම් පාලක නිලධාරියාට විරුද්ධව විනයානුකූලව කට යුතු කරන්නට ඕනෑ. [බාධා කිරීමක්] ඞී. පී. ඒ. අබේසිංහ මහත්මයා. නම කියන්නට මා කැමති නැති නිසයි, කලින් නම සඳහන් නොකළේ. ගරු සභාපතිතුමනි, මේ නිලධාරියාගේ ක්‍රියා කලාපය මේ රටට කොයි තරම් ලොකු නින්දාවක්ද? ග්‍රාම සේවක නිලධාරීන් අවංකවත්, දේශපාලනයෙන් තොරවත් කටයුතු කරන්නට ඕනෑය කියා ඔවුන්ට උපදෙස් දෙන්නට සිටින ඔවුන්ගේ නායකයා වූ ආදායම් පාලක නිලධාරියා කටයුතු කරන්නේ පක්ෂ දේශපාලනය අනුව නම් ඔහුගේ යටත් නිලධාරීන් නියම මාර්ගයට යොමු කරවන්නේ කෙසේද? මේ නිලධාරියාගේ ක්‍රියා පිළිවෙළ නිසා අකුරැස්ස ඡන්ද කොට්ඨාශය තුළ මේ ආණ්ඩුවට විරුද්ධව විශාල මහජන මතයක් ගොඩනැගිගෙන එනවා.

ගරු සභාපතිතුමනි, රජයේ ප්‍රධාන නිලධාරියකුට, එළිපිටම ග්‍රාම සේවකයන් යොදවාගෙන දේශපාලන රැස්වීම් පවත්වන්ට ඉඩ දී තිබීම ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගේ ගෞරවයට කැළලක්, ඒ නිසා ආණ්ඩු පක්ෂයේ නායකයන්ගෙන් කොයි තරම් බලපෑම් ආවත් ගරු ඇමතිතුමාගේ නිදහස සහ බලය පාවිච්චි කර මේ නිලධාරියා සම්බන්ධයෙන් සෑහෙන පරීක්ෂණයක් පවත්වන ලෙස මා ඉල්ලා සිටිනවා. මොහු පාලනය කරන්නට දිසාපතිතුමාටවත් පුළුවන්කමක් නැහැ. දේශපාලන බලතල තියෙන නිසා මේ නිලධාරියා දිසාපතිතුමාටත් වඩා ඉහළයි. මා තමයි, ලබන වාරයේ තරඟ කරන්නේ කියා එළිපිටම ප්‍රකාශ කරමින් ඔහු ඒ ප්‍රදේශයේ සැරිසරනවා. මා කී කරුණු සම්බන්ධයෙන්—විශේෂයෙන් මේ ආදායම් පාලක නිලධාරියා පිළිබඳව කී කරුණු සම්බන්ධයෙන්—ගරු ඇමතිතුමාගේ බලවත් සැලකිල්ල යොමු කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**එම්. ඒ. අබ්දුල් මජීඞ් මයා.** (පොතුවිල්)
*(ஜனாப் எம். ஏ. அப்துல் மஜீது—பொத்துவில்)*
(Mr. M. A. Abdul Majeed—Pottuvil)

Mr. Chairman, I am happy that I have the opportunity to speak a few words on the Votes of the Minister of home Affairs. The Hon. Minister has a special place in the hearts of the Muslims of this country for the good work he has done as Minister in charge of the Wakf Department, and more so for the good work he did for my community as Minister of Education in the Bandaranaike Government. He is an M.Ps' Minister; he lives among us. He is a man of many parts, and he has now become a dietician, so much so that by following his advice I was able to reduce seven to eight pounds a month.

I would like to bring to the notice of the Hon. Minister and the House the difficulties that officers of the Amparai District are faced with: Normally, in any district the Government Agent and his officers are held in high esteem. In Amparai, unfortunately, the Government Agent and his officers are treated like *kallathonis* by the River Valleys Development Board. We had to put up a fight with the R.V.D.B., which thinks that it is a government within a government, to find a small place for the kachcheri to function. At every turn they protest. The situation is that, except for three bungalows occupied by the G.A., the Additional G.A. and another officer, the rest of the buildings in Amparai town are vested in the R. V. D. B. There is not a single private house in that town. As a result of this, from the time that the Amparai Kachcheri started functioning officers who have been posted to that office have fought shy of coming there, because there are no quarters for them to live in, so much so that even the Government Agents who come there do not really unpack their baggage for some time.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබ්දුල් මජීඩ් මයා.]

අ. භා. 3

Something must be done about this situation. After all. as far as food production is concerned our district is only second to the Kurunegala District. Districts of this nature should be serviced properly, and the officers should be given the minimum facilities that are given to them elsewhere. We cannot blame the government servants. I am not blaming the Hon. Minister or the officials: they are helpless in this matter. I hope the Hon. Minister will take this matter up with the Hon. Prime Minister and see that sufficient buildings are handed over to the G.A. so that he could see that officers working in the Amparai Kachcheri are housed properly.

I would like to remind the Hon. Minister that I made a request to him to open a circuit D.R.O's office at Akkaraipattu South. About a half of the Akkaraipattu D.R.O's Division falls within the Pottuvil Electorate. Villages like Thambiluvil, Thirukovil, Thampata and Kanchirankudah are situated about ten miles from the D.R.O's office. I have received a letter from the Hon. Minister stating that a circuit D.R.O's office would cost about Rs. 2,500 and that he does not have the necessary funds for this purpose. May I humbly submit to him that Rs. 2,500 is a paltry sum, and that at least this year he should grant my request.

I would also like to speak a few words regarding the co-operative textile weaving centres in my area and the way yarn is issued to them. The representatives of the co-operative weavers' textile centres in my electorate came to me and said that they were not being given fair treatment. They said that same societies were being given fabulous amounts of yarn, while they were told that the issue of yarn is governed by the number of looms worked at cetera. I made inquiries and found the allegation made was correct.

I shall pinpoint one instance. A textile weavers' society called the Maruthamunai Central Co-operative Textile Weavers' Society in Kalmunai ha between 1st January, 1969 and 8th July 1969 bought yarn from the National Textile Corporation to the value of Rs. 1,381,000 which in terms of pounds works out to 1,600,000—a fantastic and fabulous amount for a co-operative textile weaving society.

The normal practice is for such societies to buy the yarn from the co-operative union. All the societies go to the Batticaloa Textile Weavers' Union for their requirements of yarn.

I went further into this matter and found that the yarn that had been bought had not gone to any society. What is more revealing is that the individual who bought this yarn is not even a member of this society. The individual who bought this yarn costing Rs. 1,381,000 is Mr. Mashoor Moulana.

Now, the problem is this. I know the Hon. Minister is very honest. His officers are honest. But if such things are allowed to take place it not merely brings discredit to the Government, it also brings discredit to those who support the Government. I would, therefore, urge the Hon. Minister to go into the root of this racket.

I would like to say a few words regarding the Wakfs Department. We are very happy with the Commissioner, a very honest and simple person, but I find that over a period of years in the working of the Ordinance there has been no uniform system governing the appointments of boards of trustees. In certain mosques you find a board of trustees of five persons whereas in others you find thirty or forty persons, an unwieldly number. It is a long time since this Ordinance came into force and therefore, I would urge the Hon. Minister to give some thought to this and to bring about some uniformity in making appointments to the board of trustees.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙනිය)
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்ப தெனிய)*
(Mr. R. G. Senanayake—Dambadeniya)

ගරු සභාපතිතුමනි, අද රටේ සිදු වන සමාජ දියුණුව දෙස බලන විට සාමාන්‍ය මහජනතාවට රටේ පාලන කටයුතු පිළිබඳව තමන්ගේ හැඟීම් කියාගැනීම පිණිස එක්තරා වැඩ පිළිවෙලක් ඇති කළ යුතුව තිබෙනවා. ඒ අනුව ක්‍රියා කිරීම පිණිස තමයි, ඩී. එස්. සේනානායක යුගයේදී ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය ආරම්භ කරන්නට යෙදුණේ. එම ව්‍යාපාරය වැඩිපුරම අත්හදා බැලුවේ දඹදෙණිය කෝට්ඨාශයේ නිසා මා ඒ පිළිබඳව හොඳ විස්තරයක් කරන්නට හැකි කෙනෙක් බව කියන්නට කැමතියි. අපට නිදහස ලැබුණාය කියා අපි බොහෝවිට උදම් අණනවා. එහෙත් අපට නිදහස ලැබුණේ කුමන ආකාරයකින්දැයි සොයා බැලූ විට පෙනී යන්නේ කවර තත්ත්වයක්ද? ආණ්ඩු කාරවරයකුගේ හිතුමතයට රට පාලනය කළ යුගයක සිටයි, ක්‍රමයෙන් මේ යුගයට පා තැබුවේ. එය සිදුවූයේ කෙසේද? එදා තනි මතයකට යටවී තිබුණු බලතල සියල්ල මෙවැනි මහජන නියෝජිත මණ්ඩලයකට පැවරීමෙනුයි එම තත්ත්වය ඇති වූයේ. එම නිසා රට දේශපාලන වශයෙන් නිදහස් වුණු එක ඇත්තයි. එහෙත් සාමාන්‍ය ගම්වැසියා නිදහස් වුණා දැයි අප පිකක් කල්පනා කර බැලිය යුතුයි.

සුද්දාගේ කාලයේදී රට කෙරුවේ ඔහුගේ තනි මතයටයි. ඔහුට සිටියා නිලධාරි පන්තියක්. දිසාපතිවරු, ඒජන්තවරු, කෝරළේ මහත්වරු සහ ගම් මුලාදෑනිවරු යනාදී වශයෙන් ඔහුට නිලධාරි පන්තියක් සිටියා. එම නිලධාරි පන්තිය මගින් තමයි රට පාලනය කළේ. රටට නිදහසක් ලැබුණාට මොකද අපේ ගම්වලට නම් තවම කිසි නිදහස් අයිතියක් ලැබී නැති බව අපට පෙනෙනවා. පැරණි යුගයේ පැවති පුද්ගලික නිලධාරි ක්‍රමය අනුව තවමත් පාලන කටයුතු කෙරෙන බව මා තමුන්නාන්සේට මතක් කරන්නට කැමතියි. අපි මෙම පාර්ලිමේන්තුවේදී පනවනු ලබන නියෝග යනාදිය ක්‍රියාත්මක වන්නේ තාමත් පුද්ගලික නිලධාරි ක්‍රමය අනුවයි. අපේ රටේ පළාත් පාලන ආයතන තිබෙනවා. එම පළාත් පාලන ආයතන වලට භාරදී තිබෙන්නේ ඉතා සීමිත වැඩ කොටසක් පමණයි. ළිං තැනීම, පාලම් තැනීම සහ කුඩා පාරවල් දියුණු කිරීම යනාදිය එම වැඩ කොටසට ඇතුළත් වෙනවා. සමාජයට අවශ්‍ය අනිකුත් වැඩ කටයුතු සියල්ලම පාහේ තවමත් කෙරෙන්නේ නිලධාරීන්ගේ තනි මතය අනුවයි. එයින් සමාජය බේරාගෙන මහජනතාවට සහනයක් සලසා දෙනු පිණිස තමයි එදා පොදු මහජන මතයට තැනක් දීම සඳහා ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය බිහි කළේ.

ලංකාවේ හැම මුලාදෑනි වසමකටම එක ග්‍රාම සංවර්ධන සමිතියක් බැගින් පිහිටෙව්වා. ඒ සමිති මගින් තම තමන්ගේ කරුණු ඉදිරිපත් කරන්නට මහජනතාවට පුළුවන්කම ලැබුණා. එමගින් නිලධාරීන්ටත් යම්කිසි පහසුවක් ඇති වුණා. යම්කිසි ගමකට නිලධාරියකු කැඳවා ගන්නට ඒ දවස්වල පුළුවන්කම ලැබුණේ ග්‍රාම සංවර්ධන සමිතිය මගිනුයි. ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය මැරී ගියායින් පසු යම් කිසි ගමකට නිලධාරියකු කැඳවා ගන්නට පවා බැරි තත්ත්වයක් උද වුණා. වත්තෙ මහත්මයා කී පළියට හෝ මුදලාලි මහත්මයා කී පළියට හෝ වෙන අයකු කී පළියට හෝ නිළධාරියෙක් ගමකට ඒවිද? නැහැ. පොදු මතයකට නම් ඔවුන් කිකරු වෙනවා. එම තත්ත්වය නිසා ඒ යුගයේදී ග්‍රාම සංවර්ධන සමිතිවලින් රටට විශාල සේවයක් සිදු වුණු බව මා කියන්නට කැමතියි. එහෙත් අද එම තත්ත්වය පවතිනවාද? තමන්ගේ අදහස් උදහස් අනුව පාලන ක්‍රමය නියම ආකාරයට පවත්වාගෙන යනවාද නැද්දැයි දනගැනීම පිණිස පොදු මහජනතාවට උපකාර වුණු ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාරය අද බොහෝ දුරට මැරී ගොස් තිබෙනවා.

අපි සිතමු. ඒ සමිතියක් මගින් යම්කිසි පාරක් තැනීම හෝ ළිඳක් කැණීම හෝ වෙනයම් වැඩක් පටන් ගත්තාය කියා. ඒ සමිතියේ උදවිය ස්වශක්තියෙන් එම වැඩෙන් එක්තරා කොටසක් කරනවා. ආණ්ඩුවෙන් ඉතිරි හරිය කරනවා. ඒ පිළිවෙළට අනුව එදා විශාල වැඩ කොටසක් කෙරුණා. එම ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය අද මරා දමා තිබෙනවා. එහෙත් එම වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

කටයුතුවල සම්පූර්ණ බර ගම්වැසියා මත පටවන්නට ඕනෑය යන හැඟීම ඇතුව ඒ වෙනුවට අද ශ්‍රමදාන ව්‍යාපාරයක් පටන් ගෙන තිබෙනවා. ග්‍රාම සංවර්ධන සමිති ව්‍යාපාර වැඩ පිළිවෙළ අනුව නම් එදා එවැනි කටයුතු කෙරුණේ රජයත් සමග හවුලේයි. ගම්මුන්ගේ ශ්‍රමය යොදා කොටසක් කරනවා. ආණ්ඩුවෙන් කොටසක් කරනවා. ඒ පිළිවෙළට කටයුතු කිරීම නිසා යම්කිසි වැඩක් පටන් ගත් විට ඒ පිළිබඳව ගම්මුන් තුළ විශාල උනන්දුවක් ඇති වුණා; ඒවාගේම විශාල දියුණුවක්ද ඇති වුණා.

ඒ වාගේම ග්‍රාම සංවර්ධන සමිතිය මාර්ගයෙන් පාලන තන්ත්‍රයට සම්බන්ධ වන්නට එදා සාමාන්‍ය ජනතාවට පුළුවන් වුණා. එහෙත් අද ඒ ග්‍රාම සංවර්ධන සමිති අඩපණ වී පවතිනවා. ග්‍රාම සංවර්ධන සමිති වෙනුවට අද ශ්‍රමදාන ව්‍යාපාර ඇතිකර තිබෙනවා. ශ්‍රමදාන ව්‍යාපාරවලදී ආණ්ඩුව පිටින් මාළු ටිකකුත් පිටි ටිකකුත් දෙනවා පමණයි. එතකොට මුළු වැඩේ සම්පූර්ණ බර පැටවෙන්නේ දුප්පත් ජනතාව මතයි. පිටින් මාළු ටිකක් හා පිටි ටිකක් දීමෙන් ආණ්ඩුව සෑහීමට පත් නොවිය යුතුයි. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය පොදු මහජනතාව සම්බන්ධ වන ව්‍යාපාරයක් හෙයින් ඊට යළිත් නව ශක්තියක් දිය යුතු බව මා ගරු ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. එදා වාගේම අදත් ග්‍රාම සංවර්ධන නිලධාරීන් සිටිනවා. එදා වාගේම අදත් ඔවුන් වෙනුවෙන් විශාල මහජන මුදල් ප්‍රමාණයක් වැය වෙනවා. එහෙත් අද ග්‍රාම සංවර්ධන සමිති අඩපණයි. ඇමතිවරයා හෝ නිලධාරීන් හෝ ග්‍රාම සංවර්ධන සමිති ගැන වැඩි සැලකිල්ලක් දක්වන්නේ නැහැ. සාමාන්‍ය ජනතාවට ගමේ තත්ත්වයේ සිටගෙන ආණ්ඩුවට කථා කරන්නට පුළුවන්කම තිබුණේ ග්‍රාම සංවර්ධන සමිති මාර්ගයෙන් නිසා ගමේ පාර්ලිමේන්තුව වූ ග්‍රාම සංවර්ධන සමිතියට ලැබිය යුතු සැලකිල්ල ලබා දෙන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නට කැමතියි.

ඊළඟට බීඩි කර්මාන්තය ගැන වචනයක් දෙකක් කියන්නට කැමතියි. ඇත්තෙන්ම අද මෙය කර්මාන්තයක් හැටියට පවත්වාගෙන යන්නට පුළුවන් වී තිබෙන්නේ එදා මා වෙළඳ ඇමතිවරයා වශයෙන් සිටිද්දී ඇති කර ගන්නා ලද වෙළඳ ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙනුයි. මුලදී ඉන්දියාවෙන් බීඩි ගෙන්වා ගත්තා. ඉන්දියාවෙන් බීඩි ගෙන්වීම තහනම් කර මේ රටේම බීඩි නිෂ්පාදනය කරන්නට වැඩ පිළිවෙළ යොදන ලද නමුත් ඒ මඟින් අප අදහස් කරන ලද පරමාර්ථය අද ඉෂ්ට වී නැහැ. එගොඩ සිටි බීඩි වෙළෙඳුන් අද මෙගොඩට ඇවිත්—ඉන්දියානු බීඩි වෙළෙඳුන් ලංකාවට ඇවිත්—ඒ බීඩි කර්මාන්තය අල්ලාගෙන සිටිනවා. බීඩි කොළ බෙදන ආකාරයේත් ලොකු අසාධාරණයක් තිබෙනවා. හැම ගමකම රක්ෂා ප්‍රශ්නය විසඳන්නට උත්සාහ කරන්නේ බීඩි කර්මාන්තයේ උදව් වෙනුයි. එහෙත් ආණ්ඩුව බීඩි කොළ බෙදන ආකාරයේ පවතින අවහිරතා නිසා නියම ආකාරයට බීඩි කර්මාන්තය දියුණු කරන්නට බැරි බව මතක් කරන්නට සිදු වී තිබෙනවා.

අ. භා. 3.15

ඉන්දියාවෙන් බීඩි කොළ ගෙන්වීම තහනම් කරන්නට යන බවද දැනගන්නට තිබෙනවා. මෙසේ වුවහොත් මේ රටේ බීඩි කර්මාන්තයේ යෙදී සිටින දහස් ගණන් පිරිසට කුමක් වේද? ඉන්දියාවෙන් ගෙන්වන බීඩි කොළ උඩයි, ලංකාවේ බීඩි කර්මිකයන්ගේ ජීවනෝපාය සැලසී තිබෙන්නේ. ඉන්දියාවෙන් බීඩි කොළ ගෙන්වීම මාසයක් දෙකක් හෝ නතර වුවහොත් ලක්ෂ ගණනකට බඩගින්නේ ඉන්නට සිදු වෙනවා නේද? තත්ත්වය එසේ හෙයින් ඉන්දියාවේ බීඩි කොළ ඒකාධිකාරිත්වය බිඳ හෙළමින් ලංකාවේම බීඩි කොළ නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් ගෙන යෑම අවශ්‍යව තිබෙනවා. බීඩි කොළ ලබා ගන්නා ගස් වගා කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කොට ඒ අංශයෙන් ස්වාධීන තත්ත්වයක් ඇති කර ගන්නට අප ක්‍රියා කළ යුතුව තිබෙනවා.

ලංකාවේ රෙදි මෝල් කීපයක් පිහිටුවන්නට ක්‍රියා කරගෙන යන බව ගරු සභාපතිතුමා දන්නවා ඇති. බිර්ලා මෝල හැටියට "ඒෂියන් කොටන් මිල්ස්" නමින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයවර්ධන මෝලකුත්, ඍනම් මෝලකුත් පටන් ගන්නට යනවා. මේ අතර වැල්ල වත්තේත් රෙදි මෝලක් තිබෙනවා. ආණ්ඩුව තුල්හිරියේ රෙදි මෝලක් පටන් ගන්නට යනවා. මේ මෝල් කීපයේ වැඩ කරගෙන යන විට දුප්පත් පේෂ කාර්මික යාට මුහුණ පාන්නට සිදු වන තත්ත්වය කුමක්ද? ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා ඒ ගැන කල්පනා කළාද?

පේෂකර්මාන්තය සම්බන්ධයෙන් විශේෂ පුහුණුවක් ලබා, රජයේ ආධාර ඇතිව මධ්‍යස්ථාන සාදාගෙන, මේ රක්ෂා වෙන් ආදායමක් උපයාගෙන ජීවත් වන්නට බලාපොරොත්තු වන පිරිස තුන් ලක්ෂයක් පමණ මේ රටේ සිටින බව ගරු ඇමතිතුමා දන්නවා. එසේ නම් මේ උදවිය ආරක්ෂා කරන්නට ගරු ඇමතිතුමාට යුතුකමක් තිබෙනවා. ඒ යුතුකම ඉටු නොකර, එක පිට එක රෙදි මෝල් කිහිප යක් මේ රටේ බිහි වන්නට ඉඩ දුන්නොත්, අත් යන්ත්‍රවලින් වැඩ කරන උදවියට යන කල දසාව කුමක්දැයි කල්පනා කර බැලිය යුතුව තිබෙනවා.

අවශ්‍ය නූල් ලබා ගන්නට බැරිව අනන්ත අප්‍රමාණ දුක් කරදර මැද ජීවත් වන අති විශාල පිරිසක් අදත් මේ රටේ ඉන්නවා. "පුළුවන් තරම් රෙදිපිළි නිපද වාපල්ලා; අපි ඒවා භාර ගන්නට ලෑස් තියි," කියමින් කාලයක් තිස්සේ නිෂ් පාදකයන්ට ඇතැම් අය ධෛර්‍ය දුන්නා. ඒ නිසා ඒ උදවිය වැඩි වැඩියෙන් රෙදිපිළි නිෂ්පාදනය කළා. නිෂ්පාදන වැඩි වුණාම කියනවා, "උඹලා නිපදවා ගත් ඒවා විකුණා ගනිල්ලා," කියලා. ලක්ෂ දෙක හමාරක් පමණ දෙනා අද දුකසේ ජීවත් වෙනවා. ඉන්දියාවේ හදන රෙදි පිළිවලට දෙවැනි නොවන තරම් උසස් තත්ත්වයේ රෙදිපිළි අපේ උදවිය දැන් නිෂ්පාදනය කරනවා. තමන්ටත් ඒ තරම් දක්ෂකමක් තිබෙන බව අපේ උදවිය පෙන්නා තිබෙ නවා. එහෙත්, ඒ උදවියගේ අනාගතය කුමක්ද? එක රෙදි මෝලකින් මුළු ලංකා වටම වුවමනා කරන රෙදිපිළි ප්‍රමාණය සම්පූර්ණ කර දෙන්නට පුළුවනි. නියම ආකාරයට වැඩ කළොත් එක රෙදි මෝල කින්ම ඒ තරම් නිෂ්පාදනය කරන්නට පුළුවන් බව අපට කියන්නට පුළුවනි. ඉතින්, එවැනි මෝල් පහක් ඇති කළොත් ඇති වන තත්ත්වය කුමක්දැයි අපට හිතා ගන්නට පුළුවනි. එතකොට අපේ ජනයාට යන කල දසාව කොයි විධියේ එකක් වෙයිද?

අද අපේ රටේ පවතින රැකීරක්ෂා හිඟ යේ උග්‍රකම හරියාකාර නොපෙනෙන්නේ අපේ ගෘහ කර්මාන්ත නිසයි; විශේෂ යෙන්ම පේස කර්මාන්තය සහ බීඩි කර් මාන්තය යන කර්මාන්ත දෙක නිසයි. අද ලංකාවේ හුඟ දෙනෙක් ජීවත් වන්නේ මේ ගෘහ කර්මාන්ත දෙකෙන් තමයි. ඒ දෙකම අවදානම් තත්ත්වයකටයි දැන් වැටීගෙන එන්නේ. ඉන්දියාවේ කොළ අනුවයි අද අපේ බීඩි කර්මාන්තය රැඳී තිබෙන්නේ. රෙදි මෝල් පටන් ගන්න තුරු තමයි අපේ ගෘහ කර්මාන්තයක් හැටි යට ගෙන යන රෙදිපිළි නිෂ්පාදනය පවතින්නේ.

අපේ ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා ගැන මට එක් කාරණයක් ගෞරවයෙන් සඳහන් කරන්නට පුළුවන් කම තිබෙනවා. එතුමා යම් වැඩක් භාර ගත්තොත්, එය දක්ෂ ලෙස කරනවා. වැඩක් භාර ගත්තොත් පටන් ගන්න විටම හොඳ ප්‍රතිඵල පෙනෙන ආකාරයට වැඩ කරන්නට උපන් දක්ෂකමක් එතු මාට තිබෙනවා. ඒ වාගේම ප්‍රශ්නයක් එතුමාට ඉදිරිපත් කරනු ලැබුවොත් හොඳට අත ගිහ යොදා, භාරා අවුස්සා බලා විසඳු මක් සොයා ගන්නට උනන්දුවකින් වැඩ කරන බව මට ප්‍රීතියෙන් සඳහන් කරන් නට පුළුවනි. ඒ නිසා ගරු ඇමතිතුමාට මම බොහොම හොඳට ගරු කරනවා.

මම ගරු ඇමතිතුමාට එකක් කියන් නට කැමතියි. අද මේ රටේ ලක්ෂ ගණනක් ජනයා ගරු ඇමතිතුමා දිහා බලාගෙන ඉන්නවා, ඒ අයගේ අනාගතය කෙබඳු වේදැයි සිතමින්. රෙදිපිළි කර්මාන්තයෙන්, බීඩි කර්මාන්තයෙන් ජීවත් වන ලක්ෂ ගණනක් ජනයා තමන්ගේ අනාගතය ගැන සිතමින් සිටිනවා; අලුත් ක්‍රම අනුව අවදානම් තත්ත්වයකට තමන්ගේ කර් මාන්ත වැටේදැයි සිතමින් සිටිනවා. ගරු ඇමතිතුමා මේ ගැන නියම විධියට කට යුතු නොකළොත් කවදාවත් නොඇටවූ විධි යේ භයානක ඉරණමකට විශාල පිරිසකට මුහුණ පාන්නට සිදු වෙනවා. ඒ කර්මාන්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

ආයතන වැසී යනවා ඇති. විදේශිකයන්ට මේ විධියේ තත්ත්වයක් ඇති කරන්නට ඉඩ නොදී අපේ ජනයා රැක දෙන මෙන් තරයේ ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

**එස්. එම්. රාසමානික්කම් මයා.** (පද්දිරිප්පු)

*(திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு)*

(Mr. S. M. Rasamanickam—Paddiruppu)

அக்கிராசனர் அவர்களே, உள்நாட்டு அமைச்சரின் மானியத்தில் சில வார்த்தைகள் பேசுவதற்கு இடம் அளித்தமைக்கு முதற்கண் உங்களுக்கு நன்றி கூற விரும்புகிறேன். உள்நாட்டு அமைச்சரை பற்றி நான் இங்கு தனி வர்ணனை கூற வேண்டிய அவசியம் இல்லை. தேசிய அரசாங்கத்திலுள்ள அமைச்சர்களில் சிறந்த ஒரு அமைச்சர் அவர். அவரைப் பண்பும், பாகுபாடில்லாமல் செயலாற்றும் தன்மையுமுடைய அமைச்சர் என்று கூறினல் மிகையாகாது. ஒரு முதிர்ந்த அரசியல்வாதியான அவர் பாராளுமன்றப் பிரதிநிதிகளின் கஷ்டங்களையும் பொறுப்புக்களையும் நன்கு உணர்ந்தவர். நாட்டினதும் பொது மக்களினதும் பிரதிநிதியாக அவர் பல ஆண்டுகள் இருந்த காரணத்தினல், பொது மக்களுடைய தேவைகளையும் அவர்களுடைய எண்ணங்கள் அபிலாசைகளையும் அவர் அறிந்தவராக இருக்கின்ற காரணத்தினல் அவர் ஒரு அமைச்சராக இருப்பது இந்த நாட்டின் வரப்பிரசாதமாகும்.

எதிர்க் கட்சி அங்கத்தவர் என்ருல் என்ன, அரசாங்கக் கட்சி அங்கத்தவர் என்ருல் என்ன கௌரவ உள்நாட்டு அமைச்சர் அவர்களுக்கு நன்றி கூருத அங்கத்தவர்கள் இல்லை எனலாம். அவர் ஒரு சிறந்த சிந்தனையாளர். மக்களுக்குத் தேவையான பல திட்டங்களைத் தயாரிக்கக்கூடிய தன்மை உள்ளவர். உதாரணமாக, ஆயிரம் நெசவு நிலையங்களை ஏற்படுத்தி இந்த நாட்டிலுள்ள படித்த ஆண்களும் பெண்களும் தொழில்பெறக்கூடிய ஒரு திட்டத்தை அமைத்ததன்பேரில் அவர் இந்த நாட்டுப் பொது மக்களுடைய நல்லெண்ணத்தைப் பெற்றிருக்கிருர். அவர் தாபித்த நெசவு நிலையங்களிற் பல நல்ல நிலையில் இன்று நடைபெற்றுக் கொண்டிருக்கின்றன. இதையிட்டு இன்று நாடும் நாமும் பெருமைப்படுகிறேும்.

கிழக்கு மாகாணத்தைப் பொறுத்த அளவில் நான் சில வார்த்தைகள் கூற விரும்புகிறேன். கிழக்கு மாகாணம் கல்வியிலும் கைத்தொழிலிலும் பல்வகையிலும் பின்தங்கிய ஒரு மாகாணமாக இருந்தது. அண்மைக் காலங்களில் இந்த மாகாணம் ஓரளவு மெதுவாக முன்னேறிக் கொண்டு வருகின்றது. இந்த நிலையை மேலும் மேலோங்கச் செய்ய வேண்டியது அரசாங்கத்தின் கடமையாகும்.

கிழக்கு மாகாணத்தில் பல நெசவு நிலையங்கள் ஏற்பட்டபோதிலும் இந்த நெசவு நிலையங்களில் பயிற்சி அளிக்க ஆசிரியர்கள் தேவைப்பட்ட போதிலும், இந்த ஆசிரியர்களை உற்பத்தி செய்ய நல்லூரிலுள்ள பயிற்சிக் கல்லூரிக்கே செல்ல வேண்டியிருக்கின்றது. இது பல வகைகளில் கிழக்கு மாகாண மக்களுக்கு வசதியானதாக இருக்கவில்லை. நல்லூரிலுள்ள பயிற்சிக் கல்லூரியில் எமது மாணவர்கள் சேருவது மிகவும் குறைவாக இருப்பதுடன் கஷ்டமானதாகவும் இருக்கின்றது. சென்ற ஆண்டு இப்பயிற்சிக் கல்லூரிக்கு நடந்த தெரிவில் கிழக்கு மாகாணத்தைச் சேர்ந்த ஒரு சிலரே தேர்ந்தெடுக்கப்பட்டிருக்கின்ருர்கள். இப்பயிற்சிக் கல்லூரியில் கிழக்கு மாகாணத்தைச் சேர்ந்த பலருக்கு சந்தர்ப்பம் கொடுக்காமற் போவது விசனிக்கத்தக்கது. ஆகவே, நான் கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்வது என்னவென்ருல் மட்டக்களப்பு மாவட்டத்திற்கு மிக விரைவில் ஒரு நெசவுப் பயிற்சிக் கல்லூரி அமைத்துக் கொடுக்க வேண்டுமென்பதுதான். நெசவுப் பயிற்சிக்காக மாணவர்கள் கிழக்கு மாகாணத்திலிருந்து யாழ்ப்பாணத்திற்குச் செல்லாமல் கிழக்கு மாகாணத்திலேயே பயிற்சி பெற ஒரு நெசவுப் பயிற்சிக் கல்லூரி அமைக்க வேண்டும்.

அது மாத்திரம் அல்ல. எம்மிடம் மிகச் சிறந்த நெசவாளர்கள் இருக்கிருர்கள். நெசவில் மிகவும் நூதனமான வேலைப்பாடுகளைச் செய்யக் கூடியவர்கள் எமது பகுதியில் இருக்கிருர்கள். வெளிநாடுகளில் பயிற்சி பெற ஆட்களைத் தெரிவு செய்யும்பொழுது எமது பகுதியில் இருந்து தெரிந்தெடுக்கப்படுபவர்கள் மிகவும் குறைவு. எனது தொகுதியிலே நெசவு போதகுசிரியர்கள் பலர் இருக்கிருர்கள். அவர்களை வெளிநாடுகளுக்கும் இலங்கையின் ஏனைய

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

பகுதிகளுக்கும் அனுப்பி பயிற்சி பெறக்கூடிய ஒரு திட்டத்தை அமைச்சர் தயாரிக்க வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன்.

ஒரு தொகுதிக்கு ஏழு நெசவு நிலையங்கள் வீதம் ஆரம்பிக்கப்பட்டன. ஆனால் இன்று பல கிராமங்கள் நெசவில் ஊக்கமும் ஆக்கமும் உள்ள நிலையில் இருந்த போதிலும் அப்படியான கிராமங்களுக்கு நெசவு நிலையங்களைக் கொடுப்பது இயலாமலிருக்கிறது. பல கிராமங்கள் இன்று தங்களுக்கு நெசவு நிலையங்களை நிறுவித் தரும்படி கேட்கின்றன . அப்படியான இடங்களுக்கு மேலும் நெசவு நிலையங்களை நிறுவிக் கொடுக்க அமைச்சரவர்கள் உடனடியாக நடவடிக்கை எடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன்.

அக்கிராசனரவர்களே, என்னுடைய தொகுதியிலே அனேக புதிய குடியேற்றத் திட்டங்கள் இருக்கின்றன. இந்தக் குடியேற்றத் திட்டங்களிலே நெல் சாகுபடி செய்வதையும், ஒரு சில உப உணவுப் பொருட்களை உற்பத்தி செய்வதையும் விட, அந்தப் பகுதி மக்களுக்கு தங்களுடைய ஓய்வு நேரங்களை பிரயோசனப் படுத்தத்தக்க வழிவகைகள் இல்லாததால் பொருளாதாரத்தில் அவர்கள் குன்றி வருகிறார்கள். ஆகவே, இப்படியான குடியேற்றப் பகுதிகளில் இருக்கும் மக்களுக்கும், அவர்களுடைய படித்த பிள்ளைகள், தொழில் பெற முடியாத பிள்ளைகள் முதலியவர்களுக்கும் வசதியளிப்பதற்காக குடியேற்றப் பகுதிகளில் நெசவு நிலையங்களை ஏற்படுத்துவது ஒரு முக்கிய முன்னேற்றத்தைக் கொடுப்பதாகும்.

கல்லோயா பிரதேசத்தில் இடது கை வாய்க்கால் பகுதியில் பெரும் பகுதியாக இருக்கும் குடியேற்றப் பகுதி என்னுடைய தொகுதியில்தான் இருக்கிறது. அந்தப் பகுதியிலே ஒவ்வொரு கிராமத்துக்கும் ஒவ்வொரு நெசவு நிலையம் வீதம் ஏற்படுத்த வேண்டும் என்றும் அங்கேயுள்ள குடியேற்ற வாசிகளின் பிள்ளைகள்—ஆண்களும் பெண்களும்—நெசவுத் தொழிலில் ஈடுபட்டு வாழ வழிவகுக்க வேண்டும் என்றும் கேட்டுக் கொள்கிறேன்.

தையற்கலையைக் கற்பதற்கு தையல் நிலையங்களை கிராமங்களில் ஏற்படுத்த வேண்டியது அவசியமாக இருக்கிறது. கிராமங்களில் தையற்கலை நவீன முறையில் வளர்ந்து கொண்டு வருகின்றது. மக்கள் சிரிய முறையில் தங்களுடைய உடைகளை அணியப் பழகிக் கொள்கிறார்கள். தையற்கலையைக் கிராமிய மக்கள் கற்பதற்குப் பாடசாலைகளில் போதிய வசதியில்லை. எனவே, ஆறு மாதத்துக்கு ஒரு இடமாகப் போய்க் கொண்டிருக்கக் கூடிய தையல் நிலையங்களை ஒவ்வொரு தொகுதியிலும் ஏற்படுத்தி, ஒவ்வொரு தொகுதியிலுமுள்ள பெண்கள் தையலைக் கற்கக் கூடிய வசதிகளை அமைச்சரவர்கள் எதிர்காலத்தில் ஏற்படுத்த வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன்.

கிராம சேவகர்கள் பகுதிகளைப் பற்றியும் நான் சில வார்த்தைகள் கூற விரும்புகிறேன். இப்பொழுது கிராம சேவர்கள் இருந்த பகுதிகள் பண்டைக் காலத்தில் கிராம விதானைகள் இருந்த பகுதிகளாகும். இந்தப் பகுதிகளிலே சனத்தொகை அதிகரித்த காரணத்தினாலும், பல பிரதேசங்களை அபிவிருத்தி செய்து அங்கு மக்களைக் குடியேற்றி வைத்த காரணத்தினாலும் இன்று பல கிராம சேவகர்கள் பகுதிகள் மாற்றியமைக்க வேண்டிய நிலையில் இருக்கின்றன. கிராம சேவகர்கள் பகுதியை மாற்றியமைக்காமலிருந்தால், இருக்கும் கிராம சேவகர்கள் தங்களுடைய கடமைகளைச் செய்வது கஷ்டமாக இருக்கும். எமது இணைப்புச் சபைக் கூட்டத்தில் இந்த விஷயம் தீர ஆலோசிக்கப்பட்டு ஒவ்வொரு தொகுதியிலும் மேலதிகமான கிராம சேவகர்கள் பகுதிகளை விஸ்தரிக்க வேண்டும் என்று பல தீர்மானங்களைச் செய்து அமைச்சரவர்களுக்கு அனுப்பிய போதிலும் நிதி இல்லையென்ற காரணத்தினால் அவை அமுல் நடத்தப்படவில்லை. இதனால் நிர்வாகம் பாதிக்கப்படுவது மாத்திரமன்றி மக்களுக்குத் தேவையான வசதிகளைப் பெறுவதும் தாமதமாகிக் கொண்டு இருக்கிறது. எனவே, கிராம சேவகர்கள் பகுதிகளை மாற்றியமைக்க அல்லது திருத்தி மேலதிகமான கிராம சேவகர்கள் பகுதிகளை அமைக்க இந்தத் திட்டத்தை அடுத்த நிதி ஆண்டிலாவது நிச்சயமாக நிறைவேற்ற வேண்டும் என்று அமைச்சரவர்களைக் கேட்டுக் கொள்கிறேன்.

பி. ப. 3.30

இதனை நிறைவேற்றத் தவறினால் நிர்வாகத்தில் பல சிக்கல்களையும் தாமதத்தையும் ஏற்படுத்தும் ஒரு நிலை ஏற்படும். எனது தொகுதியிலே மேலதிகமாக, துறைநீலாவணை, ஒந்தாச்சிமடம், முனைத்தீவு, காக்காச்சி வட்டை நவகிரி நகர், தும்பங்கேணி ஆகிய ஆறு இடங்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාසමානික්කම් මයා.]
களுக்கும் கிராம சேவர்களை நியமிக்கும்படி நாங்கள் வேண்டியுள்ளோம். இவைகளில் அனேகம் குடியேற்றப் பகுதியிலுள்ள கிராம சேவகர் பிரிவுகள். இதுவரை கிராம சேவகர் பிரிவுகள் இல்லாதிருந்த பகுதிகள், ஏனைய பழைய கிராம சேவர்கள் இவற்றைச் சேர்த்துப் பார்த்துக் கொண்டிருக்கிறார்கள். ஆகவே இந்தப் புதிய பகுதிகளுக்கு புதிய கிராம சேவகர்களை அடுத்த நிதி வருடத்தில் நியமித்துத் தரவேண்டும்.

அடுத்து, மின் நெசவுத் தறிகளை இலங்கையின் பல பகுதிகளுக்கும் அமைச்சர் அவர்கள் கொடுத்திருக்கிறார்கள். மின்தறிகள் வெளிநாடுகளிலிருந்து இலங்கைக்கு நன்கொடையாகக் கொடுக்கப்பட்டவை. ஆனால் எல்லாத் தொகுதிகளுக்கும் மின்தறிகள் கொடுக்கப்படவில்லை. சென்ற ஆண்டிலே கிழக்கு மாகாணத்துக்கு நான்கு மின்தறிகள் கொடுக்கப்பட்டபோது எனது தொகுதிக்கும் ஒரு மின் தறியைத் தரும்படி கேட்டேன். உடனடியாகத் தர முடியாதென்றும் அடுத்த ஆண்டிலே அதையிட்டுக் கவனிப்பதாகவும் அமைச்சர் அவர்கள் கூறினார்கள். எனவே, அடுத்த ஆண்டில் பட்டிருப்புத் தொகுதிக்கு மின்தறியொன்றைத் தரவேண்டுமென்று கேட்டுக் கொள்கிறேன்.

அடுத்து, மது பரிபாலனப் பகுதியின் நிர்வாகத்தையிட்டு இங்கு பலர் பேசினார்கள். அது பற்றியும் சில குறிப்புக்கள் கூற விரும்புகிறேன். மது உற்பத்தியைக் குறைக்கவேண்டுமென்று பல ஸ்தாபனங்களும் சமய சம்பந்தமான ஸ்தாபனங்களும் கேட்டுக்கொண்டிருக்கும் நேரத்தில் இந்நாட்டிலே மது உற்பத்தி கூடிக்கொண்டு வருவதைக் காணும்போது நாம் விசனிக்காமல் இருக்க முடியாது. மதுவால் ஏராளமான வருமானத்தைப் பெறும் காரணத்தால் அரசாங்கம் அதனைக் கைவிடத் தயங்குகின்றதென்று கருதுகிறேன். ஆகவே, மதுவை ஒழிக்க வேண்டுமென்று பல சமய சம்பந்தமான ஸ்தாபனங்கள் கூறிக்கொண்டிருக்கும் அதே நேரத்தில் அரசாங்கம் மது உற்பத்தியை அதிகரிக்கும் கைங்கரியத்தில் ஈடுபட்டுக்கொண்டிருக்கின்றது. அத்துடன் மது விற்பனையைக் குறைப்பதற்கான பல சட்டதிட்டங்களையும் தயாரித்துக் கொண்டிருக்கின்றது. அதனால், கள்ளத்தனமாக உற்பத்தி செய்யும் பல மதுபானங்கள் உற்பத்தியாவது மாத்திரமன்றி, நாடு முழுவதும் கள்ளமாக மது விற்பனை செய்யும் இடங்களும் ஏற்பட்டுக் கொண்டிருக்கின்றன. ஆகவே அரசாங்கத்தின் கொள்கைப்படி மதுவை அதிகரிப்பதானால் அங்கீகாரத்தோடு மது விற்பனை செய்யும் இடங்களை அதிகரிக்க வேண்டும். ஒருபுறம் மதுவை லைசன்ஸோடு விற்கும் விற்பனை இடங்களைக் கொடுக்க மறுக்கும் அதே நேரத்தில் மது உற்பத்தியையும் கூட்டிக்கொண்டு வருகின்றீர்கள். இதனால் அதிகாரம் இல்லாத மது விற்பனை இடங்கள் தோன்றிக் கொண்டிருக்கின்றன. எனவே, மது விற்பனைக்காகத் தவறணைகள் இல்லாத இடங்களில் தவறணைகள் ஏற்படுத்தி மதுவை இலகுவாக வாங்கும் நிலையை ஏற்படுத்த வேண்டும். அல்லது மது உற்பத்தியைக் குறைக்க வேண்டும்.

எனது பகுதியில் ஒரு கள்ளுத் தவறணை இருந்தால் அதைச் சுற்றி பத்து கள்ளமாகக் கள் விற்கும் தவறணைகள் ஏற்பட்டு விடுகின்றன. ஒவ்வொரு கிராமத்திலும் அனேகமாக ஒவ்வொரு வீடுகளிலும் கள்ளு, சாராயம் விற்பனை செய்யும் இடங்கள் ஏற்பட்டுக்கொண்டிருக்கின்றன. அதன் மூலம் மக்கள் இலகுவாகப் பணம் உழைக்கும் ஒரு வழியைக் கண்டுபிடித்திருக்கிறார்கள். குடியேற்றப் பகுதிகளில், அனேகமாகத் தவறணைகள் இல்லாத பகுதிகளில் மக்கள் தங்கள் இலாபப் பணத்தை மதுபானத்தில் விரயம் செய்யும்போது அவர்கள் அதிக விலைகொடுத்து மதுவை வாங்க வேண்டியிருக்கின்றனர். ஆகவே, அந்தப் பகுதிகளில் அரசாங்கம் தவறணைகளை ஏற்படுத்த வேண்டும். அல்லது அவர்கள் இலகுவாக மதுவைப் பெறக்கூடிய வழிவகைகளைச் செய்து கொடுக்க வேண்டும்.

Finally, Mr. Chairman, I wish to say a few words in reply to certain observations made by the hon. Second Member for Batticaloa (Mr. Latiff Sinnalebbe) regarding the administration of the kachcheri in the Batticaloa District. The hon. Member attacked not only the officers at the kachcheri but singled out the Government Agent, Mr. T. Nesiah. He also sought to say that there was discrimination against certain sections of the public in the Batticaloa District. I must here and now, Mr. Chairman, refute what my hon. Friend the Second Member for Batticaloa said.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

It looks to me as if the hon. Second Member for Batticaloa has developed an anti-Government-Agent phobia for the past several years. In fact, the Government Agent, Mr. Kasalingam, who was doing very useful service there was transferred out of Batticaloa on representations made by the hon. Second Member for Batticaloa and his colleague purely on the ground that he was not accommodating one hundred per cent of their demands.

Mr. Kadirgamanathan succeeded Mr. Kasalingam, and again the same hon. Member and his Colleague developed the same phobia and they demanded that Mr. Kadirgamanathan be transferred out. He was another efficient officer, and today he is doing very efficient service in the Mannar Kachcheri. In replacement Mr. Nesiah was transferred to Batticaloa.

Mr. Nesiah is a model public servant. He is very neutral, very impartial, very understanding, and can grasp a problem within a few seconds. He is doing yeoman service on the food production front and in other activities. That the hon. Second Member for Batticaloa should have seen in Mr. Nesiah anti-Muslim tendencies is the strangest story that I have heard in this House.

I would tell the hon. Second Member for Batticaloa that if he has any differences with the G. A. he should thrash them out with the officer at the co-ordinating committee. Let him not think that every government servant should dance to his tune or to the tune of politicians. There are government servants who are independent and take an impartial view in all matters. What the hon. Member is doing is hardly fair by them. I would like to point out to the Hon. Minister of Home Affairs that it is hardly fair that such wild charges should be levelled against officers who do not have a chance to defend themselves. I would like to finish my speech with the assurance to the Hon. Minister that he has given us one of the best Government Agents.

**කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.**
(සොරනාතොට)

*(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணத்தோட்டை)*

(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)

ගරු සභාපතිතුමනි, මෙවැනි තදබදයක් ඇති අවස්ථාවක ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට මට ඉඩ ප්‍රස්තාව ලබා දීම ගැන මා පළමුකොටම තමුන්නාන්සේට මගේ ස්තුතිය පිරිනමනවා. මේ ජාතික රජයේ ඇමතිවරුන් හුඟ දෙනෙකුටම ස්තුති කරන්නට පුළුවන්කමක් අපට නැහැ. එහෙත් ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාට අපේ ස්තුතිය පුද කරන්නට අපට සිදු වෙනවා. එතුමා අවංකවත් පක්ෂ භජනයෙන් තොරවත් ක්‍රියා කිරීම නිසා. එහෙත් නොයෙක් අවස්ථාවල ගරු ඇමතිතුමාගේ උනන්දුව තිබුණත් යම් යම් දෙපාර්තමේන්තුවල තිබෙන දුර්වල කම් නිසා අප නියෝජනය කරන කොට්ඨාශවල දියුණුවට සෑහෙන ප්‍රමාණයකින් අවහිර පැමිණෙන බව කියන්නට සිදු වී තිබෙනවා. උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව මගින් 1965 දී රිදීපාන-කිරිඹරුව-කන්දේගෙදර පාර සඳහා රුපියල් 99,000 ක් වෙන් කර 1966 දී පාර කපන්නට පටන් ගෙන අද වන විට එයින් විශාල මුදලක් වියදම් කර තිබෙනවා. ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත්කරුවෙකුට ඒ වැඩේ භාර දී මුදල් වියදම් කළා. එහෙත් වැඩේ කෙරුණේ නැහැ. මේ පිළිබඳව කීප වතාවක්ම කොමසාරිස්තුමාට පැමිණිලි කළා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාවේදීත් මේ ප්‍රශ්නය මතු කළා. එහෙත් තවම පිළියමක් යෙදී නැහැ. ඒ කොන්ත්‍රාත්කරුගේ දුර්වලකම නිසා නොවුනා නම් මේ වන විට හැතැප්ම දෙක තුනක හරිය පාර කපන්නට තිබුණා. විශේෂයෙන්ම ඒ කටයුත්ත කරවන මහනුවර අස්ගිරියේ තිබෙන රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වරද නිසා ඒ ප්‍රදේශයට වෙන්නට තිබුණු යහපතක් නැතිව ගියා. මේ රිදීපාන-කිරිඹරුව-කන්දේගෙදර පාර සෑදීම මෙතෙක් ප්‍රමාදවන්නට හේතුව කුමක්ද කියා මා අහනවා. එමෙන්ම ඒ වෙන් කළ මුදල්වලට සිදු වුණේ කුමක්ද කියාත් දැන ගන්නට කැමැතියි. මෙය ගැමි පුනරුත්ථාපන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේරත්න බණ්ඩා මයා.]

යෝජනා ක්‍රමය මගින් කපන්නට කලින් සිට තිබුණු පාරක්. කලින් නම් මේ පාරේ රථ වාහන යන්නට පුළුවන් කම තිබුණා. පාර සෑදීම සඳහා රුපියල් 70,000ක් වියදම් කළාට පසුව දැන් කරත්තයකටවත් යන්න බැහැ. කැඩූ ගල් කැපූ පස් පාර මැද තිබෙනවා. ඒ ප්‍රදේශයේ අයට මෙය ලොකුම කරදරයක්. හුඟ දෙනෙක්ම මගෙන් අහනවා මොකක් ද මේ වැඩේ තේරුම තිබුණු පාරත් නැතිව ගියා නේද කියා. මේ චෝදනාව ඇමතිතුමා බාර ගන්න වුවමනාවක් නැහැ. මෙය සිදු වී තිබෙන්නේ නිලධාරීන්ගේ වරද නිසයි. ගරු ඇමතිතුමා මේ කාරණය ගැන පරීක්ෂා කර බලා එම පාර හදා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා.

මගේ කොට්ඨාශයේ තිබෙන කුරුකුදේ-මල්වත්ත පාර, ඇටම්පිටිය-අඹේවෙල-නෙලුව පාර, රිදීපාන-කිරිඹරුව-කන්දේගෙදර පාර කියන මේ පාරවල් තුන උඩ රට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවට බාර දී තිබෙනවා. එය එම දෙපාර්තමේන්තුව බාර ගෙන එය කරනවාය කියා මට 1966 නොවැම්බර් 6 වැනි දින ලියා එවලත් තිබෙනවා. එහෙත් තවම කිසිවක් කෙරී නැහැ. ඒ ගැනත් සොයා බලා ක්‍රියා කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

දිසාපතිතුමා විසින් ඇල්ලවල ජල යෝජනා ක්‍රමය යෝජනා කර මගේ කැමැත්ත අසා එවා තිබුණා. එය සිදු වුණේ 1967 දී මා එයට කැමත්ත ප්‍රකාශ කර යැව්වා. එහෙත් අද වන තුරු කිසිවක් කෙරී නැහැ. එයට හේතුවත් සොයා බලන්නය කියා මා ගරු ඇමතිතුමාට කියනවා.

කන්දෙගෙදර මධ්‍යම දිස්පැන්සරිය ගැනත් මතක් කරන්නට ඕනෑ. මා ළඟ ලියවිලි නම් තිබෙනවා. වෙලාව නැති නිසා කියවන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. එම දිස්පැන්සරිය සඳහා ඉඩමක් වෙන් කර ගෙන තිබෙනවා. ඒ ඉඩම වෙන් කර ගත් අවුරුද්දට පසු අවුරුද්දේ සිට එහි වැඩ පටන් ගන්නවා යයි කියා තිබුණා. එහෙත් තවමත් කිසිම පියවරක් ඒ සම්බන්ධව අරගෙන නැහැ. මේ මධ්‍යම දිස්පැන්සරිය ඉතා ඉක්මණින් සාදා දීමට ක්‍රියා කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

අ. භා. 3.45

ඊළඟට ග්‍රාම සංවර්ධන සමිති ගැන මතක් කරන්නට ඕනෑ. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරුන් රාශියක් ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳව සෑහෙන විග්‍රහයක් කළා. අද ඒවා තිබෙන්නේ නමින් පමණයි. ඒක බොහොම කනගාටුදායක කරුණක්. කාලයකට ඉස්සරවෙලා මේ සමිතිවලින් ගම්වලට විශාල සේවයක් සිදු වුණා. දැන් ග්‍රාම සංවර්ධන සමිති තිබෙන්නේ කොන්ත්‍රාත් කිරීමේ බලාපොරොත්තුවෙන් සිටින සංවිධාන වශයෙන් පමණයි. ගමට සේවයක් කිරීමේ අදහසින් ඇති කරන ලද ග්‍රාම සංවර්ධන සමිති අද කිසිම බලතලයක් නැති නිකම්ම බෝඩ්ලෑලිවලට පමණක් සීමා වූ ඒවා බවට පත්වෙලයි තිබෙන්නේ. ඒ නිසා ග්‍රාම සංවර්ධන සමිති මගින් ගම්වල විශාල වැඩ කොටසක් ඉටු කර ගැනීමට හැකිවන අන්දමේ සැලැස්මක් සකස් කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ග්‍රාම සේවක මහත්වරුන් පිළිබඳවත් මතක් කරන්නට ඕනෑ. ග්‍රාම සේවක මහත්වරුන්ගේ ප්‍රශ්නය මේ සභාවේ බොහොම දුරට විවේචනය කෙරුණා. මා ග්‍රාම සේවක මහත්වරුන් බොහොම දෙනෙකු මුණ ගැසී ඔවුන්ගේ අඩුලුහුඩුකම් ආදිය සොයා බලා තිබෙනවා. ඔවුන් සේවය කරන්නේ තමන් උපන් ගමේ නොවෙයි. ඔවුන් සේවයට පත් කරන්නේ අල්ලපු ගමට හෝ ඊටත් එහා ගමටයි. ඒ උදවියට හරියාකාර කාර්යාලයක් නැහැ. කුලියට ගෙයක් ගන්නට සිදු වෙනවා. කුලියට ගන්න ගෙයි වුණත් අවශ්‍ය උපකරණ නැහැ. ග්‍රාම සේවක මහතුන් භාරයේ සෑහෙන වගකියයුතු ලිපිගොනු රාශියක් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒවා තබා ගැනීමටවත් සෑහෙන පහසුකම් ඔවුන්ට සලසා දී නැහැ. ඒ නිසා ඔවුන්ට කාර්යාලයකුත්, අත්‍යාවශ්‍ය ලිපිගොනු ආදිය තබා ගැනීම සඳහා උපකරණත් සපයා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කුඩා කර්මාන්ත පිළිබඳ අංශය ගැනත් මා මේ අවස්ථාවේදී කරුණක් දෙකක් මතක් කරන්නට කැමතියි. කුඩා කර්මාන්ත අංශයෙන් මට පෙනෙන හැටියට ක්‍රියාත්මක වී තිබෙන්නේ ඉතාම සුළු වැඩ ප්‍රමාණයක් පමණයි. රෙදි මධ්‍යස්ථාන සම්බන්ධයෙන් බොහොම දෙනෙකු මේ ගරු සභාවේදී කරුණු ඉදිරිපත් කළා. මා ඒ ගැන කියන්නට යන්නේ නැහැ. එහෙත් මැටි කර්මාන්තය, වඩු කර්මාන්තය වගේ දියුණු කළයුතු කර්මාන්ත රාශියක් ගම්බද ප්‍රදේශවල තිබෙනවා. ඒ කර්මාන්ත අද විශාල අභේනිවලට මුහුණපා තිබෙනවා. අද ඒ කර්මාන්ත සඳහා විශේෂ යන්ත්‍ර හා අවි ආයුධ ලබා ගැනීමට පවා අසීරු තත්ත්වයකුයි තිබෙන්නේ. ඔවුන්ගේ කර්මාන්තවලින් මේ රටට විශාල යහපතක් සිදු කර ගන්නට පුළුවන්කම තිබෙන අතර ඒ මගින් විශාල විදේශ විනිමයකුත් සොයා ගන්නට පුළුවන්කම තිබෙනවා. එහෙත් ඔවුන්ට ආධාර දීමට රජය කිසිම සැලැස්මක් සකස් කර නැහැ. පසුගිය රජය පැවැති කාලයේ ඔවුන්ගේ සුළු කර්මාන්ත දියුණු කර ගැනීම සඳහා රුපියල් දෙතුන් දාහක ණය මුදලක් ලබා ගැනීමේ පහසුකම් සලසා තිබුණා. එහෙත් 1965න් පසුව සහනාධාර ලබා ගන්නට උත්සාහ කළ මගේ ආසනයේ සුළු කර්මාන්ත හිමියන් කිහිප දෙනෙකුට මේ දක්වා ආධාර ලැබී නැහැ. ඒ නිසා ඔවුන්ගේ අනාගත සෞභාග්‍යය උදාකිරීම සඳහා ඔවුන්ට ආධාර ක්‍රමයක් සකස් කර දෙන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ඊළඟට මා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට අදහස් කරන්නේ කිතුල් ගස් මැදීම පිළිබඳවයි. අපේ ගම්වල දුප්පත් ජනතාව නිරායාශයෙන් හැදෙන කිතුල් ගස් මැද යම්කිසි ප්‍රයෝජනයක් ඒ මගින් ලබා ගන්නවා. ඒ පිළිබඳ නීතිරීති බොහොම තද කර තිබෙන බව මා පසුගියදා පත්‍රයකින් දැක්කා. සුරාබදු දෙපාර්තමේන්තුව රා කියා අල්ලා ගෙන එන්නේ මීරායි. ඒ අන්දමට මිනිසුන් අල්ලාගෙන ඇවිත් අමාරුවේ දමනවා. ඒ නිසා කිතුල් ගහක් මැද ගන්න පුද්ගලයාට කිසි අවහිරයක් කරදරයක් නැතිව එය මැද ගැනීමට අවසර පත්‍රයක් ලබා දීමේ වැඩ පිළිවෙලක් යොදන මෙන් තමුන්නාන්සේගෙන් මා ඉල්ලා සිටිනවා. සුරාබදු දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරීන් මීරා ටිකක් අල්ලාගෙන ගිහින් ඊට සෝඩා ටිකක් දමා අහිංසක මිනිසුන් උසාවිවලට ඉදිරිපත් කර අමාරුවේ දමනවා. ගම්බද ප්‍රදේශවල නිරායාසයෙන් හැදෙන කිතුල් ගසක් මැද ගන්න මෙවැනි හිරිහැර කරදරවලින් තොර වැඩ පිළිවෙලක් යොදන මෙන් මා තමුන්නාන්සේගෙන් නැවතත් වරක් ඉල්ලමින්, තවත් මතක් කරන්නට කරුණු රාශියක් තිබුණත් කාලවේලා මදිකම නිසා ඒවා ඉදිරිපත් කරන්නට පුළුවන්කමක් නැති නිසා මා මේ ඉදිරිපත් කළ කාරණා ගැන අවධානය යොමු කර ගම්බද ප්‍රදේශවල ජනතාවට යහපතක් සිදුවන ආකාරයට කටයුතු කරන මෙන් ඉල්ලමින්, මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardene)

ගරු සභාපතිතුමනි, කියන්නට කරුණු රාශියක් තිබුණත්, වේලාව සීමා කර තිබෙන නිසා විශේෂ කරුණු දෙක-තුනක් පමණයි, මේ අවස්ථාවේදී මා ඉදිරිපත් කරන්නට අදහස් කරන්නේ. මගේ කොට්ඨාශයේ දොඹවල නමැති ගමේ බලවේග පේෂකර්ම මධ්‍යස්ථානයක් පිහිටුවා දැන් අවුරුදු 4½ක් තරම ගත වී ඇති නමුත් එහි වැඩ තවම ආරම්භ කර නැත්තේ මොන කරුණක් නිසාදැයි මා දැන ගන්නට සතුටුයි. අපි පාලන බලයේ සිටි කාලයේදී බලවේග පේෂකර්ම මධ්‍යස්ථාන සඳහා යන්ත්‍ර 100ක් පමණ දීමට චීන රජය කැමැත්ත පළ කර තිබුණු බව මට මතකයි. ඒ කෙසේ වෙතත් මේ සාදා නිම කර තිබෙන බලවේග පේෂකර්ම මධ්‍යස්ථානයේ කටයුතු ඉක්මණින් ආරම්භ කර ප්‍රදේශයේ රැකී රක්ෂා නැති කිහිප දෙනෙකුටවත් රැකී රක්ෂා සපයා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

කටුගම්පොළ ගරු මන්ත්‍රීතුමා (සුබසිංහ මයා.) කළ ප්‍රකාශය මා සම්පූර්ණයෙන්ම අනුමත කරනවා. සමුපකාරය මගින් නූල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

ලබාගෙන අත්යන්ත්‍ර මගින් රෙදි වියා, පොදු ස්ථානයකට ගෙන ගොස් ඒවා විකුණා ගම්බද පළාත්වල තරුණ තරුණියන් විශාල ගණනක් තමන්ගේ ජීවිකාව කරගෙන ගියා. වේයන්ගොඩ නූල් නිෂ්පාදන කර්මාන්තශාලාවක් ඇති කළේ, එම නූල් සමුපකාරය මගින් බෙදා හරින්නට කටයුතු සලස්වමින් සමුපකාරය දියුණු කිරීමේ අදහසිනුයි. මිනුවන්ගොඩ, කටාන, මීරිගම හා දිවුලපිටිය යන ඡන්ද දායක කොට්ඨාශ හතරේ අත්යන්ත්‍රවලින් රෙදි වියා ජීවත් වන්නන් 6,000ක් පමණ සිටිනවා. කැලෑපිටිමුල්ලේ වියන්නන්ගේ සංගමයෙන් කොපමණ සේවයක් සිදු වී තිබෙනවාදැයි ඇමතිතුමාම දන්නවා. කටුගම්පොළ කොට්ඨාශයේ වාගේම මා කලින් සඳහන් කළ කොට්ඨාශ හතරේත්, නූල් ලබා ගන්නට තිබෙන අමාරුව නිසා රැකියාව කර ගන්නට බැරිව ළතැවෙන විශාල පිරිසක් ඉන්නවා.

රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහා රජය කළ යුත්තේ රැකීරක්ෂා සැපයෙන මාර්ග ඇති කිරීම යයි දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) දැක්වූ අදහසට මාත් එකඟ වෙනවා. 1956ට කලින් මේ රටේ 10,000කට වඩා පිරිසක් බීඩි කර්මාන්තයේ යෙදී සිටියේ නැහැ. ඒ පිරිසෙනුත් හරි අඩක්ම වාගේ ඉන්දියාවේ "කොච්චි" වශයෙන් හැඳින්වෙන අයයි. ඒ කාලයේ පිටරටින් විශාල වශයෙන් බීඩි ගෙන් වූ නිසායි, එවැනි තත්ත්වයක් ඇති වී තිබුණේ. ඒ සම්බන්ධයෙන් ඇති වී තිබෙන කණගාටුදායක තත්ත්වයත්, ඊට යෙදිය යුතු ප්‍රතිකර්මත් පෙන්වා දෙමින් 1957 දී, දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාට සංදේශයක් ලැබුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් එම විෂයය භාරව එවකට සිටි ඇමතිවරයා වූ වර්තමාන දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා, ඉන්දියාවෙන් බීඩි ගෙන්වීම අවුරුදුපතා සියයට 20 බැගින් අඩු කරමින් බීඩි ගෙන්වීම අවුරුදු 5ක් තුළ සම්පූර්ණයෙන් නතර කිරීමට වැඩ පිළිවෙළක් ඇති කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1962 වන විට ලංකාවේ බීඩි කර්මාන්තය කොයි තරම් දියුණු වුණාද කීවොත්, 4,00,000 ක් පමණ දෙනා එමගින් සිය ජීවිකාව කර ගත්තා.

බීඩි කර්මාන්තය එතෙක් ගෘහ කර්මාන්තයක් වශයෙන් පැවතුණත්, එහි දියුණුව නිසාම එය විශාල කර්මාන්තයක් වශයෙන් සලකා, අපේ රජය පැවති කාලයේදී—1964 දී—බීඩි කර්මාන්තයේ යෙදී සිටින්නන්ට අඩුම වේතනයක් පවා නියම කළා. එම දියුණුව නිසාම බීඩි කමාන්තය කර්මාන්ත අමාත්‍යාංශය යටතට පවරා ගත්තා.

මෑතක් වන තුරුත් එය පැවතුණේ කර්මාන්ත අමාත්‍යාංශය යටතේයි. මේ බීඩි කර්මාන්තය සම්බන්ධයෙන් මේ රජය ඇති වුණාට පසුව මා ඇසූ ප්‍රශ්න කීපයකටම පිළිතුරු ලැබුණේ නැහැ. මාස කීපයක් ගත වීමෙන් පසුව එය කර්මාන්ත ඇමතිතුමා වෙතින් ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාට තල්ලු වී තිබුණා. බීඩි කර්මාන්තයේ කලින් පැවති දියුණුව දැන් අඩුවේගන එන බව අපට පෙනී ගොස් තිබෙනවා. බීඩි කර්මාන්තය සම්බන්ධයෙන් දැන් නියම සැලැස්මක් අනුව වැඩ කෙරෙන්නේ නැහැ. කාටත් බලපත්‍ර ලැබෙනවා. බීඩි කර්මාන්තය යළිත් වරක් ගෘහ කර්මාන්තයක් වශයෙන් පිළිගැනීමෙන් පසු එහි දියුණුව සම්පූර්ණයෙන්ම කඩාකප්පල් වුණු බවට දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා කළ ප්‍රකාශයට මා එකඟ වෙනවා. මේ අවස්ථාවේදී මා විශේෂයෙන් නැගී සිටියේත්, විශේෂයෙන් ආණ්ඩු පෙරළියකින් හෝ ඇමති මාරුවකින් පසුව සම්පූර්ණ වැඩ පිළිවෙළම වෙනස් වෙන නිසා මෙවැනි අඩුපාඩුකම්, අතපසු වීම්, දියුණුව ඇනහිටීම් ඇති වන බව පෙන්වා දීමටයි.

අපේ රජය පැවති කාලයේදී ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වශයෙන් කටයුතු කළේ එම්. එස්. පෙරේරා මහතායි 1968 වන විට, ලංකාවට අවශ්‍ය මුළු කපු රෙදි ප්‍රමාණයම අත්යන්ත්‍ර හා බලවේග යන්ත්‍ර මගින් වියන්නට පුළුවන් තත්ත්වයකට ගෙන ඒම සඳහා එතුමා වැඩ පිළිවෙළක් සකස් කර තිබුණු බව මට හොඳට මතකයි. වේයන්ගොඩ නූල් නිෂ්පාදන කර්මාන්තශාලාව පිහිටුවීමේ මූලික පරමාර්ථය වුණේත්, සමුපකාරයට අවශ්‍ය නූල් ලබා දීමයි. එහෙත් මේ රජය යටතේ ඇති තිබෙන තත්ත්වය මොකක්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වේයන්ගොඩ නූල් නිෂ්පාදන කර්මාන්තශාලාවට උදෙන්ම ගිහින් බැලුවොත් පෙනේවි, "වෙලෝනා" වැනි පෞද්ගලික කර්මාන්තශාලා හිමියන්ගේ ලොරි ඒ අසළ පෙළ ගසා තිබෙන හැටි. එම නිසයි, සමුපකාරයට වුවමනා තරම් නූල් ලැබෙන්නේ නැත්තේ. තුවා, ඇඳ ඇතිරිලි ආදිය සෑදීම, මගේ කොට්ඨාශයේ ගෘහ කර්මාන්තයක් වශයෙන් කෙරෙනවා. එහෙත් ඒවාට අවශ්‍ය නූල් ලබා ගන්නට තිබෙන අපහසුව නිසා දැන් ඒ වැඩ නතර කරන්නට ඔවුන්ට සිදුවී තිබෙනවා. ඊට හේතුව ඒ සඳහා අවශ්‍ය නූල් ගෙන්වා ගැනීමට විවිහිස ක්‍රමය යටතේ සියයට 55 ක් ගෙවන්නට සිදු වීමයි. ඒ විදියට නූල් ගෙන්වා රෙදි නිෂ්පාදනය කොට විකුණන්නට බැරි නිසා දැන් ඒ කර්මාන්තය සම්පූර්ණයෙන්ම නතරවන තැනට කටයුතු යෙදී තිබෙනවා. ඒ අතර දැන් ලොකු කාර්මිකයෝත් පොඩි කාර්මිකයෝත් අතර තරගයක් ඇති වී තිබෙනවා. ඒ තරඟයෙන් පොඩි කාර්මිකයාට ජය ගන්නට කවදාවත් ඉඩක් ලැබෙන්නේ නැහැ. ලොකු කාර්මිකයා ඉදිරියට එන විට පොඩි කාර්මිකයා සම්පූර්ණයෙන්ම මැකී යන තැනට කටයුතු යෙදෙනවා. ස්වදේශ කටයුතු බාර ගරු ඇමතිතුමා සමග මා 1947 දී සිටම ඉතා කිට්ටුවෙන් ආශ්‍රය කරනවා. එතුමා ඒ කාලයේදී දුප්පතා වෙනුවෙන් සටන් කළ හැටි මට මතකයි. එහෙත් එතුමාට දැන් ඒවා අමතකදැයි මා දන්නේ නැහැ. වේයන්ගොඩ නූල් නිපදවන කර්මාන්තශාලාව තිබෙන්නේ තමන් අතේ නොව කර්මාන්ත ඇමතිතුමා අතේයයි බාග වේලාවට ගරු ස්වදේශ ඇමතිතුමා කියන්නට පුළුවනි. එහෙත් කැබිනට් මණ්ඩලය පොදු වගකීම් උඩ කටයුතු කරනවා නම්, වේයන්ගොඩ නිපදවෙන නූල් ලොකු කොම්පැනි කාරයන්ට පමණක් ගන්නට නොදී පොඩි කාර්මිකයාත් නගා සිටුවීමේ වැඩ පිළිවෙළක් යොදා ගන්නට පුළුවනි. ගරු ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාට හොඳ අදහස් තිබෙන බව මා දන්නවා. එහෙත් ඒවා ක්‍රියාවේ යෙදීමට අවශ්‍ය සහයෝගය එතුමාට නොලැබෙන බවයි මට පෙනී යන්නේ.

මා දීර්ඝ වශයෙන් කතා කරන්නට අදහස් කරන්නේ නැහැ. මේ වැය ශීර්ෂය යටතේ කතා කරන්නට තවත් ගරු මන්ත්‍රීවරුන් පස් දෙනෙකු පමණ මේ පැත්තේ සිටිනවා. ඒ අයටත් කෙටි වේලාවක් හෝ ගරු සභාපතිතුමා ලබා දෙනවා ඇතැයි මා විශ්වාස කරනවා. මට ඉදිරිපත් කරන්නට අවශ්‍ය වී තිබුණු කරුණු දෙක මා ඉදිරිපත් කළා. ඒවා ගරු ඇමතිතුමාගේ කල්පනාවට ගෙන රැකීරක්ෂා හිඟය නැති කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

**ඩී. ඊ. තිලකරත්න මයා.**

*(திரு. டி. ஈ. திலகரத்ன)*

(Mr. D. E. Tillekeratne)

මේ වැය ශීර්ෂය යටතේ කතා කිරීමට මට ලැබී තිබෙන්නේ ඉතාම කෙටි කාලයක්. උඩරට ගැමි කොමිෂන් සභාව සම්බන්ධයෙන් මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) ප්‍රකාශ කළ අදහසට මා එකඟ වන බව පළමු කොටම කියන්නට ඕනෑ. උඩරට සඳහා පමණක් ගැමි කොමිෂන් සභාවක් පත් කිරීමේ කිසිම තේරුමක් නැහැ. උඩරට පමණක් නොව මුළු ලංකාවේ සෑම තැනකම ගැමියන් සිටිනවා. උඩරට ගැමියන් පමණක් නොදියුණු ගැමියන් වශයෙන් වෙන් කිරීම ඉතාම වැරදි වැඩක්. දකුණු පළාතේ ගම්වලත් ඕනෑ තරම් නොදියුණු ගැමියන් සිටිනවා. එම නිසා, උඩරට පාත රට යනුවෙන් භේදයක් ඇති නොකර, "උඩරට ගැමි කොමිසම්" යන නම ඉවත් කොට දැනට එය "ගැමි කොමිසම" යන නමින් පවත්වා ගෙන යන අතර පාත රට ගැමියන් සඳහාත් ගැමි කොමිසමක් පත් කරන ලෙස මා ආණ්ඩුවෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ඊළඟට කොහු කර්මාන්තය ගැන වචනයක් දෙකක් කිව යුතුයි. දකුණු පළාතෙහි ඉතා විශාල වශයෙන් කොහු කර්මාන්තය කෙරෙන බව අප කවුරුනුත් දන්නවා. එය කුඩා කර්මාන්තයක් වශයෙන් පැවතුණත් අප එය සලකන්නේ විශාල කර්මාන්තයක් වශයෙනුයි. මෙම කර්මාන්තය දියුණු කිරීමට ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමා විශාල මහන්සියක් ගැනීම ගැන අප සන්තෝෂ වෙනවා. අධ්‍යක්ෂතුමා කොපමණ මහන්සි ගත්තත් රජයෙන් ඊට ලැබෙන උපකාරය මදි නිසා එය දියුණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තිලකරත්න මයා.]

කිරීම අපහසු වී තිබෙනවා. මෙම කර්මාන්තය සඳහා හැම ගෙදරකම තිබෙන්නේ පොඩි අත් යන්ත්‍රයක් පමණයි. ජීවිකාව ගෙන යාමට අවශ්‍ය වියදමට සැසඳෙන ආදායමක් එම කුඩා යන්ත්‍රවලින් නිපදවෙන ද්‍රව්‍ය වලින් ලබා ගන්නට බැහැ. එම නිසා මේ කර්මාන්තය දියුණු කිරීම සඳහා ලොකු කර්මාන්තශාලා අඩු ගණනේ දෙකක් තුනක් වත් දකුණු පළාතෙහි ඇති කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මගේ ඡන්දදායක කොට්ඨාශයට පමණක් මා ඒ ලොකු කර්මාන්තශාලා ඉල්ලන්නේ නැහැ. බලපිටිය, අම්බලන්ගොඩ, රත්ගම හා හබරාදූව යන පළාත්වල මෙකී ලොකු කර්මාන්තශාලා පිහිටුවා මෙම කර්මාන්තය දියුණු කිරීමට කටයුතු යොදන ලෙස මා ඉල්ලා සිටිනවා. විශේෂයෙන් මා මෙම ඉල්ලීම කරන්නේ ජර්මනිය, අයිරානය ආදී රටවලට කෝටි ගණනක ලුණු පැදුරු සපයන ලෙස අපෙන් ඉල්ලීමක් කර තිබෙන නිසායි. විදේශ විනිමය නැතැයි කෑගසන මේ අවස්ථාවේදී කෝටි ගණනක් හම්බ කරන්න අවස්ථාව මෙයින් ලැබී තිබෙන නිසා ඉල්ලා තිබෙන ඒ ලුණු පැදුරු, පාපිසි හා කඹ යනාදිය පිටරට යැවීමට වහාම කටයුතු යොදන ලෙස මා ඉල්ලා සිටිනවා.

තවත් ප්‍රශ්න දෙකක් ඉදිරිපත් කර මගේ කථාව අවසාන කරනවා. මගේ කොට්ඨාශයේ විදුලි බල පෝෂකර්ම මධ්‍යස්ථානයක් ගැන මා ගිය වර්ෂයේදීත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළා. තවමත් එය ක්‍රියා කරවන්නට පුළුවන්කම ලැබී නැහැ. යන්ත්‍ර සවි කර අවසානයි. නමුත් විදුලි බලය අඩු නිසා තවමත් ඒක ක්‍රියාත්මක කරවන්නට, විවෘත කරන්නට පුළුවන් වී නැහැ. දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මේක පුළුවන් තරම් ඉක්මණින් අවසානයක් කරන්නට මහන්සි ගන්නා බව මා දන්නවා. නමුත් මේ දක්වා විදුලිය ලබා ගන්නට නුපුළුවන් වී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මේ වර්ෂයේදීවත් යම් පියවරක් ගෙන ඒ විදුලි බල පෝෂ කර්ම මධ්‍යස්ථානය විවෘත කරවීමේ අවස්ථාව ලබා දෙන මෙන් මා ඉතා ඕනෑකමින් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

තවත් ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ප්‍රදේශවල සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති, රෙදි වියන්නන්ගේ සමුපකාර සමිති, ඇඳුම් වියන්නන්ගේ සමුපකාරසමිති රජයේ ලියාපදිංචි කරවා ගැනීමේ දුෂ්කරතාවක් තිබෙනවා. ඔවැනි සමිතියක් ලියා පදිංචි කරන්නට කිහිප වරක්ම මහන්සි ගත්තත් දෙපාර්තමේන්තුවෙන් ඉතාම නරක විධියට සලකන බව මට ප්‍රකාශ කරන්නට සිද්ධ වී තිබෙනවා. නරක විධියට සලකනවාය කියන්නේ මේ සමිති ලියා පදිංචි කිරීමට අවුරුදු ගණනාවක් ගැනීමයි. එසේ ලියා පදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර තිබෙන සමුපකාර සමිති ගණනාවක් මගේ කොට්ඨාශයේ තිබෙනවා. මා ඒවායේ නම් කියන්නට අදහස් කරන්නේ නැහැ. නම් කිව්වොත් කවදාවත් ඒවා ලියා පදිංචි කරන එකක් නැහැ. මා රහසිගතව ගරු ඇමතිතුමාට ඒ නම් දෙන්නම්. සමිතියක් ලියා පදිංචි කරන තෙක් සමහර විට ගැහැණු ළමයින්ට අවුරුදු දෙක තුන බලා ගෙන ඉන්නට සිද්ධ වෙනවා. එමනිසා යම් සමිතියක් එසේ ලියා පදිංචි කරන්නටය කියා ඉල්ලුම් පත්‍රයක් එව්වාම අවුරුදු ගණන් ප්‍රමාද නොකර පුළුවන් තරම් ඉක්මණින් ඒවා ලියා පදිංචි කිරීමට වැඩ පිළිවෙළක් සකස් කරන මෙන් මා අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා.

**සභාපති**

*(அக்கிராசனர்)*

(The Chairman)

Order please! The Sitting is suspended for half an hour.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින් අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு மீண்டும் பி. ப. 4.30 மணிக்கு ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

**ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)

*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*

(Dr. N. M. Perera—Yatiyantota)

First of all I want to refer to a parochial matter, a thing which I do not normally do. I listened to the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

hon. Member for Ratgama (Mr. D. E. Tillekeratne) and the hon. Member for Minuwangoda (Mr. de Zoysa Siriwardena) who have had the good fortune to have powerlooms installed in their areas though not working, whereas in my electorate for nearly five years the department has not been able to install a power-loom centre. I have been at the department and the P. W. D. but no action has been taken. Here is a Government that found it possible to spend or is hoping to spend Rs. 168 million—this has gone up to Rs. 268 million now—within the space of a couple of years. The money is there since 1965, but the Government is unable to put up a powerloom project in my constituency.

The Hon. Minister of Industries and Fisheries is going on at a terrific pace ; he is putting up a factory. All credit to him. But what can we make out of a Government that refuses to put up a small powerloom? I think the size of the building you require for a powerloom centre is 60 feet by 20 feet. I have waited patiently for nearly five years. I would say this to the Hon. Minister. Please do not tell me after this that you are doling out with the same spoon both to Government and the Opposition. You have one spoon for the Government and another spoon for the Opposition. Let us be clear about it. The Hon. Prime Minister talks about "හැන්ද අතේ තිබුනා පලියට බෙදා ගන්නෙ නැහැ." I am inclined to remind him that he has been doling out fairly substantially with the spoon so far as he is concerned. If you go to the Dedigama Electorate you will see that everything is provided there. I do not object to that, but the only point is that you must give us some little thing which we have been agitating for five years. That is just by the way. I am not accustomed to peddling my constituency matters in this place, but I cannot help making these observations.

There are just one or two other matters to which I want to refer before I go to the main point. There is a subsidy to the coir salt bags industry. You find that at page 39 of the Hon. Minister's Estimates. I just want some information on that. I do not know how that operates.

I should now like to refer to pawnbrokers. There are 205 pawnbrokers in Colombo of whom only seven are Ceylonese, 25 Ceylonese by descent and the rest are registered citizens. I suppose registered citizens are entitled to carry on pawnbroking. My objection is that there are some people whose turnover, at least the pledged amount sometimes comes to very nearly Rs. 1 million and more. But the deposit that you asked them to provide originally went up to Rs. 10.000. The minimum was Rs. 1,000 and the maximum was Rs. 10,000. Today that has been brought down to Rs. 1,000 and sometimes the liabilities come to a million rupees and more in certain cases of pawnbrokers. There are some people like Mariampillai, Kumar Agencies and so on, whose total liability on the pawnbroking alone. I am credibly informed, is nearly Rs. 2 million. It is not fair that you should ask only a Rs. 1,000 deposit in order to safeguard the people who have gone and pledged their goods. That is one point.

The next point is this. How is it that T. R. P. people are allowed to continue to be in the liquor trade ? I will give you a list of these names: Mr. V. I. Velappu. 632, Aluthmawatte Road, Colombo. This is the address also of Mr. K. K. Madhavan, who I think is the manufacturer of "Ambassador" toddy. Then there is Mr. K. R. Raghavan, Mahivawa Tavern, Kandy. They are all T. R. P. holders. They are not Ceylonese either by descent or registration. The others are. K. Govindanayar, Badulla Arrack Tavern ; N. Sanguny, Kurunegala Arrack Tavern. Narayanam Master, Narammala and Mawatagama Arrack Tavern; A. S. Sankaranarayan, 632, Alutmawatte

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Road,—the same address as my good friend or your good friend, Mr. Madhavan's ; K. R. Chatuni, 622/1, Alwis Place, Colombo 13. Mr. Chatuni obtained his visa, I am told, by declaring that he is the manager of Dominion Hotel. Then there is K. C. Vasudeva. He is the lessee of Bristol Hotel, Fort, and he has declared himself as the manager of Nippon Hotel. How is that possible? I thought at least the safeguard was there that you do not allow non-nationals to do this.

May I ask the Minister to tell us what the position is of his Permanent Secretary? There is something in the C. W. E. Commission Report and he has sought permission from the department to sue the C. W. E. Commission for defamation. What has happened? Has there been any launching of a suit or has anything happened in this matter? We would like to know about that.

I am not quite satisfied with the way the Excise Department is functioning, Mr. Minister. You are talking of catching the kasippu people. Your Excise Department is the biggest kasippu place. Let me give you the details. Ethyl alcohol, which is the same as rectified spirits, which is one of the main bases of kasippu, today comes under OGL. Why? Because your Excise Commissioner has declared to the customs authorities that ethyl alcohol was not an excisable article and that therefore there was no objection to it being allowed to be imported under OGL. You cannot expect to break down kasippu and stop it if one of the main bases of kasippu, rectified spirits is allowed in unlimited quantities. I have seen news items to the effect that the Home Affairs Minister, Dr. W. Dahanayake, has " moved in to prevent ethyl alcohol now imported under Open General Licence from being diverted to the kasippu trade. " But how can you prevent it if you allow it under the O. G. L.? I do not see how you can control it. They are importing it from China and various other places and you cannot possibly control kasippu as long as you allow persons to import rectified spirits.

Now, let me tell you how you produce black bottle arrack which you sell at eight rupees a bottle. It is like this: three bottles of rectified spirit, one bottle of arrack obtained from the distillery, and eleven bottles of water give you a production of fifteen bottles of your eight rupees special arrack. That is how you produce your special black arrack. The base is rectified spirit.

If a private man who brings under O. G. L. rectified spirits follows the same process, how are you going to catch him? How are you going to distinguish between kasippu and the arrack that you are producing and selling at eight rupees a bottle? The same thing is being sold out. So there is something wrong with your department in this matter.

Then for the other arrack that you are producing you import large quantities of arrack essence. Who are the manufacturers of arrack essence? Rawlings produce arrack essence. You are purchasing large quantities of it, running into millions of rupees, I believe. Why is it that you have given this monopoly to Rawlings? I understand that another company called Bush Company was provided with arrack in order to get the essence out. I am told that they are in a position to provide arrack essence at a much cheaper cost than Rawlings but for some unknown reason they continue to fall back upon Rawlings, and that through the R. V. D. B.? Why? Because I think there are certain people who are getting commission—one Mr. Percy Silva, U. K. P. de Silva or somebody like that. He is the man who for a long time has been getting commission on gin as well as on essence. He was at one time a director of the Sugar Corporation, I believe. These are the people who carry on this trade.

Now, Mr. Minister, things are not quite all right in your department. There is no reason why, if you are buying the essence from Rawlings,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

you should be paying extraordinary prices. In the case of gin it is understandable because there is a royalty involved ; you cannot get gin essence from Rawlings because there is a trade mark and you have to pay royalty, but there is no royalty for arrack essence. They are buying through the Crown Agents. I have got the details. They pay the Crown Agents Rs. 85 for every drum they import. Then, the landing and delivery charges are Rs. 183, departmental charges Rs. 74, freight charges, Rs. 4, departmental charges Rs. 6, totalling Rs. 462 per drum.

ප. භා. 4.45

I do not see that you are doing this satisfactorily. I do not blame you. Apparently the people who are concerned are not telling you the truth or they are taking you for a ride.

In point of fact you have not even got permission from the Treasury for this purpose. Originally Treasury permission was granted for a trial endeavour for three months. On the strength of that you have continued since 1964 to make arrack essence year after year without formal sanction from the Treasury for this purpose.

What I want to know is why you are importing more and more. I am told that even while there were stocks you had bought 300 more drums which was over and above the required amount. I do not know why you did that. There are all sorts of rumours about people making commissions in this business.

That apart, there is one question I want to ask. Why is it that since 1964 we have had to depend upon arrack essences produced abroad costing so much foreign exchange? This is supposed to be an industry of the people of this country, to give employment to the people of this country. But what are we doing? Really we are financing a foreign manufacturer in order to run our own local industry which has been going on for so long.

The Hon. Minister can come to this House to make arrangements for the tapping of larger areas if he wants to extend the arrack trade. So far as tapping is concerned, the areas are restricted. He can extend that if there is such a big demand for arrack. But what is happening? You are now producing arrack with rectified spirits on the one side and importing arrack essence on the other. I have got here a report from the "Times Weekender" of 16th February 1969 which says :

"WE'VE BEEN DRINKING 'SLOW POISON' MOLASSES FOR 5 YEARS

Startling revelation by Home Ministry Official

The issue of molasses which was allowed by the Treasury in 1964 as an experiment for only three months has now come to stay without further Treasury approval.

According to this official, the majority of medical experts who had subsequently submitted reports on the effects molasses arrack had on the human system, had condemned it as a slow poison which attacked the nervous system. The majority of these medical experts and analysts had stated in their reports that the arrack was not fit for human consumption.

Molasses arrack, which is a synthetic liquor, is made from rectified spirits, water and arrack essence. It was first issued in early 1964 at Rs. 8 a bottle.

According to Home Ministry sources, apart from the ill-effects of the molasses on national health, a large sum of foreign exchange had been spent on the import of arrack essence.

Although Treasury approval was given only for a period of three months in 1964, the Department had ordered Rs. 4 million worth of arrack essence in 525 barrels—each containing 46 gallons—at Rs. 7,775 a barrel."

You see it involves millions of rupees. This is supposed to be an industry that is indigenous and you are proud of it and are saying that you are going to export arrack from Ceylon, but really you would be exporting somebody else's liquor, rectified spirits and arrack essence all manufactured abroad. That is why I say that the Excise Department has to be put into some sort of order.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

One point more. Recently the police raided the arrack taverns at Kollupitiya and Jampettah. Even in Colombo your Excise Department is sleeping. That is my charge against the Excise Department. They allow the police to carry out these raids.

I am told that the Excise Department was informed in time about the sale of *kasippu* in certain arrack taverns. The Excise Department did not take action. The police had to take action.

There are all sorts of reports about employees of the Excise Department being in the pay of the renters. Here is a "Ceylon Observer" headline of 16th February 1969 :

"Are Excisemen in Tavern Fraud ?" What does it say ?

"Police investigators are probing information that certain Excise Department employees have been paid a regular monthly fee of Rs. 500 each for spiriting away bottle stoppers and arrack labels from Excise warehouses."

What happens ? The tavern men fill the bottles with *kasippu*, put on the Excise Department stopper, paste the arrack label and sell it as arrack.

At the moment I think these places have been closed down but they have appealed to the Minister to get their deposits back. Please see that they do not get back their deposits.

I am sorry, Mr. Chairman, I have taken so much time. I do not want to take any more time.

I appeal to the Hon. Minister : if the Excise Department is not doing its work, scrap it. If you are going to import all this stuff from abroad you might as well have some other department and let that department do all this instead of having this huge and glorified department which costs millions and millions.

Please look into all these matters, Mr. Minister. I think we can leave it safely in your hands, if you will take prompt action.

**එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා.** (මුතූර් පළමුවන මන්ත්‍රී)

*(ஜனாப் எம். ஈ. எச். முகம்மது அலி—மூதூர் முதல் அங்கத்தவர்)*

(Mr. M. E. H. Mohamed Ali—First Mutur)

*அக்கிராசனர் அவர்களே கௌரவ உள்நாட்டு அமைச்சரின் மானியத்தின் கீழ் நான் சில வார்த்தைகள் பேச விரும்புகிறேன். இளமையும் துடிதுடிப்பும் நிறைந்தவர் ; உழைப்பும் ஆர்வமும் மிக்கவர் ; அனைவரையும் கவரக் கூடிய வகையில் சாதனைகள் செய்பவர் ; எளிமையும் அன்பும் பூண்டவர் ; தேசிய உணர்ச்சியுடன் கடமை புரிபவர் எங்கள் அமைச்சர் அவர்கள். நான் அவருக்கு நல்கும் நல் வாழ்த்துக்கள் இவை.*

*இந்த அமைச்சின் கீழுள்ள பல இலாகாக்களைப் பற்றிப் பல கௌரவ அங்கத்தவர்கள் இன்று பல விதமாக அபிப்பிராயம் தெரிவித்தார்கள். நானும் சில இலாகாக்களைப் பற்றி இங்கே குறிப்பிட விரும்புகிறேன்.*

*முதலாவதாக கௌரவ அமைச்சர் அவர்கள் ஜனநாயக அடிப்படையிலே இந்த நாட்டிலே உள்ள அனைவரையும் சமமாகப் பாவித்து ஆயிரம் நெசவு நிலையங்களைக் கொடுத்ததனால், இன்று அவை மூலம் நம் நாட்டு மக்கள் துணியில் சுயதேவைப் பூர்த்தியை அடைந்து கொண்டிருப்பதை நாம் அனைவரும் காண்கிறோம். அதுமட்டுமல்ல. கௌரவ அமைச்சருடைய நோக்கம் என்னவென்றால், இந்த நாட்டிலே உற்பத்தி செய்யப்படும் துணிகளை இந்நாட்டு மக்கள் மதிப்புக்கொடுத்து அணிய வேண்டும் என்பது தான். அந்த அடிப்படையில், அந்த உயரிய நோக்கோடு இப்படியான நெசவு நிலையங்களை ஏற்படுத்தியதுமட்டுமன்றி, நடைமுறையிலும் அமைச்சர் அவர்கள் அதனைக் கடைப்பிடித்து வருவதையிட்டு நான் அவரைப் பாராட்டுகிறேன். அத்துடன், எனது மாவட்டத்திலுள்ள இரண்டு இடங்களான திருகோணமலைக்கும் மூதூருக்கும் இரண்டு மின்தறி நிலையங்களைத் தரும்படியும் நான் அவரைக் கேட்டுக் கொள்கிறேன்.*

*அடுத்து, இந்த அமைச்சின் கீழுள்ள முஸ்லிம் "வக்ப்" சபையைப் பற்றியும் அந்த இலாகாவைப் பற்றியும் என்னுடைய நண்பர் கௌரவ பொத்துவில் பிரதிநிதி (ஜனாப்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

எம். ஏ. அப்துல் மஜீது) அவர்கள் பேசினுர்கள். முஸ்லிம் "வக்ப்" சபை மிகவும் திறமையாகச் சேவை செய்துகொண்டு வருகின்றது. "வக்ப்" இலாகாவின் கொமிஷனராக இருப்பவர் மிகவும் நல்லவர்; நேர்மையானவர்; பண்புள்ளவர். மிகவும் நிதானமான முறையிலே தமது கடமையைச்செய்து வரும் அறிஞர் என்று அவரைக் கூறலாம். அவரோடு அந்தச் சபை அங்கத்தினர் அத்தனை பேரும் ஒத்துழைத்து முஸ்லிம் பள்ளிவாசல், வக்பு விடயங்களை மிகவும் திருப்தியான முறையில் நடத்திக் கொண்டு வருகின்றுர்கள். எனவே, தற்பொழுதுள்ள அங்கத்தினர்களையே அடுத்த மூன்று வருடங்களுக்கும் திரும்பவும் நியமிக்க வேண்டுமென்று நான் ஆலோசனை கூற விரும்புகிறேன்.

முஸ்லிம் விவாக, விவாக நீக்க சட்ட திருத்தத்தை நீங்கள் கொண்டுவர இருக்கின்றீர்கள். அந்தத் திருத்தத்தைக் கொண்டு வரும் பொழுது சுயநலத்திற்காக இன்று இஸ்லாமிய மதத்தைத் தழுவுபவர்களைக் கட்டுப்படுத்து முகமாக திட்டவட்டமான சில திருத்தங்களைக் கொண்டுவந்து அதை முஸ்லிம் சமுதாயம் ஏற்றுக் கொள்ளத்தக்க முறையில் நடத்த வேண்டுமென்று நான் ஆலோசனை கூறுகிறேன். இன்று சிலர் தமது சுயநலத்திற்காக இஸ்லாத்தைத் தழுவினுலும் அப்படித் தழுவுபவர்கள் பின்னர் இஸ்லாமிய முறைப்படி வாழ்வது கிடையாது. ஒருவர் தமது மனைவியைத் தள்ளிவிட்டு இன்னெருமனைவியை விவாகம் செய்வதற்காக இஸ்லாத்தைத் தழுவுகிறுர். இது மிகவும் வருந்தத்தக்க செயல் என்று சுட்டிக்காட்ட விரும்புகிறேன். இப்படி இஸ்லாத்தைத் தழுவுபவர்கள் யாரும் இஸ்லாமிய கடமைகளைச் செய்வதுமில்லை. இச்செயலைத் தடுக்க வேண்டும் இல்லாவிட்டால் இது இஸ்லாத்துக்கு இழிவைத் தரக்கூடிய செயலாக இருக்குமென்பதை நான் ஆணித்தரமாகச் சுட்டிக் காட்ட விரும்புகிறேன்.

இஸ்லாமிய சமுதாயத்தில் விவாக நீக்கம் இலகுவாக இருந்தாலும் விகிதாசாரப்படி முஸ்லிங்களிடையே மற்றைய சமூகங்களைவிட விவாகரத்து மிகவும் குறைவாகவே இருக்கின்றதென்பது குறிப்பிடத் தக்கது. இன்னெரு விவாகத்திற்காக ஒருவர் இஸ்லாத்தைத் தழுவினல் குறைந்தது இரண்டு வருடங்களுக்காவது விவாகம் செய்வதைத் தடுக்கச் சட்டம் இயற்றப்பட வேண்டும். அப்பொழுதுதான் அந்தக் கால எல்லைக்குள் அவருடைய நடை, உடை பாவனை இஸ்லாத்தின் சட்டங்களுக்கமையத் திருந்தும் என்பதை எதிர்பார்க்க முடியும்.

இன்று சில உதாரணங்களைக் கூறினுல் நீங்கள் ஆச்சரியப்படுவீர்கள். ஒரு சிவசுப்பிரமணியம் ஒரு முகம்மது நெய்னுவாக மாறுகின்றுர். ஒரு முனசிங்க ஒரு முகம்மது முனசிங்கவாக மாறுகின்றுர். சுயநலத்திற்காக எவரும் இஸ்லாம் மதத்தைத் தழுவுவதைக் கட்டுப்படுத்த வேண்டும். உண்மையாக ஒருவர் இஸ்லாத்தைத் தழுவினுல் அல்லது தழுவ விரும்பினுல் அவர் இஸ்லாமிய அடிப்படையில் நடந்து கொள்ள வேண்டுமென்பதைச் சுட்டிக் காட்டக் கடமைப்பட்டவனுக இருக்கிறேன்.

அடுத்து, துவக்கு உத்தரவுப் பத்திரங்கள் விஷயமாக இங்கு பலர் பேசினுர்கள். என்னுடைய மாவட்டத்தில் ஏராளமான விவசாயிகள் தங்களுடைய வயல்களையும், சேனைகளையும் பாதுகாப்பதற்கு துவக்கில்லாமல் மிகவும் கஷ்டப்படுகிறுர்கள். பலர் இங்கு குறிப்பிட்டதைப் போல ஒரு துவக்கு அனுமதிப் பத்திரத்தைப் பெறுவதற்கு கிராமசேவகர், காரியாதிகாரி, பொலிசார், அரசாங்க அதிபர் எல்லோருடைய அனுதாபத்தையும் பெற வேண்டி இருக்கின்றது. சில அரசாங்க அதிபர்கள் துவக்கு விண்ணப்பகாரர்களுக்கு சில சமயங்களில் என்ன சொல்கிறுர்கள்? காரியாதிகாரி துவக்குக் கொடுக்கலாம் என்று சிபார்சு செய்தாலும் பொலீசார் கொடுக்கக் கூடாது என்று சிபார்சு செய்திருக்கின்றுர்கள் என்று விண்ணப்பதாரர்களுக்குக் கூறிவிடுகிறுர்கள். பொலிஸ் இலாகா சொல்லக் கூடியதெல்லாம் துவக்கு விண்ணப்பதாரர் குற்றம் புரிந்தவரா இல்லையா என்பதுதான். ஒருவருக்கு துவக்குக் கொடுக்கலாமா கொடுக்கப்படக் கூடாதா என்று தீர்மானம் எடுக்கும் பொறுப்பு அவர்களுக்கு இல்லை என்பதைத் தெரிவிக்க விரும்புகிறேன். இதை நீங்கள் தயவு செய்து பரிசிலனை செய்து, என்னுடைய மாவட்டத்திலேயுள்ள உண்மையான காரணத்துடன் துவக்குப் பெறக் கூடியவர்களுக்கு உதவி செய்ய வேண்டும் என்று நான் உங்களைக் கேட்டுக் கொள்ளுகிறேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහමඩ් අලි මයා.]

ශී. හා. 5

காரியாதிகாரி பிரிவுகளை அதிகரிப்பது பற்றியும், கிராம சேவகர் பிரிவுகளை விஸ்தரிப்பது பற்றியும் திருகோணமலை மாவட்ட இணைப்புக் குழுக் கூட்டத்தில் ஆலோசிக்கப்பட்டு அந்த ஆலோசனைகள் உங்களுக்குச் சமர்ப்பிக்கப்பட்டிருக்கின்றன. என்னுடைய தொகுதிக்கு ஆறு கிராம சேவகர்களை கூடுதலாக நியமிக்க வேண்டும் என்று வற்புறுத்தப்பட்டிருக்கிறது. அதையும் மிகவும் விரைவில் அமுல் செய்ய வேண்டும் என்று நான் கேட்டுக் கொள்கிறேன்.

என்னுடைய மாவட்டத்திலே 'லக்சல' கிளை ஒன்று ஆரம்பிக்கப்பட வேண்டும். திருகோணமலையில் அல்லது கந்தளாயில் அல்லது மூதூரில் 'லக்சல' கிளை ஒன்றை ஆரம்பித்தால் மக்களுக்கு மிகவும் உதவியாக இருக்கும்.

என்னுடைய தொகுதியிலே பொற்கொல்லர்கள் பலர் இருக்கின்றார்கள். அவர்கள் தங்களுடைய தொழிலுக்கு தங்க அனுமதிப் பத்திரங்களைப் பெற்றுக் கொள்வதில் இன்னற்படுகிறார்கள். அவர்களுடைய கோரிக்கைகளை அனுதாபத்துடன் பரிசீலனை செய்து உண்மையான பொற்கொல்லர்களுக்குத் தேவையான தங்க அனுமதிப் பத்திரங்களைக் கொடுத்து உதவி செய்ய வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன்.

அடுத்து, சிறைக் கைதிகளைப் பற்றிச் சில வார்த்தைகள் கூற விரும்புகிறேன். இன்று, சிறையில் எத்தனையோ பேர் துரதிஷ்டவசமாகக் கைதிகளாக இருக்கிறார்கள். அவர்களுக்குப் புனர்வாழ்வளிக்க, நல்ல சீர்திருத்தமான திட்டங்களை வகுத்து அவர்களுடைய எதிர்காலம் மறுமலர்ச்சியடையக் கூடியவகையில் ஆவன செய்ய வேண்டும். திரு. டபிள்யூ. எப். ஜயசூரிய என்பவர் "Rescue of the Prisoner" என்ற ஒரு சிறியநூலை வெளியிட்டிருக்கிறார். அதில் அவர் பல ஆலோசனைகளைக் கூறியிருக்கிறார். அந்த ஆலோசனைகளைப் பற்றி, தங்களுடைய அமைச்சு நியாயமாக நடந்து, துரதிஷ்டவசமாகச் சிறையிலிருந்து தவிக்கும் கைதிகளுக்கு உதவி செய்ய வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன்.

மூதூரில் காரியாதிகாரி ஒருவர் இருக்கிறார். அவருடைய காரியாலயம் 20, 30 வருடங்களாக ஒரு வாடகை வீட்டிலேதான் இருக்கிறது. எனவே, மூதூரில் ஒரு காரியாதிகாரி கந்தோரையும், காரியாதிகாரி வசிப்பதற்கு ஒரு வீட்டையும் கௌரவ அமைச்சர் மிக விரைவில் அமைத்துக் கொடுக்க வேண்டும் என்றும், என்னுடைய மாவட்டத்தின் குறைகளை நியாயமான முறையில் தீர்க்க நடவடிக்கை எடுக்க வேண்டும் என்றும் கேட்டுக் கொள்கிறேன்.

எங்களுடைய மாவட்டத்திலிருக்கும் அரசாங்க அதிபர் பற்றி இந்தச் சபையிலே சில குறைகள் கூறப்பட்டன. அவருக்கு நான் பந்தம் பிடிக்கவில்லை. அவர் தம்முடைய கடமையைச் செய்து கொண்டிருக்கிறார். ஒரு பகுதிக் கதையைக் கேட்டு, எப்பொழுதோ நடந்த பிரச்சினையைக் கிழப்பி இங்கு பேசப்பட்டது. அவர் ஒரு அரசாங்க ஊழியரானபடியால், இவர்களுடைய கண்டனங்களுக்கு பதில் கொடுக்க அவருக்குச் சந்தர்ப்பம் கிடையாது. இரு பகுதிக் கதைகளையும் கேட்காமல், ஒரு பகுதிக் கதையை மாத்திரம் கேட்டு ஒரு அரசாங்க ஊழியர் மீது குறை கூறுவது நல்லதல்ல. இரு பகுதிக் கதைகளையும் விசாரணை செய்து நியாயமாக எது பிழை, எது சரி என்பதை அறிந்து இக் குறையை இச் சபையில் சமர்ப்பிக்க வேண்டும் என்று கேட்டு, எனக்குப் பேசுவதற்கு நேரம் தந்தமைக்காக நன்றி கூறி எனது உரையை முடித்துக் கொள்கிறேன்.

**රාජා කුලතිලක මයා.** (තෙල්දෙණිය)
*(திரு. ராஜா குலத்திலக்க—தெல்தெனிய)*
(Mr. Raja Kulatillake—Teldeniya)

ගරු සභාපතිතුමනි, තෙල්දෙනිය කොට්ඨාශය නියෝජනය කරන මට ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා. මේ අමාත්‍යාංශය ගැන දැන් නොයෙකුත් ගුණ දොස් විවේචන ඇතිවුණා. විශේෂයෙන්ම සුරා බදු දෙපාර්තමේන්තුවේ කණ්ගාටුදායක තත්ත්වය ගැන යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කරුණු කීපයක් ඉදිරිපත් කළා. මෙවර මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගේ විශේෂ අවධානයට යොමු කළයුතු කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට තිබෙනවා.

ගරු සභාපතිතුමනි, තෙල්දෙනිය සංවර විනීත මිනිසුන්ගෙන් ගහණ ප්‍රදේශයක්. නමුත් මෑතක සිට ඒ සංවර විනීත මිනිසුන් සුරාවට පුරුදු කරමින් ජනතාව නොමගට පොළඹවන ව්‍යාපාරයක් ගෙන යනවා. කඩකාරයින් නැත්නම් ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකු විසින් ක්‍රීඩා කිසිවක් නොකරන ඔත් පැත් පමණක් ජනතාවට පුරුදු කරවන "ස්පෝර්ට්ස් ක්ලබ්" එකක් පිහිටුවා තිබෙනවා. මේ නොමනා ස්ථානය සුරාබදු දෙපාර්තමේන්තුවේ බැල්මට හසු නොවීම ගැන අප කණගාටු වෙනවා. නමුත් එහි සිටින දක්ෂ නිලධාරියකු වන පොලිස් ස්ථානාධිපතිතුමා මේ ස්ථානය අල්ලා එය පවත්වාගෙන යන උදවිය නීතියේ රැහැණට හසු කර ක්‍රියා කරන්නට පටන් ගෙන තිබෙනවා. ඒ ගැන මගේ බලවත් සතුට පළ කරනවා. නමුත් මෙවැනි හොඳ නිලධාරීන්—දූෂිත ක්‍රියා මර්දනය කරමින් අවංකව වැඩ කරන නිසා—කරදරයේ දමන්නට ආණ්ඩු පක්ෂයට හිතවත් සමහර දේශපාලනඥයින් පවා ඉදිරිපත් වී සිටින බව මා සඳහන් කරන්නේ කණගාටුවෙන්. ඒ තත්ත්වය ගැන මගේ බලවත් කණගාටුව පළ කරන අතර එසේ අවංකව හොඳට සේවය කරන නිලධාරීන් හට අයුත්තියක් සිදුවන්නට ඉඩක් නොතබන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, සුරා බදු දෙපාර්තමේන්තුවේ අක්‍රමිකතාවන් රාශියක් තිබෙන බව මට පෙන්වා දෙන්නට පුළුවනි. විශේෂයෙන්ම රේන්ද වෙන්දේසි කරන, කොන්ත්‍රාත් දෙන වැඩ පිළිවෙළ සම්බන්ධව බලවත් අක්‍රමිකතාවන් රැසක් සිදු වන බව අපට ආරංචියි. ඒවාගේම ලාංකික රේන්දකරුවන්ට ඉන්දියන්කාරයින් විසින් කරනු ලබන අයුක්තියක් ගැනත් අපට ආරංචියි. පුරවැසි සහතික ලැබ මෙහිදී මිය ගිය ඉන්දියානුවන්ගේ ඒ පුරවැසි සහතික වෙනත් ඉන්දියානුවන් විසින් පාවිච්චි කිරීමේ භයානක කූට ව්‍යාපාරයක් දැන් මේ රටේ ගෙන යන බව අපට පෙනෙනවා. මේ පිළිබඳව කරුණු ගරු ඇමතිතුමා ඉදිරියේ තබන්නට අප අදහස් කරනවා. ඒ මළ අයගේ නම්වලට සරිලන ලෙස නම් වෙනස් කරගෙන මළ අයගේ නම්වලින් රේන්ද කරන බවට කරුණු ඉදිරිපත් කරන්නට පුළුවනි. ආණ්ඩුවේ සමහර මන්ත්‍රීවරුන්ගේද, සෙනෙට් මන්ත්‍රීවරියකගේද සහයෝගය ඇතිව මෙවැනි කටයුත්තක් කළ රත්නපුරයේ පැල්මඩුල්ලේ එම්. කේ. ක්‍රිෂ්ණන් නමැත්තා මින් කෙනෙකි. මොහු 1969-70 රා රේන්ද වික්ණීමේදී කොළඹ නගරය තුළ වූ රා තැබෑරුමක්ද මෙවර ලබාගෙන ඇත්තේ මෙවැනි මළ අයකුගේ පුරවැසි සහතිකයක් කොළඹ දිසාපතිට පෙන්වීමෙනි. මොහු ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය මගින් නිකුත් කරන ලද අංක 208720 දරණ ඉන්දියානු පාස්පෝට් එක හිමිකාරයා වී සිටිද්දී ලාංකික පුරවැසිකම ලබා ගත්තේ කෙසේද යන්න දිසාපතිගෙන් ප්‍රශ්න කළ නමුත් මෙම කරුණ ගැන මේ දක්වාම විභාගයක් පවත්වා නැහැ. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා මේ ගැන දන්නවාදැයි මා දන්නෙ නැහැ. දේශීය ව්‍යාපාරිකයන්ට හිමි මෙවැනි ව්‍යාපාරවල යෙදීමට විජාතික නුසුදුස්සන්ට ඉඩ දීමෙන් දේශීය ව්‍යාපාර කඩාකප්පල් වන නිසා එවැනි විජාතිකයන්ට කිසිසේත් ඉඩ නොදෙන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මළ අයකුගේ පුරවැසි සහතිකයක් ඉදිරිපත් කරමින් පුරවැසි උරුමයන් භුක්ති විඳින මේ තැනැත්තා නිසා මෙවර රා රේන්ද වික්ණීමේදී නියම ලාංකික පුරවැසියකුගේ ටෙන්ඩරය පරාජය වී ගොස් ඔහුගේ අයිතිවාසිකම් හා ව්‍යාපාර ලාභයද නැති වී ගිය බැවින් මෙවැනි වංචාකාරයන් ගැන විභාග කර බලා මොවුන් මෙරටින් තුරන් කළ යුතු බව අගමැතිතුමාට දැන්විය යුතුයි. ලාංකික පුරවැසි අයිතිවාසිකම් තහවුරු කරනවාය යි පාර්ලිමේන්තුවේදී කියන ගරු අගමැතිතුමා මේ කාරණය සම්බන්ධයෙන් කොයි විධියේ දැඩි පියවරක් ගන්නවාද යන්න මා දැන ගන්නට සතුටුයි.

ගරු සභාපතිතුමනි, උඩරට ගැමි පුනරුත්ථාපන ව්‍යාපාරය හොඳ චේතනාවෙන්—හොඳ පරමාර්ථයෙන්—ආරම්භ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රාජා කුලතිලක මයා.]

කළත් ඒ තුළත් නොයෙකුත් දූෂණ තිබෙන බවට කරුණු ඉදිරිපත් කරන්නට පුළුවන්. කාල වේලා මදි නිසා එක කාරණයක් පමණක් සඳහන් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. එය ගල ගෙදර ප්‍රදේශයට සම්බන්ධ කරුණක්. 5 ශ්‍රී 1018 දරණ ජීප් රථය මිනිගමුවේ මේරියගොල්ල වත්තේ පියදාස වීරකෝන් නමැති මහත්මියකුට අයිති එකක්. එහෙත් එය පාවිච්චි කරන්නේ උඩරට ගැමි කොමිෂන් සභාවේ පාරවල වැඩ බලන ඕවර්සියර් කෙනෙක්. තමුන්නාන්සේ නොදැනුවත්ව වන්නට පුළුවනි, මේ විධියේ අක්‍රමිකතා සිදු වෙනවා. මේ ගැන විභාග කර ඇඩි පියවරක් ගන්න ලෙස මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා.

නුවර ප්‍රදේශයේ අපට තවත් බලවත් ප්‍රශ්නයකට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා. උඩරට ගැමි කොමිෂමේ වැඩවලින් වැඩි කොටසක් නුවර සහකාර පළාත් පාලන කොමසාරිස්තුමා භාරගෙන තිබෙනවා. ඒ මහත්මයාට ඒ වැඩ කොටස තනිව කරන්නට බැරි බව ඒ ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට අප කාටත් පෙනී ගොස් තිබෙනවා. ඒ සහකාර කොමසාරිස් තුමාගේ කාර්ය බහුලත්වය අඩු කර ඒ වැඩ ඉක්මණින් කර ගැනීමට තව සහකාර කොමසාරිස්වරයකු සහ නිලධාරීන් ඉක්මණින් සපයන ලෙස මා ඉල්ලා සිටිනවා. උඩරට ගැමි කොමිෂමෙන් අනුමත වී ඇස්තමේන්තු පවා සකස් කර තිබෙන අපේ සමහර වැඩ මේ සහකාර කොමසාරිස්වරයා භාර ගන්නට බැරිය කියන නිසා ඇනහිට තිබෙනවා. එය බලවත් පාඩුවක්. අවුරුදු ගණනාවක් තිස්සේ අපේ ප්‍රදේශ සඳහා අනුමත කර තිබෙන මුදල්වලින් වැඩක් නොවන තත්ත්වයක් ඇති වී තිබෙනවා. රඹුක්වැල්ල ජල යෝජනා ක්‍රමය, ගිඩ්ඩව-වරදිවෙල ජල යෝජනා ක්‍රමය, ගිඩ්ඩව-කුඹල් ඔළුව පාර, උඩිස්තුව-උතුර ජල යෝජනා ක්‍රමය ආදී වැඩිපුර මුදල් වියදම් නොවන වැදගත් වැඩ කටයුතු කීපයක් මේ නිසා ඇනහිට තිබෙනවා. මෙම කටයුත්ත සීඝ්‍රාකාරයෙන් කිරීම සඳහා අවශ්‍ය නිලධාරීන් සපයා දෙමින් සහයෝගය දක්වන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

ගම්වල නම් වෙනස් කිරීම පිළිබඳවත් වචනයක් කිව යුතුයි. තෙල්දෙණියේ ගම් තුනක්, එනම්, රිලාමුල්ල, හෙනගැහුවල සහ උරුගල යන ගම් තුන පිළිවෙළින් රම්මුල්ල, සෙනරත්වෙල සහ මැදමහනුවර යන අන්දමට වෙනස් කරන්නැයි අප යෝජනා කර තිබෙනවා. එහෙත් මේ දක්වා ඒ නම් අනුමත වී නැහැ. ඒ ගැන අපි කනගාටු වන අතරම එම ඉල්ලීම ඉක්මණින් ඉටු කර දෙන ලෙස මතක් කරනවා.

අ. භා. 5.15

ගරු සභාපතිතුමනි, පේෂකර්මය සඳහා අත්යන්ත්‍ර 1,000 ක් ලබා දීමෙන් අපේ රටේ රැකීරක්ෂා නොමැති අයගෙන් 25,000 කට පමණ රක්ෂා සපයා දීමට කටයුතු කිරීමේ වැඩ සැළැස්ම අපි හැමෝම අත්පොළසන් දීමෙන් පිළිගත් බව මට මතකයි. එහෙත් අද රෙදි විවීමට උපයෝගි කර ගන්නා නූල් නොමැතිකම නිසා විදින්නට සිදු වී ඇති කරදර එමටයි. එම නූල් ගෙන්වන විජාතික කුට වෙළෙන්දන්ගේ ඒකාධිකාරය හේතුකොටගෙන එම ව්‍යාපාරයෙහි යෙදී සිටින්නන් අමාරුවට පත්ව සිටිනවා. ඒ හේතුකොටගෙන එම සංවර්ධන සැළැස්ම අඩ පණ වී කඩා බිඳ වැටෙන්නට තරම් කරුණු යෙදී තිබෙනවා. එම ව්‍යාපාරය උපන් ගෙය තුළම මැරෙන්නට ඉඩ තබන්නේ ඇයි? එම ව්‍යාපාරය අද නොමරා මරන්නට උත්සාහ දරණ පිරිසක් සිටින බව පේනවා. එම උවදුර පිළිබඳ උග්‍ර තත්ත්වය තමුන්නාන්සේ වහාම කල්පනාවට ගතයුතුව තිබෙනවා. එසේ කල්පනාවට ගෙන එම වැඩ පිළිවෙළ නොමැරෙන තත්ත්වයකට ගෙන එන ලෙස අප ඉල්ලා සිටිනවා. එම පේෂකර්ම මධ්‍යස්ථානවලට නොමැරී ජීවත් වන්නට හැකි තත්ත්වයක් ඇති කර දෙන මෙන් අපි ඉල්ලා සිටිනවා. මා සඳහන් කළ ඒකාධිකාරී ව්‍යාපාරිකයන්ගෙන් බැට කන්නට එම 25,000 ක් දෙනාට ඉඩ නොදී කෙලින්ම රජයේ සංස්ථාවක් මගින් මෙම නූල් සපයා දෙන්නට හැකි ක්‍රමයක් ඉක්මණින්ම ක්‍රියාත්මක කරන ලෙස මතක් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාසල් ගොඩනැගිලි වෙනුවෙන් දී තිබෙන ආධාර මුදල් ගැනද අපේ ස්තුතිය පළ කළයුතුව තිබෙනවා. අපේ ආසනයට ඒ සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් 21,657 ක් බව කිවයුතුයි. ඒ මුදල කොහෙත්ම ප්‍රමාණවත් වන්නේ නැහැ. දුන්හින්නට විද්‍යාගාරයක් තැනීම සඳහා අඩු වශයෙන් රුපියල් 35,000 ක් වත් වෙන් කිරීමෙන් සහයෝගය දක්වන හැටියට මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, බීඩි අවසර පත්‍ර පිළිබඳවත් යමක් කිවයුතුයි. නීතිරාජලා වැනි ලොකු ධනපතියන්ට බීඩි ඒකාධිකාරය මගින් බීඩි රජවරුන් වන්නට හැකි තත්ත්වයක් උදා වී තිබෙනවා. අපේ ප්‍රදේශවල අහිංසක උදවිය බීඩි අවසර පතක් ඉල්ලුවාම තමුන්නාන්සේලාගේ දෙපාර්තමේන්තුවෙන් එය ලබා දෙන්නට උනන්දු වන බවක් පෙනෙන්නට නැහැ. අපේ රටේ දේශීය ඉල්ලුම් කරුවන්ට එවැනි සැළකිල්ලක් දක්වීම ගැන මා කන ගාටු වෙනවා. දේශීය වශයෙන් එවැනි කර්මාන්තයක යෙදී තමන්ගේ ජීවිතය ගෙන යාමට කැමති උදවියට පහසුවෙන් එම අවසර පත් ලබා දෙන ලෙස මතක් කරනවා. රැකීරක්ෂා නොමැතිව දුක් විඳින එම ජනතාව ඒ තත්ත්වයෙන් මුදාලන්නට උනන්දුව දක්වන මෙන් මා මතක් කර සිටිනවා.

ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳවත් වචනයක් කිවයුතුයි. ඉඩම් අත්පත් කර ගැනීමෙහි ඇති ප්‍රමාදය හේතුකොටගෙන අපේ පාරවල් සාදා ගන්නට නොහැකි තත්ත්වයක් උදා වී තිබෙනවා. වරදිවෙල-මකුල්දෙණිය පාරේ වැඩ මෙලහකටත් අවසාන කරන්නට තිබුණා, ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය ඇති නොවුණා නම්. එම කර්තව්‍යයෙන් අඩක් වත් හරියාකාර කරගන්නට බැරි වුණේ ඒ හේතුකොට ගෙනයි. එසේහෙයින් එම තත්ත්වය මග හරවන්නට තමුන්නාන්සේගේ සහයෝගය දියයුතු බව මතක් කරන්නට කැමතියි.

අපේ ඇරයුම පරිදි ගරු ඇමතිතුමා වෙනුවෙන් තෙල්දෙණියට පැමිණි එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා ප්‍රසිද්ධ සභාවකදී පොරොන්දුවක් දුන්නා, පොද්දලගොඩ පාර කර දෙන බව. ඒ අන්දමට පාරවල් තුනක් සංවර්ධනය කර දෙන ලෙස අපි එතුමාගෙන් ඕනෑකමින් ඉල්ලා තිබෙනවා. පොද්දලගොඩ පාර, රම්මුල්ල-වැගල පාර සහ මහදොරලියැද්ද පාර ඒ පාරවල් තුනයි. එම පාරවල් තුන පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කරනවා නම් ඒ වෙනුවෙන් අපගේ කෘතඥතාවය පුද කරන්නට අප හැමවිටම ලෑස්තියි.

ගරු සභාපතිතුමනි, මා මීට වඩා කතා කරන්නට යන්නේ නැහැ. මා ඉදිරිපත් කරන ලද කරුණු ගරු ඇමතිතුමාගේ සැළකිල්ලට යොමු කරන ලෙස නැවත වරක් ඉල්ලා සිටිනවා. එතුමාගෙන් අපට සාධාරණ යුක්තියක් සහ සහයෝගයක් ලැබේවිය කියන ඒකාන්ත විශ්වාසය අප තුළ පවතින බව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා.

**එස්. කේ. කේ. සූරියාරච්චි මයා.** (මහර)
*(திரு. எஸ். கே. கே. சூரியாரச்சி—மகற)*
(Mr. S. K. K. Suriarachchi—Mahara)

ගරු සභාපතිතුමනි, ස්වදේශ ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කාරණා කීපයක් ගැන සඳහන් කරන්නට ඇතත් කාල වේලාව නොමැති නිසා එයින් එකක් දෙකක් ගැන පමණක් සඳහන් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. වර්තමාන ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ සුරා ප්‍රතිපත්තිය කුමක්දැයි මේ රටේ ජනතාව අද විමසිල්ලෙන් සිටිනවා. අමද්‍යප ප්‍රතිපත්තියක් ගෙන යන බව එතුමා මුලදී කියා තිබුණා. එහෙත් එතුමාගේ අමද්‍යප ප්‍රතිපත්තිය කුමන විධියේ එකක්දැයි තේරුම් ගැනීම අපහසු කාරණයක් වී තිබෙනවා. බොන්න කියනවද නොබොන්න කියනවාද තේරුම් ගන්නට බැහැ. මෙම ගරු සභාවේදී අසන ලද ප්‍රශ්නයකට ගරු ඇමතිතුමා දුන් පිළිතුරක් 1968 නොවැම්බර් මස 23 වැනි දින හැන්සාඩ් වාර්තාවේ පළ වී තිබෙනවා. දුම්රියේ මත්පැන් පාවිච්චි කිරීම තහනම් කරන බවට පත්‍රයේ ලොකු වාර්තාවක් පළ කර තිබුණා. උතුරු පළාතේ මන්ත්‍රීවරුන් රාශියක්ම දුම්රිය සේවයේ මත්පැන් තහනම් කරන ලෙස ඉල්ලා තිබුණු බවත් පළ වුණා. ඒ ඉල්ලීම අනුව හෝ දුම්රිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සූරියාරච්චි මයා.]

සේවයේ මත්පැන් පාවිච්චි කිරීම තහනම් කරන්නට යෙදුණා. ඒ බව මේ ගරු සභා වේදීත් සඳහන් කර තිබෙනවා. මා මේ සඳහන් කරන්නේ 1968 නොවැම්බර් මාසයේ 23 වැනිදා හැන්සාඩ් වාර්තාවේ අශෝධිත පිටපතේ 2672 වැනි තීරුවේ සඳහන් වී තිබෙන කොටසක් :

යූ. කේ. එඩ්මන්ඩ් මහතා,
දුම්රිය ආපනශාලා,
කොටුවේ දුම්රියපල,
කොළඹ.

**මත්පැන් බලපත්‍රය අවලංගු කිරීම**

මහත්මයාණනි,

ඔබගේ 65. 8. 12 දිනැති ලිපිය ගැනයි. මහජන යහපත තකා මෙම මත්පැන් බලපත්‍රය නිකුත් නොකරන බව ඔබ වෙත දන්වීමට ගරු ඇමතිතුමා මට නියම කර තිබේ.

මීට,
යටහත් සේවක,
ස්ථිර ලේකම් වෙනුවට.

එතකොට එදා මේ බලපත්‍රය නිකුත් නොකළේ මහජන යහපත තකායි. මහජන යහපත තකා යූ. කේ. එඩ්මන්ඩ් මහතාට මත්පැන් බලපත්‍රය නිකුත් කෙළේ නැහැ. ඔහු අපේ පක්ෂයේ හිතවතකු හැටියට ප්‍රසිද්ධියක් ලබා සිටියා. මේ ගරු ඇමතිතුමාට ස්ථිර අමද්‍යප ප්‍රතිපත්තියක් තිබෙනවද, එසේ නැත්නම් දේශපාලන ප්‍රතිපත්තිය හා මිශ්‍ර වූ අමද්‍යප ප්‍රතිපත්තියක් තිබෙනවාදැයි මට දැන ගන්නට වුවමනා කරනවා. යූ. කේ. එඩ්මන්ඩ් මහතාට දුම්රිය ආපනශාලාවල මත්පැන් විකිණීම තහනම් කළා. එහෙත් ඊට ටික දවසකට පසුව ඒ දුම්රිය ආපනශාලා සේවය දුම්රිය දෙපාර්තමේන්තුවට භාර දුන්නායින් පසුව 1968.8.28 දින "දවස" පත්‍රයෙහි "දුම්රිය ආරක්ෂක අංශයට සංසථා ලොක්කා අසු වෙයි" යන සිරස්තලය යටතේ වාර්තාවක් පළ වී තිබුණා. සංසථාවක ලොක්කකු බීගෙන දුම්රිය මැදිරියක ගමන් කළ අනෙක් මගීන්ට කරදර කළ නිසා දුම්රිය ආරක්ෂක සේවයේ නිලධාරීන් ඔහු අල්ලා දඩුවම් දුන්නාලු. මෙයින් පෙනී යන්නේ කලින්ටත් වඩා දුම්රිය සේවයේ ආපන ශාලාවලදී මත්පැන් පාවිච්චියට ඉඩ දී තිබෙන බවයි. ඇත්තෙන්ම කලින්ටත් වඩා දැන් ඒ සඳහා ඉඩ දී තිබෙනවා. ඉතින් අර "මහජන යහපත කතා" යනුවෙන් කීවේ මොන මහජනයා සම්බන්ධයෙන්ද ? නුවරඑළිය බීර කාරයන් සම්බන්ධයෙන් ඒ වචන පාවිච්චි කළාදැයි සැකයක් ඇති වෙනවා. ඔය කියන මහජනයා ඒ උදවිය වන්නට ඇති. සිංහල මිනිහකු වූ මැකලම් මුදලාලි— යූ. කේ. එඩ්මන්ඩ් මහතා—බීර කර්මාන්ත ශාලාවක් සාදා ඒ බීර දුම්රිය ආපනශාලා සේවයේ තැබුවා. මේ ආණ්ඩුව ඒ බීර තහනම් කොට ඒ වෙනුවට නුවරඑළියේ බීර පාවිච්චියට ඉඩ දී තිබෙන බවයි, අපට පෙනී යන්නේ. මේක දේශපාලන ප්‍රතිපත්තියත්, අමද්‍යප ප්‍රතිපත්තියත් එකට පටලවා ගෙනයන්නාවූ ප්‍රතිපත්තියක් බව පෙනී යනවා. අමද්‍යප ප්‍රතිපත්තියක් ගෙන යනවා නම් අවංකවම එය ක්‍රියාත්මක කළ යුතුයි. ඊට දේශපාලන ප්‍රතිපත්ති මිශ්‍ර කර ගන්නට හොඳ නැහැ. ජාතියේ ආගමේ රටේ යහපත සඳහා, මහජන යහපත සඳහා එඩිතරව ඒ ප්‍රතිපත්තිය ගෙන යන්නට ඕනෑ. ගරු ඇමතිතුමා වෙනත් පුද්ගලයන්ගේ බලපෑම්වලට යට වන පුද්ගලයෙකැයි මා හිතන්නේ නැහැ. එහෙත් මෙතැනදී නම් නොයෙකුත් බලපෑම්වලට යට වී තිබෙන බව පෙනී යනවා. අමද්‍යප ප්‍රතිපත්තිය උපයෝගී කරගෙන දේශපාලන පලිගැනීම් කරන්නට එපා කියා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මා නියෝජනය කරන කොට්ඨාශයටත් පෝෂකර්ම මධ්‍යස්ථාන 7 ක් ලැබුණා. විලිඹුල ගමේ පෝෂකර්ම මධ්‍යස්ථානය භාරව ගුරුවරියක් පත් වී සිටිනවා. ප්‍රනාන්දු නමින් හැඳින්වෙන ඒ මහත්මිය දැන් එහි අවුරුදු හතරක් පමණ සේවය කර තිබෙනවා. හැම අවුරුද්දේම ඒ පෝෂකර්ම මධ්‍යස්ථානය හොරුන් විසින් කඩන්නට යෙදුණා. හොඳට රෙදි එකතු වූ විට, ඒ මධ්‍යස්ථානය හොරුන් විසින් බිඳිනු ලබනවා. මේක පොලීසියට අල්ලන්නටත් බැහැ; පලාතේ මහජනයාට අල්ලන්ටත් බැහැ; මුරකාරයන්ට අල්ලන්ටත් බැහැ; කාටවත්ම අල්ලන්නට බැහැ; මේ ගැන පැමිණිලි කළාට ප්‍රයෝජනයක් වෙලා නැහැ. ඒ පැමිණිලි ගැන කිසි විභාගයක් පවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්නේ නැහැ. මීට හේතුව කුමක්දැයි සොයා බැලූ අපට දැන ගන්නට ලැබුණේ ඒ නෝනා මහත්මයාගේ සවාමි පුරුෂයා ගරු ඇමතිතුමාගේ දෙපාර්තමේන්තුවේ ලියන මහත්මයකු බවයි. එකම පැමිණිල් ලක්වත් විභාගයට ඉදිරිපත් කර නැත්තේ මේ තත්ත්වය නිසා වන්නට හොඳටම ඉඩ තිබෙනවා. ඒ තත්ත්වය කොහෙත්ම සතුටුදායකයයි කියන්නට කාටවත් පුළු වන්කමක් ඇත්තේ නැහැ. මීට සති දෙක කට පමණ පෙර ගරු ඇමතිතුමාට මේ ගැන දන්වා ලියමනක් මම යැව්වා. මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටියේ, මේ ගැන විශේෂ නිලධාරියකු ලවා විශේෂ පරීක්ෂණ යක් කරවිය යුතුයයි අප කල්පනා කරන නිසා එසේ කරන ලෙසයි. දෙපාර්තමේන් තුව මගින් මේ ගැන පරීක්ෂණයක් කරවිය යුතුයයි අප කල්පනා කරන නිසා එසේ කරන ලෙසයි. දෙපාර්තමේන්තුව මගින් මේ ගැන පරීක්ෂණයක් කළොත් නම් කවදා වත් වරදකරුවකු අල්ලන්නට බැහැ. කොයි විධියකට හෝ ටිකින් ටික රෙදිපිළි වියා නැත්පත් කර, සෑහෙන ප්‍රමාණයක් ගොඩ ගැහෙන විට ගොඩනැගිල්ලට හොරු එනවා. අවුරුදු පතාම හොරු කඩන එක සිදු වෙනවා. කොයි තරම් පැමිණිලි කළත් එයින් ප්‍රයෝජනයක් වෙලා නැහැ. විභාග යක් කරන්නේත් නැහැ. මේ නෝනා මහත්මයාගේ සවාමි පුරුෂයා ග්‍රාම සංවර් ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන් තුවේ ලිපිකරුවකු නැත්නම් වෙනත් නිල ධාරියකු හැටියට වැඩ කරන නිසා වෙන්නට පුළුවනි, මෙවැනි තත්ත්වයක් පවතින්නේ. ඒ නිසා මා විසින් ගරු ඇමතිතුමා වෙත පෞද්ගලිකව ලියා ඉදිරිපත් කරන ලද පැමිණිල්ල ගැන විභා ගයක් කරවා, මෙපමණ කාලයක් මේ පේස කර්ම මධ්‍යස්ථානයෙන් නැති වූ රෙදිපිළි සම්බන්ධයෙන් ලැබිය යුතු අලාභය අයකර ගෙන ඒ ළමයින්ට දෙන ලෙස ඉල්ලා සිටි නවා.

**හේමචන්ද්‍ර සිරිසේන මයා.,** (අකුරණ පළමුවන මන්ත්‍රී)

*(திரு. ஹேமச்சந்திர சிறிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)*

(Mr. Hemachandra Sirisena—First Akurana)

ගරු සභාපතිතුමනි, අපේ ඡන්ද කොට්ඨාශවලට පිරිමසින ආකාරයට වැඩක් කරවා ගැනීම සඳහා මේ ගරු සභාවේදී අපේ අඩුපාඩු ගැන කියන්නට ඉඩක් ලැබෙන්නේ අවුරුද්දකට වරක් අමාත්‍යාංශවල වැය ශීර්ෂ සාකච්ඡා කරන අවස්ථාවල පමණයි. එවැනි අවස්ථාවක කථා කරන්නට මිනිත්තු පහක්වත් මට ලබා දීම ගැන මම තමුන්නාන්සේට ස්තුති වන්ත වෙනවා.

ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා පළපුරුදු, දක්ෂ, දේශපාලනඥයකු හැටි යට රටේ පිළිගැනෙන කෙනෙක්. එතුමා වර්තමාන ආණ්ඩුවේ ඇමති ධූරයකට පත් වීමෙන් පසු, පුරුදු පරිදි, තමන්ගේ දක්ෂ කමත් පළපුරුද්දත් අනුව හොඳ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළා. එය මේ ගරු සභාවටත් රටටත් ඉදිරිපත් කරන ලද හොඳ වැඩ පිළිවෙළකැයි පිළිගන්නට පුළුවනි. එවැනි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළ ගරු ඇමතිතුමා සෑහෙන වැඩ කොට සක් ආරම්භ කළා. සමහර ගරු මන්ත්‍රීන් ප්‍රකාශ කළ අන්දමට, නොයෙක් බලපෑම් තුළින් වුවත් එතුමා තමන්ගේ වැඩ කට යුතු වහ වහා ක්‍රියාත්මක කරන්නට පටන් ගත්තා. එය රහසක් නොවන බව සඳහන් කරන්නට කැමතියි.

තුන් මාසයකට වරක් අප කැඳවා අපේ ඕනෑ එපාකම් විමසා බලා උචිත අන්දමට තමන්ගේ වැඩ පිළිවෙළ සකස් කිරීමේ විශේෂ දක්ෂකමක් ගරු ඇමතිතුමාට තිබුණා. එහෙත්, ළඟදී සිට ඒ විශේෂ දක්ෂකම පිළිබිඹු වෙන්නේ නැතිව ගියා. ඊට හේතුව කුමක්දැයි අපට නම් හරිය ටම කියන්නට පුළුවන්කමක් ඇත්තේ නැහැ. එතුමාගේ ඔළුවට යම්කිසි බරක් ඇවිල්ලා වාගේ අපට පෙනෙනවා. මේ පාර්ලිමේන්තු වාරය අවසන් වන්නට යන නිසා එසේ වුණාදැයි දන්නේ නැහැ. පිකක් නොසන්සුන්තාවක් තිබෙනවා වාගෙ අපට පෙනෙනවා. තමන්ගේ වැඩ කඩාකප්පල් වීම ගැන සැලකිල්ලක් දක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හේමචන්ද්‍ර සිරිසේන මයා.]
වීම දැන් අඩු වෙලා තිබෙනවා. එය මගේ පෞද්ගලික හැඟීමක් පමණයි. ගාල්ලේ ප්‍රශ්නය එතුමාගේ ඔළුවට වැදීම නිසා ටිකක් දුරටවත් වැඩ කටයුතු අතපසු වෙන වාදෝයි මට පෞද්ගලික වශයෙන් හිතෙනවා. ඒ ප්‍රශ්නය කොයි තරම් බරපතල එකක් හැටියට සැලකුවත්, එතුමා තමන් ලත් පළපුරුද්ද සහ විශේෂ දක්ෂකම් අනුව කරගෙන ආ වැඩ කටයුතු ටික ඉදිරියටත් ඒ ආකාරයටම කරගෙන යනු ඇතැයි අපි අපේක්ෂා කරනවා. ඒ වාගේම, අපේ ඉල්ලීම්ද ඉටු කර දෙනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට යොමු කරවන්නට අදහස් කරන්නේ අපේ ප්‍රදේශයේ පාරවල් සෑදීම සඳහා වෙන් කරනු ලබන මුදලින් පාරවල් තැනීම ගැනයි. මේ පාර්ලිමේන්තුව ආරම්භ කළ මුල් අවස්ථාවේදීම ප්‍රමුඛතා ලැයිස්තුවට ඇතුළත් කරන ලද පාරවල් පවා තවමත් සාදා අවසන් කර නැහැ. ඒ සම්බන්ධයෙන් ජනතාව තුළ පවතින දුක් ගැනවිල්ල ජනතාව වෙනුවෙන් මගේ මාර්ගයෙන් ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. කොනකලගල-ගල්ඒදණ්ඩ පාර 1965 දී සකස් කළ පළමුවැනි අයවැය ලේඛනයට ඇතුළත් කර තිබුණා. එහෙත් ඒ පාර හදන්නට තවම පටන්ගෙනවත් නැහැ. ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර කොළඹ පළාත් පාලන කොමසාරිස් තුමා වෙත එවා තිබෙනවා. අවශ්‍ය මුදල් නිදහස් කරවා ගැනීමට, කරුණා කර එය සටහන් කරගෙන ඒ පාරේ වැඩට මුදල් නිදහස් කර දුන්නොත් අවුරුද්දේ ඉතිරි කෙටි කාලය තුළ ඒ පාරේ වැඩ අවසන් කරන්නට පුළුවන් වෙනවා ඇති. බොකලාවල උළු සහ ගඩොල් කර්මාන්තය කෙරෙන නමුත් ඒවා ප්‍රවාහනය කරන්නට පාර ප්‍රමාණවත් නැහැ. මේ පාර සකස් කළොත් අකුරණ ආසනයේ රැකීරක්ෂා ප්‍රශ්නය තරමක් දුරටවත් විසඳා ගන්නට පුළුවන් වේය කියා මා විශ්වාස කරනවා.

අ. භා. 5.30

ගරු සභාපතිතුමනි, සුරා ප්‍රශ්නය පිළිබඳවත් තමුන්නාන්සේට කරුණක් දෙකක් මතක් කරන්නට කැමතියි. ගරු ඇමතිතුමාට ඔය ප්‍රශ්නය පිළිබඳව හොඳ පළපුරුද්දක් තිබෙනවා. ගරු ඇමතිතුමා හොඳ හොඳ පාඩම් ඉගෙන ගෙන දැන් තැන්පත් වෙලා ඉන්නවා. මේ සුරා ප්‍රශ්නය කවදාවත් විසඳන්නට බැහැ. ඒ නිසා කසිප්පුවලින් සිදු වන විපත් වළක්වා ගන්නට බැරිව සිටිනවා. එයත් හොරෙන් හොරෙන් කරන්නට ඉඩ දී තිබෙන්නේ දේශපාලඥයින් තමන්ගේ දේශපාලන බලය තහවුරු කරගන්නට වෙන්න ඇති. ගම්බද පිටිසර මහන්සි වී වැඩ කරන කෙනෙක් ගමේ ගොඩේ කිතුලක් මැද ගෙන රා ටිකක් බීලා මිත්‍රයෙකුට දෙන්නෙකුටත් එයින් ටිකක් දීමේ නිදහස ඔවුන්ට ලබා දෙනවා නම් නරකද? අපේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ප්‍රකාශ කළා ජනතාවට කසිප්පු නිසා විශාල හානියක් සිදු වෙනවාය, මිනිසුන්ට ලෙඩ රෝග වැළඳෙනවාය, ජනතාව සුන් වෙනවාය කියා. ඒ අනුව බලන විට ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ උත්පත්ති පාලනය නැති වුණාට කමක් නැහැ. ඒ වෙනුවට තවත් මොලැසස් ටිකක් ගෙන්වලා කසිප්පු ටිකක් බොන්න සැලැස්සුවාම වැඩේ හරි. ඒ නිසා ගරු සභාපතිතුමනි, ගම්බද මිනිහෙකුට කිතුලක් මැද ගෙන රා ටිකක් හදාගෙන තමන්ගේ මිත්‍රයෙකුටත් ටිකක් දී විනෝද වන්නට ඔවුන්ට ඉඩකඩ සලසන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය සම්බන්ධවත් උඩ පහත වශයෙන් බේදයක් තිබෙන බව පෙනෙනවා. උඩරට ප්‍රදේශය විදේශිකයින්ගේ පාලනයට අසු වී ඔවුන් විසින් මහජනතාව පාගාගෙන, ඔවුන් තළා පෙළා, ඒ ප්‍රදේශවල තිබුණු මහා මාර්ග, ගොඩනැගිලි, ජලසම්පාදන ක්‍රම ආදිය විනාශ කර දැම්මා. ඒ නිසා ඒ ප්‍රදේශ නැවත දියුණු කිරීම පිණිස උඩරට ගැමි කොමිසම ඇති කළා. ඒ නිසා ඒ ප්‍රශ්නයේදී උඩ පහත කියා බේදයක් ඇති කර නොගන්නා හැටියට මා ඉල්ලා සිටිනවා. මේ රටට ආදායම් ලැබෙන තේ ආදී කෘෂිකාර්මික ද්‍රව්‍ය ලැබෙන්නේ උඩරටින්. ඒ නිසා උඩරට ගැමි කොමිසම සම්බන්ධව ඊර්ෂ්‍යාවක් ඇක්වීම ගැන කණගාටුයි. පහත රට කුඹුරු වගා කිරීමට ජලය පවා ලැබෙන්නේ උඩරටින් බව කවුරුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දන්නවා. ගරු සභාපතිතුමනි, මා තමුන්නාන්සේගේ ඡන්ද කොට්ඨාශයටත් ගොස් තිබෙනවා. වයඹ පළාතේ හලාවත ප්‍රදේශයටත් ජල පහසුකම් මදි. උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව යටතේ විශේෂ වැය ශීර්ෂයක් ඇති කර බිංගිරිය හලාවත ආදී ප්‍රදේශ සම්බන්ධයෙන් කටයුතු කරනවා නම් මා ඉතාමත්ම කැමතියි.

මේ වාරයේ පාඨශාලා ටිකයි ලැබී තිබෙන්නේ. මේ ළඟදී ලොකු උද්ඝෝෂණයක් නම් කළා. එහෙත් දැන් නම් කරන වැඩ ටිකක් අඩු වී තිබෙනවා. ඒ ගැන සැලකිලිමත් වන්නය කියා මා ගරු ඇමතිතුමාට කියනවා. ගාල්ලේ ප්‍රශ්න ඔය තරම් ඔළුවට ගන්නට වුවමනාවක් නැහැ. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේට පළපුරුද්දකුත් තිබෙනවානේ. තමුන්නාන්සේ කොහොම ආවත් අපි ආණ්ඩුව පිහිටෙව්වාම අපේ පැත්තට එන්නද කියා අහන්න බැරිකමක් නැහැ. ඒ නිසා ඔළුවේ තිබෙන ඔය ගාල්ලේ ප්‍රශ්නය අහකින් තබා මේ ප්‍රශ්න විසඳන හැටියට මා ඉල්ලා සිටිනවා.

**පර්සි සමරවීර මයා.** (වැලිමඩ)
*(திரு. பேர்ஸி சமரவீர—வெலிமடை)*
(Mr. Percy Samaraweera—Welimada)

ගරු සභාපතිතුමනි, ස්වදේශ කටයුතු ඇමතිතුමාගේ වැය ශීර්ෂය පිළිබඳ සාකච්ඡාව අවසාන වේගෙන යන මේ මොහොතේදී මටත් ඒ පිළිබඳව වචනයක් දෙකක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ගරු මන්ත්‍රීවරුන් රාශියක් කසිප්පු ආදී විෂ මත්පැන් ගැන මේ විවාදයේදී කරුණු ඉදිරිපත් කළා. හපුතලේ ප්‍රදේශයේ කලක් පවත්වාගෙන ගිය තැබෑරුමක් ඇමතිතුමාගේ නියෝගයක් අනුව වසා දමන්නට යෙදුණු අවස්ථාවේදී ප්‍රදේශයේ මහජනතාවගෙන් වැඩි කොටසකගෙන් ඊට විරුද්ධව පැමිණිලි ඉදිරිපත් වුණා. මේ තැබෑරුම වැසිය යුතුය කියා ගෙන ගිය ව්‍යාපාරයේ පුරෝගාමියකු වශයෙන් ක්‍රියා කළේ හපුතලේ විල්බට් සිල්වා නමැති මහත්මයායි. නගර සභාව මගින් යෝජනාවක් සම්මත කර, ඒ අනුව මහජනතාවගේ අත්සන් සහිත ලියවිල්ලක් ගරු ඇමතිතුමාට ඉදිරිපත් කර හපුතලේ ප්‍රසිද්ධ අරක්කු තැබෑරුම වසා දැමුවා. අවසානයේදී මොකද වුණේ? අරක්කු තැබෑරුම වැසීමට මූලිකව ක්‍රියා කළ විල්බට් සිල්වා මහත්මයා විසින් අරක්කු විකුණන සාප්පුවක් නම් නොවෙයි; රට බීම විකුණන සාප්පුවක් මිළයට ගෙන දැන් ඒකත් තැබෑරුමක් වගේ හපුතලේ නගරයේ ඒ මහත්මයා විසින්ම කරගෙන යන බව ගරු ඇමතිතුමා දැන ගන්නට ඕනෑ. ඒ නිසා යම් අවස්ථාවකදී දැනට තිබෙන තැබෑරුම් වැසීමට කියා හෝ ඒවා ඒ නගරවලින් ඉවත් කළයුතුය කියා හෝ යෝජනා ඉදිරිපත් වන විට එහි අනික් පැත්තත් ටිකක් සොයා බලා කටයුතු කළ යුතුයි. එසේ නැතිනම් මිළ මුදල් තිබෙන මිනිසුන් ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා රට බීම සාප්පු පිහිටුවාගෙන අරක්කු වෙළඳාම් කරන්ට ඉඩ තිබෙන නිසා, දැනට පවතින මහජන පහසුකම් නැති කිරීමේ යෝජනා ඉදිරිපත් වන විට ටිකක් කල්පනාකාරීව වැඩ කටයුතු කළ යුතු බව ගරු ඇමතිතුමාට මේ අවස්ථාවේ මතක් කරන්නට සතුටුයි.

අරක්කු විකිණීමේ කටයුතු ආදිය සම්බන්ධයෙන් යම් යම් ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළ සමහර අදහස්වලට මමත් එකඟ වෙනවා. වැලිමඩ ආසනයට අල්ලපු ආසනයේ සිටි ප්‍රසිද්ධ කසිප්පු වෙළෙන්දෙක් මා සමග ප්‍රකාශ කළ අදහසක් මේ අවස්ථාවේදී මා මතක් කරන්නට සතුටුයි. මේ කාරණය මතක් කරන්නට යාමේදී මේ ගරු සභාවේ යම් කෙනෙකුගේ හිත රිදෙන විධියේ වචනයක් මගෙන් ප්‍රකාශ වුණොත් ඒ ගැන සමාවන ලෙස මා ඉල්ලා සිටිනවා. මා මගේ ආසනයට අල්ලපු ඒ ආසනයේ යම් කටයුත්තකට සහභාගි වන්නට ගිය අවස්ථාවකදී, ගරු ඇමතිතුමනි, මට හදිසියේ ඒ ප්‍රසිද්ධ කසිප්පු වෙළෙන්දා මුණ ගැසුණා. මේ පුද්ගලයා මට කිව්වා, "තමුන්නාන්සේ දන්නවාද මන්ත්‍රීතුමනි, මම ඩඩ්ලි සේනානායක උන්නැහේටත් වැඩිය ලොකු සේවයක් මේ රටට කරනවා" කියා. මම ඇහුව ඒක කරන්නෙ කොහොමද කියල. "අවුරුදු 70 ක් ජීවත් වන වතුකරයේ සිටින දෙමළ මනුෂ්‍යයා මම අවුරුදු 30 න් මරණවා." යයි ඔහු කිව්වා. බාග වෙලාවට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි සමරවීර මයා.]
ඇත්ත වෙන්නට පුළුවනි. ඩ්රම් එකක් ශත 50 ට පමණ විකුණන කසිප්පු, දිනකට බෝතලය බැගින් දිනපතා අවුරුදු 2 ක් විතර බිව්වොත් අවුරුදු 70 ක් විතර ජීවත්වන පුද්ගලයෙකුගේ වයස අවුරුදු 15 කින්, 20 කින් තරම අඩුවන එක නම් සත්‍යයක්. කසිප්පු හදන වෙළෙන්ද මේ විධියේ ප්‍රකාශයක් කළා නම්, එයින් අපට හිතා ගන්නට පුළුවනි කසිප්පු බොන අහිංසක රටේ ජනතාවට මෙය කොයි අන්දමින් බලපායිද කියා. ඒ නිසා අමද්‍යප ප්‍රතිපත්තිය කෙසේ වෙතත් මා මේ කාරණය ගරු ඇමතිතුමාට මතක් කරන්නට සතුටුයි. හපුතලේ වැසූ අරක්කු තැබෑරුම වෙනුවට වැලිමඩ ප්‍රදේශයේ අරක්කු තැබෑරුමක් විවෘත කරන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටි අවස්ථාවේදී එතුමා කියා සිටියේ අපේ ප්‍රතිපත්ති අනුව ඒක කරන්නට බැහැ කියායි. එහෙත් වැලිමඩ නගරයේ අඩුවක් නැතිව අරක්කු විකිණෙන බව මා දන්නවා. නුවරඑළියේ තැබෑරුමෙන් අරක්කු ගෙනැවිත් රුපියල් 11 ට 12 ට අරක්කු විකුණන කඩ රාශියක්ම වැලිමඩ තිබෙනවා. එසේම අරක්කු බොන අයත් හුඟ දෙනෙක් ඉන්නවා. බොන මිනිහා කොහේ හෝ ගිහින් අරක්කු තිබෙන තැනක් හොයාගෙන බොනවා. එම නිසා මෙය නවත්වන්න පුළුවන් දෙයක් නොවෙයි. එවැනි තත්ත්වයක් තිබෙන නිසා අප මේ කටයුත්තේදී හුඟාක් කල්පනාකාරීව කටයුතු කරන්නට ඕනෑ. එහෙම කල්පනාකාරී නොවී කටයුතු කළොත්, මේ කසිප්පු ව්‍යාපාරය නිසා මුළු ජාතියම අන්ධකාරයේ වැටෙන්නට ඉඩ තිබෙනවා.

ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා ආරම්භ කළ පේසකම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් හුඟ දෙනෙක් කථා කළා. ඒවා අතුරින් විශේෂයෙන් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් හුඟ දෙනෙක් පළ කළ අදහස්වලට එකඟ වන්නට පුළුවන් කමක් නැහැ. ඒ මන්ද? උඩරට ප්‍රදේශයේ පිහිටුවා තිබෙන පේසකර්ම මධ්‍යස්ථාන ඉතාමත් සාර්ථක අන්දමින් පවත්වාගෙන යන බව අත්දැකීමෙන්ම කියන්නට පුළුවනි. විශේෂයෙන් වැලිමඩ කොට්ඨාශය ගැන කියන්නට පුළුවනි. ඒ ප්‍රදේශයේ එවැනි මධ්‍යස්ථාන 7 ක් විවෘත කළා. කටුගම්පොළ ගරු මන්ත්‍රීතුමා (ජී. බී. සුබසිංහ මයා.) කීවා වාගේ, බෙර ගහ ගෙන, නළා පිඹගෙන, පෙරහැරින් ගිහින් තමයි, ඒවා විවෘත කළේ. ඒ පේසකර්ම මධ්‍යස්ථාන විවෘත කරන අවස්ථාවේදීම ප්‍රදේශයේ මහජනතාවට අප අවබෝධ කර දුන්නා, ඒ මධ්‍යස්ථානවල වැඩ කරන තම දරුවන් නිෂ්පාදනය කරන රෙදි අලෙවි කර දීමට දෙමාපියන් සූදානම් වුණේ නැත්නම්, ඒවා සාර්ථක අන්දමින් පවත්වාගෙන යන්නට බැරි වන බව. තම දරුවන් අතින් වියෙන රෙදි ඇඳ සමාජයේ පෙනී සිටින්නට දෙමාපියන් අකමැති නම් ඒ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම අසාර්ථක වන බව ප්‍රදේශයේ වැසිහිටියන් හොඳින් අවබෝධ කර ගත් නිසා, මගේ කොට්ඨාශයේ පිහිටුවා ඇති පේසකර්ම මධ්‍යස්ථාන 7 න් නිෂ්පාදනය වන රෙදි අලෙවි වෙනවා. එම නිසා කිසිත් අපහසුවක් නැතිව ඒවා පවත්වාගෙන යන්නට අපට පුළුවන්කම ලැබී තිබෙනවා.

මෙවැනි පේසකර්ම මධ්‍යස්ථාන පිහිටුවීමේ පරමාර්ථය 25,000 කට රක්ෂා සැපයීම යයි කීම වැරදියි. පළමුවෙන්ම 30 දෙනකු මෙවැනි පේසකර්ම මධ්‍යස්ථානයකට ඇතුළු කරගෙන රෙදි විවීම පිළිබඳ ව ඔවුන්ට මනා පුහුණුවක් දී, අවුරුදු 2ක් ඇතුළත පහසු මිළකට අත් යන්ත්‍රයක් තමාටම මිළදී ගන්නට පුළුවන් වන තත්ත්වයක් ඇති කර, ඒ කර්මාන්තයේ දිගටම යෙදීමට වැඩ කටයුතු සැලැස්වීමයි, මේ ව්‍යාපාරයේ පරමාර්ථය වුණේ. එසේ කොටස් වශයෙන් 30 දෙනා බැගින් ඇතුළු කරගෙන රෙදි විවීම පිළිබඳව ඔවුන්ට පුහුණුවක් දී, එම කර්මාන්තයේ දිගටම යෙදීමට පුළුවන් වන තත්ත්වයක් ඇති කරනවා. එම නිසා, නිෂ්පාදනය කරන රෙදි අලෙවි කිරීමට මාර්ග සලස්වා නොතිබුණොත් මේ ක්‍රමය අනුව මෙම මධ්‍යස්ථාන පවත්වාගෙන යාම දුෂ්කර වෙනවා. එහෙයින් මෙවැනි මධ්‍යස්ථාන වලින් නිෂ්පාදනය කෙරෙන රෙදි ඒ ගමේම නැත්නම් ඡන්දදායක කොට්ඨාශය තුළම අලෙවි කර ගැනීමට හැකි පහසුකම් සලස්වා දීම මන්ත්‍රීවරුන්ගේ යුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කමක්. එසේ කළොත් නම් මේ මධ්‍යස්ථාන සාර්ථක අන්දමින් පවත්වාගෙන යාම කොහෙත්ම අමාරු වන්නේ නැහැ.

ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාගේ අවධානය යොමු වීම සඳහා තවත් කරුණු දෙක තුනක් සඳහන් කළ යුතුව තිබෙනවා. තුවක්කු බල පත්‍ර සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් හුඟ දෙනෙක් කථා කළා. තමන්ගේ බෝග ආරක්ෂා කර ගැනීම සඳහා තුවක්කු ලබා ගැනීම අමාරු නම්, ගොවීන් අධෛර්යමත් වීම පුදුමයක් නොවෙයි. එසේම තුවක්කු බලපත්‍ර දීමේදී නොයෙකුත් අක්‍රමිකතාවන් සිදු වන බවත් අප දන්නවා. ඒ කෙසේ වෙතත්, මීට වඩා පහසු අන්දමින් තුවක්කු බලපත්‍ර ලබා ගැනීමට හැකි වන සේ අවශ්‍ය විධි විධාන සැලැස්වීම කාලෝචිත බව මතක් කරන්නට කැමතියි.

අ. භා. 5.45

ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව ගැනත් අදහස් ප්‍රකාශ වුණා. උඩරට ගැමි කොමිෂන් සභාවෙන් කෙරුණේ මොනවාදැයි එක් මන්ත්‍රීවරයකු ප්‍රශ්න කරනු මා අසා සිටියා. උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂමෙන් නොකෙරුණේ මොනවාද යනුවෙන් මටත් ප්‍රශ්නයක් අහන්න පුළුවනි. රජයේ වෙනත් දෙපාර්තමේන්තුවලින් ලැබුණාට වඩා විශාල සේවයක් උඩරට ප්‍රදේශවලට සැලසී තිබෙන්නේ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසමෙනුයි. එම දෙපාර්තමේන්තුවෙන් වැලි මඩට නම් යම් යම් දේ සිදු වී තිබෙනවා යයි සමහරුන් දිස්ත්‍රික් සම්බන්ධතා කමිටුවේදීත් චෝදනා එල්ල කළා. වැඩ නොකෙරුණු කොට්ඨාශවලට එම දෙපාර්තමේන්තුවෙන් නොයෙක් වැඩ කළ බව සත්‍යයක්. මේ අවස්ථාවේදී මා එක් කරුණක් විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. මේ කරුණ ගැන මා ඇමතිතුමා සමග රණ්ඩුවක් අල්ලන්නයි හිටියේ. මගේ කොට්ඨාශය වෙනුවෙන් ගොඩ නැගිලි 6ක් සඳහා අප ලැයිස්තු ඉදිරිපත් කර තිබියදී මේ මුදල් වර්ෂය සඳහා එක් ගොඩනැගිල්ලක් පමණක් දී මහ ලොකු වැඩක් කළ බවක් පෙන්වන්න ඇමතිතුමා සූදානම් වෙනවාදැයි මා එතුමාගෙන් අහන්න ලැහැස්තිවයි සිටියේ. එහෙත්, විරුද්ධ පක්ෂයේය ආණ්ඩු පක්ෂයේය කියා නොබලා සෑම කොට්ඨාශයකටම සම සේ මුදල් බෙදා දීම නිසා මෙවැනි තත්ත්වයක් ඇති වූ බව එතුමා පැහැදිලි කර දුන්නා. ගරු ඇමතිතුමා එවැනි වැඩ පිළිවෙළක් අනුගමනය කර තිබෙන නිසා වගකිව යුතු මන්ත්‍රීවරුන් වශයෙන් අප එය පිළිගත යුතුයි. අපේ ආසනවලට පමණක් වැඩ කළ යුතුයයි මා කියන්නේ නෑ. සාධාරනව බෙදී යන අයුරු මුදල් වියදම් කරමින් සාධාරණ සේවයක් සැලසෙන අන්දමට උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව ක්‍රියා කිරීම ගැන එහි කොමසාරිස්තුමාට මගේ විශේෂ ප්‍රශංසාව මේ අවස්ථාවේදී පුද කරනවා. තමුන්නාන්සේටද ස්තුති කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

**වී. අන්නාමලෙයි මයා.** (පත්කරන ලද මන්ත්‍රී)

*(திரு. வி. அண்ணாமலை—நியமன அங்கத்தவர்)*

(Mr. V. Annamalay—Appointed Member)

Mr. Chairman, I should like to speak a few words—

**සභාපති**

*(அக்கிராசனர்)*

(The Chairman)

Order, please ! I made an announcement that the Minister will reply at 5.45 P.M. I am sorry I cannot allow any more speakers.

**අන්නාමලෙයි මයා.**

*(திரு. அண்ணாமலை)*

(Mr. Annamalay)

Then what is the point in moving an amendment ? As a matter of privilege I would like to see that when we move an amendment we get an opportunity of speaking.

**සභාපති**

*(அக்கிராசனர்)*

(The Chairman)

The hon. Member comes in the evening and expects me to give him time to speak.

**අන්නාමලෙයි මයා.**

*(திரு. அண்ணாமலை)*

(Mr. Annamalay)

I am sorry, Sir. I have been here the whole of this afternoon.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

The hon. Member should have listened to what I said in the morning. I am sorry I cannot allow him to speak. Please sit down!

අන්නාමලෛයි මයා.
(திரு. அண்ணாமலை)
(Mr. Annamalay)

I shall sit down. Anyway, I think it is most unsatisfactory.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Then bring a Vote of Censure. Twenty-six hon. Members have spoken.

ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)
(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)
(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

Mr. Chairman, reference was made by the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) to the permission given by me to my Permanent Secretary to sue the C. W. E. Commission and I, therefore, make this statement:

In view of the reference to the permission given by me to my Permanent Secretary to sue the C. W. E. Commission for defamation, I am glad to *table copies of: first, my letter dated 12th December, 1967 to the Chairman of the Commission; second, his reply dated 17th December, 1967; third, my letter dated 28th December, 1967 to the Hon. Prime Minister; fourth, my letter of the same date to the Hon. Minister of State; and fifth and sixth, the replies dated 10th January, 1968, and 21st January, 1968, received from the Secretary to the Prime Minister and from the Hon. Minister of State.

All this took place more than one and a half years ago. Clearly Mr. Moragoda's efficiency and conduct were not open to question, and he has continued to maintain the highest standards of integrity and efficiency as my Permanent Secretary.

When I gave permission to my Permanent Secretary to sue the C. W. E. Commission for defamation it was after a full study of all the relevant C. W. E. files which the Hon. Minister of State kindly permitted perusal of, and the papers tabled give full references to the pages of these files.

The criticism of the C. W. E. Commission was in regard to an alleged lack of care in the provisions of an agreement signed by Mr. Moragoda when he was Acting Chairman and General Manager of the C. W. E.

The papers tabled would show that this agreement was only a Sole-Agency Agreement for one year which ended in October, 1959. Renewal was provided for, thereafter, only if both parties agreed. Mr. Moragoda was certainly not a party to such renewal, as he was no longer in office in the C. W.E. when the initial trial year ended. Clearly, therefore, he is not the authority to blame for any shortcomings regarding the subsequent imports of refrigerators, such as models T-80, T-90, T-150 and T-158 which are the subject of criticism in the C. W. E. Report. No decision was taken by Mr. Moragoda that orders for these were suitable. The only model regarding which there is a decision by Mr. Moragoda that orders were suitable is the Plastic Froster T-58, and that too for only fifty refrigerators on trial at £ 25 each C. & F. Colombo to be sold at three hundred and fifty rupees less than the lowest-priced refrigerator then available in

---

* සභාගත කරන ලද ලිපි අද දින වැඩ කටයුතු අවසානයේ දී පරිශිෂ්ටයක් වශයෙන් මුද්‍රණය කොට ඇත.

இன்றைய நிகழ்ச்சிகளின் இறுதியில் அனுபந்தமாகத் தரப்பட்டுள்ளது.

*Documents tabled reproduced as an Appendix at the end of this Day's Proceedings.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Ceylon. The T-58 is the only model specially mentioned in the agreement signed by Mr. Moragoda.

Mr. Moragoda's last working day in the C. W. E. was 12th February, 1959. The papers tabled make it clear that he had taken necessary and effective steps about both spare parts and guarantees for the refrigerators ordered while he was in office in the C. W. E.

It is to be regretted that Mr. Moragoda was not even summoned before the Commission or given any opportunity to make the position clear before their references to him were made in their report and in regard to which I agreed that an action for defamation lay.

Since then, however, I have advised Mr. Moragoda to drop the suit for defamation, as, to use my own words to him, " No one I know thinks any the less of you over this question, " and the C. W. E. Commission may plead they acted without malice, and the Commission, as the Chairman explains in his reply to me, is now functus.

මේ කාරක සභා අවස්ථාවේදී ස්වදේශ කටයුතු අමාත්‍යාංශය පිළිබඳ සාකච්ඡාවට සහභාගි වූ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මා පළමුවෙන්ම ස්තුති කරනවා. පසුගිය වර්‍ෂයේදී වාගේම මේ වර්‍ෂයේදීත් ඒ ගරු මන්ත්‍රීවරුන් විසින් සඳහන් කරන ලද සියලුම කරුණු තෝරා බේරා ඒවා එකින් එකට පිළිතුරු සැපයීමටත්, ඒ වාගේම පුළුවන් තැන්වල සහන සැලැස්වීමටත් විශේෂ නිලධාරීන් කීප දෙනෙකු කටයුතු කරන බව මා මතක් කරන්නට සතුටුයි. මෙතැන කළ කිසිම විවේචනයක් අහක දමන්නේ නැහැ. සමහර විවේචන ගැන ක්‍රියා කරනවා ඇති; සමහර විවේචන සාකච්ඡාවට භාජන කරනවා ඇති; ක්‍රියාත්මක කරන්නට බැරි අදහස් අත්හැර දමනවා ඇති. නමුත් කිසිම විවේචනයක් කල්පනා නොකර අහක දමන්නේ නැහැ. ගරු සභාවට මට ඒ පොරොන්දුව දෙන්නට පුළුවනි.

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුන් හුඟ දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද සාමාන්‍ය ප්‍රශ්න කීපයක් ගැන මා මුලින්ම වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට සතුටුයි. අත් යන්ත්‍ර ව්‍යාපාරය ගැන බොහෝ ගරු මන්ත්‍රීවරුන් කථා කළා. ඒ සියලුම විවේචන ඇත්ත ප්‍රකාශ වන විවේචන බව මා පිළිගන්නවා. ඒ වාගේම අත් යන්ත්‍ර ව්‍යාපාරයට හානියක් වන පිළිවෙළට වැඩ සිද්ධ වී තිබෙන බවත් මා පිළිගන්නවා. අත් යන්ත්‍ර ව්‍යාපාරයට දැන් හුඟක් අමාරුකම් තිබෙන බවත් මා පිළිගන්නවා. ඒ සියලුම දුෂ්කරතාවලට ප්‍රතිකර්ම යෝජනා කර තිබෙන බව මා මතක් කරන්නට සතුටුයි. නමුත් සමහර අවස්ථාවලදී ඒ ප්‍රතිකර්ම යෝජනා ක්‍රියාවේ යෙදවීම ප්‍රමාද වන්නට පුළුවනි. මක්නිසාද? ඒවා සාකච්ඡාවට භාජන කළ යුතුව තිබෙන නිසයි. අපට දෙපැත්තක් ගැන කල්පනා කරන්නට සිද්ධ වෙනවා. එවැනි කරුණු හේතුකොටගෙන සමහර විට ප්‍රතිකර්ම යෙදීම ප්‍රමාද වන්නට ඉඩ තිබෙනවා. නමුත් තමුන්නාන්සේලා ඒ ගැන ඉවසිලිවන්තව අපට සමාව දෙන්න. මක්නිසාද? අත් යන්ත්‍ර ව්‍යාපාරය ආරක්‍ෂා කරමින් ඉදිරියට ගෙන යෑමට අප සියලුම වැඩ කටයුතු ගෙන යන නිසයි.

අත් යන්ත්‍ර ව්‍යාපාරය ගැන තවත් වචනයක් කිය යුතුව තිබෙනවා. රජයට වුවමනා නම් විශාල කර්මාන්තශාලා පිහිටුවා අත් යන්ත්‍ර සම්පූර්ණයෙන් නැති කර දමන්නට පුළුවනි. ප්‍රතිපත්තියක් වශයෙන් අපට අත් යන්ත්‍ර වුවමනා නැත, ලොකු කර්මාන්තශාලාවලින් මේ සියලුම වැඩ කටයුතු කරන්නට ඕනෑය කියා රජය කල්පනා කළොත්, අත් යන්ත්‍ර සියල්ලම සම්පූර්ණයෙන් වසා දමන්නට පුළුවනි. නමුත් පසුගිය රජය වාගේම අපේ රජයත් මේ රටේ අත් යන්ත්‍ර ව්‍යාපාරයට තැනක් තිබිය යුතුය යන ප්‍රතිපත්තිය පිළිගෙන තිබෙනවා. අත් යන්ත්‍ර ව්‍යාපාරය ආරක්‍ෂා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාර්ය දහනායක]

කරන්නට ඕනෑය යන ප්‍රතිපත්තිය අප පිළිගෙන තිබෙන බව මා ස්ථිර වශයෙන්ම ප්‍රකාශ කරන්නට සතුටුයි. මක්නිසාද ? ලොකු කර්මාන්තශාලාවලින් මේ සියලුම වැඩ කටයුතු කරන්නට පුළුවන්කම තිබුණත්, ලංකාව වැනි නොදියුණු රටවල මෙවැනි ව්‍යාපාරවලින් ගම්බද රැකිරක්ෂා ප්‍රශ්නය සැහෙන ප්‍රමාණයකට විසඳන්නට පුළුවන් වන නිසයි. අත් යන්ත්‍ර ව්‍යාපාර යෙහි "employment potential" එනම් රැකිරක්ෂා සැපයීමේ බලය ඉහළයි. අත් යන්ත්‍ර ව්‍යාපාරයෙන් බලවේග යන්ත්‍රවලට වඩා හය ගුණයකට වැඩියෙන් රැකිරක්ෂා සපයන්නට පුළුවන්ය කියා පොත්පත්වල තිබෙනවා. යම් යම් අඩුපාඩුකම් හා දුර්වලකම් තිබුණත් අත්යන්ත්‍ර ව්‍යාපාරය වැදගත් එකක් හැටියට අප පිළිගන්නවා. එම නිසා එය ආරක්ෂා කළ යුතුයි. මෙම කර්මාන්තය සම්බන්ධයෙන් දැනට ඇති වී තිබෙන අමාරුකම මතු වුණේ, වෙළෙන්දන්ගෙන් අය කෙරෙන පිරිවැටුම් බද්ද මීට මාසයකට පමණ කලින් සියයට 1 සිට 5 දක්වා රජය වැඩි කිරීම නිසායි. ගරු මුදල් ඇමතිතුමාගේ අය වැය කතාවෙන් පිරිවැටුම් බද්ද වැඩි කළ හැටියම අත් යන්ත්‍ර රෙදි පිළි නිෂ්පාදනයට විශාල විපතක් සිදු වුණා. එනම්, වෙළෙන්දන්, අත්යන්ත්‍රවලින් නිෂ්පාදනය කෙරෙන රෙදි ගන්නට බැරිය කීමයි. දැන් තිබෙන ක්‍රමය අනුව අත්යන්ත්‍ර රෙදි වෙළඳාම් කරන්නේ ආණ්ඩුව නොවෙයි. සළුසල ගන්නේත් ඉතාම සුළු ප්‍රමාණයක්. එම නිසා, අත්යන්ත්‍ර රෙදි පිළි සියල්ලම පෞද්ගලික වෙළෙන්දන්ට විකුණා නියමිත ලාභ ලබා ගන්නා ලෙස මා නියම කර තිබෙනවා. පසුගිය අවුරුදු දෙක තුන තුළදී එය ඉතාම හොඳින් කෙරුණා. එහෙත්, පිරිවැටුම් බද්ද වැඩි කළ වහාම, වෙළෙන්දන් "දැන් ඉතින් අපට උඹලාගේ අත්යන්ත්‍ර රෙදි වුවමනා නැත" යි කිව්වා. මේ තත්ත්වය ඇති වී දැන් මාසයක් පමණ කල් වෙනවා. එම නිසා මේ මාසය ඇතුළත කෙරනෙ නිෂ්පාදන නොවිකිණී ගොඩ ගැසෙනවා. මේ තත්ත්වය මට පෙනී ගිය වහාම, පිරිවැටුම් බද්ද වැඩි කිරීම වරදක් බවත් එය අඩු කළ යුතු බවත් ගරු මුදල් ඇමතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයට මා දැනුම් දුන්නා. මුදල් ඇමතිතුමාත් මුළු කැබිනට් මණ්ඩලයත් මගේ කීමට එකඟ වේයයි මා විශ්වාස කරනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
**(Dr. N. M. Perera)**

ඒක කරන්න මුදල් ඇමතිතුමාටත් බෑ, ලෝක බැංකුවට යන්න ඕනෑ.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
**(The Hon. Dr. Dahanayake)**

කොහොම වුණත් ඒ කාරණය ඉෂ්ට කර ගැනීම සඳහා සටන් කිරීමට මා පොරොන්දු වෙනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
**(Dr. N. M. Perera)**

එහෙම නම් මේ පැත්තට එන්න වෙයි.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
**(The Hon. Dr. Dahanayake)**

බීර්ලාලා එන බවට ඊයේ පෙරෙයිදා පැතිර ගිය කතාවද මෙම අත්යන්ත්‍ර කර්මාන්තයට තවත් බාධාවක් වුණා. මොන බිල්ලකු ආවත් අපේ අත්යන්ත්‍ර ව්‍යාපාරය යට කරනන්ට මා උන්ට ඉඩ දෙන්නේ නැහැ. රජයෙන් දැන් මෙම කර්මාන්තය සම්බන්ධව එක්තරා වැඩ පිළිවෙලක් යොදා තිබෙනවා. එක් අතකින් අත්යන්ත්‍රවලිනුත් අනෙක් පැත්තෙන් බලවේග යන්ත්‍ර හා ලොකු මෝල් වලිනුත් නිපදවන්නට පුළුවන් ද්‍රව්‍ය පිළිබඳව විස්තරයක් සපයන ලෙස මා ඉල්ලීමක් කර තිබෙනවා.

අ. භා. 6

අත් යන්ත්‍රවලට මේවා සාදන්න පුළුවන්ය, බලවේග යන්ත්‍රවලට සහ මෝල්වලට ඒවා සාදන්න බැරිය කියා විස්තර සහිතව නියමයක් කරන්නය කියායි, මා ඉල්ලා තිබෙන්නේ. අත් යන්ත්‍රවලින් සාදන්නේ මොනවාද, මෝල්වලින් සාදන්නේ මොනවාද යන්න ස්ථිර වශයෙන් නියම කර ගත් පසු කවදාවත් අත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන්ත්‍රවලට හානියක් සිදු නොවන වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා තිබෙනවා. ඒවා ගැන යෝජනා යවා තිබෙනවා. ඒවා ගැන සාකච්ඡා කිරීමෙන් පසු ඒ පිළිබඳ විස්තර ඉක්මණින්ම අපට දැන ගන්නට පුළුවන් වෙයි. දැනට මට පුළුවන් දේ මා කර තිබෙනවා. ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවට අයිති බල වේග යන්ත්‍රවල සාදන රෙදි පිළි ඒ අයට නියම කර තිබෙනවා. අත් යන්ත්‍රවල සාදන රෙදිපිළි බලවේග යන්ත්‍රවල සෑදීම තහනම්. මගේ දෙපාර්තමේන්තුව යටතේ තිබෙන කටයුතු සම්බන්ධයෙන් එවැනි පාලනයක් කරන්නට මට අයිතියක් තියෙනවා. එවැනි සීමාවක් ඇති කළේ නැත්නම් අත් යන්ත්‍ර ඉබේම නැතිවෙලා යනවා ඇති.

තවත් ප්‍රශ්නයක් තමයි, අත් යන්ත්‍රවලට නූල් සපයා ගැනීමේ අමාරුව. ඒ ගැනත් ඉල්ලීමක් තියෙනවා. දැන් ඒ ගැන වැඩ කටයුතු සියල්ලක්ම ලෑස්තියි. ඒ ඉල්ලීමට ළඟදීම ඉඩ දෙන්න පුළුවන්. දැන් සියළු දෙනාම නූල් ලබා ගන්නේ ජාතික පේෂකර්ම සංස්ථාවෙන්—එක මධ්‍යස්ථානයකින්. මගේ ඉල්ලීම නම් ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවට සහ හුඟක් නූල් පාවිච්චි කරන ආයතනවලට, තමන්ට අවශ්‍ය නූල් කෙළින්ම ගෙන්වා ගැනීමට බලයක් දිය යුතුය යන්නයි. ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවට වුවමනා නූල් අපම ගෙන්වා ගනන්ට ඕනෑ. මේක අවුරුදු දෙක තුනක් තිස්සේ කර තිබෙන ඉල්ලීමක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
තවම ලැබුනෙ නැහැ.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)
හිනහ වන ගරු මන්ත්‍රීවරුන්ට මා කියන්නට කැමතියි, මේ ක්‍රමය ඇති කළේ පසුගිය ආණ්ඩුවෙන් බව. ඒ ඒ ආයතනවලට වුවමනා නූල් ඒ ඒ ආයතන මගින් කෙළින්ම ගෙන්වා ගැනීමේ ක්‍රමයක් කලින් තිබුණා. ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවට වුවමනා නූල් ඒ දෙපාර්තමේන්තුවෙන් ගෙන්වුවා. 1965 මාර්තු මාසයට මාස කීපයකට පෙර කැබිනට් තීරණයක් ගෙන තිබුණා, අත්හදා බැලීමක් වශයෙන් නූල් ගෙන්වීම එක මධ්‍යස්ථානයකට පැවරිය යුතුය කියා. ඒ අන්දමට විරුද්ධ පාර්ශ්වයේ ආණ්ඩුව තියෙන කාලයේදී ගන්නා ලද කැබිනට් තීන්දුවක් අනුව ජාතික පේෂකර්ම සංස්ථාවට පමණක් මේ වැඩය පැවරුවා. දැන් ඒ අත්හදා බැලීම අනුව මට පෙනෙනවා, ඒ ක්‍රමය හොඳ නැති බව. ඒ නිසා පරණ ක්‍රමයම ඇති කළ යුතු බව මා යෝජනා කර තිබෙනවා. [බාධා කිරීමක්] කෙසේ වුණත් ඒ වෙනස කළේ පසුගිය ආණ්ඩුවයි. ගරු සභාපතිතුමනි, මේ ගැන අපරණ්ඩු කරන්නට වුවමනා නැහැ. මේ වෙනස්කම ඇති කළේ වැඩය තවත් හොඳට කරන්නයි. එහෙත් ඒ වෙනස්කම නිසා අමාරුවක් ඇති වී තිබෙන බව දැන් අපට පෙනෙනවා. ඒ නිසාම සංශෝධනය කිරීම ගැන වැරැද්දක් කියනන්ට මා කැමති නැහැ. එහෙත් ඉදිරියේදී මෙම අත්යන්ත්‍ර කර්මාන්තය සෑම අන්දමකින්ම දියුණු කරන්නට අප උත්සාහ දරණ බව මතක් කරන්නට ඕනෑ.

අත්යන්ත්‍ර ක්‍රමයට සිදුවුණු තවත් හානියක් පිළිබඳව සිහිපත් කළ යුතුයි. මෙසේ පටන් ගත් අත් යන්ත්‍ර මධ්‍යස්ථාන 1,000 මගින් මුලදී 25 දෙනා බැගින් පුහුණු කෙරෙව්වත් ඉන් පසු කරන්නේ කුමක්ද යන ප්‍රශ්නය බොහෝ ගරු මන්ත්‍රීවරුන් විසින් අසන්නට යෙදුණා. ඇතැමුන් කිව්වා සමහර මධ්‍යස්ථාන දැන් වසා තිබෙන බව. කැබිනට් කාරක සභාව මගින් ඒකච්ඡන්දයෙන් පිළිගෙන දැන් කැබිනට් එකට එක්තරා නිර්දේශයක් ඉදිරිපත් කර තිබෙනවා. මා සිතනවා ළඟදීම එම නිර්දේශය පිළිගනීවිය කියා. එවැනි මධ්‍යස්ථාන හිස් වන්නට ඉඩ නොතබා ඒවායේ ඇති වන පුරප්පාඩු පුරවා ඒ හැම මධ්‍යස්ථානයක්ම දැන් සිටින ගුරුවරයාත් සමග සමුපකාර ක්‍රමයකට අනුව ඉදිරියට ගෙන යාමයි එම වැඩ පිළිවෙළ. එවිට එවැනි කිසිම මධ්‍යස්ථානයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාර්ය දහනායක]

වැහෙන්නේ නැහැ. අපි සිතමු, දැන් තිබෙන එක මධ්‍යස්ථානයක සිටින්නේ 25 දෙනෙක් නොව 12 දෙනෙක්ය කියා. එම ස්ථානයට තව 13 දෙනෙක් ඇතුළත් කර ගෙන එම ස්ථානය සමුපකාර ක්‍රමය කට අනුව එහි සිටින ගුරුවරයාත් සමගම ඉදිරියට ගෙන යාමට අපි කල්පනා කරන බවයි මා කිව්වේ. එම නිර්දේශය දැන් කැබිනට් මණ්ඩලයට යවා තිබෙනවා. ළඟදීම එය පිළිගන්නවා ඇතැයි මා විශ්වාස කරනවා. ගරු සභාපතිතුමනි, ඉන්දියාවෙන් සාරි දස දහස් ගණනක් මෙරටට ගලා ගෙන එන බව පෙනෙනවා. මෙසේ හොරෙන් ගෙනෙන සාරි නිසා මෙම කර්මාන්තයෙහි දියුණුවට විශාල බාධාවක් සිදු වී තිබෙනවා. එම තත්ත්වය නැති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම ටත් දැන් කටයුතු කරගෙන යන බව මතක් කරන්නට ඕනෑ. එම නිසායි මා කිවේ. කිසිම බිර්ලෙකුට මෙමඅත්යන්ත්‍ර කර්මාන්තය යට වන්නේ නැති බව. මොන අන්දමේ බිර්ලා කෙනෙක් ආවත් අත් යන්ත්‍ර කර්මාන්තයට නියම අන්දමේ උසස් තැනක් ලබා දෙන බව මා ස්ථිර වශයෙන්ම මෙම ගරු සභාවට මතක් කරන්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, සුරා ප්‍රතිපත්තිය පිළිබඳවත් බොහෝ දේ කියවුණා. ඒ පිළිබඳව මටත් හුඟක් දේ කතා කරන්නට පුළුවනි. අද දවසේ සුරා නිපදවීමත් සුරා පාවිච්චියත් අතර පරතරයක් තිබෙන බව කිව යුතුයි. 1960 දී මහජනයා අරක්කු ගැළුම් කොතරම් ප්‍රමාණයක් පාවිච්චි කර තිබෙනවාද ඒ උදවිය අද කොතරම් ප්‍රමාණයක් පාවිච්චි කරනවාද කියා දැනගන්නට ලැබුණොම තමුන්නාන්සේලා පුදුම වෙනවා ඇති. 1960 වර්ෂයේදී ලංකාවේ මහජනයා අරක්කු ගැළුම් ලක්ෂ 15ක් බී තිබෙනවා. දැනට ගැළුම් ලක්ෂ 36ක් බොනවා. එදා ගැළුම් ලක්ෂ 15 අද ගැලුම් ලක්ෂ 36 වී තිබෙනවා. බීමෙහි ප්‍රමාණය මෙතරම් වැඩි වී තිබෙන නමුත් අපේ නිපදවීමේ ප්‍රමාණය වැඩි වුණේ නැහැ. මා පුළුවන් තරම් මහන්සි ගත්තා අපේ බීම නිපදවීමේ ප්‍රමාණය වැඩි කර ගන්නට. අපේ ජනයාට අළුතින් ගස්වල රා මදින්නට පුරුදු පුහුණු කිරීම බීම නිපදවීම වැඩි කරන්නට ගත්තා. ලද එක්

පියවරක් හැටියට සඳහන් කරන්නට පුළුවනි. ඊයේ පෙරේදා එක පත්‍රයක තිබෙනවා මා දුටුවා එම පුහුණු කිරීමේ ක්‍රමය හරි ගියේ නැති වග. එය සත්‍යයක් නොවෙයි. එසේ පුහුණු කළ උදවියගෙන් බාගයකට වැඩි ප්‍රමාණයක් එම රක්ෂාවල් වලට ගියා. අප ළඟ තිබෙන ලේඛනවල ඒ උදවියගේ නම් ගම් තිබෙනවා. පුහුණු කරවූ උදවියගෙන් බාගයකට වැඩි ප්‍රමාණයක් රක්ෂාවලට ගොස් තිබෙන බව එම ලේඛනවලට අනුව පෙනෙනවා. තවත් කොටසක් එම රක්ෂාව අතහැර දමාගොස් තිබෙනවා. එම තත්ත්වය අපි මුලදීම බලාපොරොත්තු වුණා. අපේ ජනයා එක පාරටම මේ වැඩ පිළිවෙළ පුරුදු වී පිළිගන්නේ නැහැ. එහෙත් දැන් හුඟක් දුරට එය පිළිගන්නා බව අපට ඔප්පු වී තිබෙනවා. අපි 100 දෙණෙක් පුහුණු කෙරෙව්වොත් ඒ අයගෙන් 60ක් 70 ක් හෝ එම රක්ෂාවට යනවා. 1960 දී පෑණ්ප් ගැළුම් 40,000 ක් වැඩි කරන්නට අපට පුළුවන් වුණා. 1969 දී තවත් ගැළුම් 50,000 ක් වැඩිපුර නිපදවන්නට විධිවිධාන යොදා ගෙන යනවා. කෙසේ වුණත් නිෂ්පාදනය ප්‍රමාණවත් නැහැ. පිපාසය සංසිඳවීම සඳහා දැනට තිබෙන ප්‍රමාණය කිසි සේත්ම ප්‍රමාණවත් නැහැ. ඒ නිසා වෙනත් මාර්ගයකින් රජයේ කසිප්පු ක්‍රමයක් ඇති කර තිබෙනවා. පිටරටින් මොලැසස් ගෙන්වීම ගැන යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) සඳහන් කළා. 1965න් පසුව "ඇරැක් එසන්ස්" පිටරටින් ගෙන්වන්නේ නැහැ. එහෙත් ස්පිරිට් සහ මොලැසස් පිටරටින් ගෙන්වනවා. වෙනත් විධියේ අරක්කු සාදනු ලබන්නේ ඒවා උපයෝගී කරගෙනයි. එය නවත්වන්නට වුවමනා නම් දැනට වඩා ස්කාගාර පිහිටුවන්නට ඕනෑ. ඒ වාගේම දැනට වඩා දෙගුණයකින් රා මැදීමද කළ යුතුයි. එහෙත් ඒ කාරණා දෙක ඉෂ්ට කිරීම සඳහා මට ඉඩ ලැබෙන්නේ නැහැ.

යාපනයේ අලුත් ස්කාගාරයක් පිහිටුවීමට මා ඊයේ පෙරේදා යෝජනා කළා. අලුත් ස්කාගාරයක් පිහිටුවනවා නම් යාපනයේ තිබෙන තල් ගස් දස දහස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගණනින් ඒ ප්‍රදේශයේ වැසියන්ට සැලකිය යුතු ආදායමක් ලබාගන්නට පුළුවන් වෙනවා. දැනට ඒ තල් ගස් වලින් කිසි ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. ඒ තල් රා නියම විධියට සෑදුව හොත් පිටරට පවා යවන්නට පුළුවනි. මා ඒ ස්කාගාරය සාදන්නට ලැස්ති වූ අවස්ථා වේදී හින්දු සභාව ඊට විරුද්ධත්වය ප්‍රකාශ කළ නිසා මා ඒ අදහස අතහැර දැම්මා. අලුත් ස්කාගාර පිහිටුවන්නට මට ඉඩ ලැබෙන්නේ නැහැ. දැනට තිබෙන ප්‍රතිපත්තිය අනුව අලුත් ස්කාගාර පිහිටුවන්නට බැහැ. ඒ වාගේම අලුත් දිස්ත්‍රික්කවල ගස් මැදීමත් තහනම්. ඒ නිසා අවුරුදු 50ක් පමණ වයසැති පරණ ගස්මයි, තවමත් මදින්නේ. අපේ පොල් ගස අවුරුදු 50ක් මැද්දත් තවමත් රා දෙනවා. මෙය කර්මාන්තයක් හැටියට දියුණු කරන්නට වුවමනා නම් තව තවත් ස්කාගාර සහ තව තවත් මදින ප්‍රදේශ ඇති කළ යුතුයි. ඒ දෙකටම ඉඩ නො දෙතොත් නිෂ්පාදනය ශීඝ්‍රයෙන් වැඩි දියුණු කරන්නට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. කෙසේ වුණත් දැනට මදින ප්‍රදේශ වලින්ම පුළුවන් තරමකින් වැඩි නිෂ්පාදනයක් ඇති කරන්නට උත්සාහ කරනවා.

අපේ අරක්කු පිටරටවලට යවා විදේශ විනිමයක් ලබා ගන්නට පුළුවනි. ලංකාවේ නිපදවන ලද අරක්කු සෑහෙන තොගයක් දැනටමත් පිටරට යවා තිබෙනවා. ඉදිරිය ටත් අපේ අරක්කු පිටරට යවන්නට උත්සාහ දරනවා. දැනට ගෙන යන සුරා ප්‍රතිපත්තිය අනුව තව අවුරුදු 20 කින් 30 කින් ලංකාවේ සුරාපානය සම්පූර්ණ යෙන්ම තහනම් වුණත් මේ කර්මාන්තය කරගෙන යන්නට පුළුවන් වෙනවා. දැනට දෙලක්ෂයක් පමණ පිරිසක් සුරා කර්මාන්තයේ යෙදී සිටිනවා. ඒ කර් මාන්තය නැති කර දැම්මොත් ඒ පිරිසට වෙනත් රක්ෂා සපයා දෙන්නට සිදු වේවි.

අ. භා. 6.15

ඒ කර්මාන්තය නැති වන්නේ නැහැ. අපි දැන් පිටරටවලට මේවා පටවන්නට පුරුදු කරගෙන යනවා. එතකොට, තව අවුරුදු විස්සකින් පමණ "ටෝටල් ප්‍රොහි බිෂන්" හෙවත් සම්පූර්ණ තහනම් කිරීය ගෙනාවත් ඒ කර්මාන්තය අපට දිගටම පවත්වාගෙන යන්නට පුළුවන් බව ප්‍රකාශ කරන්නට කැමතියි.

මෙන්න අපේ සුරා ප්‍රතිපත්තිය. මම තමුන්නාන්සේලාගේ දැනගැනීම සඳහා එය කියවන්නම්:

"සුරා බදු තහනම් කොමිෂන් සභා වාර්තාවේ විස්තර කර ඇති පරිදි මත්පැන් පානය සඳහා බලපත්‍ර දීමේ ක්‍රමය මතු යම් දිනයක ක්‍රියාත්මක කිරීමේ අදහස පෙරදැරි කරගෙන................."

බලපත්‍ර ක්‍රමයක් වුවමනායයි ඒ කොමිෂන් සභාව නිර්දේශ කර තිබෙනවා. ඒ කාරණය අපි පිළිගන්නවා. ආණ්ඩුව එය පිළිගෙන තිබෙනවා.

"ඉදිරියට එය ක්‍රියාත්මක කිරීමේ අදහස අනුව ලැබේ....................."

එය ක්‍රියාත්මක කරන්නේ කොයි කාල යේදීදැයි අපට කියන්නට බැහැ.

"ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, ලංකා ගුවන් විදුලි සංස්ථාව, අධ්‍යාපන සහ සංස්කෘතික අමාත්‍යාංශය සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යන මේ රජයේ ආයතනවල සහාය ඇතිව, ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් මත්පැන් පානය කිරීමෙන් ඇති වන අනිෂ්ට විපාක සහ එයින් වැළකීමෙන් ඇති වන යහපත පිළිබඳව ප්‍රචාරය කර ගෙන යෑම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරනු ඇත....................."

**ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)

*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னாவ)*

(Mr. T. B. Ilangaratne—Kolonnawa)

මෛත්‍රී බුදුන්ගෙ කාලය වෙන කොටද, එතකොට නවත්වන්නෙ?

**ගරු ආචාර්ය දහනායක**

*(கௌரவ கலாநிதி தகநாயக்க)*

(The Hon. Dr. Dahanayake)

මේ වැඩ කරන්න කල් යන්නෙ නැද්ද? කල් යන එක නවත්වන්න බැහැ. ඇබ්බැහි වුණු දෙයක් එහෙම එක පාරටම නවත්වන්න පුළුවන්ද?

"ඒ අතරතුර බොහොම සාධාරණ වැඩ පිළිවෙළක් ද ක්‍රියාත්මක කරනු ඇත....................."

කරන්න බලාපොරොත්තු වන්නේ කුමක්දැයි මම කියන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාය්‍ය දහනායක]

"මේ රටේ මෙන්ම පිටරටවලද පැවැත්වෙන ලංකාණ්ඩුවේ සියලුම නිල උත්සවවලදී මත්පැන් භාවිතය තහනම් කරනු ලැබේ. සැණකෙළි, සල්පිල් ආදිය සඳහා දැනට නිකුත් කරන අවස්ථානුකූල බලපත්‍ර මින් මතු නිකුත් කරනු නොලැබේ. සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා රාජ්‍ය කටයුතු අමාත්‍යාංශය විසින් කරනු ලබන නිර්දේශයන් මත හැර හෝටල් සහ භෝජනාගාර ආදිය සඳහා අලුතින් මත්පැන් බලපත්‍ර නිකුත් කරනු නොලැබේ."

හෝටල්වලට සහ භෝජනාගාරවලට මත් පැන් සඳහා බලපත්‍ර ඉල්ලා සිය ගණන් ඉල්ලුම්පත්‍ර අපට ලැබෙනවා. ඒ කාටවත් දෙන්නේ නැහැ. හැබැයි, සංචාරක මණ්ඩලය නිර්දේශ කළොත් අසුවල් අසුවල් තැන්වලට ඕනෑය කියලා, අන්න ඒ අයට අපි දෙනවා. සංචාරක මණ්ඩලය වෙනම ආයතනයක්. එය මගේ අමාත්‍යාංශයට අයිති දෙයක් නොවෙයි. ඒ අයගේ වෙනම වැදගත් ජාතික ව්‍යාපාරයක් තිබෙනවා, සංචාරකයන් සම්බන්ධයෙන්. ඒ මණ්ඩලය නිර්දේශ කළොත් මිස වෙන කාටවත් බල පත්‍රයක් දෙන්නේ නැහැ.

"නීතිය සුදුසු පරිදි සංශෝධනය කිරීමෙන්, බීමත්කම පිළිබඳ වැරදි කරන උදවියට නීතිය යටතේ නියම කළ හැකි දඬුවම් වඩාත් තදබල කරනු ලැබේ."

ඒ සඳහා සංශෝධන නීති කෙටුම්පතක් න්‍යාය පත්‍රයේ සඳහන් කර තිබෙනවා. දඬුවම් වැඩි කිරීම සඳහායි එය සකස් කර තිබෙන්නේ. ගරු මන්ත්‍රීවරුන්ට වුවමනා නම් එය බලාගන්නට පුළුවනි.

ගරු මන්ත්‍රීතුමන්ලා නොයෙක් ප්‍රශ්න මතු කළා, සුරා දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු ගැන. හපුතලේ කැන්ටිම ගැන මතු කරන ලද ප්‍රශ්නය ගැන වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (සමරවීර මයා.) උනන්දුවක් දක්වා තිබෙනවා. හපුතලේ කැන්ටිම වසා දමන ලද්දේ "ලෝකල් ඔප්ෂන්" කියන නීතිය අනුවයි; අපේ අමාත්‍යාංශයෙන් පිට කරන ලද ඔඩරයක් අනුව නොවෙයි.

ඊළඟට කියන්නට තිබෙන්නේ මෙයයි. විල්බට් සිල්වා මහත්මයාට බලපත්‍රයක් තිබෙනවා. හෝටලයේදී නොයෙක් විධියේ මත්පැන් විකිණීමට පරණ ලයිසමක් ඒ මහත්මයාට තිබෙනවා. ඒ අනුව, තොග පිළිවෙළට අරක්කු විකුණනවා වෙන්නට පුළුවනි. එය නවත්වන්නට පිළිවෙළක් මට නම් ඇත්තේ නැහැ. තෙල්දෙණියේ සමාගමකට හෝ සමිතියකට හෝ තිබීම බලපත්‍රයක් නිකුත් කර නැහැ. මා දැන් සඳහන් කළ සුරා ප්‍රතිපත්තිය අනුව "ක්ලබ්" නැත්නම් සමාජ ශාලාවලට අලුතින් බලපත්‍ර නිකුත් කරන්නේ නැහැ. එහෙත් නොයෙකුත් සමාජ ශාලාවල එවැනි බලපත්‍ර නැතිව මත්පැන් විකුණන බව මා දන්නවා. සාමාජිකයින්ට විකුණන්නට නීතියෙන් ඉඩ තිබෙනවා. ඒ අනුව ඒ අය සාමාජික ලැයිස්තුවක් තබා ගෙන ඔවුන්ට විකුණනවා. අරක්කු හැර අනිකුත් මත් පැන් සාමාජිකයින්ට විකුණනවා. එය දැනට තිබෙන නීතියයි එහෙත් මෙවැනි දේවල් තිබෙන නිසා සමාජ ශාලාවලට බලපැවැත්වෙන නීතියක් සංශෝධනය කරන්නට රජය කල්පනා කර ගෙන යනවා.

එඩ්මන්ඩ් මහත්මයාට බලපත්‍ර දුන්නේ නැත කියා ලියුම් කියවන්නට යෙදුණා. ඒ මහත්මයාට අන්තිම දවස වන තුරුම තමන්ගේ කොන්ත්‍රාත්තුව යටතේ මත් පැන් වෙළඳාමට ඉඩ දුන්නා. එය අවලංගු කරන්නය කියා යෝජනාවක් තිබුණු නමුත් අවලංගු කළේ නැහැ. ඒ මහත්මයා ඒ කොන්ත්‍රාත්තුව අත්හැරියාට පසුව ඒ විධියටම ඒ බලපත්‍රය දුම්රිය දෙපාර්තමේන්තුවට තිබෙනවා.

ඊළඟට පිටරටින් ගෙන්වන ස්ප්‍රීතු ගැන කියන්නට යෙදුණා. ඒ සම්බන්ධව යම්කිසි පැටලිල්ලක් තිබෙනවා නම් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඉදිරිපත් කළ චෝදනා ගැන සම්පූර්ණ පරීක්ෂණයක් කරවන් නම්. වැරදි තිබෙනවාදැයි බලන්නම්. සමහරවිට වැරදි තිබෙන්නට පුළුවන්. එවැනි වැරදි ගැන මන්ත්‍රීවරුන් පෙන්වා දෙනවා නම් ඒවා හරිගස්සන්ට උත්සාහ ගන්නට පුළුවන්.

අරක්කු බෝතල්වලට ගහන පොරොප්පය නැත්නම් මූඩිය සැපයීමේ කොන්ත්‍රාත්තුව හැම අවුරුද්දේම එකම කොම්පැනියක් මගිනුයි අරගෙන තිබෙන්නේ. එය අරගෙන තිබෙන්නේ ලොකු මුදලකටයි. එය එකම කොම්පැනියකට දීම පුළුවන් විධියකින් කඩා දමන්නය කියා මා කිව්වා. දැන් තිබෙන මූඩිය ගලවා බෝතලවලට කසිප්පු පුරවා ආපසු සවි කරන්නට පුළුවන්කම තිබෙනවා. පරණ ස්කොච්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විස්කි මූඩිය නම් ගලවා ආපසු ගහන්නට බැහැ. අපටත් ඒ විධියට හදන්නට බැරි ඇයි? ඒ ගැන දැන් මා උත්සාහයක් දරනවා. යම්කිසි විධියක වැරදි තිබෙනවා නම් ඒවා ගැන මට කියන්නය කියා මා ගරු මන්ත්‍රීවරුන්ට කියනවා. කොතනද ඔය කොමිස් ක්‍රමයක් තිබෙන්නේ? ඒවා කඩා බිඳ දමන්නට මා ලැහැස්තියි. ගරු යටියන්තොට මන්ත්‍රීතුමා කළ චෝදනාව ගැන සියුම්ව කල්පනා කර බලා සුදුසු විධි විධාන යෙදීමට උසස් නිලධාරියෙක් යොද වන්නම්.

ස්ප්‍රීතු ගෙන්වීම කසිප්පු නිපදවීමට උදව් වෙනවාය කියා ගරු යටියන්තොට මන්ත්‍රීතුමා අදහසක් ඉදිරිපත් කළා. මගේ සුරාබදු කොමසාරිස්තුමාත් එයට එකඟ වෙනවා. ඒ අනුව ස්ප්‍රීතු ගෙන්වීමට අපි විරුද්ධ වෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
එහෙනම් ගෙන්වන්නේ ඇයි?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

තවත් දුරට ඒ ගැන කටයුතු කරනවා ඇති. තාවකාලිකව බලපත්‍ර පිට සිටින ඉන්දියන්කාරයින් මේ වෙළඳාමට ලයිසන් ලබා ගන්නවාය කියා චෝදනාවක් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා. එමෙන්ම තවත් මන්ත්‍රීවරුන් කීප දෙනෙක්මත් එසේ කීවා. අරක්කු සහ රා රේන්ද දීමේදී එක් සථිර කොන්දේසියක් තමයි පුරවැසියෙක් නොවේ නම් එවැනි රේන්දයක් ගැනීම තහනම් කියන එක. ඒ අයට එවැන්නක් ගන්නට බැහැ. එම නිසා යම්කිසි පුරවැසියෙක් නොවන කෙනෙක් එවැනි රේන්දයක් අරගෙන තිබෙනවා නම් දැනගත් හැටියේම ඒ බල පත්‍ර අවලංගු කරනවා. දිසාපතිවරුන්ට බලය තිබෙනවා මේ කරුණ ගැන සෝදිසි කර බලා යම් කෙනෙක් පුරවැසියෙක් නොවේ නම් ඔහුට බලපත්‍රයක් නොදෙන් නට. ක්‍රිෂ්ණන් කියන මහතාට බලපත්‍රයක් දිසාපතිතුමා විසින් දී ඇත්තේ ඒ මහතා විසින් තම උප්පැන්න සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසුවයි. ඒ මහතා මෙරට පුරවැසි යකු බව ඔප්පු කර තිබෙනවා. එම නිසා මෙරට පුරවැසියකු නොවන කිසිම කෙනෙකුට බලපත්‍ර නොදෙන බව ස්ථිර වශයෙන්ම කියන්න කැමතියි.

කොල්ලුපිටියේ රා තැබෑරුමක කසිප්පු තිබුණාය, පොලිසියෙන් කඩාපැන එම ස්ථානය සෝදිසි කළාය කියා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා චෝදනාවක් එල්ල කළා. එතුමා සඳහන් කළ එම කාරණය සම් බන්ධයෙන් මා සුරාබදු කොමසාරිස්තුමා ගෙන් ලිපිගොනු ගෙන්වා පරීක්ෂා කර බැලුවා. මට පෙනී ගියා, මෙම ස්ථානය සම්බන්ධයෙන් කරුණු සකස් කරගෙන යන අවස්ථාවකදී—දින දෙක තුනකට පෙර පොලීසියට ඔත්තු ලැබී මෙම ස්ථානයට පැන තිබෙන බව. එම නිසා, ඇපේ සුරාබදු දෙපාර්තමේන්තුවේ නිල ධාරීන් ක්‍රියා කරන්නේ නැතැයි මට කොහොමවත් කියන්න බැහැ. ඒ කෙසේ වුණත්, පොලීසිය ඉදිරිපත් වීම ගැන ස්තුතිවන්ත වෙනවා. නමුත් පොලීසිය කඩා පැන අල්ලා ගත් දේවල් සම්බන්ධ යෙන පවරනු ලැබූ නඩු දෙකක් අස් කර ගැනීමට කර තිබුණු යෝජනාවක් ගැන අසන්න ලැබීමෙන් මා පුදුමයට පත් වුණා; මා බිරාන්ත වුණා. මට එය විශ්වාස කරන්න බැහැ. කොහාම වුණත් මෙම නඩු දෙක අස්කර ගන්න මොන විධිය කින්වත් මා ඉඩ දෙන්නෙ නැති බව ප්‍රකාශ කරන්න කැමතියි. නඩුකාරතුමා ඒ පිළිබඳව තීන්දුවක් දුන් විට අපට ඇත්ත නැත්ත බලා ගත හැකියි. කෙසේ වුණත්, මෙවැනි පියවරක් ගැනීම ගැන නැවත වරක් මා පොලිසියට ස්තුතිවන්ත වෙනවා. කවර අන්දමකින් මෙම සුරා බදු දෙපාර්තමේන්තුවට චෝදනා නගන්න උත්සාහ කළත් මේ කාරණා සම්බන්ධ යෙන් කිසි වරදක් සිදු වී නැති බව පෙනී යනවා. කසිප්පු උවදුර නැති කර දැමීම විශාල කටයුත්තක් නිසා අනලොස්සක් පමණ වූ නිලධාරීන් පිරිසකට සෑහෙන යමක් කරන්න බැහැ. කසිප්පු උවදුර ඉතාමත්ම භයානක උවදුරක් බව අප පිළිගන්නවා. මාතර ගරු මන්ත්‍රීතුමා කී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාර්ය දහනායක]

වචනයක් වචනයක් පාසා මා එකඟ වෙනවා. කසිප්පු උවදුර නැති කර දමන්න ඕනෑ බව මාත් පිළිගන්නවා. කසිප්පු උවදුර නැති කර ඇමීමේ ක්‍රමයක් ගැන සුරාබදු නිලධාරීන් සමග සාකච්ඡා කොට ආණ්ඩුවට ඉදිරිපත් කළා. මට තිබෙන ආයුධ කසිප්පු උවදුර මැඩීමට ප්‍රමාණවත් නැහැ. දිස්ත්‍රික්ක 22 ක් තිබෙනවා. එයින් දිස්ත්‍රික්ක 12 ක නිල ධාරීන් හය දෙනා බැගිනුයි සිටින්නේ. බදුල්ල දිස්ත්‍රික්කයේ සිටින නිලධාරීන් හය දෙනා, මොනරාගල දිස්ත්‍රික්කයේත් සේවය කරන්න ඕනෑ. එම නිසා නිල ධාරීන් තුන් සියයකුත් වාහන තවත් අසූවකුත් සපයා දෙන මෙන් ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරන්න යෙදුණා. දැනට මුළු ලංකාවේම සේවය කරන්න, දෙපාර්ත මේන්තුව සතුව තිබෙන්නේ වාහන දොළහයි. වාහන දොළහකින් හා සුළු නිලධාරීන් පිරිසකගෙන් කසිප්පු උවදුර සම්පූර්ණයෙන්ම මැඩ පවත්වා ඇමිය හැකියයි කල්පනා කරනවාද? ගරු සභා පතිතුමනි, එම නිසා කසිප්පු උවදුර සම්පූර්ණයෙන් මැඩ පැවැත්වීමට මගේ අමාත්‍යාංශයට පුළුවන්කමක් නැහැ. ඊට මට ශක්තියක් ඇත්තේ නැහැ. නමුත් එය කරන්න වුවමනා නම් සෑහෙන සංඛ්‍යාවක් වාහන ලබා දෙන්න ඕනෑ. නිලධාරීන් සෑහෙන සංඛ්‍යාවක් ඕනෑ. වෙනත් අඩුවැඩිය වුවමනා කරනවා. කෙසේ හෝ වේවා ඉදිරියටත් එම අවශ්‍යතාවන් ලබා දීමට ක්‍රියා කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, කසිප්පු උවදුර නැති කර ඇමීමට මාත් කැමතියි. හැම අවුරුද්දක දීම අපි කසිප්පු උවදුර ගැන කථා කරනවා පමණයි. නියම විධියට පියවරක් ගෙන නොතිබීම ගැන මා කනගාටු වෙනවා. එම නිසා කොමිෂන් සභාවක් පත් කර, මේ සඳහා කුමන විධියේ වැඩ පිළිවෙළක් අනුගමනය කළ යුතු දැයි තීරණය කර ගෙන ඒ අනුව ක්‍රියා කළොත් පමණක් මේම උවදුර නැති කර ගැනීමට හැකි වේයයි මා විශ්වාස කරනවා. නමුත් දැනට අපට සිටින නිලධාරීන්ගේ සංඛ්‍යාව අනුව එවැනි පියවරක් ගන්න අමාරුයි.

ගරු සභාපතිතුමනි, 1967 සිට අප වැදගත් ව්‍යාපාරයක් ආරම්භ කළා. එනම්, මේ මත්පැන් විකුණන භෝජන ශාලාවල සහ හෝටල්වල වංචා ක්‍රමයකට ඒවා විකිණීමේ සිරිතක් තිබුණා. පාරිභෝගිකයා ගෙවන මුදල් ප්‍රමාණයට අනුව මත්පැන් ප්‍රමාණයක් ලැබෙන්නේ නැති තත්ත්ව යක් තිබුණා. මත්පැන් පාවිච්චි කරන තැනැත්තාට ගෙවන මුදලේ ප්‍රමාණයට මත්පැන් ලැබෙන්නේ නැහැ. දෙන මත් පැන් ප්‍රමාණය අඩු කරනවා. ඒ වාගේම මත්පැන්වලට වතුර මිශ්‍ර කර දෙනවා. වීදුරු දෙක තුනක් පානය කළ පසු දෙන මත්පැන් වීදුරුවලට තවත් වැඩි වැඩි යෙන් වතුර මිශ්‍ර කරනවා. වතුර මිශ්‍ර කර දීම හා දෙන මුදල් ප්‍රමාණයට දිය යුතු මත්පැන් කොටසට වඩා අඩුවෙන් මත් පැන් විකිණීම යන කරුණු දෙක නැති කිරීම සඳහා 1967 සිට විශේෂ කඩාපැනීමේ ව්‍යාපාරයක් ඇති කර තිබෙනවා. ඒ විධියේ කඩාපැනීම් මාර්ගයෙන් දඩ මුදල් වශයෙන් දැනට රුපියල් ලක්ෂ එක හමාරක් පමණ එකතු වී තිබෙනවා. බල පත්‍ර 27 ක් තාවකාලික වශයෙන් අවලංගු කර තිබෙනවා. මේ බලපත්‍ර තහනම් කරන්න එපාය කියා හුඟ දෙනෙක් අපෙන් ඉල්ලා සිටියා.

අ. භා. 6.30

අපේ දෙපාර්තමේන්තුවේ අලුත් ක්‍රම යක් පටන්ගෙන තිබෙනවා. පළමුවැනි වතාවට වරදක් කර අසු වුණ විට මේ තරම් දඩයක් ගැසිය යුතුය කියා නියම කර තිබෙනවා; දෙවැනි වතාවට වරදක් කර අසු වුණු විට මේ තරම් දඩයක් ගැසිය යුතුයි; තුන්වැනි වතාවට වරදක් කළ විට තුන් මාසයකට එම බලපත්‍රය තහනම් කළ යුතුයි. මත්පැන් ශාලා හිමියන් මේ නීති වලට විරුද්ධව අද කොතෙකුත් කතා කරනවා. නමුත් මේ වගේ තද නීති අද වැනි දවසක ක්‍රියාත්මක වන බව මා කියන්න කැමතියි. ගරු සභාපතිතුමනි, දැන් සිටින නිලධාරී සංඛ්‍යාව අනුව මට මීට වැඩි දෙයක් කරන්නට බැහැ.

නමුත්නාන්සේලා දන්නවා ඇති, කොපමණ ලොකු ආදායමක් මේ සුරා බදු දෙපාර්තමේන්තුවෙන් ලැබෙනවාද කියා. රුපියල් කෝටි 35 ක පමණ ආදායමක් සුරා බදු දෙපාර්තමේන්තුවෙන් ලැබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ ආදායම ලබා ගැනීම සඳහා නිලධාරීන් වැඩි පිරිසක් යොදවා සිටින නිසා, කසිප්පු උවදුරට විරුද්ධව ගෙන යන ව්‍යාපාරයට යොදවන්නට අපට නිලධාරීන් නැහැ. මේ විධියේ ප්‍රශ්නයකුයි අද සුරා බදු දෙපාර්තමේන්තුවට ඇති වී තිබෙන්නෙ. පුළුවන් තරම් දුරට මහජනයාට පහසුකම් ඇති කරමින් මහජනයාගේ ඕනෑ එපාකම් අනුව කටයුතු කරගෙන යන බවත්, ඉදිරියට තවත් වැඩි වැඩියෙන් පහසුකම් සැලසීමට හා ඕනෑ එපාකම් ඉටු කිරීමට කටයුතු කරන බවත් මතක් කරන්න කැමතියි. සුරා බදු දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් කියන්නෙ එපමණයි.

ඊළඟට ඉතාමත් වැදගත් කරුණක් වශයෙන් තුවක්කු ප්‍රශ්නය ඉදිරිපත් වුණා. මෙය විශේෂයෙන් ගොවි ජනතාවට බල පාන ප්‍රශ්නයක්. මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ චෝදනා මම පිළිගන්නවා. සමහර විට පොලිසියෙන් බල පත්‍රයක් ඉල්ලූ අවස්ථාවලදී කරුණු නැති ව ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනවා. තුවක්කුවලට බල පත්‍රයක් ලබා ගැනීමට දැන් තිබෙන නීතිය අනුව පළමුවෙන් පොලීසියෙන් බලය ලබාගන්න ඕනෑ. ඊළඟට දිසාපතිතුමාගේ බලය ලබා ගන්න ඕනෑ. පොලිසිය බලය දුන්නේ නැත්නම්, දිසාපතිතුමාගේ බලය ලැබුණාට බලපත්‍ර යක් ලැබෙන්නේ නැහැ. පොලිසියේ බලය ලබා ගන්නේ නැතිව බලපත්‍රයක් දෙන්න දිසාපතිතුමාට බලයක් නැහැ. ඔය විධියේ අයුක්ති සහගත දේවල් සිදු වන බව මා පිළිගන්නවා. මේවා ගැන වැඩියෙන් විස්තර නොකළාට තමුන්නාන්සේලා සියලු දෙනාම මේ ගැන හොඳට දන්නවා ඇති. යම් කෙනෙක් ඉල්ලුම් පත්‍රයක් එවූ විට ඒ ගැන රපෝර්තු කරන්නය කියා පොලිස් භටයෙක් යවනවා. ඒ පොලිස් භටයා ඒ ගමේ කඩයකට ගොස් වාඩි වී කාගෙන් හෝ වචනයක් දෙකක් අසා ගෙන ඉල්ලුම් පත්‍රය එවූ පුද්ගලයාගේ ගෙදරට යනවා. ඒ ගෙදරට ගොස් වචනයක් දෙකක් කියා සමහර විට කියනවා, මේවා නිකම්ම කර ගන්න බැරිය කියා. ඊට පසු රපෝර්තුව එනවා ඒ තැනැත්තාට බලපත්‍රයක් දෙන්න එපාය කියා. එවිට ඒ පුද්ගලයාට බලපත්‍ර යක් ලැබෙන්නෙ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, මේ ක්‍රමය නැති කරන්නය කියා; නමුත් මට මෙය සම්පූර්ණයෙන්ම නැති කරන්න බැහැ. මට මේ විධියට කරන්න පුළුවනි. ගැමියෙකු ගේ නැත්නම් ගොවියෙකුගේ ඉල්ලුම් පත්‍ර යක් පොලිසිය විසින් ප්‍රතික්ෂේප කළොත්, පොලිසියේ රපෝර්තුව හරිද වැරදිද කියා පරීක්ෂා කර බැලීමක් කරන්නය කියා දිසාපතිතුමාට දන්වන්නම්. මින් ඉදිරියට දිසාපතිතුමා විසින් මොන කාරණයක් නිසා පොලිසිය විසින් බලපත්‍රය දීම ප්‍රතික්ෂෙප කර තිබෙනවාද කියා සොයා බැලිය යුතුය කියා දිසාපතිවරුන්ට දන්වන්නම්. තමන් ගේ හිතේ හැටියට ඒ බලපත්‍රය දීම කරන්නය කියා දිසාපතිතුමාට අවසාන බලය දෙන්නම්. පොලිසිය විසින් බලපත්‍රයක් දීම ප්‍රතික්ෂෙප කළ විට ඒ ගැන සොයා බලා සුදුසු අයට බලපත්‍ර ලබා දෙන්නය කියා දිසාපතිවරුන්ට දන්වා යවන්නම්. මට ඔපමණයි කියන්න පුළුවන්. ඒ මන්ද? සාමාන්‍ය ගැමි ජනතාවට අමාරුවක් තිබෙන බව මම පිළිගන්නවා.

තවත් කාරණයක් නම්, කලින් අවුරුදු දෙක තුන ඇතුළත බලපත්‍ර ලබාගත් අයට පවා තුවක්කු ලබා ගැනීමට බැරි තත්ත්ව යක් තිබුණා. එහෙත් මෑත අවුරුදු තුනේ දී මේ රජය ඒ තත්ත්වය මගහැරවීම පිණිස තුවක්කු පිටරටින් ගෙන්නුවා. දැනට 6 මාසෙකට කලින් තුවක්කුවක් මිලට ගන්නට බැරි වූ එකම බලපත්‍රකරු වකුවත් සිටියේ නැති බව මට ප්‍රකාශ කරන්න පුළුවන්. අද තත්ත්වය කොහොමද කියා මම දන්නෙ නැහැ. යම් ලෙස කින් අද තුවක්කු හිඟයක් තිබෙනවා නම් ඊළඟ තොගය පිටරටින් ලැබුණ විට එම අඩුපාඩුවද මගහැරී යනවා ඇති.

තුවක්කු සම්බන්ධයෙන් තවත් සහන යක් ඇති කිරීම් වශයෙන් අපි "මොරටෝරියම්" නමැති ක්‍රමය ඇති කළා. එනම් හොර තුවක්කු සම්බන්ධයෙන් නීතිය ක්‍රියාවෙ යොදවන්නෙ නැතුව සිටීමයි. අපි දැන්වීමක් ප්‍රසිද්ධ කළා, "බලපත්‍ර නැති තුවක්කු තමන් ළඟ තිබෙනවා නම් මෙතැන් සිට 6 මාසයක් ඇතුළත එම තුවක්කු ඒ ඒ ප්‍රදේශවල ඩී. ආර්. ඕ. මහතාට හෝ පොලිසියට හෝ ගෙනැවිත් භාර දෙන්නය, එවිට ඒ සම්බන්ධයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාර්ය දහනායක]

කිසිම නඩුවක් දමන්නේ නැතුව—ඒ සඳහා තිබෙන නීතිය ක්‍රියාත්මක කරන්නෙ නැතුව—ඒ තුවක්කුව සෝදිසි කර බලා, ඒ තුවක්කුව අයිති ගොවියකුට නම් ඒ සුදුසුකම් නුසුදුසුකම් සෝදිසි කර බලා, අවශ්‍ය බලපත්‍රය නිකුත් කරනවා" ය කියා ඔය විධියට 6 මාසයක් 6 මාසයක් බැගින් දෙවතාවක්ම අපි ඒ අවස්ථාව දුන්නා. ඌව වැනි ප්‍රදේශවල හත් අට සිය දෙනකු පමණ තමන් ළඟ තිබුණ බල පත්‍ර නැති තුවක්කු, මේ ක්‍රමය යටතේ බලපත්‍ර ඇති තුවක්කු කර ගත් බව මම ප්‍රකාශ කරන්න කැමතියි. තමුන්නාන්සේලාගේ ඉල්ලීම අනුව මා නැවතත් සටහන් කර ගත්තා, ඉදිරියට තවත් 6 මාසයක් ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන්න. ගොවි ජනතාව අතර තවත් හොර තුවක්කු තිබෙනවා නම් ඒවා පොලීසියට හෝ ඩී. ආර්. ඕ. ට හෝ ගෙනැවිත් බාර දී, තමන්ට තුවක්කුවක් අවශ්‍යයි කියා ඔප්පු කළ විට බලපත්‍ර ලබා ගන්නට පුළුවන් වෙනවා ඇති. ඔය විධියට දෙවතාවක්ම සහන දී තිබෙන බව තමුන්නාන්සේලා නොදන්නවාදැයි මා දන්නෙ නැහැ. මේ විධියට සහන දෙන්නේ ගොවි ජනතාවට තුවක්කු ඉතා ම අවශ්‍ය බව මේ රජය පිළිගන්නා නිසයි. අපි පිළිගන්නෙ නැහැ, රතිඤ්ඤ පත්තු කර අලි එලවන්න පුළුවන් ය කියා. ගොවි ජනතාවට තුවක්කු අවශ්‍ය බව අපි පිළිගන්නවා. ඒ නිසා, ගොවි ජනතාවට මේ මේ විධියේ අමාරුකම්වලට මුහුණ පාන්නට තිබෙනවාය, තුවක්කු ලබා ගැනීමට මේ මේ විධියේ අපහසුකම් තිබෙනවාය, කියා තමුන්නාන්සේලා පෙන්වා දෙනවා නම් ඒ ගැන නිසි පරිදි ක්‍රියා කරන්න මා සූදානම් බව මේ ගරු සභාවේදී ප්‍රකාශ කරන්න කැමතියි.

බීඩි සම්බන්ධව ප්‍රශ්න කීපයක් නගන්න යෙදුණා. එතුමන්ලා මතු කළ ඒ ප්‍රශ්නවලට මා පිළිතුරු දෙන්න කැමතියි. මෙම රජය පිහිටුවන්නට පෙර බීඩි බෙදා දීමේ යම් කිසි ක්‍රමයක් තිබුණාද, ඒ ක්‍රමය අනුව බලපත්‍ර ක්‍රමයක් යටතේ බීඩි කොළ ලබාගන්නා අයගේ ලැයිස්තුවක් තිබුණාද, ඒ ලැයිස්තු පිළිබඳ කිසිම වෙනසක් අපි කෙළේ නැහැ. දැන් අපට චෝදනා කරනවා අසුවල් අසුවල් අයට දෙනවාය කියා. පසු ගිය ලැයිස්තුවේ සිටි අයට අමතර වශයෙන් අලුතෙන් එකතු කළ අය ගැන මම කියන්නම්. එම ලැයිස්තුවලට අපි තුන්දාහක් එකතු කළා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

කවදාවත් බීඩියක් ඇල්ලුවෙ නැති අයට බලපත්‍ර දී තිබෙනවා.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

අසුවල් අසුවල් අයය කියා තමුන්නාන්සේ ලියා එවා පෙන්වා දෙනවා නම් ඒ ගැන සෝදිසි කර බලා යම් වරදක් තිබෙනවා නම් මම හරිගස්සන්නම්. එහෙත් 1965 තිබුණ ලැයිස්තුව එසේම තිබෙන බව මම එතුමන්ලාට දන්වන්න කැමතියි. ඒ ලැයිස්තු එසේම තිබෙන අතර ලොකු මුදලාලිලාට තිබුණ කොටස් කීපයක් කපා ඒ වෙනුවට සමුපකාර සමිති 375 කට කොටස් ලබා ගැනීමට මේ රජය ඉඩ දුන්නා. ඒ සමුපකාර 375 සාමාජිකයන් 33,638 ක් සිටිනවා. 1968 දී ඒ එක් සාමාජිකයකුට බීඩි කොළ රාත්තල් 60 බැගින් නිකුත් කළා. මේ අවුරුද්දේ 1969 දී එක් සාමාජිකයාට රාත්තල් 90 බැගින් දෙන්නට නියම කර තිබෙන අතර දැන් එයින් රාත්තල් 45 ක් දී තිබෙනවා. අනික් 45 ත් ළඟදීම දෙනවා ඇති. ඒ අළුතෙන් අවසර දුන්න අයයි. ඊට අමතරව මේ රජය මගින් තවත් සුළු කර්මාන්තකරුවන් 3000 ක් ඒ ලැයිස්තුවට එකතු කළා. ඒ 3000 ම සුළු නැති බැරි පුංචි මිනිස්සුයි. ඒ අය එකතු කළේ මේ ගරු සභාවේ දෙපැත්තේම සිටින මන්ත්‍රීවරුන්ගේ නිර්දේශ අනුවයි. ඒ පැත්තටත් දුන්නා; මේ පැත්තටත් දුන්නා. ඒ මිනිසුන්ට දී තිබෙන්නෙ අවුරුද්දකට රාත්තල් 500 බැගින් පමණයි. ලොකු ප්‍රමාණයක් දෙන්නෙ නැහැ. මම ඒ ලැයිස්තුවට එකතු කළේ ඔය දෙගොල්ල පමණයි. බීඩි ඔතන්නන් විශාල පිරිසක් රට පුරා සිටින බව අපි දන්නවා. ඒ නිසා බීඩි එතීම සඳහා අවශ්‍ය කොළ ගෙන්වීම පිණිස විදේශ විනිමයත් සැහෙන ප්‍රමාණයකින් මේ රජය වැඩි කර තිබෙනවා. තමුන්නාන්සේලාගේ ල සිස්තුවට හානියක් නොකර ඒ ලැයිස්තුවෙන් කොටසක් කඩා මේ අළුත් අයට මේ රජය බෙදා දී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එතකොට මා කර තිබෙන්නේ මොන වරදක්ද කියා මා අහනවා. සමහරවිට සමහරුන්ට බීඩි කොළ නැතිව ඇති. අද දවසේ රැකී රක්ෂා හිඟ නිසාත්, බීඩි එතීම පහසු කටයුත්තක් නිසාත් රක්ෂා නැති බොහෝ දෙනකු බීඩි එතීමේ යෙදෙනවා. ඒ නිසා කොළ ලබා ගන්නට බැරිව සමහර උදවිය ඇති. අපි උත්සාහ කරන්නේ ඉදිරියේදී තවත් කොළ ගෙන්වන්නටයි. ඒ වගේම මේ රටේ බීඩි කොළ නිපදවන්නටත් අපි උත්සාහ ගෙන තිබෙනවා.

බීඩි ගැන කථා කරන විට ඒ සඳහා පාවිච්චි කරන කොළ දෙවර්ගයක් තිබෙන බව මා තමුන්නාන්සේලාට මතක් කරන්නට සතුටුයි. පසුගිය රජය පැවති කාලයේදී බීඩි ඇතුළට දමන දුම්කොළ පිටරටින් ගෙන්නුවා. දැන් අපි ඒ දුම්කොළ පිටරටින් ගෙන්වීම තහනම් කර මේ රටෙන්ම ඒවා සොයා ගන්නට නියම කර තිබෙනවා. දැන් බීඩි දුම්කොළ ටිකක් වත් ගෙන්වන්නෙ නැහැ. අපි දැනට ගෙන්වන්නේ පිටින් ඔතන කොළ පමණයි. ඒ පිටින් ඔතන කොළත් මේ රටේම නිපදවා ගන්නට අපි දැන් උත්සාහ දරන බව මා තමුන්නාන්සේට මතක් කරන්නට කැමතියි. මට තව පැය 3 ක් වත් කථා කරන්නට ඉඩ දුන්න නම්, තමුන්නාන්සේලා ඉදිරිපත් කළ ප්‍රශ්න එකින් එකට පිළිතුරු දෙන්නට පුළුවන්කම තිබුණා. එහෙත් මගේ වෙලාව සීමා කර තිබෙන නිසා තමුන්නාන්සේලා සියලු දෙනාටම ස්තුති කරමින් තමුන්නාන්සේලා ඉදිරිපත් කළ කරුණුවලට පිළිතුරු සපයන්නට පොරොන්දු වෙමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

**"70 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 4,83,015 මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**70 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"70 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 4,83,015 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

70 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 483,015 for Head 70, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 70, Vote 1, ordered to stand part of the Schedule.*

**2 වන සම්මතය —පාලන ගාස්තු —පුනරාවර්තන වියදම, රු. 1,50,240**

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 1,50,240

*Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 150,240*

**"70 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 1,50,240 මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**70 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"70 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 1,50,240 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

70 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 150,240 for Head 70, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 70, Vote 2, ordered to stand part of the Schedule.*

**3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 3,500**

வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 3,500

*Vote No. 3.—Administration Charges—Capital Expenditure, Rs. 3,500*

**"70 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 3,500 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**70 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"70 ஆம் தலைப்பு,3 ஆம் வாக்குப்பணம் ரூபா 3,500 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

70 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 3,500 for Head 70, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.*

*Head 70, Vote 3, ordered to stand part of the Schedule.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**71 වන ශීර්ෂය : ප්‍රාදේශීය පාලනය**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 2,87,03,637**

*71 ம் தலைப்பு.—மாகாண நிருவாகம்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 2,87,03,637

HEAD 71.—PROVINCIAL ADMINISTRATION

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 28,703,637*

**"71 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 2,87,03,637ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

**71 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"71 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 2,87,03,637 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

71 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 28,703,637 for Head 71, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 71, Vote 1, ordered to stand part of the Schedule.*

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 30,78,650**

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு ரூபா 30,78,650

*Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 3,078, 650*

**"71 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 30,78,650 මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**71 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"71 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 30,78,650 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

71 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 3,078,650 for Head 71, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 71, Vote 2, ordered to stand part of the Schedule.*

**3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 3,40,000**

வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 3,40,000

*Vote No. 3.—Administration Charges—Capital Expenditure, Rs. 340,000*

**"71 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 3,40,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**71 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"71 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூபா 3,40,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

71 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 340,000 for Head 71, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.*

*Head 71, Vote 3 ordered to stand part of the Schedule.*

**4 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා —පුනරාවර්තන වියදම, රු. 4,74,000**

வாக்குப்பணம் இல. 4.—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 4,74,000

*Vote No. 4, Services provided by the Department—Recurrent Expenditure, Rs. 474,000*

**"71 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය සඳහා රු. 4,74,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**71 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"71 ஆம் தலைப்பு, 4 ஆம் வாக்குப்பணம் ரூபா 4,74,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

71 ஆம் தலைப்பு, 4 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 474,000 for Head 71, Vote No. 4, be inserted in the Schedule", put, and agreed to.*

*Head 71, Vote 4, ordered to stand part of the Schedule.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## 72 වන ශීර්ෂය : රෙජිස්ට්‍රාර් ජනරාල්

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 47,48,135**

*72 ஆம் தலைப்பு.—பதிவாளர் நாயகம்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 47,48,135

HEAD 72.—REGISTRAR-GENERAL

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 4,748,135*

**"72 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 47,48,135 මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**72 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"72 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 47,48,135 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

72 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 4,748,135 for Head 72, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 72, Vote 1, ordered to stand part of the Schedule.*

**2 වන සම්මතය.—පාලන ගාස්තු —පුනරාවර්තන වියදම රු. 2,97,160**

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 2,97,160

*Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 297,160*

**"72 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 2,97,160 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**72 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"72 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 2,97,160 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

72 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 297,160 for Head 72, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 72, Vote 2, ordered to stand part of the Schedule.*

## 73 වන ශීර්ෂය : මුස්ලිම් පල්ලි සහ මුස්ලිම් පුණ්‍යාධාර දෙපාර්තමේන්තුව

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 53,789**

*73 ஆம் தலைப்பு.—பள்ளிவாசல் முஸ்லிம் தரும நம்பிக்கைச் சொத்துத் திணைக்களம்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 53,789

HEAD 73.—DEPARTMENT OF MOSQUES AND MUSLIM CHARITABLE TRUSTS

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 53,789*

**"73 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 53,789 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**73 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"73 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 53,789 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

73 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 53,789 for Head 73, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 73, Vote 1, ordered to stand part of the Schedule.*

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 21,380**

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 21,380

*Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 21,380*

**"73 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 21,380 මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**73 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"73 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 21,380 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

73 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 21,380 for Head 73, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 73, Vote 2, ordered to stand part of the Schedule.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## 74 වන ශීර්ෂය: සුරාබදු දෙපාර්තමේන්තුව

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 31,88,183**

*74 ஆம் தலைப்பு :—மதுவரித் திணைக்களம்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 31,88,183

HEAD 74.—EXCISE DEPARTMENT

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 3,188,183*

**"74 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 31,88,183 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**74 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"74 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 31,88,183 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

74 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 3,188,183 for Head 74, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 74, Vote 1, ordered to stand part of the Schedule.*

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 5,79,000**

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 5,79,000

*Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 579,000*

**"74 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 5,79,000 මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**74 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"74 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 5,79,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

74 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 579,000 for Head 74, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 74, Vote 2, ordered to stand part of the Schedule.*

**3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 1,80,000**

வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 1,80,000

*Vote No. 3.—Administration Charges—Capital Expenditure, Rs. 180,000*

**"74 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 1,80,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**74 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

"74 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூபா 1,80,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

74 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 180,000 for Head 74, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.*

*Head 74, Vote 3 ordered to stand part of the Schedule.*

**7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම, රු. 11,41,410**

வாக்குப்பணம் இல. 7.—பொருளாதார அபிவிருத்தி—ஆக்கப் பொருட். செலவு, ரூபா 11,41,410

*Vote No. 7.—Economic Development—Capital Expenditure, Rs. 1,141,410*

**"74 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 11,41,410 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**74 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

"74 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் ரூபா 11,41,410 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

74 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 1,141,410 for Head 74, Vote No. 7, be inserted in the Schedule", put, and agreed to.*

*Head 74, Vote 7, ordered to stand part of the Schedule.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## 75 වන ශීර්ෂය : උඩරට ගැමි පුනරුත්ථාපන යෝජනා ක්‍රමය

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 62,124

75 ஆம் தலைப்பு :—கண்டி உழவர் மறுசீரமைப்புத் திணைக்களம்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 62,124

## HEAD 75.—DEPARTMENT OF KANDYAN PEASANTRY REHABILITATION

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 62,124*

"75 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 62,124 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

75 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"75 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 62,124 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

75 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 62,124 for Head 75, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 75, Vote 1, ordered to stand part of the Schedule.*

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 19,000

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 19,000

*Vote No. 2.—Administration Charges—Recurrent Expenditure, Rs. 19,000*

"75 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 19,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

75 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"75 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 19,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

75 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 19,000 for Head 75, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 75, Vote 2, ordered to stand part of the Schedule.*

3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම, රු. 25,000

வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூபா 25,000

*Vote No. 3.—Administration Charges—Capital Expenditure, Rs. 25,000*

"75 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 25,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

75 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"75 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூபா 25,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

75 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 25,000 for Head 75, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.*

*Head 75, Vote 3, ordered to stand part of the Schedule.*

5 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම, රු. 10,00,000

வாக்குப்பணம் இல. 5.—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 10,00,000

*Vote No. 5.—Services provided by the Department—Capital Expenditure Rs. 1,000,000*

"75 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය සඳහා රු. 10,00,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

75 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"75 ஆம் தலைப்பு, 5 ஆம் வாக்குப்பணம் ரூபா 10,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

75 ஆம் தலைப்பு, 5 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question "That the sum of Rs. 1,000,000 for Head 75, Vote No. 5, be inserted in the Schedule", put, and agreed to.*

*Head 75, Vote 5, ordered to stand part of the Schedule.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය— මූලධන වියදම, රු. 40,00,000**

வாக்குப்பணம் இல. 7.—பொருளாதார அபிவிருத்தி—ஆக்கப்பொருட் செலவு, ரூபா 40,00,000

*Vote No. 7.—Economic Development—Capital Expenditure, Rs. 4,000,000*

"75 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 40,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

75 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

" 75 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் ரூபா 40,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

75 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 4,000,000 for Head 75, Vote No. 7, be inserted in the Schedule", put, and agreed to.*

*Head 75, Vote 7, ordered to stand part of the Schedule.*

## 76 වන ශීර්ෂය : ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

**1 වන සම්මතය.—කායිකි මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 1,13,25,814**

*76 ஆம் தலைப்பு.—கிராமாபிவிருத்தி குடிசைக் கைத்தொழில் திணைக்களம்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 1,13,25,814

HEAD 76.—DEPARTMENT OF RURAL DEVELOPMENT AND COTTAGE INDUSTRIES

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 11,325,814*

"76 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 1,13,25,814 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

76 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

" 76 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் ரூபா 1,13,25,814 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

76 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 11,325,814 for Head 76, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.*

*Head 76, Vote 1, ordered to stand part of the Schedule.*

**2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම, රු. 12,53,080**

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூபா 12,53,080

*Vote No. 2.—Administration charges—Recurrent Expenditure, Rs. 1,253,080*

"76 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 12,53,080 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

76 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

" 76 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூபா 12,53,080 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

76 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 1,253,080 for Head 76, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.*

*Head 76, Vote 2, ordered to stand part of the Schedule.*

**4 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—පුනරාවර්තන වියදම, රු. 8,14,547**

வாக்குப்பணம் இல. 4.—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 8,14,547

*Vote No. 4.—Services provided by the Department—Recurrent Expenditure, Rs. 814,547*

"76 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය සඳහා රු. 8,14,547 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

76 වන ශීර්ෂයෙහි 4 වන සම්මතය උප ලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

" 76 ஆம் தலைப்பு, 4 ஆம் வாக்குப்பணம் ரூபா 8,14,547 அட்டவணையிற் சேர்க்கப்படுமாக " எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

76 ஆம் தலைப்பு, 4 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 814,547 for Head 76, Vote 4, be inserted in the Schedule", put, and agreed to.*

*Head 76, Vote 4, ordered to stand part of the Schedule.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

5 වන සම්මතය.—දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා—මූලධන වියදම රු. 16,00,000

வாக்குப்பணம் இல. 5.—திணைக்களத்தால் அளிக்கப்படும் சேவைகள்—மீண்டுவருஞ் செலவு, ரூபா 16,00,000

*Vote No. 5.—Services provided by the Department—Capital Expenditure, Rs. 1,600,000*

"76 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය සඳහා රු. 16,00,000 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

76 වන ශීර්ෂයෙහි 5 වන සම්මතය උප ලේඛන යෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"76 ஆம் தலைப்பு, 5 ஆம் வாக்குப்பணம் ரூபா 16,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

76 ஆம் தலைப்பு, 5 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 1,600,000 for Head 76, Vote No. 5, be inserted in the Schedule", put, and agreed to.*

*Head 76, Vote 5, ordered to stand part of the Schedule.*

6 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—පුනරාවර්තන වියදම රු. 14,92,158

வாக்குப்பணம் இல. 6.—பொருளாதார அபிவிருத்தி மீண்டுவருஞ் செலவு, ரூபா 14,92,158

*Vote No. 6.—Economic Development—Recurrent Expenditure, Rs. 1,492,158*

"76 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය සඳහා රු. 14,92,158 ක මුදල උප ලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

76 වන ශීර්ෂයෙහි 6 වන සම්මතය උප ලේඛන යෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"76 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் ரூபா 14,92,158 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

76 ஆம் தலைப்பு, 6 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 1,492,158 for Head 76, Vote No. 6, be inserted in the Schedule", put, and agreed to.*

*Head 76, Vote 6, ordered to stand part of the Schedule.*

7 වන සම්මතය.—ආර්ථික සංවර්ධනය—මූලධන වියදම, රු. 86,39,842

வாக்குப்பணம் இல. 7.—பொருளாதார அபிவிருத்தி—ஆக்கப்பொருட் செலவு, ரூபா 86,39,842

*Vote No. 7.—Economic Development—Capital Expenditure, Rs. 8,639,842*

"76 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය සඳහා රු. 86,29,842 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

76 වන ශීර්ෂයෙහි 7 වන සම්මතය උපලේඛන යෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"76 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் ரூபா 86,39,842 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

76 ஆம் தலைப்பு, 7 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

*Question, "That the sum of Rs. 8,639,842 for Head 76, Vote No. 7, be inserted in the Schedule", put, and agreed to.*

*Head 76, Vote 7, ordered to stand part of the Schedule.*

අ. භා. 6.45

**සභාපති**
*(அக்கிராசனர்)*
(The Chairman)

We shall now take up Head 80.

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.

*Whereupon* MR. SPEAKER *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *took the Chair.*

80 වන ශීර්ෂය: සෞඛ්‍ය අමාත්‍යවරයා

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩි නඩි සහ අනිකුත් දීමනා, රු. 24,61,720

*80 ஆம் தலைப்பு :—சுகாதார அமைச்சர்*

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 24,61,720

HEAD 80.—MINISTER OF HEALTH

*Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 2,461,720*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

නියෝජ්‍ය සභාපතිතුමනි, "වැය සම්මතය රුපියල් 10 කින් අඩු කළ යුතු ය" යි මා යෝජනා කරනවා.

සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මෙය ඉතා වැදගත් අමාත්‍යාංශයක්. සමහරුන් එයට සුව ඇමති අංශය යයි කියනවා. එහෙත් ඇමතිතුමාට නම් හිතෙනවා ඇති, එය ලෙඩ ඇමති අංශයක්ය කියා. ඒ තරම් ලෙඩ ගොඩක් මේ අමාත්‍යාංශයේ තිබෙනවා. රෝහල්වල ඉඩකඩ අඩුකම, දොස්තර හිඟය, හෙදියන් මදකම, උපස්ථායකයන් ප්‍රමාණවත් නොවීම, වුවමනා තරම් බෙහෙත් නැතිකම ආදී වශයෙන් ලෙඩ රාශියක් තිබෙනවා. එවැනි හිඟකම් බොහොමයක් තිබෙන අතරම, වැඩිපුර තිබෙන දේවලුත් තිබෙන බව අමතක කරන්න හොඳ නැහැ. ඒවා අතුරින් ලෙඩුන් වැඩිකම, සාමාන්‍ය හා හදිසි මරණ බහුල වීම කැපී පෙනෙනවා.

දොස්තර හිඟය, මීට කලින් තිබුණු දෙයක් නොවෙයි. එමෙන්ම මීට කලින් නම්, දොස්තර විභාගයෙන් සමත් වුණු කිසිම කෙනකුට රක්ෂා හිඟයක් තිබුණේත් නැහැ. එය අළුතින් ඇති වී තිබෙන තත්ත්වයක්. මේ රටේ නොයෙකුත් වෘත්තීන් ගැන කල්පනා කර බලන විට, විභාගය සමත් වූ වහාම රක්ෂාවක් ලැබීමේ භාග්‍යය උදා වී තිබුණේත් දොස්තරවරුන්ට පමණක් යයි කියන්නට පුළුවනි. සමහර කාලවල ඉංජිනේරුවන් පවා රැකියා හිඟයකින් පෙළුණා. එහෙත් පසුගිය රජයෙන් ඇති වුණු කර්මාන්ත විප්ලවයෙන් පසුව නම් ඉංජිනේරුවන්ටත් රැකියා හිඟයක් බල පෑවේ නැහැ. එහෙත් දොස්තරවරුන්ට නම් මීට ඉස්සර කිසිම කාලයක රැකියා හියඟක් තිබුණේ නැහැ. දොස්තර විභාගය සමත් වූ වහාම රැකියාවත්, ඒ සමඟම ලොකු දැවද්දක් සමඟ විවාහයත් යන දෙකම ලැබීමේ භාග්‍යය ඒ කාලයේදී නම් දොස්තරවරුන් සතුව තිබුණා. එහෙත් අද තත්ත්වය ඊට හාත්පසින්ම වෙනස්. මා නියම සංඛ්‍යා ලේඛන දන්නේ නැති නමුත්, දොස්තර විභාගයෙන් සමත් වුණු සැහෙන පිරිසක් රැකියා නැතිව සිටින බව නම් දන්නවා. මේ සුව ඇමති අංශයේ හුඟක් ලෙඩ ඇති වී තිබෙන්නේ ලෙඩුන් වැඩිකම නිසා බැවින්, දොස්තරවරුන්ගේ සේවය නම් අත්‍යවශ්‍ය බව මතක් කරනන්ට කැමැතියි. එහෙත් ලෝක බැංකුවේත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේත් බලපෑම අනුව දොස්තර ඇබෑර්තු නොපුරවා සිටින්නට සෞඛ්‍ය ඇමතිතුමාට සිදු වී තිබෙනවා. ඒ බලපෑම තිබෙන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයට පමණක් නොවෙයි. අගමැතිතුමා ඇතුළු හැම ඇමතිවරයකුම ලෝක බැංකුවේ හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඒ බලපෑමට හසු වී සිටිනවා. අනෙක්වා ගැන කොහොම වුණත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඉටු විය යුතු සේවය සම්බන්ධයෙන් නම් කල්පනා කර බලන විට, ඒ අවහිරකම් ඉවත ලා අත දිග හැර වැඩ කළ යුතු බව කිව යුතුයි.

බෙහෙත් හිඟයත්, මීට කලින් කවදාවත්ම තිබුණු දෙයක් නොවෙයි. දැන් නම් කොයි පැත්ත බැලුවත් පෙනෙනවා, බෙහෙත් හිඟයෙන් විඳින දුක් ගැහැට. සමහර බෙහෙත් වර්ග ලබා ගැනීමට මාස දෙක තුන රස්තියාදු වන්නට පවා සිදු වී තිබෙන බව මා පෞද්ගලිකව දන්නවා. සමහර බෙහෙත් කොහෙත්ම ඇත්තේ නැහැ. අත්‍යවශ්‍ය සමහර බෙහෙත්වල ඇති හිඟය නිසා භයානක තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වී තිබෙන බව ප්‍රකාශ කරන්නේ කණගාටුවෙන්. බෙහෙත් ආනයනය ක්‍රමයෙන් රජය අතට ගැනීමට අපේ කාලයේදී උත්සාහයක් ගත්තා. ඒ සඳහා ස. තො. ස. ආයතනයේ වෙනම අංශයක් පවා ඇති කළා. ඒ වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් මට මුලින්ම උපදෙස් දුන්නේ සුප්‍රකට වෛද්‍යවරයෙක්. ඔහු නම් පේරාදෙණියේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ හිටපු උප කුලපති සර් නිකුලස් ආටිගලයි. අප පටන් ගත් ඒ වැඩ පිළිවෙළ දැන් සම්පූර්ණයෙන් අහෝසි කර දමා තිබෙනවා. විදේශ විනිමය හිඟයක් තිබෙන මෙවැනි වකවානුවකදී, අපට අවශ්‍ය බෙහෙත් වර්ග ලබා ගැනීම සඳහා නොයෙක් රටවල් සමඟ ගිවිසුම්වලට එළඹීම අනිවාර්යයෙන්ම කළ යුත්තක්. එවැනි වැඩ පිළිවෙළක් යටතේ රජය මඟින් බෙහෙත් වර්ග ආනයනය කරනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනුවට, පෞද්ගලික වෙළෙඳුන් සෑනසීම සඳහා ඒ කාර්යය ඔවුන්ට භාර දීම නිසා අප ඉතාමත් අමාරු තත්ත්වයකට මුහුණ පා සිටිනවා. බොහෝ ලෙඩුන් තමන්ගේ සාමාන්‍ය ආහාරය ගන්නා බව අප දන්නවා. එහෙත් රජයේ ප්‍රතිපත්තිය නිසා එම රෝගීන්ට තමන්ට පුරුදු පත්‍ය ආහාරය ලබා ගන්නට විධියක් නැහැ. බත් වේලක් කෑ විට සමහර අයගේ ලෙඩ මඟහැරී යන බව අප දන්නවා. ඇතැම් ලෙඩුන්ට බත් දීම සුදුසු බව වෛද්‍යවරුන් පවා ප්‍රකාශ කර තිබෙනවා. වෛද්‍යවරුන් එසේ නියම කර තිබුණත්, රෝගීන්ට පත්‍ය වුවත් ඔවුන්ට බත් දීමට කිසිම සංවිධානයක් නැහැ. අද මේ රටේ ආහාර තත්ත්වය හුඟක් දියුණුයයි රජය පුර සාරම් දොඩන නිසා, හාල් සේරු දෙකම නොදුන්නත්, රෝහල්වල සිටින ලෙඩුන්ටවත් සෑහෙන තරමට බත් වේලක් දීමට කටයුතු යොදන ලෙස මා ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

මීළඟට, ප්‍රාදේශික වශයෙන් ප්‍රශ්න කීපයක් ඉදිරිපත් කරනන්ට තිබෙනවා. සමස්ත ලංකා හෙද සේවා සංගමයත් රජයේ හෙද සේවා සංගමයත් බොහෝ කාලයක් තිස්සේ ඒ අයගේ සේවාවන් පිළිබඳ දුක්ගැනවිලි රාශියක් රජයට ඉදිරිපත් කරන බව ගරු සෞඛ්‍ය ඇමතිතුමා දන්නවා. මේ සංවිධාන දෙක වෙන වෙනම සංගම් දෙකක් වුවත් ශ්‍රේණි වැඩ සම්බන්ධයෙන් සංගම් දෙකම එකඟත්වයකට පැමිණ සිටිනවා. දැනට කම්කරු ශ්‍රේණියත් හෙද ශ්‍රේණියත් තිබෙනවා. මේ දෙක අතරේ මධ්‍යම ශ්‍රේණියක් ඇති කළ යුතුය යන ඉල්ලීම මේ සංගම් දෙකම විසින් කර තිබෙනවා. 1969 ජූලි මස 11 වන දා මා මේ සම්බන්ධව ප්‍රශ්නයක් ඇසුවා. එදින හැන්සාඩ් වාර්තාවේ 2520 වන තීරුවෙහි එය ඇතුළත් වී තිබෙනවා. "යථා කාලයේ දී කැබිනට් මණ්ඩලයෙහි සාකච්ඡා කොට තීරණයක් ගන්නට බලාපොරොත්තු වෙමි" යි එදා ඔබතුමා කී බව ඔබතුමාට මතක ඇති. වෘත්තීය සමිති සමග සාකච්ඡා කොට තීරණයක් ගන්නා බවත් ඔබතුමා කියා තිබෙනවා. ඒ අනුව, සෞඛ්‍ය ඇමතිතුමා මේ ගැන සාකච්ඡා කොට තීරණයක් ගෙන තිබෙනවාද, එසේ නැත්නම් මේ ප්‍රශ්නය දැන් තිබෙන්නේ කුමන තත්ත්වයකද යන කරුණු මා දැනගන්නට කැමතියි.

දැනට තිබෙන හෙද සේවය ඉතාමත් අසතුටුදායක බව අප කවුරුනුත් දන්නවා. හෙද සේවයට හෝ කම්කරුවන්ගේ සේවයට හෝ අයිති නැති සමහර වැඩ තිබෙනවා. "බෙඩ් පෑන්" දීම වැනි වැඩ සම්බන්ධයෙන් අර්බුදයක් පවතිනවා. එම නිසා, ඉහත කී ශ්‍රේණි දෙකට අතර සේවයක් සෑහෙන විධියේ පඩි සැලැස්මක් ඇතිව සකස් කළහොත් මේ දුක්ගැනවිල්ල මග හැරී යනවාට කිසිම සැකයක් නැහැ.

මගේ ඡන්දදායක කොට්ඨාශය නොයෙක් අංශවලින් වැදගත් වන එකක්. එහි උණ රෝහලත් මානසික රෝහල් දෙකකුත් තිබෙනවා. මේ රෝහල් තුනම අංගොඩ පෙදෙසට පමණක් හෝ ඒ අවට පළාත්වාසීන්ට පමණක් හෝ සීමා වූ ඒවා නොව මුළු ලංකාවටම පොදුවූ ආයතන තුනක්. එම නිසා මේ ආයතන තුන ප්‍රාදේශික ආයතන වශයෙන් සැලකීම නුවණට හුරු නැහැ. විශේෂයෙන් අංගොඩ රෝහල්වල අඩු පාඩුකම් රාශියක් තිබෙනවා. මා නිතර නිතර ඒ ස්ථානවලට යනවා. සෞඛ්‍ය ඇමතිතුමාත් යනවා ඇතැයි මා විශ්වාස කරනවා. මේ රෝහල්වල බෙහෙත් හිඟය ඉතාම තදබද ලෙස පවතිනවා. වැඩි වශයෙන්ම මානසික රෝගීන්ට තාවකාලික සහනයක් සැලසිය හැකි වන්නේ විදින බෙහෙත්වලිනුයි. විදින බෙහෙත් හිඟකම නිසා රෝග උත්සන්න වන අතර සේවකයන්ටත් විශාල කරදරයකට මුහුණ පාන්නට වෙනවා. මේ රෝහල්වලට අත්‍යවශ්‍ය බෙහෙත් වර්ග ලබා දීමට සෑහෙන ක්‍රියා මාර්ගයක් නොමැතිවීම කාගේත් කණගාටුවට කාරණයක්. මේ තත්ත්වය සම්බන්ධව පත්‍රවලිනුත් නොයෙක් අවස්ථාවලදී කරුණු පෙන්නුම් කර තිබෙනවා. 1969 සැප්තැම්බර් 3 වන දින "ජනසතිය" පත්‍රයේ පළ වූ වාර්තාවක් මා මේ අවසථා වේදී කියවන්නට සතුටුයි. මේ කරුණු සත්‍ය බව මා පෞද්ගලිකව දන්නවා.

"මානසික රෝහලේ බෙත් නෑ
දොස්තරලත් නෑ"

ඒකයි ශීර්ෂ පාඨය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

"අංගොඩ මානසික රෝහලේ රෝගීන්ට එන්නත් කිරීම සඳහා අවශ්‍ය පෙනිසිලින් ශිරාගත කරන මිදි යුෂ, 'ඩෙක්ස්ට්‍රෝස්', 'ස්ටැලසින්', 'ලාස්ටිල්' හා 'සැරිනේස්' එම රෝහලේ නැතැයි උසස් නිල ධාරියෙක් 'ජනසතියට' කීය."

මා ඒ රෝහලට ගිය අවස්ථාවේදී මටත් මේ අඩුපාඩුකම් ගැන කරුණු ඉදිරිපත් කළා. මානසික රෝහලේ මේ කණගාටු දායක තත්ත්වය ගැන මා ඊට පසු පැමිණිලි කළා. නමුත් අදත් ඒ තත්ත්වයෙහි වෙනසක් වී නැහැ. එම නිසා විශේෂ පරීක්ෂණයක් කර මේ රෝහල් දෙකට අත්‍යවශ්‍ය බෙහෙත් වර්ග ලබා දීමට පියවරක් ගන්නා මෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

අංගොඩ මානසික රෝහලේ දැන් තිබෙන තත්ත්වය වර්තමානයේ මානසික රෝහලක තිබිය යුතු තත්ත්වයට කොහෙත්ම නොගැලපෙන බව මා මේ අවස්ථාවේ දී පෙන්නුම් කරන්නට සතුටුයි. දැන් ක්‍රමයෙන් වෙනස් කිරීම් කරගෙන යනවා. ඉස්සර ඔවැනි රෝහලකට යනවාය කිව්වාම ඒක අන්තිම ගමනක් වශයෙන් තමයි සැලකුවෙ. නමුත් දැන් ඒ තත්ත්වය නැහැ. ළඟදී මා එහි ගිය අවස්ථාවේදී පරණ ගොඩනැගිලිත් දැනට අළුත්වැඩියා කර ගෙන යන ගොඩනැගිලිත් දුටුවා. පරණ ගොඩනැගිලි කොහොමද ? ඒවා දුටුවාම අර ඩිකන්ස් නම් ලේඛකයාගේ කථා මතක් වෙනවා. කලුවර ගුහා පමණයි තිබෙන්නෙ. එතැනට ගිය කෙනෙකුට නැවතත් ආපසු එන්නට බැරි තත්ත්වයක් තිබුණේ. නමුත් ඒ තත්ත්වය දැන් නැහැ. කල් පනා කර බැලුවොත් අප කාටත් ටික ටික ඔය මානසික රෝග ඇති. මනුෂයා නොයෙකුත් තත්ත්වයේ මානසික රෝගවලින් පෙළෙනවා ඇති. ඉස්සර තිබුණු තත්ත්වය උඩ ඒ ස්ථානයට අප එහෙම ඇද ගෙන ගියා නම් කිසි කලෙක අපට නිවනක් නැහැ. නමුත් විශේෂඥයින් මානසික රෝගීන්ට පිළියම් කරන අළුත් ක්‍රම සොයා ගෙන තිබෙනවා. ඒ අනුව දැන් ඒ රෝහල් සකස් කරගෙන යනවා. නමුත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ සහයෝගය නැතිකම නිසා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ඒ කටයුතු සම්පූර්ණ කරන්නට නුපුළුවන් වී තිබෙනවා. මානසික රෝගීන් සියළු දෙනාටම එකට ඉන්නට පුළුවන් තත්ත්වයක් දැන් ඇති කර තිබෙනවා. ඔවුන්ට එකට ඉන්නට එකට කථා බහ කරන්නට අවස්ථාව සලසා දී තිබෙනවා. ඒවාගේම සේවය කරන අයත් රෝගීන් සමග එකට හැසිරෙනවා. ඒක අළුත් වැඩ පිළිවෙලක්. නමුත් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ සහයෝගය මදිකම නිසා යථා පරිදි මේ පරිවර්තනය ඇති කරන්නට නුපුළුවන් වී තිබෙනවා. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබා ගෙන ඒ දුක්ඛිත තත්ත්වයක සිටින මානසික රෝගීන්ගේ යහපතට පියවර ගන්නා මෙන් මා ඉල්ලා සිටිනවා.

අංගොඩ මානසික රෝහලේ කොයි තරම් නරක තත්ත්වයක් තිබෙනවාද යන්න "ඩේලි නිව්ස්" පත්‍රයේ පළ වූ මේ ප්‍රවෘත්තියෙන් පෙනෙනවා ඇති.

"Rats eat corpses in Angoda morgue."

මිනී කාමරේ තිබෙන මිනී මීයන් කනවාලු. මිනී අඳුනා ගන්නවත් බැරි වන තරමට මීයන් කනවාලු. මේ අංගොඩ මානසික රෝහලේ මිනී කාමරේ තත්ත්වයයි. එම නිසා අංගොඩත් මුල්ලේරියාවේත් තිබෙන මුළු ලංකාවම ප්‍රයෝජන ගන්නා මේ රෝහල් දෙක ගැන මීට වඩා උනන්දුවක් දක්වන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

අ. භා. 7

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මනෝ වෛද්‍යවරුන් හුඟ දෙනකු පත් කර තිබෙනවා. එහෙත් ඒ මනෝ වෛද්‍යවරුන්ගෙන් නියම සේවය ලැබෙන්නේ නැති බවට දුක්ගැනවිල්ලක් තියෙනවා. ඇමතිතුමාගේ සැලැස්ම අනුව ප්‍රධාන රෝහලකට එක් කෙනකු පත් කළ යුතුයි. එහෙත් එය ක්‍රියාත්මක කරන්නට බැරි වී තිබෙනවා, හුඟ දෙනකු කොළඹම ඉන්නට කැමති නිසා. ඒ එක මනෝ වෛද්‍යවරයකු කොයි තරම් බලවත්ද කියතොත් මට ආරංචි හැටියට ඇමති මාරුවට හේතු වී තිබෙන්නෙත් ඒ දෙස්තර මහත්මයායි. කෙසේ වෙතත් නමුන් නාන්සේට සෞඛ්‍ය ඇමතිකම ලැබීම ගැන මා සතුටු වෙනවා. ඒ මනෝ වෛද්‍යවරයා පමණක් කියනවලු, මට කොළඹින් යන්න බැහැ, ඇමතිවරුන් ගියත් මා කොළඹම ඉන්නවාය කියා. ඒ නිසා ලොකු ආරෝග්‍ය ශාලාවලට මනෝ වෛද්‍යවරුන්ගේ සේවය ලබා ගන්නට බැරි වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අංගොඩ රෝහලේ ජල නළ ඉතා අසතුටුදායකයි. සමහර තැන්වල ජල නළ ඇත්තෙම නැහැ. එතැන ලෙඩුන් මානසික වශයෙන් කොයි තරම් දුර්වල වුණත් ශාරීරික වශයෙන් සෞඛ්‍ය සම්පන්නව සිටිය යුතුයි. මානසික රෝගීන් ශාරීරික වශයෙනුත් ඒ තරම් පිරිසිදුව සිටින්නට කැමති නැහැ. ඒ නිසා මානසික රෝගීන් සඳහා ජල නළ සේවය ඉතාම අවශ්‍යයි. මළ නළ සේවය ඇත්තෙම නැහැ. ඒ නිසා සේවකයන්ගෙනුත්, දොස්තර මහත්වරුන්ගෙනුත් නොයෙක් දුක් ගැනවිලි තියෙනවා. ඒ දුක්ගැනවිලිවලට ඇහුම්කන් නොදීම නිසා ඒ අය අධෛර්‍යයට පත් වී සිටිනවා.

මැලේරියා මර්දන ව්‍යාපාරයේ සේවකයන්ගෙන් ලොකු දුක්ගැනවිල්ලක් තියෙනවා. ඒ ව්‍යාපාරයේ ප්‍රධාන දොස්තර මහත්මයා ඒ නිලධාරීන්ට සාධාරණ අන්දමට සලකන්නේ නැති බවයි—පක්ෂග්‍රාහීව කටයුතු කරන බවයි—ඒ පැමිණිල්ල. දේශපාලන වශයෙන් පක්ෂග්‍රාහීව කටයුතු කරනවාය කියා මා කියන්නේ නැහැ. සමහර නිලධාරීන්ට පමණක් පක්ෂව අසාධාරණ ලෙස කටයුතු කරනවා. සමහර අය නිකම් ඉන්නවා; සමහර අය වැඩ කරනවා. එක් කෙනෙක් සිංහල පන්තිවලට යනවාය කියා උදය වරුවේ වැඩ නොකර නිකම් ඉන්නවා. ඉගෙන ගන්න යන්නෙත් නැහැ. සවස අතිකාල දීමනා ලබා ගන්න වැඩ කරනවා. ඒ නිසා ඒ අංශයේ දුක් ගැනවිලි ගැන සොයා බලන්නට ඕනෑ.

මගේ කොට්ඨාශයේ නිලධාරියකු සම්බන්ධයෙන් පැමිණිල්ලක් තියෙනවා. කීප විටක්ම මා මේ ගැන සඳහන් කළා. එම්. සී. රත්නවේල් නමැති ඔහු ස්ටෝකීපර් කෙනෙක්. 1964 මැයි 22 වැනිදා ඔහුගේ වැඩ තහනම් කළා. 1964 අගෝස්තු 27 වැනිදා ඔහුට විරුද්ධව චෝදනා ඉදිරිපත් කළා. 1965 නොවැම්බර් 17 වැනිදා ඔහු සම්පූර්ණයෙන් නිර්දෝෂ බව පිළිගෙන ඔහුට ආපසු රක්ෂාව දුන්නා. එහෙත් අද වන තෙක් ඔහුට, වැඩ තහනම් කර තිබුණු කාලය සඳහා ලැබිය යුතු ඉත්පිරි වැටුප් බාගය ගෙවා නැහැ. මේ සම්බන්ධයෙන් කොයි තරම් පෙත්සම් ඇරියත් ඒ පිළිබඳව ක්‍රියා කර නැහැ. ස්ථිර ලේකම්තුමාටත් මා මේ ගැන පැමිණිලි කළා. එතුමා ඉක්මනින්ම මේ ගැන සොයා බලා පිළියමක් යොදනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා. පහළ සිටින අය ඊර්ෂ්‍යා සහගතව කටයුතු කරන නිසා කඩදාසි ඉහළට යන්නේ නැති බවයි, දැන ගන්නට ලැබී තිබෙන්නේ. ඒ නිසා මේ ගැන සොයා බලා ඉක්මනින් කටයුතු කරන ලෙස ස්ථිර ලේකම්තුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

මගේ කොට්ඨාශයේ අධික ජනගහනයක් ඇති ප්‍රදේශයක්. කොටිකාවත්තේ ඉන්නේ සෞඛ්‍ය පරීක්ෂකවරුන් දෙදෙනයි. ඉන් කෙනකුට 41,000 ක ජනගහනයක් බලාගන්නට තියෙනවා. අනික් තැනැත්තට 34,000 ක ජනගහනයක් බලාගන්නට තියෙනවා. සෞඛ්‍ය ඇමතිතුමා 3 දෙනකු පත් කරන බව කියා තිබෙනවා. නොවැම්බර් මාසයේදීවත් පත්වේයැයි අප බලාපොරොත්තු වෙනවා. [බාධා කිරීමක්] ඔක්තෝබර් වුවත් කමක් නැහැ. එම කටයුතු යථා කාලයේදී ඉටු වේවිය කියා අප විශ්වාස කරනවා.

බුත්ගමුව මධ්‍යම බෙහෙත් ශාලාව පිළිබඳව විශාල උද්ඝෝෂණයක් පවතිනවා. දැනට එම බෙහෙත් ශාලාව මාතෘදරකාභිවෘද්ධි මධ්‍යස්ථානයක් වශයෙන් පමණයි පවත්වන්නේ. සතියකට දෙදිනක් දොස්තර කෙනෙක් එහි යනවා. ජනගහණය වැඩි නිසා ඒ දින ගණන ප්‍රමාණවත් නැහැ. එම සේවය මීට වඩා ශක්තිමත් කරනවා නම් හොඳයි. කොටුවිලටත් සතියකට දෙවරක් පමණයි දොස්තර කෙනෙක් යන්නේ. එසේම අංගොඩ මධ්‍යම බෙහෙත් ශාලාවෙනුත් දිනපතා ලෙඩුන් 1,500 ක් පමණ වෙදකම් ගන්නවා. එම ස්ථානයෙහි බෙහෙත් හිඟය පිළිබඳව අපට නිතරම පැමිණිලි ලැබෙනවා. නොයෙක් දෙනා නොයෙක් දේ කියනවා. ඒ සියල්ලම මෙතන කියන එක හරි නැහැ. ඇතැමුන් කියනවා, "බංගලාවේ බෙහෙත් තිබෙනවා; ඩිස්පෙන්සරියේ බෙහෙත් නැහැ" යනුවෙන්. ඒ පිළිබඳව යම්කිසි පරීක්ෂණයක් කළොත් හොඳය කියා මා විශ්වාස කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

කොළොන්නාව ගංවතුරට අසුවන කොට්ඨාශයක්. ගංවතුරක් ආවායින් පසු එම කොට්ඨාශයේ සෞඛ්‍ය තත්ත්වය බොහෝ දුරට පහත වැටෙනවා. ගංවතුරින් පසු කාණු, ළිං, ඇළවල් යනාදිය ශුද්ධ පවිත්‍ර කරන්නට ඉක්මන් වැඩ පිළිවෙළක් නොගන්නා නිසයි, එම තත්ත්වයට මුහුණ දෙන්නට සිදු වී තිබෙන්නේ. සෞඛ්‍ය අංශයෙන් එම පළාතේ බොහෝ දුක්ගැනවිලි තිබෙන බව කියයුතුයි.

එක්තරා කනගාටුදායක කාරණයක් මා ගරු ඇමතිතුමාට මතක් කර දී තිබෙනවා. දැන් එය මා නැවත වරක් මතක් කරනවා. වැල්ලම්පිටිය-අවිස්සාවේල්ල පාරේ අංක 143 දරණ ස්ථානයේ මොහමඩ් අබ්දුල් කරීම් බුහාරි මහතාගේ පුතා වන මොහමඩ් පවුසි බුහාරිගේ මරණය ගැනයි මා නැවතත් මතක් කරන්නේ. ඒ ළමයා අසනීප වී 1967 දෙසැම්බර් 24 වන දින මහා රෝගය ශාලාවට ඇතුළත් කළා. 23 වන වාට්ටුවේ 17 වන ඇඳේයි ඒ ළමයා සිටියේ. ඒ ළමයා දින නවයක්ම ඒ ඇඳේ හිටියා. ඒ ළමයාට වෙදකම් කළේ දොස්තර නෝනා කෙනෙක්. දැන් මේ රටේ දොස්තර නෝනලා වැඩි කීර්තියක් ලබා නොගන්නා බවයි පෙනෙන්නේ. ඒ ළමයාගේ පියා ළමයාගේ අසනීපය ගැන දොස්තර නෝනාට දන්වූ නොයෙක් අවස්ථාවලදී ඇය ඔහුට බැන වැදී තිබෙනවා. "ළමයාට කිසි ලෙඩක් නැහැ; ළමයා ඔහේ හිටපුවාවේ; අපි හොඳට බලා ගන්නම්" යනුවෙන් ඇය කියා තිබෙනවා. කෙසේ වෙතත් නව දිනකට පසු ළමයා මිය ගියා. මිය ගියාට පසු පැවැත්වූ මරණ පරීක්ෂණයේදී එළිදරව් වුණේ කුමක්ද? දොස්තර කෝදාගොඩ මහතායි, මිනිය කපා නිගමනයක් දී තිබෙන්නේ. ඒ මහතාගේ නිගමනය මෙසේයි:

ළමයාගේ පියා ගොස් හැමවිටම කිව්වේත් "ළමයාගේ බඩේ අමාරුවක්—ගෙඩියක්ද කොහේද—තිබෙනවා; ඒක බලන්න" යනුවෙනුයි. එහෙත් දොස්තර නෝනා බැණ වැදුණා. ලෙඩා මිය ගියා. දොස්තර මහතා මිනිය කැපූ පසු කියා තිබෙන්නේත් ටියුමර් එකක් තිබෙන බවයි. මෙම කාරණය මා තමුන්නාන්සේට කලින් ඉදිරිපත් කර තිබෙනවා. මා නැවතත් මෙය ඉදිරිපත් කරන්නට කල්පනා කළේ අන් කරුණක් නිසා නොවෙයි, තවමත් මේ උදවිය පාඩමක් ඉගෙන ගෙන නොමැති බව පෙන්වන්නටයි. තවමත් නොයෙක් අන්දමේ වැරදි සිදු වන බව පෙනෙනවා. මා සිතන හැටියට මෙවැන්නකට ප්‍රධාන හේතුව වන්නේ දොස්තර හිඟය පමණක් නොවෙයි. අප්‍රවේසම්කමත් ඊට හේතුවක් හැටියට පෙන්වන්නට පුළුවනි. මේ පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලමින් මගේ කථාව අවසාන කරනවා.

**එච්. කුලරත්න මයා. (රක්වාන)**

*(திரு. எச். குலரத்ன—றக்குவான)*

**(Mr. H. Kularatne—Rakwana)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම අවස්ථාවේදී සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට මා බලාපොරොත්තු වෙනවා. මැලේරියා මර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් ඒ පිළිබඳ කටයුතු කරන අමාත්‍යාංශයේ නිලධාරීන්ටත් මා පළමුකොටම ස්තුතිවන්ත වෙනවා. මා ඒ උදවියට එසේ ස්තුති කරන්නේ මැලේරියාව නිසි අයුරු පාලනය කිරීමේ තත්ත්වයකට පත් කර තිබීම නිසයි. අප නියෝජනය කරන කොට්ඨාශවල තමයි බරපතලම තත්ත්වයකට මෙම රෝග පැතිර ගොස් තිබෙන්නේ. විශේෂයෙන් උඩවලවේ ප්‍රදේශයේ මැලේරියාව බල පවත්වනවා. ආහාර නිෂ්පාදනය පිණිස වැඩි වශයෙන් මහජනතාව නිරත වන රක්වාන ප්‍රදේශය කොළොන්න ප්‍රදේශය වැනි ප්‍රදේශවල පැතිර යන මැලේරියා රෝගය පාලනය කරන්නට බැරි තරම් තත්ත්වය කුයි උදාවේගෙන ආවේ. එහෙත් ගමන් පහසුකම් නොමැති එම දුෂ්කර ප්‍රදේශවල සැතපුම් හය හත පයින්ම ගොස් එම නිලධාරීන් මැලේරියාව මර්ධනය කරන්නට ගන්නා ලද පියවරවලින් උසස් ප්‍රතිඵල ලැබී තිබෙනවා. එම නිසා තමයි එම රෝගය පාලනය කරන්නට හැකි තත්ත්වයකට අද පැමිණ සිටින්නේ. මැලේරියා රෝගය පැතිරීගෙන ආ වේගය මැඩීමට සාර්ථක අන්දමින් ක්‍රියා කිරීම ගැන මගේ ප්‍රශංසාව පුද කරනවා.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නොයෙක් දුර්වලකම් තිබෙන්නට පුළුවනි. ජනගහණය වැඩි වන වේගයෙන් ආදායම්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

තත්ත්වය වැඩි නොවන රටක අප බලාපොරොත්තු වන තත්ත්වයෙන් සෞඛ්‍ය සේවය පවත්වාගෙන යෑමට කුමන ආණ්ඩුවකට වුණත් අමාරුයි. කෙසේ වුණත් මෙම ආණ්ඩුව බලයට පත් වුණායින් පසුව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව තුළ සතුටුදායක වෙනස්කම් රාශියක් ඇති කර තිබෙන බව අප දන්නවා. ඖෂධ අඩුපාඩුකම් රාශියක් තිබෙන බව කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) ප්‍රකාශ කළා. ඖෂධ සම්බන්ධ අඩුපාඩුකම් දිගටම තිබුණු බව ඒ ගරු මන්ත්‍රීතුමා පිළිගනිතැයි මා හිතනවා. දිගටම පැවති ඒ තත්ත්වය දැන් වෙනස් වී සෑහෙන දුරට සතුටුදායක අතට හැරී තිබෙනවා. මේ ආණ්ඩුව බලයට පත් වුණායින් පසුව පමණක් ඒ අඩුපාඩුකම් ඇති වුණා යයි කාටවත් කියන්නට පුළුවනැයි මා හිතන්නේ නැහැ. කෙසේ වුණත් දැන් නම් තත්ත්වය සෑහෙන දුරට සතුටුදායකයි. එදා ඖෂධ සම්බන්ධව සියලුම කටයුතු කෙරුණේ කොළඹිනුයි. ඒ කාලයේදී, නොයෙකුත් බෙහෙත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් පිට පළාත්වල සිටින වෛද්‍යවරුන් කොළඹ බෙහෙත් ගබඩාවට ලියුම් එව්වත් ඒවාට පිළිතුරු ලැබුණේ මාස ගණන් ගත වීමෙන් පසුවයි. 1965 න් පසුව ප්‍රාදේශීය බෙහෙත් ගබඩා පිහිටුවන්නට ගරු ඇමතිතුමා ක්‍රියා කළා. එයින් සතුටුදායක ප්‍රතිඵල ලැබුණා. කොළඹ මහ බෙහෙත් ගබඩාවේ ශාඛා පිටපළාත් වලත් විවෘතකොට ඒවා ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරීන්ගේ මාර්ගයෙන් පාලනය වන්නට කටයුතු යෙදුවා. මේ ක්‍රමය නිසා දුර බැහැර ප්‍රදේශවලට පහසුවටත්, ඉක්මනටත් බෙහෙත් ලබා ගන්නට පුළුවන් වී තිබෙනවා. ඒ නිසා ඔය කියන තරමටම උග්‍ර තත්ත්වයක් දැන් නැති බව කියන්නට ඕනෑ. අඩුපාඩු සියල්ලම සම්පූර්ණ යයි මා කියන්නේ නැහැ. කෙසේ වුණත් දැන් පෙරට වඩා සහනදායක තත්ත්වයක් ඇති වී තිබෙනවා.

පසුගිය කාලයේදී රත්නපුර මහ රෝහලට ජලපහසුකම් ආදිය නැති වීමෙන් එහි තරමක අසතුටුදායක තත්ත්වයක් පැවතුණත් දැන් එය හොඳ තත්ත්වයකට පත් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. හැතැප්ම 65 ක්, 70ක් දුර බැහැර ප්‍රදේශවල සිට මේ මහ රෝහලට ලෙඩ්ඩු එනවා. රත්නපුර දිස්ත්‍රික්කයට ඇති මේ මහ රෝහල සතුටුදායක තත්ත්වයකට ගෙන අවුත් තිබෙනවා පමණක් නොව ආයුර්වේද රෝහලත් ජයප්‍රිය තත්ත්වයකට පත් වන විධියට කටයුතු යොදා තිබෙනවා. ඇත්තෙන්ම කලින් නොලැබුණු හොඳ සේවයක් දැන් ඒ ආයුර්වේද ආරෝග්‍යශාලාවෙන් ලැබෙනවා.

යම් දෙපාර්තමේන්තුවක ආයතන ගණන වැඩි වන විට එක නිලධරයකුට හෝ දෙදෙනකුට ඒවා සියල්ල පාලනය කිරීම අපහසුයි. ඒ විධියට පාලනය වුණොත් ඇත්තෙන්ම එය අඩපණ පාලනයක් බවටත් පත් වන්නට පුළුවනි. දුර බැහැර ප්‍රදේශවල ඇති යම් යම් ස්ථාන පාලනය කරන්නට සිදු වන නිසා එවැනි තත්ත්වයක් උද්ගත වන්නට පුළුවනි. මම උදාහරණයක් කියන්නම්: රත්නපුරයේ සිට කොලොන්නා කෝරළේ එහා කොණට හැතැප්ම 65 ක් විතර තිබෙනවා. ඒ ප්‍රදේශයේ සාමාන්‍ය බෙහෙත් ශාලාවක සිටින නිලධරයා හරියාකාර ලෙස රාජකාරි කරනවාදැයි සොයා බැලිය යුත්තේ රත්නපුරයේ සිටින ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධරයා හෝ ඔහුගේ දෙවැනියා විසිනුයි.

අ. භා. 7.15

ඉස්සර නම් බලංගොඩ එහා කොණේ හල්තොටට යන්න ඕනෑ. සමහර විට එතනට යෑමට වරුවක් පමණ කාලය ගත වෙනවා. ඒ නිසා සාමාන්‍ය පාලනය අසතුටුදායක තත්ත්වයකට වැටෙන්නට ඉඩ තිබෙනවා. ඒ නිසා එහි සත්‍යතාවක් තිබෙන බව සඳහන් කරන්නට කැමතියි. අනෙක් හැම රජයේ දෙපාර්තමේන්තුවකටම මැතිවරණ කොට්ඨාශයකට එක් නිලධාරියෙකු බැගින් පාලන කටයුතු සඳහා යොදන්නට පුළුවන් නම් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවටත් ඒ ඒ මැතිවරණ කොට්ඨාශයේ පාලන කටයුතු සඳහා පාලකයකු බැගින් පත් කරන්නට විධිවිධාන යොදන්නැයි මා ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලන්නට කැමතියි. නොයෙක් කරුණු සම්බන්ධයෙන් චෝදනා එල්ල වන සැටි අපට දකින්නට ලැබී තිබෙනවා. සෞඛ්‍ය මධ්‍යස්ථාන ගැනත් නොයෙක් විට නොයෙක් චෝදනා එල්ල කරන සැටි අපට දකින්නට ලැබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කුලරත්න මයා.]

ඉදිරිපත් කරනු ලබන චෝදනාවලින් ඇත්ත වශයෙන්ම සියේට 99ක්ම ඔප්පු කරන්නට බැරි ඒවා බව කියන්නට මට පුළුවනි. ඔනෑ තරම් චෝදනා නම් එල්ල කරන්නට පුළුවනි. ඔප්පු කරන්නට පුළුවන් නම් තමයි ඒවා නියම හේතු අනුව මතු කරන ලද චෝදනා හැටියට අපට සලකන්නට පුළුවන් වන්නේ. ඒ කොයි හැටි වෙතත්, නියම පාලනයක් තිබෙනවා නම් මේ එක චෝදනාවක්වත් මතු වන්නේ නැහැ. සමහර මධ්‍යම බෙහෙත් ශාලාවලට මාස හයක් හතක් ගියත් සෞඛ්‍ය නිලධාරි මහත්මයාට යන්ට බැහැ. රත්නපුර දිස්ත්‍රික්කය තුළ මැතිවරණ කොට්ඨාශ අටක් තිබෙනවා. මේවායින් බොහොමයක්ම නොදියුණු දුෂ්කර ප්‍රදේශ හැටියටයි විස්තර කරන්නේ. මෙවැනි ප්‍රදේශවල පිහිටි මධ්‍යම බෙහෙත් ශාලා ආදිය සම්බන්ධයෙන් ලැබෙන චෝදනා නවත්වන්නට අඩු වශයෙන් මැතිවරණ කොට්ඨාශයක ඉන්න රාජකාරියෙන් පැරණි එක් වෛද්‍ය නිලධාරියෙක්වත් සති දෙකකට එක් වරක් බැගින් හෝ ඒ ප්‍රදේශයේ වෛද්‍ය මධ්‍යස්ථාන පරීක්ෂා කිරීමට යැවිය යුතුය යන්නයි මගේ අදහස. නොයෙක් අංශවලින් නොයෙක් චෝදනා වරින් වර එල්ල කරනවා. මේ මධ්‍යස්ථානවල රාජකාර්යයන් පිළිබඳ වැඩ කටයුතු මහජනයාගේ යහපතට අදාළ වන පරිදි සිදු වන්නේ නැතැයි චෝදනා නිතර නිතර ඉදිරිපත් කරන නමුත් මෙවැනි විධිමත් වැඩ පිළිවෙලක් ඇති කළොත් එවැනි තත්ත්වයකට ඉඩ ලැබෙන්නේ නැහැ.

මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශය පිළිබඳ අඩුපාඩු රාශියක් ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. ඒවා සියල්ලක්ම ගැන සඳහන් කරන්නට මේ අවස්ථාවේ මට පුළුවන්කමක් නැහැ. ඒ නිසා කීපයක් ගැන පමණක් සඳහන් කරන්නට කැමතියි. අපේ අඩුපාඩුවලින් කීපයක් ඇනටමත් සම්පූර්ණ කර දී තිබෙනවා. ඒ ගැන ගරු ඇමතිතුමාටත්, අමාත්‍යාංශයේ නිලධාරීන්ටත් මා ස්තුතිවන්ත වෙනවා. අටකලම්පන්නට මධ්‍යම බෙහෙත් ශාලාවක් ලබා දී තිබෙනවා. ඒ සඳහා පෞද්ගලික පරිත්‍යාග දෙකක්ම ලැබී තිබෙන බව මේ අවස්ථාවේ ස්තුති පූර්වකව සඳහන් කරන්නට කැමතියි. ගොඩකවෙල මාතෘ නිවාසයත්, උඩවෙල මධ්‍යම බෙහෙත් ශාලාවත් සඳහා පරිත්‍යාග කළ උදවියට අපේ කෘතඥතාව පළ කළ යුතුව තිබෙනවා. මාකඳුරේ මධ්‍යම බෙහෙත් ශාලාවක් සඳහා ගොඩනැගිල්ල තැනීමට කොන්ත්‍රාත්තුවක් දී තිබෙන බව ගරු ඇමතිතුමා දන්නවා. ඒ බෙහෙත් ශාලාව පුළුවන් ඉක්මණින් ජනතාවට ලබා දෙන්නැයි මා ඉල්ලා සිටිනවා. ලඟම ආරෝග්‍යශාලාවේ සිට මෙය පිහිටුවන්නට බලාපොරොත්තු වන ස්ථානයට දුර හැතැප්ම දහයක් පමණ ඇති. කාලාන්තරයක් තිස්සේ පයින්ම බෙහෙත් ශාලාවට හැතැප්ම ගණනාවක් ගමන් කළ පිරිසට මේ පහසුකම් ඉක්මණින් ලැබුණොත් ඉතාමත් හොඳයි.

අප නියෝජනය කරන ප්‍රදේශය වනගත ප්‍රදේශයක් වුවත් දැන් විදුලි බලය සැපයීමේ මාර්ග හුඟක් දුරට වැඩි වේගන යනවා. හල්තොට ප්‍රදේශයේ සිට කුට්ටිගල ප්‍රදේශයට දැන් මධ්‍යස්ථාන කීපයක් හදාගෙන යනවා. මේ ප්‍රදේශයේ රෝහල්වලට ලිංවලින් තමයි තවමත් වතුර ලබා ගන්නේ. එය ඉතාමත් දුෂ්කර කාර්යයක් බව තමුන්නාන්සේ දන්නවා. විදුලි බලය ලබා දුන්නොත් ආලෝකය ලැබෙනවා පමණක් නොව, එය උපයෝගි කර ගෙන ජල පහසුවද ලබා ගත හැකි වෙනවා. නවීන පහසුකම් රාශියක්ම ඒ මගින් ලබා ගත හැකි වන බව සලකා ඒ ගැන ක්‍රියා කරන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ගොඩකවෙල, වැලිගෙපොළ ආදී ප්‍රදේශවල ආදියේ පටන් පැරණි ක්‍රමය ළිංවලින්ම වතුර ලබා ගන්නා නමුත් විදුලි බලය ලබා දුන්නොත් පොම්ප මාර්ගයෙන් ජලය පහසුවෙන් ලබා ගන්නට පුළුවන් වනු ඇතැයි මා කල්පනා කරනවා.

අප ප්‍රදේශවලට ලබා දෙන්නට පුළුවන් පහසුකම් රාශියක් තිබෙනවා. දුරකථන පහසුකම් එයින් වැදගත් තැනක් ගන්නවා. කහවත්තේ සිට ඇඹිලිපිටිය දක්වා හැතැප්ම විසිපහක් තිහක් පමණ ප්‍රදේශයට දුරකථන පහසුකම් නැහැ. ගොඩකවෙල දක්වා තිබෙන නමුත් සාමාන්‍ය කෙනෙකුට ලෙහෙසියෙන් එයින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රයෝජනයක් ලබා ගන්නට බැහැ. ඇඹිලිපිටිය, පල්ලේබැද්ද, කහවත්ත යන තැන්වල සිටින ලෙඩුන් රත්නපුර ආරෝග්‍යශාලාවට ගෙන යෑමට විධියක් නැහැ. අවශ්‍ය වෑන් රථයක් පවා ලබා ගැනීම බොහොම අමාරු දෙයක් වෙලා තියෙනවා. උඩවලවේ යෝජනා ක්‍රමය යටතේ ඒ අයගේ සේවකයින් ගෙන යෑමට නම් ගිලන් රථ පහසුකම් ලබා දී තිබෙනවා. එහෙත් අනික් අයට නැහැ. ඒ නිසා ඇඹිලිපිටිය ගොඩකවෙල ආදී ප්‍රදේශවලටත් ඒ පහසුකම් ලබා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා.

මට මේ අවස්ථාව ලබා දීම ගැන ගරු නියෝජ්‍ය සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් නතර කරනවා.

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.** (අත්තනගල්ල)

*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டாரநாயக்க—அத்தனகல்ல)*

(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ප්‍රථමයෙන්ම මා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා.

අද රජයේ ආරෝග්‍ය ශාලාවල තිබෙන දුෂ්කරතාවන් ගැන කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාගේ (ඉලංගරත්න මයා.) කථාවේදී කෙටියෙන් සඳහන් වුණා. අපට නිතර නිතර අහන්නට ලැබෙන දෙයක් තමයි අද රජයේ රෝහල්වල තිබෙන දුෂ්කරතාවන්. පත්‍රවලිනුත් නිතර නිතර ඒ ගැන දකින්නට ලැබෙනවා. විශේෂයෙන්ම අවශ්‍ය බේත් හේත් ඇත්තේ නැහැ. බොහෝ අවස්ථාවල ලෙඩෙක් රෝහලකට ගෙන ගිය විට පිටින් බෙහෙත් ගෙනෙන්නට නියම කරනවා. එසේ කරන්නේ ආරෝග්‍යශාලාවේ බෙහෙත් නැති නිසයි. පිටින් බෙහෙත් සොයා ගන්නත් අමාරුයි; තිබුණත් බ්ලැක්මාර්කට් ගණන් ගෙවලයි ගන්නට වෙන්නේ. කෙනෙක් අසනීපයක් වී ආරෝග්‍යශාලාවකට යන්නේ වෙදකමක් ගන්නයි. බෙහෙත් ටිකක් බී හොඳට ආහාර ලබා ගන්නයි. එහෙත් බෙහෙත් පමණක් නොවෙයි, අද බත් වේලකුත් ලැබෙන්නේ නැහැ. මේ නිසා අද ආරෝග්‍යශාලාවල තත්ත්වය ඉතාම දුර්වල බව කියන්නට ඕනෑ; පුවත්පත්වලත් තිබෙනවා. ඊයේ පෙරේදා පත්තරයක තිබුණා දොස්තර වරුනුත් මේ ගැන කරුණු හෙළි කරන්නට ලැහැස්තියි කියා.

“DOCTORS PLAN TO EXPOSE HOSPITAL MESS”

‘Fed-up’ with how their problems are handled

ඇමතිතුමාට යැවූ පෙත්සමක් ගැන මෙහි සඳහන් කර තිබෙනවා. එය මෙසේයි :

“The crisis in Government hospitals has reached such a pitch that top-flight surgeons have decided to break their long silence and expose the hospital administration in a memorandum to the Minister of Health Mr. E. L. Senanayake.

Several doctors—ranging from house officers to specialists—told the “Observer” that they were ‘fed-up with the manner in which the administration handled their difficulties.’

Specialists state that this step-motherly treatment of hospitals has led to the gradual deterioration of medical standards. Besides, they state, that by trying to cover up for the administration they ultimately fall into difficulties.”

මේ තත්ත්වය මඟහැරවීමට ගරු ඇමතිතුමා ගත යුතු පියවරවල් ගන්නවා ඇත කියා අපි බලාපොරොත්තු වෙනවා.

ඒ සමගම මේ අවස්ථාවේ සඳහන් නොකරම බැරි කරුණක් තිබෙනවා. එනම් ගරු කොටගම් වාචිස්සර ස්වාමීන් වහන්සේගේ කණගාටුදායක මරණය ගැනයි. උන්වහන්සේ ආරෝග්‍යශාලාවට ඇතුළත් වුණේ ඉතාම සුළු ශල්‍ය කර්මයක් කරවා ගැනීමටයි. එහෙත් ලෙඩා මළා. උන්වහන්සේගේ ඒ මරණයෙන් පසු විභාගයක් පැවැත්වුවා. ඒ විභාගයේදී ඉතා වැදගත් කරුණු කීපයක් හෙළි වුණා. එකක් නම් ඒ ශල්‍ය කර්මය කළ වෛද්‍යවරයා ඒ විභාගයේදී සාක්ෂි දී නැහැ. ඒ වෙනුවට සාක්ෂි දී තිබෙන්නේ එම්. එස්. මහත්මයා.

ප්‍රොෆෙසර් රාජසූරිය මහත්මයාගේ සාක්ෂියේදී හෙළි වී තිබෙන කරුණු මේවායි : මේ ස්වාමීන් වහන්සේ ගැන පරීක්ෂණයක් කරන්නය කියා ඒ මහත්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.]
මයාට කියා තිබෙනවා. එයට හේතුව වශයෙන් කියා තිබෙන්නේ පඩි නඟින විට, ඇවිදින විට, හති වැටෙනවාය කියන එකයි. ඒ නිසා ලෙඩා සෝදිසි කිරීම මේ රාජසූරිය මහත්මයාට පවරා තිබෙනවා. ඒ මහත්මයා ලෙඩා පරීක්ෂා කර බලා ශල්‍ය කර්මයක් කිරීමට සුදුසුයි කියා වාර්තාවක් දී තිබෙනවා. ඒ ශල්‍ය කර්මයට දවස් 3 කට කලිනුයි. රාජසූරිය මහත්මයාගේ සාක්ෂියේදී කොර්නර්තැනගේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් එතුමා කියා තිබෙනවා, සාමාන්‍යයෙන් "ඇනිස්තටිස්ට්" කෙනෙක් ලෙඩා "ඇනිස්තටයිස්" කරන්නට කලින් ලෙඩා පරීක්ෂා කර බලන්නට ඕනෑය කියා. රාජසූරිය මහත්මයා මුන්වහන්සේ පරීක්ෂා කර තිබෙන්නේ ශල්‍ය කර්මය කරන්නට දවස් 3 කට කලිනුයි. ඊට දවස් තුනකට පස්සෙයි ශල්‍ය කර්මය කරන්නට අරගෙන තිබෙන්නේ. ඒ අවස්ථාවේදී රෝගියා පරීක්ෂා කර බැලුවේ නැතැයි දොස්තර නෝනා කියා තිබෙනවා. බෙඩ් හෙඩ් ටිකට් පතේ එසේ නොලියා තිබීමෙන් පෙනී යන්නේ රෝගියා පරීක්ෂා කළේ නැති බවයි. දවස් තුනකට පස්සෙ උන්වහන්සේගේ හෘද වස්තුවේ ක්‍රියාකාරිත්වයෙහි වෙනසක් ඇති වන්න පුළුවනි. සිහි නැති කරන අවස්ථාවේ උන්වහන්සේ මොන තත්ත්වයක සිටියාදැයි කියන්න දන්නෙ නැහැ. එය එක් කාරණයක්.

අනික් කාරණය නම් මෙයයි. රාජසූරිය දොස්තර මහතා කියා තිබෙනවා, සාමාන්‍යයෙන් හර්නියා වැනි ශල්‍ය කර්මවලදී දෙන්නේ "ස්පයිනල් ඉන්ජෙක්ෂන්" කියා. නමුත් දොස්තර නෝනා—ඇනස්තටිස්ට්—කියා තිබෙනවා ස්පයිනල් ඉන්ජෙක්ෂන් එකක් දුන්නෙ නැත, උන්වහන්සේ මහත වැඩි නිසා දෙන්නට බැරි වුණාය කියා. [බාධා කිරීමක්] ස්පයිනල් ඉන්ජෙක්ෂන් එකක් දෙන්න අමාරු නිසා ජෙනරල් ඇනස්තටයිසර් එකක් දෙන්න සිදු වුණාය කියා තිබෙනවා. එපමණක් නොවෙයි, ඇය එතරම් පළපුරුද්දක් නැති කෙනෙකු බව සාක්ෂියේදී හෙළිදරව් වී තිබෙනවා. අවුරුදු දෙකකවත් පළපුරුද්දක් නැති අතර තවමත් සේවයේ ස්ථිර කර—කන්ෆර්ම් කර—නැති බව ද හෙළි වී තිබෙනවා. එහෙනම්, ස්පයිනල් ඉන්ජෙක්ෂන් එක වෙනුවට ජෙනරල් ඇනස්තටයිසර් එකක් දෙනවා නම් එසේ දීමට පළමු ජ්‍යෙෂ්ඨ ඇනස්තටිස්ට් කෙනෙකුගේ උපදෙස් ලබාගැනීම යුතුකමක්ව තිබුණා නොවේද? ඇය එහෙම කර නැහැ. ඒ බව පරීක්ෂණයේදී ඔප්පු වී තිබෙනවා. එයා තනියමයි එම තීරණය අරගෙන තිබෙන්නෙ. ශල්‍ය කර්මය කරගෙන යන විට, මැදක් හරියේදී උන්වහන්සේගේ හෘද වස්තුව ක්‍රියා කිරීම නතර වී තිබෙනවා. ඒ අවස්ථාවේදී ශල්‍ය කර්මය කළ වෛද්‍යවරයාත්, දොස්තර නෝනාත් උත්සාහ කර තිබෙනවා නැවත වරක් හෘද වස්තුව ක්‍රියා කරවන්න. නමුත් සාර්ථක වී නැහැ. ඊට පසුව වෛද්‍ය අධිකාරී තැනට ආරංචි වී එතැනට දුව ගොස් තිබෙන අතර වෙනත් වෛද්‍යවරුන්ද පැමිණ උන්වහන්සේගේ හෘද වස්තුව ක්‍රියා කරවන්න උත්සාහ දරා තිබෙනවා.

ගරු සෞඛ්‍ය ඇමතිතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාවේත් ඒ බව සඳහන් වෙනවා. අපට වෛද්‍යවරුන්ගෙන් දැනගන්නට ලැබී තිබෙනවා, සාමාන්‍යයෙන් හෘද වස්තුව විනාඩි හතරකට වැඩි වේලාවක් ක්‍රියා නොකර තිබුණොත් මොළයට අවශ්‍ය ලේ නොයාම නිසා මොළයට විශාල හානියක් සිදු වෙනවාය, වැඩක් ගන්න බැරි තත්ත්වයක් ඇති වෙනවාය කියා. ඒකයි උන්වහන්සේටත් සිදු වී තිබෙන්නෙ. විනාඩි හතරකට වැඩි කාලයක් හෘද වස්තුව ක්‍රියාකර නැහැ. මට දැනගන්න ලැබී ඇති හැටියට විනාඩි දහයකට පහළොවකට වැඩි කාලයක් හෘද වස්තුව ක්‍රියාකර නැහැ. ඒ අවස්ථාවේදී ඊට යාබද කාමරවල ජ්‍යෙෂ්ඨ ශල්‍ය වෛද්‍යවරුන්, ජ්‍යෙෂ්ඨ ඇනස්තටිස්වරුන් ඉඳලා තිබෙනවා. ඇන්තනීස් දොස්තර මහතාද ඒ අසල කාමරයක ඉඳල තිබෙනවා. නමුත් ඒ කාටවත් අඬගහන්නෙ නැතුව මෙම කනිෂ්ඨ වෛද්‍යවරයා සහ කනිෂ්ඨ ඇනස්තටිස්ට් උත්සාහ දරා තිබෙනවා, හෘද වස්තුව ක්‍රියා කරවන්නට. ආධාරය පිණිස වෙනත් වෛද්‍යවරුන් යන විට ප්‍රමාද වැඩියි. මෙය ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයක්. මේ ගැන අපි ටිකක් සොයා බැලුවා. අපට දැනගන්න ලැබී ඇති හැටියට ජ්‍යෙෂ්ඨ වෛද්‍යවරයකු ශල්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර්මයක් කරන විට ඔහුට උදව් කරන්නේ ජ්‍යෙෂ්ඨ ඇනස්තටිස්ට් කෙනෙක්. කණිෂ්ඨ වෛද්‍යවරයෙකු ශල්‍යකර්මයක් කරන විට උදව් කරන්නේ කණිෂ්ඨ ඇනස්තටිස්ට් කෙනෙක්, මෙය ඉතාමත්ම භයානක තත්ත්වයක්. මෙම නොසැලකිල්ල නිසා ඉතාමත්ම වටිනා ජීවිතයක් අපට නැතුව ගියා. ලංකාවට පමණක් නොවෙයි, මුළු ලෝකයටම උන්වහන්සේගේ අභාවය විශාල පාඩුවක්. කෙසේ වුණත්, කොයි තරම් දුප්පත් අයෙකුට වුණත්, හිඟන්නකුට වුණත් මේ අන්දමේ සැලකිල්ලක් දැක්වීම ගැන අප ඉතා කනගාටු වෙනවා.

ගරු සභාපතිතුමනි, ආරෝග්‍යශාලාවල පවතින මෙම තත්ත්වය වෙනස් කළේ නැති නම් අපට ඉතාමත්ම භයානක තත්ත්වයට මුහුණ පාන්න සිද්ධ වෙනවා. කොටගම වාචිස්සර හිමියන්ගේ අභාවයට පසුවදා පළමු දරුවා ලැබෙන්නට කාසල් වීදියේ මාතෘ නිවාසයට ඇතුළු වී සිටි මවක්, දරුවා ලැබෙන්නට සිහි නැති කළ අවස්ථාවේදී මරණයට පත් වී තිබුණා. මේ වාගේ මරණ නිතර නිතර අපට අසන්නට ලැබෙනවා. නමුත් අසන්නට නොලැබෙන මෙවැනි මරණ දුසිම් ගණන් අපේ ආරෝග්‍යශාලාවල සිදුවනවා.

අ. භා. 7.30

එයින් අපට සෑහීමකට පත් වෙන්න බැහැ. කොටගම වාචිස්සර ස්වාමීන් වහන්සේගේ පණ ගන්න නැවත වරක් අපට පුළුවන් කමක් ලැබෙන්නෙ නැහැ. නමුත් මුන්වහන්සේගේ මේ මරණයෙන් පාඩමක් ඉගෙන ගන්න ඕනෑ. රජය විසින් නැවත වරක් ඒ මරණයට හේතුන් සොයා බලන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් නැවත වරක් හොඳ පරීක්ෂණයක් පවත්වන්න ඕනෑ. අපක්ෂපාත අය ලවා පරීක්ෂණයක් පැවැත්විය යුතුයි. මා හිතන විධියට මේ දොස්තරවරුන්ගේ වෘත්තීය සමිතියක් තිබෙනවා. මේ දොස්තරවරුන් සියලු දෙනාම වාගේ ඒ වෘත්තීය සමිතියට අයිතියි. ඒ නිසා පරීක්ෂණ පවත්වන විට ඒ අය යම් යම් කාරණ සඟවා ගන්න සමහර විට උත්සාහ ගන්න පුළුවනි. එවැනි දේවල් සිදු වන බව කරන ලද පරීක්ෂණයේදී අපට ඔප්පු වුණා. ඒ නිසා සම්බන්ධ

යෙන් අපක්ෂපාත පරීක්ෂණයක් පවත්වා මේ විධියේ දේවල් මීට පසු ආරෝග්‍යශාලාවල සිදු නොවන හැටියට කටයුතු කරනවා ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. ඒ විධියට කටයුතු කළොත් කොටගම වාචිස්සර ස්වාමීන් වහන්සේගේ මරණය සම්බන්ධයෙන් තරමකින්වත් සෑහීමට පත් වෙන්න පුළුවනි. උන්වහන්සේගේ මරණය නිසා ආරෝග්‍යශාලාවල තිබෙන මේ නරක තත්ත්වය වෙනස් වුණා කියාවත් අපට සෑහීමට පත් වෙන්න පුළුවනි.

මේ සම්බන්ධයෙන් තවත් කාරණා කිහිපයක් කියන්න තිබෙනවා. නමුත් මට ඒ තරම් වෙලාවක් ලැබෙන්නෙ නැහැ. මේ සම්බන්ධයෙන් කතා කරන අනික් මන්ත්‍රීවරුන් සමහර විට ඒ කරුණු ගැන කියාවි. ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණයෙන් ලැබී තිබෙන තීරණය මෙයයි. "Anaesthetic misadventure" දොස්තරවරුන් කියන්නෙ එයයි. එයින් පෙනෙන්නේ මෙය නොසැලකිල්ලෙන් වුණ දෙයක් බවයි.

මට තවත් කාරණයක් කියන්න බැරි වුණා. කොටගම වාචිස්සර සවාමීන් වහන්සේගේ "ඇනිස්තටිස්ට්" හැටියට කටයුතු කිරීමට පිරිමි කෙනෙක් දමන්න බැරි වුණාද? සාමාන්‍යයෙන ගැහැණු උදවිය ස්වාමීන් වහන්සේලාට ස්පර්ශ කිරීම වරදක් වශයෙන් සලකනවා. ඔය තරම් ආරෝග්‍යශාලාවේ පිරිමි දොස්තරවරුන් සිටියදී මේ සවාමීන් වහන්සේගේ වෛද්‍ය කටයුතු කිරීමට පිරිමි කෙනෙක් යොදවන්න බැරි වුණේ ඇයි? එයත් නොසැලකිල්ල නිසා සිදු වුණ දෙයක් වශයෙන් සලකන්න පුළුවනි.

ඒ නිසා මෙය නොසැලකිල්ල නිසා සිදු වුණ අපරාධයක් හැටියට මහජනයා අද පිළිගෙන අවසානයි. මේ ගැන අද රටේ ලොකු ආන්දෝලනයක් තිබෙනවා. සමහර අය කියනවා අපරාධයක් කිරීමක් වශයෙන් මෙය සලකන්න පුළුවන්ය කියා. අපි නම් එහෙම කියන්නෙ නැහැ. නමුත් මෙය නොසැලකිල්ලෙන් වුණ මරණයක් හැටියට නම් කවුරුත් පිළිගන්නවා. ඒ නිසා මේ තත්ත්වය වෙනස් කිරීමට සෞඛ්‍ය ඇමතිතුමා පියවර ගන්නවා ඇතැයි යන බලාපොරොත්තුවෙන් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

**වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන** (අම්බලංගොඩ)

*(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன—அம்பலாங்கொட)*

(Dr. M. H. Saddhasena—Ambalangoda)

ගරු සභාපතිතුමනි, මා නැගී සිටියේ සෞඛ්‍ය අමාත්‍යාංශය විවේචනය කිරීමට නොව, මගේ ප්‍රදේශයේ තිබෙන අඩු පාඩුකම් කිහිපයක් ගැන කතා කිරී මටයි. මා ප්‍රථමයෙන්ම කියන්න කැමතියි, මේ අවුරුද්දේදී මේ රජය විසින් සංචාරක බෙහෙත් ශාලා, ශාඛා බෙහෙත් ශාලා, මධ්‍යම බෙහෙත් ශාලා ඇති නොකළ යුතුය කියා නියමයක් කළා. නමුත් ගරු සභාපතිතුමනි, ජනගහ නය ශීඝ්‍රයෙන් වැඩි වෙන යුගයකදී මුදල් තත්ත්වය ගැන සලකන්නෙ නැතිව ඒ ජනගහනයට සරිලන පරිදි විශේෂයෙන් ඔවුන්ගේ රෝගී අවස්ථාවලදී බෙහෙත් ටික ලබා ගැනීමට හැකි වන පරිදි බෙහෙත් සැල් ඉදි කිරීම කොයිම රජයක වුණත් යුතුකමක්ය කියා මා සිතනවා. අද විශේෂ යෙන්ම මට එවැනි තත්ත්වයකට මුහුණ පාන්න සිදු වී තිබෙනවා. රක්වාන මන්ත්‍රී තුමාගෙන් (එච්. කුලරත්න මයා.) නම් මට දැනගන්න ලැබුණා, එතුමාට නම් මධ්‍යම බෙහෙත් ශාලා තිබෙනවාය දැනටත් එක් මධ්‍යම බෙහෙත් ශාලාවක් සෑදීමේ කොන් ත්‍රාත් එකක් කරගෙන යනවාය කියා. නමුත් අපට නම් එවැනි දෙයක් ලැබී නැහැ. මෙන්න මේ විධියේ වෙනස්කම් විරුද්ධ පක්ෂයේ අයට පමණක් නොව අපටත් කෙරෙන බව මට නම් දැන් වැටහී ඉවරයි.

මගේ කොට්ඨාශයේ ජනපද රාශියක් ඇති වීම නිසා ජනගහනය වැඩි වී තිබෙන ප්‍රදේශයක මට සිදු වුණා යම්කිසි පරිත්‍යාග යක් කර දුප්පත් අම්මණ්ඩිලාගේ හැඹිලි වල තිබෙන මුදල් පවා එකතු කර ඩිස් පැන්සරියක් සෑදීමට කටයුතු කරන්න. ඒ සඳහා කලින් සිටි සෞඛ්‍ය ඇමතිතුමාගෙන් අවසර ඉල්ලුවා; නමුත් අවසර ලැබුණේ නැහැ. දැන් සිටින සෞඛ්‍ය ඇමතිතුමාගෙන් අවසර ඉල්ලුවා. ඒත් ලැබුණේ නැහැ. අන්තිමට එතුමා එහි කැඳවාගෙන ගොස් තත්ත්වය පෙන්නුවාට පසු අවසර දෙන් නම්ය කිව්වා. අන්තිමේදී කියනවා මේක ආණ්ඩුවෙන් කරන්න බැරිය කියා. එහෙත් මහජනතාවට ඇති බලවත් අවශ්‍යතාව නිසා ඒ දුප්පත් මහජනතාව කැමති වුණා අපි හිඟා කා හෝ කරමුය කියා. ඊළඟට ආණ්ඩුව රුපියල් 80,000 කට ලක්ෂයකට කිට්ටු වෙන්න ප්ලෑන් සකස් කර එව්වා. එහෙම කරන්න ඇත්තෙ, කරන්න එපයි නොකියා එපා කරවන්න වෙන්න ඇති. ඒ නිසා මට සිද්ධ වුණා ඒ සඳහා ප්ලෑන යක් සාදවා දෙන්න. කොහොමද ඒත් කරන්නෙ? දුප්පතුන්ගේ දුක නොදන්න දුප්පතුන්ගේ අවශ්‍යතා ගැන නොදන්න මොකක්ද කෙහෙල්මල් අමාත්‍යාංශයක් තිබෙනවා, ක්‍රම සම්පාදක අමාත්‍යාංශය කියා. ඒකෙන් මොකක්ද කරන්නෙ? විදුලි පංකා යට ඉඳගෙන එක පෑන් පහ රින් ගහනවා, "කපා පත්, බැහැ දෙන්න" කියා. මේ තත්ත්වය වෙනස් කළ යුතු බව මම අවධාරණයෙන්ම කියා සිටිනවා.

කෙසේ හෝ වේවා, සභාපතිතුමනි, මා ගත් උත්සාහය නිසා ඒ දෙපාතීමේන්තුවේ සිටින උප අධ්‍යක්ෂ කෙනෙකුගේත් සපිර ලේකම්තුමාගෙත් ආධාරය ඇතුව අපේ මුදල්වලින්වත් එය හදාගන්න පුළුවන් තත්ත්වයක් දැන් ඇති වී තිබෙනවා. ඒ වාගේම තවත් මගේ හිත මිත්‍රයෙකුගෙන් පරිත්‍යාගයක් ලබාගෙන ආරච්චි කන්දේ මාතෘ නිවාසයක් නොමිලේ තනා දීම පිණිස කටයුතු කර ඇතත්, දැන් මාස ගණනක් තිස්සේම එය පමා වී තිබෙනවා. මට අද දැනගන්නට ලැබුණා, යම්තම් ඒකෙ ප්ලෑන් පාස් වී තිබෙනවාය කියා. තවද, කිරිදිඇල මධ්‍යම බෙහෙත් ශාලාවක් තනවා දීම පිණිස ප්ලෑන සකස් කර ඇතත් තවමත් ඒ පිළිබඳව කිසිම පිය වරක් ගෙන නැහැ. කෙසේ වෙතත් ඒවා බාහිර වශයෙනුයි මා සඳහන් කෙළේ.

අද උපත් පාලනය ගැන කොතෙක් කට යුතු කරගෙන ගියත්, අපේ දුප්පත් ප්‍රදේශ වල—විශෙෂයෙන් බටපොළ වැනි ගමක් උදාහරණයක් වශයෙන් ගන්න පුළුවනි—විශාල ජනපද රාශියක් ඇති වී තිබෙන අවස්ථාවේදී දුප්පත් ගොවි-කම්කරු ජන තාවට ගෙදර පැමිණ ටිකක් විනෝද වන් නට තිබෙන එකම අවස්ථාව එය විතරයි. ඒ විනෝදයේදී සමහර විට දරු ප්‍රසූතියක් ඇති වීමට හේතු වෙන්න පුළුවන්. [බාධා කිරීම්] එපමණයි ඒ මිනිසුන්ට තිබෙන විනෝදය. දරු ප්‍රසූතිය සඳහා මාතෘ නිවාස යක් බටපොළ නැහැ. ඒ නිසා එක්කෝ සැතැප්ම 8 ක් මග ගෙවා හික්කඩුවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආරච්චි කන්දට එන්න ඕනෑ. එහෙම නැත්නම් අනික් පැත්තෙන් හැතැප්ම 8ක් මග ගෙවා අම්බලන්ගොඩට යන්න ඕනෑ.

බටපොළ ග්‍රාමීය රෝහලට මාතෘ නිවාසයක ඇති අවශ්‍යතාව ගැන මා 1965 දී ප්‍රශ්නයක් මතු කළ අවසථාවේදී ගරු ඇමතිතුමා වෙනුවෙන් පිළිතුරු දුන් ගරු උප ඇමතිතුමිය ප්‍රකාශ කරන්න යෙදුණා, එහි තත්ත්වය සෝදිසි කර බලා එම ග්‍රාමීය ආරෝග්‍යශාලාව පයඝීන්ත ඒකකයක් බවට පත් කිරීමට කටයුතු යොදනවාය කියා. මා සන්තෝෂයි කියන්න, මේ රජයෙන් එම ආරෝග්‍යශාලාවට වෛද්‍ය නිවාසයක් නැතිම හේතු කොට ගෙන එදා 10කට, 20කට පමණ සීමා වූ ලෙඩුන් සංඛ්‍යාව අද 300 ඉක්මවා තිබෙන බව. එම නිසා මා ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව, එතුමාට මුදල් නැත්නම් රජයත් සමග කෝලාහල කර හෝ තව මුදල් ටිකක් ලබාගෙන මෙම මහජන අවශ්‍යතාව පිරිමසාලන්නය කියා.

සභාපතිතුමනි, මා පත් වුණාට පසු මා නියෝජනය කරන ප්‍රදේශයට එකම ආරෝග්‍යශාලාවක්වත් සාදා දී නැහැ. එම නිසා මා නැවත වරක් ඉල්ලා සිටින්නේ බටපොළ ග්‍රාමීය ආරෝග්‍යශාලාවට ගැබිණි වාට්ටුවක් තනා දී හැකි පමණ ඉක්මනින් එය පයඝීන්ත ඒකකයක් කරන ලෙසයි. මේ යුගයේ දවල් තිස්සේ රුකීරක්ෂා කර වෙහෙස වී සිටින අම්මලාට හික්කඩුවට හෝ අම්බලන්ගොඩට යන්නට සිදුවුණොත් මගදීම දරු ප්‍රසූති සිදු වෙන්න ඉඩ තිබෙනවා. එවැනි අභාග්‍යයකට මුහුණ පාන්නට සිදු නොවේවායි මා ප්‍රාර්ථනා කරන අතර, ඒ දුප්පත් මව්වරුන්ගේ හදිසි අවශ්‍යතාව සපුරාලීම පිණිස, මව්වරුන්ට පහසුවීම පිණිස ගැබිණි වාට්ටුවක් ලබා දීම කෙරෙහි විශෙෂ සැලකිල්ල යොමු කරන මෙන් මා නැවතත් අවධාරණයෙන් ඉල්ලා සිටිනවා.

තවත් කිවයුත්තක් තිබෙනවා. අම්බලන්ගොඩ ආරෝග්‍යශාලාවට ජලනළ පහසුකම් දීම සඳහා රුපියල් 1,42,000ක මුදලක් සම්මත වී තිබෙනවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. මෙම කටයුත්තට ප්‍රමුඛත්වය දීම සඳහා නියෝගයක්ද කිරීම ගැන. එහෙත් ඇමතිතුමනි, එහි ළිඳ හෑරීමටවත් තවම තමුන්නාන්සේගේ නිලධාරීන් ගිහින් නැහැ. මෙවැනි අක්‍රමිකතාවන් වෙනවා. මහජනයාට මේවා ඉවසන්න බැහැ. කොතරම් මුදල් හිඟයක් තිබුණත්, රටේ සෞඛ්‍ය තත්ත්වය පිරිහෙන්න ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. මහජනයා ආරක්ෂා කිරීම, මහජනයාගේ බැරි අමාරුකම්වලට උදව් වීම, ඕනෑම රජයක යුතුකමක්. එම නිසා ගරු ඇමතිතුමාට දී තිබෙන මුදල් කොටස මදි නම් මුදල් ඇමතිතුමාගේ සාක්කුවෙන් හෝ හොරකම් කරගෙන මේ කටයුතු ඉෂ්ට කර දීමට සෞඛ්‍ය ඇමතිතුමා ක්‍රියා කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

